# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
# WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 දෙසැම්බර් 07 වන සිකුරාදා**
2012 டிசெம்பர் 07 வெள்ளிக்கிழமை
Friday 07th December 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.30 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.30 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.30 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2013 පූර්ණ කාරක සභාව
## ANNUAL FINANCIAL STATEMENT - 2013 COMMITTEE OF THE WHOLE COUNCIL

***2013 වාර්ෂික මුදල් ප්‍රකාශයේ ප්‍රදානයන් සලකා බැලීම සඳහා පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය යුතු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය.***

*Having stated by the Hon. Chairman that the Provincial Council be converted into a Committee of the Whole Council, in order to consider the grants of the Annual Financial Statement of 2013, the provincial council converted itself into a Committee of the Whole Council.*

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක 105** | - | **සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය.** |
| **ශීර්ෂ අංක 116** | - | **සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 117** | - | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 118** | - | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 119** | - | **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** |
| Head no 105 | - | Ministry of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs, Probation and Child Care Services and Council Affairs |
| Head no 116 | - | Department of Health |
| Head no 117 | - | Department of Ayurveda |
| Head no 118 | - | Department of Social Services |
| Head no 119 | - | Department of Probation and Child Care Services |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, *"ශීර්ෂ අංක 105, 116, 117, 118 සහ 119 යන වැය ශීර්ෂයන්ගෙන් රුපියල් 10/- බැගින් අඩු කළ යුතු යැයි"* මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැය ශීර්ෂ ආරම්භ කරමින් මම මුලින්ම ආරාධනා කරනවා, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ පූ.භා. 09.35 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, ආරෝග්‍යා පරමා ලාභා කිව්වා වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපේ සෞඛ්‍ය අමාත්‍යතුමා පිළිබඳවත්, අමාත්‍යාංශය පිළිබඳවත්. එතුමා ඉතාමත් ඕනෑකමින් මේ විෂයය කරන ඇමැතිවරයෙක් බව මට කියන්න වෙනවා. විපක්ෂයේ හිටියත්, විරුද්ධව ඡන්දය දුන්නත්, අපට එය කියන්න වෙනවා. එතුමාත් සමග මම දීර්ඝ කාලයක් කටයුතු කළ කෙනෙක් හැටියට, අපේ ප්‍රදේශයේ අපේ දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක් හැටියට එතුමා නිහඬව තමන්ගේ සේවය කරමින් කාලය ගත කරන ඇමැතිවරයෙක් හැටියට සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම අද එතුමා උදේම අමාත්‍යාංශ විවාදය පටන් ගන්නකොටම හොඳ කැඳ වීදුරුවකුත් දීලා, පොත්පත් ප්‍රමාණයක් අපට ලබා දීලා තිබෙනවා. දියවැඩියාව, පිළිකාව වැනි රෝග වැළඳීමේදී ප්‍රථමයෙන්ම අපව දැනුවත් කිරීමට කටයුතු කිරීම පිළිබඳවත් එතුමාට මම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම මුඛය ආරක්ෂා වන වැඩ පිළිවෙළකටත් එතුමා සම්බන්ධ වෙලා තිබෙනවා. දායක වෙලා තිබෙනවා. ඊට ස්තූවන්ත වන ගමන්ම මේ විවාදය පටන් ගන්න කලින් මම මතක් කරන්න ඕනෑ. එතුමා අද සායනයක් පැවැත්වීමට කටයුතු කරලා තිබෙනවා. එතුමාටත්, ඒ නිලධාරී මහත්වරුන්ටත් ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ඒ සායනයේ ප්‍රතිඵල කඩිනමින් ලබා දෙන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒක ගිය වතාවට වඩා -

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

දින තුනකින් දෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

දින තුනක් වනකොටත් ඒක ප්‍රමාදයි. ලේ සම්බන්ධ වාර්තාවට දින තුනක් යනකොට ප්‍රමාද වැඩියි. ඒ නිසා පසුගිය වතාවේ වාගේ නැතුව - මම අද Report එක ගන්න ගියෙත් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සඳුදාට දෙන්න කියන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පුළුවන් නම් සඳුදාවත් එය මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න. අපේ මන්ත්‍රීවරුන් පිළිබඳව සභා කටයුතු අමාත්‍යවරයා වශයෙන් දැක් වූ සහාය පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මෙතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරනකොට 2012 ට වඩා මිලියන 24 ක විතර පුංචි වැඩිවීමක් මේ අවුරුද්දේ සිදු කරලා තිබෙනවා. සෞඛ්‍ය කියන්නේ, පළාතේ මිනිසුන්ගේ 27% ක 28% ක ජනතාවගේ වගකීම් දරන අමාත්‍යාංශයක්. අධ්‍යාපනය වාගේම. මිලියන 24 ක වැඩිවීමක් වෙලා තිබෙනවා. 2012 දී 7079 යි. 2013 දී 8003 යි. ඒකෙනුත් ප්‍රාග්ධන වියදම් සඳහා 10% ක ආසන්න ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන්නේ. මිලියන 759 යි. එතකොට පුනරාවර්තන වියදම 7344 යි. දැන් මේ 759 තියාගෙන එතුමා මුළු පළාතේ - විශේෂයෙන් නගර අයින් කළත්, කළුතර, ගම්පහ වාගේ දුෂ්කර පළාත්වල ඉන්න දුගී ජනතාව වෙනුවෙන් කරන සේවාව මීට වඩා දියුණු කරන්න පුළුවන් වෙයිදෝ කියන එක අපට ලොකු ප්‍රශ්නාර්ථයක් බව සඳහන් කරන්න ඕනෑ. මේ අයවැය සකස් කිරීමේදී එතුමාගේ අමාත්‍යාංශය මීට වඩා සැලකිලිමත් වෙනවා නම්, අද රෝග පිළිබඳව නිතරම සාකච්ඡා වෙනවා. අද උදේත් ප්‍රවෘත්ති අහගෙන ඉන්නකොට විවිධ රෝගයන් තිබෙන බව පැවැසුණා. ආපහු නැවත වරක් ඩෙංගු හිස ඔසවනවා. ඒ වාගේම අපේ පළාත ගත්තාම මී උණ වැඩි වෙනවා. ඒක දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කරනවා. විසඳුමක් නැහැ. එක අවස්ථාවක කිව්වා, මේ සඳහා කියුබාවෙන් බැක්ටීරියා ගේනවා කියලා. ඊට පස්සේ කිව්වා දේශීය නිෂ්පාදනවලින් බැක්ටීරියා - එක බැක්ටීරියාවක්වත් නැහැ. ගරු ඇමැතිතුමා උත්සාහ කරනවා. පෞද්ගලිකව එතුමාගේ කැපවීම, මහන්සිය පිළිබඳව නැවත ස්තුතිවන්ත වෙනවා. නමුත් මේ නිලධාරීන් ටික තියාගෙන ගෙවල්වලට ගිහිල්ලා මිනිස්සුන්ව දැනුවත් කරලා, ඒ දැනුවත් කිරීම තුළ මිනිසුන්ට දැන් අලුත් නීතියක් තමයි, ගම්සභා මට්ටමට නොවෙයි ප්‍රාදේශීය සභා මට්ටමට පත් වෙලා ඉවරයි, දඩ කොලේ දෙන්න. දඩ ගහන්න. පසුගිය කාලේ ගත් දඩ මුදල් ඒ ආදායම ඔබතුමාට හම්බ වුණාද මම දන්නේ නැහැ. රේඛීය අමාත්‍යාංශයට කෝටි 05 ක විතර ආදායමක් ඇවිල්ලා තිබෙනවා. බස්නාහිර පළාතේ? මේ සම්බන්ධව පළාත් සභාවක් හැටියට රෝග නිවාරණයට, මර්දනයට යම් වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. එහෙම නැතුව අද සමහර ඉඩම්වලට පොලීසිය අරගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම ප්‍රාදේශීය සභාවේ කාණු පද්ධතිය පිළිබඳව, ප්‍රාදේශීය සභාව නඩත්තු කිරීම පිළිබඳව මීට වඩා උනන්දු වෙන්න ඕනෑ. සෞඛ්‍ය අමාත්‍යාංශයට වඩා. ඒ අයගේ වගකීම. මම කුඩා කාලේ දැකපු දෙයක් තමයි PHI මහත්වරුන්ට ඉස්සර සැන්ට්පෝට් මහත්තයා කියලා කියන්නේ. කාකි කොටු කලිසම ඇඳගෙන, විල්බැරෝ එක තල්ලු කරගෙන ගෙයක් ගෙයක් ගාණේ, ගමක් ගමක් ගාණේ ඇවිද්දා. කුණු ටින් එකතු කළා. නමුත් අද PHI මහත්වරු එක්ක පොලීසියයි, ගමේ ආරක්ෂක අංශයේ හරි, සමෘද්ධි කෙනෙක් හරි තමයි මේ වත්ත ඇතුළට යන්නේ. බාහිර පුද්ගලයෝ වත්තට ඇතුල් වීම අපට ලොකු ප්‍රශ්නයක්. වර්තමානයේ තිබෙන තත්ත්වය හැටියට ඒක ලොකු ගැටළුවක් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රෝග නිවාරණය වෙනුවෙන්ම යම් කැපවීමක් කරන්න වෙනවා. එක පැත්තකින් ඒ සඳහා මේ අවශ්‍ය මුදල් මදී.

ඒ වාගේම ගමේ සායන තිබෙනවා. මේ සායනවලට මව්වරු ගියාට පස්සේ ඒ අයට අවශ්‍ය බෙහෙත් හේත් ලබා ගැනීමේදී අඩු තරමින් වාඩි වෙලා ඉන්න, වතුර ටිකක් බොන්න තරම් ඒ පහසුකම් පිළිබඳව මීට වඩා පුළුල් විධියට හිතන්න ඕනෑ. කළුතර දිස්ත්‍රික්කය ගැන කථා කරනවා නම් අගලවත්ත, මතුගම, බුලත්සිංහල වාගේ දුෂ්කර ප්‍රදේශ ගත්තාට පස්සේ රෝහල්වල විශාල අඩුපාඩු තිබෙනවා. මම මීට පෙරත් මේ සභාවේ කථා කළා. මීගහතැන්න රෝහලට ගිය අවස්ථාවක මම දැක්කා, ඒවායේ ලෙඩ්ඩු නිදාගෙන ඉන්නේ මෙට්ටේ නොවෙයි. මෙට්ට ලෙල්ලේ. ඒ නිසා මට පුළුවන් වුණා. රුපියල් ලක්ෂයක ප්‍රතිපාදන ලබා දීලා මෙට්ට කිහිපයක් ලබා දෙන්න. මෙට්ට 20 ක් 25 ක් විතර ලබා දෙන්න.

ඒ අයගේ ඉල්ලීම් තිබෙනවා. මම හිතන්නේ 1 - 12 වැටුප් තලය පිළිබඳව. ඒ වාගේම සාත්තු සේවිකාවන්ගේ ගැටළු තිබෙනවා. ඒ වාගේම පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ ගැටළු තිබෙනවා. මේ අයගේ ඉල්ලීම් ඇති කළේ කවුද? ඔවුන් වෘත්තීය සමිතියක් හැටියට රේඛීය අමාත්‍යාංශය කරුණු සාකච්ඡා කළාම, ඒ අය අනුයුක්ත කිරීම් පමණයි කියන්නේ. ඒ අය හිඟ වෙනවා. දෙන්නම් කියලා පොරොන්දු වෙනවා. ඔක්කෝම කරලා ඉවර වෙලා අවසානයට ඒ අයට වෙන ප්‍රශ්නයක් මතු කරලා CGR එකේ තත්ත්වයට පත් කරනවා. අදත් CGR එකේ ස්ට්‍රයික් එකක් තිබෙනවා. අද කම්කරුවෝ, වැඩ කරන ජනතාවක් හැටියට - අද ඉන්න නායකයෝ තමයි එදා 52 හර්තාලය ඇති කළේ. ඊට පස්සේ විවිධ ස්ට්‍රයික් කළේ. 1983 වැඩ වර්ජකයෝ. මේ තත්ත්වය ඇති කරලා, උසි ගන්වලා, ඔවුන්ව දැනුවත් කරලා

අද ඒ සේවකයාට කියනවා ඉල්ලීම් ඉල්ලන්න එපා. ඔවුන්ට ජීවත් වීමේ ප්‍රශ්නය මත, ජීවන තත්ත්වය මත, වැඩිවන ජීවන වියදමට සරිලන විධියට ඔවුන්ට - කම්කරුවාට වඩා වෛද්‍යවරුන්ට වැටුප් තලයක් තිබිය යුතුයි. ඒ තත්ත්වයේ වෙනස පිළිබඳව විශේෂයෙන්ම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් මම ගරු ඇමැතිතුමාට කියනවා සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ රැස්වීම්වලදී හරි කමක් නැහැ, පුළුවන් නම් සාකච්ඡාවට භාජනය කරන්න. ඒ නිසා ඉහළ මට්ටමින් ගන්නා වූ තීරණ හේතුවෙන් පහළ මට්ටමේ ගැමි ජනතාවටයි ප්‍රශ්න මතු වෙලා තිබෙන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ආයුර්වේද අංශය පිළිබඳව මීට වඩා ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු විය යුතුයි. ආයුර්වේද මධ්‍යස්ථාන කිහිපයක් තිබෙනවා. ඒවායෙන් ප්‍රතිකාර ලබා ගැනීමට විශාල රෝගීන් සංඛ්‍යාවක් එනවා. බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා අපි එදා ඉඳලා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගැන සාකච්ඡා කරනවා. අපට පුළුවන් නම් කොත්තමල්ලි ටිකට, පත්පාඩගම් ටිකට, කටුවැල්බඩු ටිකට, වෙනිවැල්ගැට ටිකට ඒ අයගේ රෝගයන් පිළිබඳව දැනුවත් කරලා කරන්න. එක පැත්තකින් විදේශ විනිමය ඉතුරු වෙනවා. දේශීය වෛද්‍ය ක්‍රමය, පාරම්පරිකව තිබුණු එක. එදා සැත්කම් පවා තිබුණා. එහෙම නම් අද දේශීය වෛද්‍ය ක්‍රමය තුළ අපට දියුණුවක් ඇති කර ගන්න පුළුවන් නම් අපේ සම්පත් උපයෝගී කරගෙන, අපට දානපති සමාගම් සම්බන්ධ කර ගන්න පුළුවන් නම්, අද දිවි නැඟුම යටතේ පැළ බෙදා දෙනවා වාගේම අඩු තරමේ ආයුර්වේද පැළයක් දෙකක් හෝ බෙදා දීමක් කරන්න පුළුවන් නම්, අපට පැළ තවාන් ඇති කර ගන්න පුළුවන් නම් ආයුර්වේද ක්‍රමය දියුණු කරගෙන අපට ඉදිරියට යන්න පුළුවන් වෙනවා. විශේෂයෙන්ම ආයුර්වේදය මිනිසුන්ගේ හෙම්බිරිස්සාවට, උණට විතරක් නොවෙයි, විවිධ රෝග සඳහා මේ අය දැනුවත් කිරීම, ඒ වාගේම ආයුර්වේද වෛද්‍ය වෘත්තිය පිළිබඳව විදේශ පුහුණුවක් ලබා දීමට ඉන්දියාවට යවන්න පුළුවන් නම්, ඉන්දියාවේ තිබෙන දැනුම අපේ වෛද්‍යවරුන්ට ලබා දෙන්න පුළුවන් නම් - ඒ වාගේම යුනානි වෛද්‍ය ක්‍රමය අද නැති වෙලා ගිහිල්ලා තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඉන්දියාවට යන්නේ මොකටද? ඊට වඩා අපේ අය ඉන්නවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

යුනානි වෛද්‍ය ක්‍රමය - උදේ පාන්දර දොඩවන්නේ නැතුව ඉන්න. ඒ අය දන්නේ නැහැ අපේ වෛද්‍ය ක්‍රමය කොහෙන්ද ආවේ. දැනුම බෙදා හදා ගන්න ඕනෑ කියන එක. ඒ නිසා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ දියුණු මට්ටමට යන්න අපට පුළුවන් නම්, විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරලා ජනතාවට පුළුවන් තරම් දුරට දේශීය වෛද්‍ය ක්‍රමය ලබා දෙන්න පුළුවන් නම් අපේ ජීවන මට්ටම මීට වඩා යහපත් වෙනවා. තත්පරයක් දෙන්න ගරු සභාපතිතුමනි. අද වාර්තමානයේ හඳුනාගෙන තිබෙනවා මඤ්ඤොක්කා කෑමෙන් අපට වැළදෙන පිළිකා රෝගය නැති කර ගන්න පුළුවන් කියලා. සමාජය තුළ එවැනි මතයක් තිබෙනවා. අද මඤ්ඤොක්කා කිලෝ එක රුපියල් 70 යි 80 යි. බොහෝ දෙනා අද මඤ්ඤොක්කා කන්න පුරුදු වෙලා තිබෙනවා. අනිවාර්යයෙන්ම කනවා. දිනපතා ග්‍රෑම් 100 හෝ 200 ක් කන්න පුළුවන් නම් අපට පුළුවන් වෙනවා, ඒ රෝගය නිවාරණය කර ගන්න.

දේශීය වෛද්‍ය ක්‍රමය තුළත් අද හඳුනාගෙන තිබෙනවා, ඩෙංගු රෝගයට ගස්ලබු දළු අරගෙන ඉස්ම දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ මතය අද සමාජය තුළ තිබෙනවා. එහෙම නම් මේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලට වඩා අපට පුළුවන් වෙන්න ඕනෑ - රෝග නිවාරණය තුළ තමයි ඔබතුමාගේ අමාත්‍යාංශයේ ආයෝජනය කරන ප්‍රතිලාභය මේ බස්නාහිර පළාතේ මුදල් ප්‍රකාශය තුළ රුපියල් දස ලක්ෂ 40,000 ක වියදමින් ප්‍රතිඵල නෙලා ගන්න පුළුවන් වෙන්නේ. නිරෝගිමත් සමාජයක්, නිරෝගිමත් දරු පිරිසක්, ඒ වාගේම නිරෝගිමත් දරු උපතක් දෙන්න කාය ශක්තිය තිබෙනවා නම්, ඒ තුළ අපේ මේ අයවැයෙන් සම්මත කරන ප්‍රතිඵල අපට නෙලා ගන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මතක් කරමින් ගරු සභාපතිතුමනි, මේ විනාඩි කිහිපය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

[ පූ.භා. 09.48 ]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමාගේ වැය ශීර්ෂය සඳහා අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි කවුරුත් දන්නවා, රටක සෞඛ්‍ය යහපත් වුණොත් තමයි ඒ රටේ ජනතාවගේ සෞඛ්‍ය යහපත් වෙන්නේ. අද රටක් විධියට ගත්තාම අපේ රටේ පැවතුණු දරුණු ත්‍රස්තවාදය, රටේ තිබුණු පිළිකාව අවසන් වෙලා, රටේ ජීවනාලිය යහපත් කරගෙන, රටේ සෞඛ්‍ය තත්ත්වය හොඳ තැනකට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම මේ වනවිට බස්නාහිර පළාත් සභාව හරහා, ඒ වාගේම අපේ මධ්‍යම රජය හරහා මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න භාවය වර්ධනය කරන්න, ජනතාව වඩා සෞඛ්‍යමත් ජනතාවක් බවට පත් කරන්න, අවශ්‍ය වටපිටාව මේ වනවිට සකස් කරමින් පවතිනවා. පසුගිය වර්ෂ එක්ක ගත්තාම ලබන වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය, සමාජ සේවා අපේ අමාත්‍යාංශය යටතේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මේ රටේ ජනතාවගේ ජන ජීවිතය වඩා නිරෝගිමත් කරන්න වාගේම, වඩා අර්ථවත් සැපදායී තත්ත්වයට පත් කරන්න කටයුතු සංවිධානය වී තිබෙනවා. විශේෂයෙන්ම

අපේ පළාතට දස ලක්ෂ 6 කට ආසන්න ජනතාවකගේ ගැටළු විසඳන්න, විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් වෙන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය වර්ෂ එක්ක ගත්තාම අපට තිබෙන මුදල් ප්‍රමාණය අනුව 14.13% ක මුදල්

[ ගරු ජගත් කුමාර ]

වැඩිවීමක් මේ සෞඛ්‍ය කටයුතු සඳහා එළැඹෙන වර්ෂය සඳහා වෙන්න කරන්න කටයුතු කිරීම, මම හිතන්නේ රටේ ජනතාවගේ සෞඛ්‍ය ගැන වඩා වැඩි අවධානයක් යොමු කරලා ගත්තා වූ යහපත් තීරණයක් කියලයි.

විශේෂයෙන්ම අපට තිබෙන වෛද්‍ය ආයතන ටික ගත්තාම මේ රටේ තිබෙන අනෙකුත් සියලු පළාත් එක්ක ගත්තාම අපි තමයි ඉදිරියෙන්ම වගකීම් සහ යුතුකම් ඉෂ්ට සිද්ධ කරන පළාත් සභාව බවට පත් වෙන්නේ. ඒ අතරත් අපේ පළාත් සභාව තුළ මේ රටේ ජනතාවගෙන් මහ විශාල ප්‍රමාණයකගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න කටයුතු කරන අපි, පසුගිය කාල පරිච්ඡේදය තුළ විශේෂයෙන් ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් විවිධ අණපනත් සම්මත කර ගන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන් පසුගිය කාල පරිච්ඡේදය තුළ බෝ නොවන රෝග සම්බන්ධයෙන් තමයි රට පුරාම තිබුණු බරපතළ ප්‍රශ්නය. මේ බෝ නොවන රෝග හරහා තමයි විශාල වශයෙන් ජනතාව පීඩනයට සහ මරණයට පත් වීමේ කටයුතු දිගින් දිගටම සිද්ධ වෙලා තිබෙන්නේ. මධ්‍යම ආණ්ඩුවේ මෛත්‍රීපාල සිරිසේන ගරු ඇමැතිතුමා මේ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදලා කටයුතු කරනකොට මධ්‍යම ආණ්ඩුව විටෙක බස්නාහිර පළාත් සභාව සඳහාත් ආධාර උපකාර කරලා, ඒ වාගේම දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙනුත් ආධාර උපකාර කරගෙන පසුගිය වර්ෂය තුළ විශාල සංවර්ධනයක් මේ සෞඛ්‍ය අංශය තුළ සිද්ධ කළා. විශේෂයෙන්ම මම නියෝජනය කරන කඩුවෙල ආසනයේ රෝහල් සඳහා අපට බරපතළ ප්‍රශ්නයක් තිබුණා, හදිසි තත්ත්වයකදී රෝගියෙක් කොළඹ මහ රෝහලට ගෙනියන්න. ඒ නිසා තලංගම රෝහල සඳහා ගිලන් රථයක් ලබා දෙන්න. මේ වනවිට තලංගම රෝහල කියන්නේ, විශාල ජනතාවක් රෝගාබාධවලට ලක් වෙලා නිතර පැමිණෙන ස්ථානයක්. විශේෂයෙන් අපට තිබුණේ නැහැ, මේ රෝහල තුළින් ප්‍රතිකාර ගන්නා වූ ජනතාව සඳහා ලේ, මළ, මුත්‍රා පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයන් සඳහා හැකියාවක්. ඒ සඳහා අවශ්‍ය යම් උපකරණ ලබා දීලා තියෙනවා. මේ වනවිට ඒ සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ නිලධාරීන්ගේ අඩුව විතරයි තිබෙන්නේ. අපේ අමාත්‍යතුමා අපට පොරොන්දු වෙලා තිබෙනවා, ඉදිරියේදී මේ බඳවා ගැනීම් හරහා තලංගම රෝහල සඳහා ඒ පහසුකමත් අපට ලබා දෙනවා කියන කාරණාව. ඒ වාගේම ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා, අපේ ඉල්ලීම් සලකා බලලා කඩුවෙල ආසනයේ රෝහල් ගණනාවක් සඳහා පහසුකම් සලසා දීලා තියෙනවා. ඒ වාගේම බස්නාහිර පළාතේ විශේෂයෙන් අපි නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කය තුළ විවිධ අවස්ථාවල සෞඛ්‍ය ගැටළුවලදී අපට විශාල සහයෝගයක් ලබා දුන්නා කියන කාරණාව මේ වෙලාවේ මම කෘතවේදීව මතක් කරනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂය තුළ අපට තිබුණා ඩෙංගු උවදුර. ඒ වාගේම මේ වර්ෂය තුළත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඉදිරි වර්ෂය තුළත් එය ලොකු ප්‍රශ්නයක්. මේ ඩෙංගු උවදුර මඩින්නේ කොහොමද? කියලා. ඒ නිසා අපි පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට, අපි විසින්ම හදා ගත්තු ප්‍රඥප්තියක් තුළ මේ රෝගාබාධවලට ලක් වීම වළක්වා ගැනීම සඳහා අපි යම් ප්‍රඥප්තියක් සකස් කරලා, අද ඒක ක්‍රියාත්මක කරලා, ඒ තුළ උත්සාහයක් දරලා තිබෙනවා. විශේෂයෙන්ම මධ්‍යම ආණ්ඩුවට සමගාමීව මේ ඩෙංගු උවදුරින් මිදීම සඳහා අපේ පළාතේ අපේ වගකීම ඉෂ්ට සිද්ධ කරමින් අපි ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මොකද, එය ජාතික ව්‍යසනයක් බවට පත් වෙමින් තිබෙන අවස්ථාවක්.

ඒ වාගේම මේ කාල පරිච්ඡේදයේ රට තුළ නිරන්තර කථා බහට ලක් වෙමින් තිබෙනවා පළාත් සභා අවශ්‍යද? පළාත් සභා සුදු අලියෙක්ද? පළාත් සභාවෙන් මොනවාද කෙරෙන්නේ කියලා. පළාත් සභාවට ආපු නවක මන්ත්‍රීවරු විධියට අපි සතුටින් කියනවා. මේ කාල පරිච්ඡේදය තුළ අපි විවිධ ක්‍රම භාවිතා කරලා, බොහොම සාධාරණව, ප්‍රජාතන්ත්‍රවාදීව අපේ මැති ඇමැතිවරු, රජයේ මැති ඇමැතිවරු මුණ ගැහිලා විවිධ අයුරින් වෙහෙස මහන්සි වෙලා කෝටි 40 ක විතර ප්‍රතිපාදන මම තනි පුද්ගලයෙක් විධියට, මහජන නියෝජිතයෙක් විධියට පළාත් සභාව හරහා මේ දිස්ත්‍රික්කය තුළ යම් යම් කටයුතුවලට යොදවලා තිබෙනවා. ඒ අතරත් අපි විශේෂයෙන් සෞඛ්‍ය, සමාජ සේවා කටයුතු සඳහා මේ මුදල් යොදවලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා. මේ පළාත් සභාව ජනතාවට අවශ්‍ය ආයතනයක් බවට අද පත් වෙලා තිබෙනවා. මධ්‍යම ආණ්ඩුව යම් වගකීමක් ඉෂ්ට සිද්ධ කරනකොට, බලය විමධ්‍යගත කිරීමක් කරලා ඒ පළාතේ, ප්‍රදේශයේ ජනතාවට පාලනයට හවුල් වෙන්න ඉඩ අවස්ථාව දීලා, ඒ හරහා ඒ ප්‍රදේශයේ යම් යම් කටයුතු - අප සෞඛ්‍ය පිළිබඳව අධීක්ෂණය කරනවා. සමාජ සේවා කටයුතු අධීක්ෂණය කරනවා. මේ අංශයට අදාළ පරිවාස කටයුතු පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන නිසා සමහර වෙලාවට නිලධාරීන් අතින් වෙන්න තිබෙන වැරැදි, අඩුපාඩු - මධ්‍යම රජයෙන් අධීක්ෂණය නොවන දේවල්. පළාත් සභාවේ මහජන නියෝජිතයෝ විශාල ප්‍රමාණයක් සිටින නිසා, ජනතාවට සමීප ආයතන බවට, පුද්ගලයෝ බවට අපි පත් වෙලා තිබෙන නිසා මේ කටයුතු අපි කරනවා. ඒ නිසා මේ අයවැය විවාදයේදී අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ පළාත් සභාව සුදු අලියෙක් නොවී, ජනතාවට අවශ්‍ය පළාත් සභාවක් බවට පත් වෙලා, ජනතා සේවාවන් ඉෂ්ට සිද්ධ කරන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා කියලා.

ඒ වාගේම මෙම පළාත් සභාව හරහා කරගෙන යන කටයුතුවලදී යම් සුළු ගැටළුකාරී තත්ත්වයනුත් තිබෙනවා. මේවා ගැනත් අපට කියන්න සිද්ධ වෙනවා. විශේෂයෙන්ම අපේ සමාජ

සේවා අමාත්‍යාංශය, සමාජ සේවා අධ්‍යක්ෂතුමිය යටතේ විශාල වැඩ කොටසක් කරනවා. ජ්‍යෂ්ට පුරවැසි සමිති අධීක්ෂණය කිරීම්, ජ්‍යෂ්ට පුරවැසි සමිතිවලට පහසුකම් ලබා දීම්, ජ්‍යෂ්ට පුරවැසි සමිතිවලට අවශ්‍ය දේවල් ලබා දීම් කටයුතු කරනවා. නමුත් අපට එක ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමා මගින් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. ජ්‍යෂ්ට පුරවැසි සමිති අපෙන් යම් යම් අවස්ථාවල ඉල්ලීම් කරනවා. ඒ සමිති සඳහාම තහඩු, මඩු, පුටු සහ ඔවුන්ගේ මරණයකදී, අවශ්‍යතාවයකදී ගන්න පුළුවන් උපකරණ ගන්න කියලා. හැබැයි, අපේ ප්‍රතිපාදන හරහා මේ සමිති සමාගම් සඳහා, ජ්‍යෂ්ට පුරවැසි සංවිධාන සඳහා මුදල් වෙන් කරන්න විධියක් නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම විශේෂයෙන් කරනවා. ඒ වාගේම ජ්‍යෂ්ට පුරවැසි සමිති හැදීම නිසා අතිගරු ජනාධිපතිතුමාට පිංසිද්ධ වෙන්න අද මේ රටේ ජ්‍යෂ්ට, වැඩිහිටි අපේ ආදරණීය අම්මලා, තාත්තලා ඉතා සතුටින්, එකමුතුව, සමගියෙන් තමන්ගේ නිරෝගී භාවය රැක ගන්නවා වාගේම සමගියෙන් ප්‍රදේශයට, ගමට, රටට වැඩ කරන්න අවස්ථාවක් උදා කරගෙන තිබෙනවා. ඒ වාගේම අපේ සමාජ සේවා අමාත්‍යාංශය විශේෂයෙන්ම පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු නිලධාරීන් ඇගයීම් කරලා, ඔවුන්ට යම් වටිනාකමක් ඇති කරලා දිරිමත් කිරීම් සිදුකළා. ඒ ගැන අපි අගය කරනවා.

ඒ වාගේම අපේ ගරු ඇමතිතුමා පසුගිය දිනවල පරිපූරකය හරහා අපට යම් මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා. MOH Office වලට සම්බන්ධ වෙලා ඉන්න සෞඛ්‍ය නිලධාරීන් සියලු දෙනාට කාර්යාල උපකරණ තිබුණේ නැහැ. අපි කාර්යාල උපකරණ ඒ නිලධාරීන්ට ලබා දීම සඳහා අවශ්‍ය මැදිහත් වීම්, මහ පෙන් වීම් සිද්ධ කළා ගරු සභාපතිතුමනි. ඒ වාගේම අපි පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ වැඩිහිටියන්ට මහජන ආධාර ලබා දීම සම්බන්ධව සාකච්ඡා කළා. නමුත් අපට යම් ගැටළුවක් තිබෙනවා. මධ්‍යම රජයේ රුපියල් 1000 ක මහජන ආධාරය පළාත් සභාවේ ජනතාවට අපට ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. මට මතකයි ගිය අයවැයේදී කිව්වා. අපි රුපියල් 1000 ක් අපේ ප්‍රදේශයේ ඉන්න පළාත නියෝජන කරන අයටත් දෙනවා කියලා. ඒ පළාතට සම්බන්ධ අය පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගෙන් මම මේ වෙලාවේ විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මේ ක්ෂේත්‍රය තුළ අපේ දේශීය වෛද්‍ය අංශය හරහා විශාල පිරිසක් ප්‍රතිලාභ ගන්නවා. ඒ වාගේම ඒ හරහා විශාල සේවාවන් සිද්ධ වෙනවා. ඒ වාගේම අපේ කාන්තා කටයුතු අංශය හරහා කාන්තාවන් විශාල ප්‍රමාණයක් පුහුණු කිරීම් කරලා, ස්වයං රැකියාවලට යොමු කරලා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. ඇස් කණ්ණාඩි ලබා දීලා, දහස් ගණනකගේ දෑස් පාදන්න අවශ්‍ය කටයුතු අපි සිද්ධ කරලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, බස්නාහිර පළාත් සභාව තමයි රටේ අංක 01 පළාත් සභාව. ඒ පළාත් සභාව හරහා විය යුතු යුතුකම් ටික අපේ ගරු ජගත් අංගගේ පළාත් සෞඛ්‍ය අමාත්‍යතුමා, එතුමාගේ කාර්ය මණ්ඩලය, නිලධාරීන්, අධ්‍යක්ෂවරු මේ සියලු දෙනා සම්බන්ධ කරගෙන සුවිශාල වැඩ කොටසක් සිද්ධ කරමින් ඉන්න මොහොතක තමයි මේ අයවැය විවාදය යන්නේ. අපි විශ්වාස කරනවා, එළැඹෙන අයවැයවලදී මේ අමාත්‍යාංශය තියෙන්නේ එක පැත්තකින් ජ්‍යෂ්ට පුරවැසියෝ නඩත්තු කරන්න. අනෙක් පැත්තෙන් රෝගාබාධවලට ලක් වන රෝගීන් නඩත්තු කරන්න. ඒ වාගේම මහජන ආධාර දෙන්න කටයුතු කරන අමාත්‍යාංශයක්. ඒ නිසා ඊළඟ අයවැයවලදී අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේත් අවධානය යොමු කරනවා, ඔබතුමා මගින්. මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් මේ අමාත්‍යාංශයට වෙන් කිරීමේ සුදුසුකමක් තිබෙනවා. මොකද, අපට වැඩි ප්‍රමාණයක්ම තිබෙන්නේ, සමාජය විසින් රැක බලා ගත යුතු ජනතාවක් නඩත්තු කරන්න සහ බලාගන්න. ඒ නිසා රටක සෞඛ්‍ය හොඳ වෙනවා වාගේම ඒ හා සමානවම රටේ ජනතාවගේ සෞඛ්‍ය හොඳ කරන්න නම් අපේ අමාත්‍යාංශවලින් විය යුතු යුතුකම් ටික නිවැරදි ආකාරයෙන් සිද්ධ කරන්න ඕනෑ. පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ වගකීම් අපි ඉෂ්ට සිද්ධ කරපු නිසා තමයි අද වනවිට බස්නාහිර පළාත් සභාව පිළිබඳව බොහොම ප්‍රසාදයෙන්, බොහෝ ජනතාව කථා කරන්නේ.

විශේෂයෙන් පරිවාස දෙපාර්තමේන්තුව. අපට අදාළ නැති මධ්‍යම පළාතේ, වෙනත් පළාත්වල දරුවෝ, වැරැදිවලට යොමු වුණු දරුවෝ, වැරැදිවලට යොමු වෙලා උසාවියෙන් දඬ ගහලා පුනරුත්ථාපනය කරන්න කියන දරුවෝ අද බස්නාහිර පළාත් සභාවට භාර ගන්න වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි. අපි අනුන්ගේ වගකීනුත් ඉෂ්ට සිද්ධ කරන පළාත් සභාවක්. ඒ නිසා ඒ පිළිබඳවත් මධ්‍යම රජයේ අවධානය යොමු කරවන්න, ඔබතුමන්ලා හරහා මේ වෙලාවේ මතක් කරනවා. අපට අනුන්ගේ වගකීම් තිබෙනවා නම්, ඒ වෙනුවෙන් වැඩි ප්‍රතිපාදනයක් අපට ලබා දිය යුතුව තිබෙනවා. ඒ දරුවෝත් ජාතියේ දරුවෝ. මොන තරම් වැරදි, අඩුපාඩුවලට යොමු වෙලා තිබුණත්, ඒ දරුවන්ගේ ඉදිරි අනාගතය සැලසීමේ වගකීම තිබෙන නිසා අපේ පළාත් සභාව ඒ වගකීම පැහැර හැරලා නැහැ. ඒ වාගේම සංක්‍රමණික, විදේශගත වුණු ඇතැම් අය වැරැදිවලට යොමු වුණාම ඒ වැරැදිවලට යොමු වුණු අයවත් අද රැක බලාගෙන උසාවි කාල පරිච්ඡේදය තුළ ඔවුන්ව නඩත්තු කරන්න, නේවාසිකව හදන්න සිද්ධ වෙලා තියෙන්නෙත් බස්නාහිර පළාත් සභාවට. ඒ නිසා බස්නාහිර පළාත් සභාවේ මේ සෞඛ්‍ය, සමාජ සේවා අමාත්‍යාංශය කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව අවසන් කරන්න. කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාව ආරම්භ වුණේ විනාඩි 35 ක් ප්‍රමාද වෙලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම අවසන් කරනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා මහ විශාල අනුන්ගේ වැය බරක් භාර ගත්තු පළාත් සභාවක් විධියට, පළාත් ආයතනයක් විධියට බස්නාහිර පළාත් සභාවට මධ්‍යම රජයේ

[ ගරු ජගත් කුමාර ]

අනුග්‍රහය, අවධානය යොමු කරන්න කියන කාරණාව මතක් කරමින්, විශේෂයෙන් ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා අපේ ඉල්ලීම් සලකා බලා, අපේ ප්‍රදේශයන්වල අඩුපාඩු, සෞඛ්‍ය අංශවල අඩුපාඩු නිවැරදි කරන්න කටයුතු කළා. නිලධාරීන් සහ ඒ සියලු දෙනා බොහෝ වගකීමෙන් මේ කටයුතු ඉෂ්ට සිද්ධ කළා. ඒ සියලු දෙනාටත් අපේ ගෞරවය, ස්තුතිය පිරිනමමින් මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ස්තුති වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

[ පූ.භා. 10.00 ]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ජගත් අංගගේ ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව කථා කිරීමට අවස්ථාව සලසා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම හිතනවා මේ අයවැය වාර්තාව දිහා බැලුවාම සෞඛ්‍ය ගැන කථා කරද්දී මෙහි වැඩි අවධානයක් ලබා දීලා තිබෙන්නේ ගිලන් රථ සඳහායි. ගිය වර්ෂයේත් ගිලන් රථ අරන් දුන්නා. මේ වර්ෂයේත් ගිලන් රථ 10 ක් අරන් දෙනවා කියලා තියෙනවා. ඒක තමයි සෞඛ්‍යයේ වැඩියෙන්ම Highlight කරලා තිබෙන්නේ. ඉතින් මම හිතනවා, ගිලන් රථ අරන් දෙන්නේ රෝහලට වැඩ බැරි නිසයි. රෝහලෙන් වැඩේ කර ගන්න බැහැ. ඒක නිසා කොහේට හරි Transfer කරන්න. ඕක තමයි ගිලන් රථ අරන් දෙන එකේ හේතුව. එහෙම නම් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් දෙන්න නොවෙයි හදන්නේ. අපට බැහැ, වැඩ කරන්න. මහ රෝහලටවත් දෙමු කියන තේමාව තුළ තමයි අද සෞඛ්‍ය සම්බන්ධ අයවැය වාර්තාව පදනම් වෙලා තිබෙන්නේ. ඉතින් ඇයි ගිලන් රථ අපට ඕනෑ වෙන්නේ? විශේෂයෙන්ම මම හිතනවා. ඔබතුමාත්, මමත් නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය බැලුවොත්, ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල්වලට වැඩියෙන්ම ලෙඩ්ඩු ඇතුල් වෙන්නේ ත්‍රීවීල්වලින්. ඒ අයට එම රෝහලේ ප්‍රතිකාර කර ගන්න බැරි වුණාම පළමුවෙන්ම මූලික රෝහල්වලට ගිලන් රථ හරහා Transfer කරනවා. අපේ දිස්ත්‍රිකයේ නම් ගම්පහ, වතුපිටිවල, මීගමුව වාගේ මූලික රෝහල්වලට තමයි Transfer වෙන්නේ. ඊට පස්සේ එතැනත් කර ගන්න බැහැයි කියලා තේරුණාම අපි කොළඹට හෝ රාගමට Transfer කරනවා. එතකොට තමයි අපට ගිලන් රථ ඕනෑ වෙන්නේ. ඉතින් මම දකින්නේ, කලින් කිව්වා වාගේ මේ අයවැයේ සද්දේ විතරයි තියෙන්නේ. ගිලන් රථය අරන් දුන්නත් ඒකෙත් පී පෝ ගාන සද්දේ විතරයි. වැඩ නැහැ. මොකද ඩ්‍රයිවර්ලා නැහැ. කාඩර් එක නැහැ. එළවන්න කෙනෙක් නැහැ. සමහර විට ඩ්‍රයිවින් ලයිසන් තියෙන ලේබර් කෙනෙක් තමයි ගන්නේ. එහෙම තත්ත්වයක් තමයි තියෙන්නේ. ඉතින් සද්දේ විතරක් තියෙන අයවැයක්. ගුණාත්මක භාවයක් පෙන්වන අයවැයක් නොවෙයි. ඇත්තටම ඇයි අපට ලෙඩ්ඩු Transfer කරන්න වෙන්නේ? නැත්නම් ගිලන් රථ හරහා ලෙඩ්ඩු යවන්න වෙන්නේ? අපේ රෝහල්වල තියෙන වෛද්‍ය උපකරණ දිහා බැලුවොත් එහෙම යල් පැන ගිය උපකරණ තියෙන්නේ. ගිලන් රථ නොවෙයි අපට ඕනෑ. අපට ඕනෑ හොඳ උපකරණ. අලුත් අලුත් උපකරණ. නව සමාජයත් එක්ක, අලුත් වර්ෂයත් එක්ක, අලුත් අවුරුද්ද එක්ක ඉදිරියට යන උපකරණ තමයි අපේ රෝහල්වලට ගන්න ඕනෑ. ඒ වාගේම ඔබතුමාත් මමත් නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය බැලුවොත් 2000 අවුරුද්දේදී අලුත් Building එක හැදුවා. මම හිතන්නේ එදායින් පස්සේ අලුත් උපකරණ දීලා නැහැ. එදා දීපු උපකරණ ටික තමයි 2012 වනකොටත් තියෙන්නේ. එහෙම නම් ඊට වැඩිය ගුණාත්මක සේවයක් දෙන්න නම් ගිලන් රථ නොවෙයි, ගිලන් රථ තියෙන්නේ ගුණාත්මක සේවයක් දෙන්න බැහැයි කියන එකට. ඊට වඩා අදට ගැළපෙන උපකරණ රෝහල්වලට දෙන්න ඕනෑ. ඒකට අයවැයෙන් ලොකු අවධානයක් යොමු කරලා තිබෙනවා මම දැක්කේ නැහැ.

ඒ විතරක් නොවෙයි. වැඩිවන ජනග්‍රහනය අනුව - සමහර වෙලාවට මම දැකලා තියෙනවා, ලෙඩෙක්ව Transfer කර ගන්න විධියක් නැහැ. දැඩි සත්කාර ඒකකයේ ඇඳක් නැහැ. දැඩි සත්කාර ඒකකය ප්‍රමාණවත් නැහැ. එයාව දාන්න ඕනෑ දැඩි සත්කාර ඒකකයට. එක්කෝ, එක්කෙනෙක් මැරෙණකල් හරි බලාගෙන ඉන්න වෙලා. එහෙම තත්ත්වයක් තමයි තියෙන්නේ. දැන් වැඩිවන ජනගහනය මත, 2005 ඉඳලා අද වනකල් බැලුවොත්, 2007 ඉඳලා අද වනකල් බැලුවොත් දෙගුණයක් ලෙඩ්ඩු වැඩි වෙලා. එහෙම නම් ඒ වැඩි වන ජනගහනය මත අපට තිබෙන්න ඕනෑ දැඩි සත්කාර ඒකක. එය වැඩිදියුණු කරන්න පුළුවන් වෙන්න ඕනෑ. එය වැඩිදියුණු කරනවා කියන්නේ, ලොකු කරනවා විතරක් නොවෙයි. ගම්පහ බැලුවොත් තව ඇඳක් දාන්න පුළුවන්. නමුත් ඒකට අවශ්‍ය උපකරණ සියල්ලම සපයන්න ඕනෑ. ඉතින් ඒ ගැන වැඩි අවධානය මේ අයවැයේදී යොමු කරන්න කියලා විශේෂයෙන්ම අවධානයට යොමු කරනවා.

ඒ විතරක් නොවෙයි. වැඩිවන ජනගහනය අනුව සේවක අවශ්‍යතා තියෙනවාද? අපි ගිලන් රථ දුන්නාට ඩ්‍රයිවර්ලා ඉන්නවාද? 2007 න් පස්සේ ඒ කාඩර් එක වෙනස් කරලා නැහැ. රෝහල් සේවකයන්ගේ කාඩර් එක වෙනස් කරලා නැහැ. 2007 සේවක කාඩර් එක තමයි අද වනතුරුත් තියෙන්නේ. එහෙම නම් ඒ කාඩර් එක වෙනස් කිරීම, සේවකයින් වැඩි කිරීම ගැන අවධානය යොමු කරන්න වෙනවා. ඒ විතරක් නොවෙයි. මම හිතනවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළා . බොහොම සන්තෝෂ වුණා. මහ ආණ්ඩුවේ අයවැයෙන් පස්සේ අපට අයවැය

ඉදිරිපත් කරන්න වුණාම, ඒක අපේ වාසනාවක්. ඒක අපට ගළපන්න පුළුවන් කියලා. මේ අයවැය වාර්තාවේ මම හැමතැනම හොයලා බැලුවා. හැම අමාත්‍යාංශයකටම රේසින් කාර් එකක් අරන් දෙන්න හදලා නැද්ද කියලා. මොකද, අයවැය බැලුවාම රේසින් කාර් තමයි අපට ලාබෙට දෙන්න පුළුවන්. ගිලන් රථ නොවෙයි. මම හිතන්නේ, ඒක හොයලා බලලා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ජනාධිපතිතුමාට කියන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේ අයවැය දිහා බැලුවාම හැම අමාත්‍යාංශයකටම රේසින් කාර් එකක් අරගෙන දෙන්න කියලා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, බෙහෙත් නැහැ. ඇයි අපට ලෙඩෙක් Transfer කරන්න වෙන්නේ? අපට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය, ලෙඩ්ඩුන්ට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය නැහැ. අපි ලෙඩ්ඩු දැනුවත් කරනවා. TV එකෙන්, විවිධ මාධ්‍ය ඔස්සේ ලෙඩ්ඩු දැනුවත් කරනවා. උණක් තිබෙනවා නම් වහාම ළඟම ඉන්න වෛද්‍යවරයා හම්බ වෙන්න. නමුත් අවශ්‍ය බෙහෙත් හේත් ප්‍රමාණය තවම අපට හදා ගන්න බැරි වුණා. මේවා නැති නිසා තමයි ගිලන් රථ අවශ්‍යතාවය පැන නැඟලා තියෙන්නේ. ගිය අවුරුද්දේ ගිලන් රථ දුන්නා. මේ අවුරුද්දේ 10 ක්ම දෙනවා කියන්නේ, මෙන්න මේ ප්‍රශ්න ඇතුළේ තිබෙන නිසා. එහෙම නම් ගිලන් රථ දෙන එක නොවෙයි. අපට බැහැයි කියන එක නොවෙයි. මේකේ බලාපොරොත්තු වෙන්න ඕනෑ, ගුණාත්මක සේවයක් දෙන්න. ගිලන් රථ ඕනෑ නැහැ. අපි අපේ දේ කරනවා. එහෙම නම් මම අභියෝග කරනවා. අද වනකල් ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ පළාත් සභා රෝහලකට CT Scan යන්ත්‍රයක් තියෙනවාද? ගම්පහ දිස්ත්‍රික්කය තුළ CT Scan එකක් කරන්න ඕනෑ නම්, කොළඹට ගිලන් රථය යවන්න වෙනවා. එහෙම CT Scan යන්ත්‍රයක් නැහැ. ඉතින් එහෙම නම් තව කාලයක් යනකොට ගම්පහ - කොළඹ ප්‍රයිවට් බස් දුවනවා වාගේ, ගිලන් රථ දුවන්න පටන් ගනී එහාටයි මෙහාටයි ලෙඩ්ඩු උස්සාගෙන. ඇයි? බෙහෙත් නැහැ. උපකරණ නැහැ. ඒ නිසා ගිලන් රථ වැඩි කළාට කමක් නැහැ. නමුත් ඒක නොවෙයි උත්තරය. ගුණාත්මක සේවයක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, ඩෙංගු පිළිබඳව ප්‍රශ්න තියෙනවා. ඔක්කෝමලා මහන්සි වෙනවා. නමුත් තවම අපට බැරි වුණා, වාහනයට සවි කළ ඩෙංගු දූමාන යන්ත්‍ර ලබලා දෙන්න. එහෙම නැත්නම් ඩෙංගු ගැන කථා කරද්දී අපි දැක්කා හැම තිස්සේම Advice කරනවා, හතර පැත්තෙන් දූමාන මැෂින් සවි කරලා දූමානය කරන්න ඕනෑය කියලා. දූමානය කරන්න ඕනෑය කියලා. නමුත් මම දන්නේ නැහැ, කිසිම තැනක තියෙනවාද කියලා යන්ත්‍ර හතරක් එකපාර පාවිච්චි කරන්න පුළුවන් පහසුකමක්. ඒ නිසා මේවා ගැන අවධානය යොමු කරන්න ඕනෑ. ගිලන් රථ ගැන නොවෙයි.

ඒ වාගේම උදේ පාන්දර රෝහලකට ගිහිල්ලා බැලුවොත් ගරු සභාපතිතුමනි, රෑ 12.00 ට 01.00 ට ආපු ලෙඩ්ඩු ඉන්නවා. රෑ 12.00 ට 01.00 ට ඇවිල්ලා නිදා ගන්නවා. පෝලිම. ENT Clinic දිහා බැලුවොත්, Eye Clinic දිහා බැලුවොත් රෑ 12.00 ට 01.00 ට ලෙඩ්ඩු ඇවිල්ලා තියෙන්නේ. 01.00 ට විතර ගිහිල්ලත් බෙහෙත් ගන්න පෝලිමේ යන්න ඕනෑ. බෙහෙත් ගන්න පෝලිමේ ගියත් සමහර විට ඔක්කෝම බෙහෙත් ටික හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන හිතන්න වෙනවා. අඩු ගාණේ Appointment දෙන System එකක්වත් රෝහලකට යොමු කරන්න පුළුවන් නම් මෙපමණ ලෙඩ්ඩු රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. ලෙඩාට වෙන ලෙඩ හැදෙනවා පාන්දර 01.00 ඉඳලා පහුවදා 11.00 වනකල් ඉන්න ගියාම. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. අඩු ගාණේ මේ ලෙඩ්ඩු රස්තියාදු කරන්නේ නැතිව යන වැඩ පිළිවෙළක් තියෙනවාද? ලෙඩ්ඩුන්ට ඇවිල්ලා රස්තියාදු වෙන්නේ නැතුව ඒ අවශ්‍ය දේ කර ගන්න පුළුවන් විධියට Appointment දෙන System එකක් හදන්න බැරිද? මෙහෙම ගිහිල්ලා පෝලිමේ ගියත් සමහර -

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මොකක්ද රෝහල?

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඕනෑම රෝහලක. ENT Clinic තියෙන, Eye Clinic තියෙන රෝහල්වලට යන්න. ඒ ගැන අවධානය යොමු කරන්න ගරු ඇමැතිතුමනි. නැත්නම් ඒ කට්ටියත් Ambulance එකක දාලා අරින්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා නම් කරන රෝහල් ගරු ඇමැතිතුමාට ප්‍රකාශ කළොත් එතුමාට ඒ පිළිබඳව විසඳුමක් ලබා දෙන්න පුළුවන් වෙයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

රෝහල් මහ ගොඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා පැහැදිලිව කියන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**

Hon. Ajith Mannaperuma

රෝහල් නම් කරන්න ඕනෑ කියලා මම හිතන්නේ නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නම් කරලා කියන්න ගරු මන්ත්‍රීතුමා. ප්‍රශ්නයක් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු ඇමැතිතුමාව එපමණ පහත් තත්ත්වයට දාන්න එපා. එතුමා දන්නවා, ගම්පහ දිස්ත්‍රික්කයේ තියෙන රෝහල් මොනවාද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කරලා කියන්න. ඒක වැදගත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ පිළිබඳව පැහැදිලිව ගරු අමාත්‍යතුමාට කියන්න. ගම්පහද, මීගමුවද කියලා -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගම්පහ, මීගමුව, වතුපිටිවල. ගරු ඇමැතිතුමනි, ENT Clinic, Eye Clinic තියෙන හැම රෝහලක්ම චෙක් කරන්න. ඒ වාගේම කියනවා දේශපාලඥයන්ගේ කමිටු හැදුවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

විශේෂයෙන්ම දේශපාලඥයන්ගේ කමිටු හැදුවාම අපි කියනවා, පෝෂණ මල්ල දෙන එක හොඳයි. එහෙම නැත්නම් ගිලන් රථ දෙන එක හොඳයි. පත්තරේට ලියන ඒවාට පේන එක, දෙන එක තමයි හොඳ. නමුත් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. වෛද්‍යවරුන්ගේ කමිටුවක් හදලා විශේෂයෙන්ම 2025 ට අපේ රෝහල කොතැනද තියෙන්නේ කියන එක පදනම් කරගෙන, ඒ වාර්තා අරගෙන අයවැය වාර්තාව හරි ගස්සන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. තව රෝහල් දියුණු කරන්න තව විධියක් මට හිතුනා. අඩුපාඩු කියනවා වාගේම. අපේ රජයේ සේවකයෝ හැමෝටම අග්‍රහාර රක්ෂණය තියෙනවා. ඒකෙන් අපේ රජයේ රෝහලට වැඩක් ගන්න පුළුවන්ද? යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ඉල්ලනවා. අපේ රජයේ සේවකයෙක් එහෙම නැත්නම් ඉන්ෂුවරන්ස් තියෙන කෙනෙක් රෝහලකට ඇතුල් වුණාම ඒක අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන් විධිය මොකක්ද? අන්න ඒ ගැනත් අවධානය යොමු කරන්න කියනවා.

ඒ විතරක් නොවෙයි. මෝචරියක් ගැන කථා කළොත් නම් මරණයට ඉස්සෙල්ලා මෝචරිය මැරිලා. මොකද, විශේෂයෙන් ගම්පහ රෝහලට ගිහිල්ලා බලන්න ගරු ඇමැතිතුමනි. වහලය කඩාගෙන වැටෙන්න එනවා. ශීතකරණ වැඩ කරන්නේ නැහැ. මොකද, ශීතකරණවල ගොඩක් කල් Bodies තියාගන්න වෙනවා. මැරුණු අය හඳුනාගන්න කල්. නමුත් ශීතකරණ වැඩ කරන්නේ නැහැ. අවට දුගඳ හමනවා. ඒ විතරක් නොවෙයි. හවස පහෙන් පස්සේ නීතියක් තිබෙනවා, මරණ පරීක්ෂණ කරන්න බැහැයි කියලා. මුස්ලිම් ජාතිකයෙකුගේ මරණයක් වුණොත් පැය 24 ක් ඇතුළත භූමදානය කරන්න ඕනෑ. ඒ සඳහා අවස්ථාව හැදිලා නැහැ. මොකද, හවස පහෙන් පස්සේ පරීක්ෂණ කරන්න බැහැ. අද වාගේ නවීන ලෝකයක සවස පහෙන් පස්සේ පරීක්ෂණ කරන්න බැහැයි කියන්න බැහැ. එම නිසයි මම අවධානය යොමු කරන්නේ. රට මෙපමණ දියුණු වෙලා තියෙද්දී, නැත්නම් සමාජය නවීන විද්‍යාවට යද්දී හවස පහෙන් පස්සේ මරණ පරීක්ෂණ කරන්න බැහැයි කියන නීතිය එන්න බැහැ. ඒ සඳහා අවශ්‍ය සුදුසුකම්, පහසුකම් සලසා ඕනෑම වේලාවක මරණ පරීක්ෂණය කරලා ඒ මැරුණු රෝගියාව අරගෙන යන්න පුළුවන් තත්ත්වය නිර්මාණය කරන්න ඕනෑ. වෙලාවක් දෙන්නේ නැතුව.

ඒ වාගේම තවත් අදහසක් යොමු කරනවා. ආරක්ෂක සේවා ගුණාත්මක වෙන්න ඕනෑ ගරු සභාපතිතුමනි. රෝහලකට බොහෝ විට එන්නේ අසරණ තත්ත්වයට පත් වුණු මිනිස්සු. තමුන්ගේ ලෙඩා, තමුන්ගේ අම්මා, තමුන්ගේ තාත්තා අසනීප වෙලා අසරණ වුණු අය එන්නේ. තමන්ගේ දරුවා අසනීප වෙලා. එහෙම නම් ඒ අයට ගුණාත්මක සේවය දෙන ආරක්ෂක පද්ධතියක් පවා තියෙන්න ඕනෑ. බොහෝ විට බැලුවොත් අපි දකිනවා. සමහර වෙලාවට ආරක්ෂක නිලධාරීන් කථා කරන්න දන්නේ නැහැ. ආරක්ෂක නිලධාරීන්ට වාහන හසුරුවා ගන්න බැහැ. එම නිසා මීට වඩා ඒ ආරක්ෂක සේවාව ගැනත් අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. අවසාන වශයෙන් කියනවා. ගිලන් රථ විතරක් නොවෙයි අරන් දෙන්න වෙන්නේ, ලෙඩ්ඩුන්ගේ භාරකාරයින්ට ත්‍රීවීලුත් අරගෙන දෙන්න. මොකද බෙහෙත් නැහැ. රෑ දෙගොඩ හරියේ හතර වටේ දුවන්න වෙනවා බෙහෙත් හොයන්න. ඒක නිසා රෝහලට ගිලන් රථ අරගෙන දෙනකොට ලෙඩ්ඩුන්ගේ භාරකාරයන්ට බෙහෙත් හොයන්න ත්‍රීවීල් ටිකක්වත් අරගෙන දෙන්න කියන එක පිළිබඳව අවධානය යොමු කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 10.13 ]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ඉතාමත්ම වැදගත් විෂයයක් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේදී දැඩි මානසික ආතතියෙන් යුක්තව හුදෙක් ගිලන් රථ පමණක්ම උපයෝගී කර ගනිමින් මේ විවාදයේදී මේ සභාව නොමඟ යවමින්, විශේෂයෙන්ම පළාත තුළ ඉතාමත්ම වැදගත් කාර්ය භාරයක් ඉෂ්ට කරන අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අනවශ්‍ය විධියට විවේචනය කිරීම පිළිබඳව බස්නාහිර පළාතේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මට එයට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. අපි දන්නවා. අද අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව කල්පනා කරලා බලනකොට මධ්‍යම රජයෙන්, ඒ වාගේම පළාත් සභාවෙන් ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කරගෙන මම හිතන්නේ පළාත තුළ දෙන්න පුළුවන් උපරිම සේවාවක් අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දීලා තිබෙනවා කියන එක අපි ඉතාමත්ම ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. මොකද, මේ විෂයය පිළිබඳව කථා කරනකොට විපක්ෂයට, එහෙම නැත්නම් ජනතාවට නොයෙකුත් විධියට ඇඟිල්ල දික් කරන්න පුළුවන්. එලෙස ඇඟිල්ල දික් කරන්න පුළුවන් අමාත්‍යාංශයක් තමයි සෞඛ්‍ය කියන්නේ. නමුත් අද මේ රට මුහුණ පාලා තිබෙන විශේෂයෙන්ම ප්‍රධාන මාතෘකාවක් වෙලා තිබෙන ඩෙංගු උවදුර පිළිබඳව අපි කල්පනා කරලා බැලුවොත් එහෙම අද අපට සන්තෝෂ වෙන්න පුළුවන්, රජයක් හැටියට, පළාත් සභාවක් හැටියට අපි ඩෙංගු මර්දනයට මුහුණ දීලා තිබෙනවා. අපි ඒකෙන් ජයග්‍රහණය ලබා ගෙන තිබෙනවා. අද වනකොට අපේ පළාත්වල ඉන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු කියනවා අද ඩෙංගු ප්‍රශ්නයක් නැහැයි කියලා. මොකද, ඒක නිකම්ම නැති වුණු දෙයක් නොවෙයි. මේ වැරැදි කරන මිනිස්සු අල්ලලා දඬුවම් දීලා, උසාවි ගෙනිහිල්ලා, අද පාලනයකට යටත් කරලා තිබෙනවා. කළුතර යුසුෆ් වාගේ ඩෙංගුවෙක් ඉන්න පුළුවන්. ගම්පහ මාන්නප්පෙරුම වාගේ ඩෙංගුවෙක් ඉන්න පුළුවන්.

ඒක වෙනම කාරණයක් ගරු සභාපතිතුමනි. නමුත් අපි ඩෙංගු මදුරුවාගේ අභියෝගයට පළාතක් හැටියට මුහුණ දීලා තිබෙනවා. අපි ඒකේ ජයග්‍රහණ ලබා දීලා තිබෙනවා. අපේ අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා කිව්වා, ත්‍රීවිල් රථ ලබා දෙන්න කියලා. ඔව්. අපි සෑම සෞඛ්‍ය මධ්‍යස්ථානයකටම ඩෙංගු මර්දනය වෙනුවෙන් ත්‍රීවිල් රථයක් ලබා දීලා තිබෙනවා කියන එකත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා. අනෙක් එක මේක මේ මිනිස්සුන්ට අපි දේශපාලන වශයෙන් - දැන් කහ ඉරේ අනතුරක් වුණාම Driver අල්ලා ගන්නවා. ඩෙංගු මදුරුවා දෂ්ට කරලා මැරුණාම අපි PHI ව අල්ල ගන්නවා. නැත්නම් පළාත් පාලන ආයතනය අල්ල ගන්නවා. නැත්නම් සෞඛ්‍ය ඇමැතිතුමාව අල්ල ගන්නවා. අපි ඕනෑම වැරැද්දක් වුණාම, ඒ විෂයය භාර ප්‍රධානියාව තමයි අල්ල ගන්නේ. නමුත් කහ ඉරේ මනුස්සයෙක් මැරුණාම අපි කවුරුත් කථා කරන්නේ නැහැ ඒ මිනිහා කහ ඉරේ කොහොමද ආවේ කියලා. වාහන පදවන මිනිස්සු හැටියට අපිම දැකලා තිබෙනවා, මගීන් කොයිතරම් පාරේ වැරැදි විධියට යනවාද කියලා. මට තරම් ඩෙංගු ගැන මේ සභාවේ ඉන්න කාටවත් කථා කරන්න පුළුවන්කමක් නැහැ. මම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙලා ඉන්න කාලේ පළමුවැනි ඩෙංගු මදුරුවා හඳුනා ගත්තේ වත්තේගෙදර ප්‍රදේශයෙන්. පහුවදා අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගිහිල්ලා ඒ අවශ්‍ය කටයුතු කරලා මාස තුනකට පස්සේ ගිහිල්ලා පරීක්ෂා කරනකොට ආපහු ඒ විධියටම අයිස්ක්‍රීම් කාලා, Containers ඒ විධියටම ඒ වත්තේ දාලා තිබුණා. ඒ නිසා මේක දේශපාලන වශයෙන් රජයට, පළාත් සභාවට ඇඟිල්ල දික් කරලා අපේ රටේ තිබෙන වසංගත නැති කරන්න බැහැ. මොකද, ඩෙංගු අද විතරක් නොවෙයි. මීට අවුරුදු ගාණකට ඉස්සෙල්ලා තිබුණා. හැබැයි, ඒ කාලේ මිනිස්සුන්ට ඩෙංගුවලට මුහුණ දෙන්න පුළුවන් ප්‍රතිශක්තිකරණයක් තිබුණා. අද අපි කෘතිම ආහාරවලට වහල් වෙලා. අද අපේ ශරීරවල ප්‍රතිශක්තිකරණයක් නැහැ. ඒක නිසා තමයි ඩෙංගු අපේ ජීවිතය උදුර ගන්නේ. ඒකයි යථාර්ථය. එහෙම නැතුව මේ දේශපාලන වශයෙන් ගහනවා නම්, විපක්ෂයේ ඉන්න කෙනෙකුට ඕනෑ විධියට ගහන්න පුළුවන්. නමුත් යථාර්ථයට ගහන්න ඕනෑ. ඒකයි අපි කියන්නේ. අද අපේ ස්වාමීන් වහන්සේ මෙතැන නැහැ. අද ස්වාමීන් වහන්සේලාට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ආහාර වට්ටෝරුවක් ලබා දෙනවා. ඇයි? දායකයෝ ලබා දෙන ආහාර - මට මේ ළඟදී කිව්වා. එක දානයකට ගියාම සම්පූර්ණයෙන්ම ඒ ආහාර තෙල්වලින් තිබුණේ කියලා. අද මඟුල් ගෙදරකට ගිහිල්ලා කන්න කෑම නැහැ. ඔක්කෝම බැදලා තියෙන්නේ. Fry කරලා තියෙන්නේ. ගෙදරින් පිට ස්වාභාවික ලෙස ආහාර වට්ටෝරුවක් ගන්න පුළුවන්කමක් නැහැ. අද ගෙදරත් පුරුදු වෙලා තියෙන්නේ, රූපවාහිනියේ තිබෙන ආහාර රටාවලට. අපේ දරුවන් ගොදුරු වෙලා තියෙන්නේ ඒකට. නමුත් මේ සෞඛ්‍ය ගැන කථා කරනකොට අපේ උදේ කෑම වේලේ ඉඳලාම අපේ ජන ජීවිතය පිළිබඳව අපි සැබෑ ලෙස වෙනස් කරන්න ඕනෑ. නියම මඟකට යොමු කරන්න ඕනෑ. එහෙම නැතුව මේ තිබෙන ආහාර වට්ටෝරුවත් එක්ක කවදාවත් සෞඛ්‍ය අමාත්‍යාංශයට තිබෙන චෝදනාවලින් නිදහස් වෙන්න පුළුවන්කමක් නැහැ.

අද අපේ පළාත් ඇමැතිතුමා, ඒ වාගේම ලේකම්තුමා, ඒ වාගේම අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා, ඒ වාගේම පළාත් ආයුර්වේද කොමසාරිස්තුමා, ඒ වාගේම අපේ සමාජ සේවා අධ්‍යක්ෂතුමිය ඇතුළු ඒ කාර්ය මණ්ඩලය මේ පළාතේ වඩාත් පිරිපුන් සෞඛ්‍යයක් ආරක්ෂා කිරීමට, සමාජ පරිසරයක් නිර්මාණය කිරීමට කැප වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අද ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අද ගමක සේවය කරන්න විශාල නිලධාරී පිරිසක් ඉන්නවා. ඒ වාගේම ගරු සභාපතිතුමා මඟින් ගරු ඇමැතිතුමාට

කියන්න කැමැතියි. මම මේ ළඟදී දැක්කා, අපි අලුතින් බඳවා ගත්තු උපාධිධාරීන්ව ඩෙංගු මර්දන කටයුතුවලට යවනවා, අපේ ඇතැම් නිලධාරීන්. අපේ උපාධිධාරීන්ට සමාජය පිළිබඳව අවබෝධයක් නැහැ. ආත්මාර්ථකාමීව විභාග මානසිකත්වයෙන් ගිහිල්ලා උපාධිධාරීන්ට වුණු අයට සමාජය පිළිබඳව අවබෝධයක් නැහැ.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

අධ්‍යාපන උපාධිධාරීන් ආත්මාර්ථකාමී කියන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

නැහැ, කියන්න පුළුවන්. ඒක මගේ අදහස නේ? ආත්මාර්ථකාමී අධ්‍යාපන රටාව තුළ නිමාර්ණය වෙලා තිබෙන ආත්මාර්ථකාමී පුද්ගලයන් සමහර භාරධූර කාර්යයන් හි යෙදවීවාම අනවශ්‍ය ප්‍රශ්න ඇති වෙනවා. ඒක කියන්න අපහසුකමක් නැහැ. ඒ නිසා ඩෙංගු මර්දනය කිරීමේදී අපි විශාල ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ලැබී තිබෙන විනාඩි 07 ක කාලය තුළ මට අවශ්‍ය විධියට කථා කරන්න පුළුවන්කමක් නැහැ. කොහොම නමුත් විශේෂයෙන්ම අපේ පළාතේ සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීමට අපේ ගරු ඇමැතිතුමාත්, ඒ වාගේම ලේකම්තුමා, අධ්‍යක්ෂතුමා ඇතුළු - ආයුර්වේද කොමසාරිස්තුමා ගැනත් වචනයක් කියන්න ඕනැ. මොකද, එතුමා බොහොම ජනප්‍රියයි. නමුත් බස්නාහිර පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස් හැටියට නොවෙයි. එතුමා ජනප්‍රිය වෙලා ඉන්නේ, වයඹ පළාතේ ආයුර්වේද කොමසාරිස්තුමා හැටියට. මොකද, මම මේ විහිළුවක් කරනවා නොවෙයි. මෙතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමහර නිලධාරීන් ඉන්නවා - සමාජ සේවා අධ්‍යක්ෂතුමිය ගනිමු. එතුමිය බොහොම දක්ෂ නිලධාරිනියක්. නමුත් එතුමියට හුඟක් වෙලාවට ලැබෙන සහයෝගය මදී. ගරු සභාපතිතුමාගෙන්වත්, අපේ ගරු ඇමැතිතුමාගෙන්වත්, ලේකම්තුමාගෙන්වත් නොවෙයි. ඒ හා සමාන නිලධාරීන්ගෙන්. ඒ වාගේම තමයි අපේ ආයුරේවේද කොමසාරිස්තුමාටත්. අපේ අමල් මහත්මයාට ප්‍රශ්නයක් නැහැ. හොඳ දොස්තරලා ටිකක් ඉන්න නිසා. නමුත් අනෙක් නිලධාරීන්ට ලැබිය යුතු සහයෝගය ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ අයට ඇමැතිතුමාගෙන් වාගේම සහයෝගයක් පල්ලෙහා තලවලිනුත් ලැබෙනවා නම් මීට වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න පුළුවන් කියලා මම අදහස් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 07 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ පූ.භා. 10.22 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක කියන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මුලින්ම ගත්තොත් මෙහිදී විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයෙන් සිදු වන සේවාව සම්බන්ධයෙන් ගරු ඇමැතිතුමාට හරි එහෙම නැත්නම් සෞඛ්‍ය ලේකම්වරයාට හෝ නිලධාරී මණ්ඩලයට දොස් කියනවාට වඩා අද මේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙලා තිබෙන්නේ කුමක්ද කියන එක සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කැමැතියි. මොකද, මේ තිබෙන සීමිත ප්‍රතිපාදන යටතේ, තමන්ට ලැබිලා තිබෙන සීමිත බලතල යටතේ, සෞඛ්‍ය ලේකම්තුමාත්, ඒ වාගේම අපේ RE මහත්වරු, PD මහත්වරු සහ ආයුර්වේද කොමසාරිස් මේ සියලු දෙනා තමන්ට හැකි උපරිමයෙන් සේවය කරනවා කියලා ඒ සම්බන්ධයෙන් අගය කිරීමක් අපට තිබෙනවා. කොහොම වුණත් අපි විශ්වාස කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය වාගේ විෂයයක් බෙදලා පවත්වාගෙන යන්න බැහැ. රටක සංවර්ධනයේදී සෞඛ්‍ය අතිශය වැදගත්. එවැනි විෂයයක් මධ්‍යම ආණ්ඩුව යටතේ පවත්වාගෙන යනවා මිසක් පළාත්වලට බෙදලා, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍යයි, පළාත් සෞඛ්‍යයි කියලා බෙදලා කටයුතු කරන්න බැහැ.

අපි දන්නවා. ලෙඩ ගත්තාට පස්සේ, ලෙඩ බෙදන්න බැහැ. පළාත් ලෙඩ, මධ්‍යම ආණ්ඩුවේ ලෙඩ කියලා ලෙඩ බෙදන්න බැහැ. ඩෙංගු ගත්තොත් පළාත් ඩෙංගු, මධ්‍යම ආණ්ඩුවේ ඩෙංගු කියලා බෙදන්න බැහැ. රෝහලකට ගියාට පස්සේ වෛද්‍යවරු, පළාත් වෛද්‍යවරු, මධ්‍යම ආණ්ඩුවේ වෛද්‍යවරු කියලා එහෙම නැහැ. අපට බෙදලා තියෙන්නේ මොනවාද? අපට රෝහල් ප්‍රමාණයක් බෙදලා තිබෙනවා. පළාත් අමාත්‍යාංශයට, මධ්‍යම ආණ්ඩුවට රෝහල් ප්‍රමාණයක් බෙදලා තියෙනවා. ඒක තමයි තිබෙන බෙදීම. ඒ බෙදීම කියලා කියන්නේ ඉතාම අකාර්යක්ෂම බෙදීමක්. මේ පරිපාලන යාන්ත්‍රය දුර්වල කරන, ජනතාවට නිසි

සේවය නොලැබෙන ව්‍යුහයක් බවට පත් වෙලා තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි මේ සෞඛ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන යන්න - ඇමැතිතුමා කොපමණ උත්සාහ කළත් එතුමාට ලැබී තිබෙන ප්‍රතිපාදනය මොකක්ද? 2011 ජන සංගණනය අනුව 28.8% ක රටේ ජනගහනයක් ඉන්නේ බස්නාහිර පළාත් සභාව ඇතුළේ. එහෙම ජනගහනයක් ඉන්න බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෙන් වෙන්නේ රුපියල් මිලියන 6383 යි. නිකම් හිතුවොත් මේක පළාතේ වෙන් වන මුදලින් 15% ට 16% ට ආසන්න වුණාට රටේ සමස්ත වියදමින්, කල්පනා කරලා බලන්න. රටේ ජනගහනය 30% ක් ඉන්න පළාත් සභාවේ රටේ මුළුමහත් වියදමින් - නොවැම්බර් මාසේ 08 වැනිදා ජනාධිපතිතුමා ඉදිරිපත් කරනවා. ඒ වියදමින් බස්නාහිර පළාතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෙන් වෙන්නේ සියයට දශම තුනයි. දාහෙන් තුනයි වෙන් වෙන්නේ. එතකොට දාහෙන් තුනක් වෙන් කරගෙන රටේ ජනතාවගෙන් 30% කගේ සෞඛ්‍ය ආරක්‍ෂා කරන්නේ කොහොමද?

ආයුර්වේද ගැන හිතුවොත්, කථාවට නම් කියන්නේ දේශප්‍රේමී ජාතික චින්තනය රකින, මේ තරම් රට රකින ආණ්ඩුවක් නැහැයි කියලා. හැබැයි මේ රටේ දේශීය වෛද්‍ය ක්‍රමයට වෙන් කරලා තියෙන්නේ කීයද? දේශීය වෛද්‍ය ක්‍රමයට මුළු පළාත් සභාවෙන් වෙන් කරන්නේ රුපියල් මිලියන 290 යි. නිකම් හිතුවොත් එහෙම පළාතේ අයවැයෙනුත් සියයට දශම හතයි දෙකක්. ආයුර්වේදයට වෙන් කරන්නේ සියයට දශම හතයි. මේ පොතේ නම් සඳහන් කරලා තිබෙනවා, ආයුර්වේදය වෙනුවෙන් ජනතාව අවධානය යොමු කරලා තිබෙනවා. ලෙඩ වැඩි වනකොට ආයුර්වේදයෙන් ප්‍රතිකාර ගන්න ජනතාව යනවා කියලා. හැබැයි සියයට දශම හතක් වෙන් කරලා මොකක්ද රටේ ජනතාවට සෞඛ්‍ය වෙනුවෙන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ?

ඒ වාගේම තමයි දැන් අපේ පළාතේ 2011 අවුරුද්දේ OPD එකට ලක්‍ෂ 55 ක් ඇවිල්ලා තියෙනවා. ක්ලිනික්වලට ඇවිල්ලා තිබෙනවා ලක්‍ෂ 26 ක්. In-ward Patients ඉඳලා තිබෙනවා ලක්‍ෂ 7 1/2 ක්. දැන් මේ පළාත් සභාවට රෝහල් ප්‍රමාණයක් දීලා, ඒකට ප්‍රතිපාදන වෙන් කරන්නේත් නැතුව, සියයට දශම තුනක් පළාත් සභාවේ ප්‍රතිපාදන වෙන් කරලා මොකක්ද කරන්න පුළුවන්? ඒ නිසයි මම කිව්වේ පුද්ගලයින්ගේ අඩුපාඩුවලට වඩා මේ තිබෙන ව්‍යුහය තුළින් සෞඛ්‍ය බිඳ වැටිලා තිබෙනවා. අඩු තරමේ අර ඉස්සර කිව්වා වාගේ කාර්ය මණ්ඩලය බඳවා ගන්න බැහැ. ආයුර්වේද රෝහල්වල කාර්ය මණ්ඩලයේ බරපතළ අඩුපාඩුවක් තිබෙනවා. හොරණ ගත්තොත් එහෙම හොරණ OPD එකට අවුරුද්දකට ලක්‍ෂ 2 1/2 ක් එනවා. ලක්‍ෂ 2 1/2 ක් එනවා. ගිය වසරේ, 2011 අවුරුද්දේ නේවාසික රෝගීන් ලක්‍ෂයක් ප්‍රතිකාර ලබනවා. හැබැයි කණිෂ්ට කාර්ය මණ්ඩලයෙන් 50% ක් හිඟයි. කරගෙන යන්න බැහැ. මම දන්නවා. මීට අවුරුද්දකට විතර ඉස්සර වෙලා කණිෂ්ට කාර්ය මණ්ඩලය බඳවා ගන්න කියලා, මම හිතන්නේ එක ඡන්දයක් කාලයක. සම්මුඛ පරීක්‍ෂණ තිබුණා. ඕකට බස්නාහිර පළාතේ 40,000 ක් විතර ලියුම් දැම්මා. කළුතරත් ඒ දවස්වල සැහෙන ගණනක් පෝලිමේ හිටියා. බැඳෙන්න කියලා 40,000 ක් ආවා. එන්න කියලා 25,000 කට ලියුම් දැම්මා. 16,000 ක් විතර ආවා. මම දන්න තරමින් අවසානයේ සියයක් විතර බඳවා ගත්තා. ඒ සියයත් බඳවා ගත්තේ සම්මුඛ පරීක්‍ෂණවලින්, අරවයින්, මේවයින් නොවෙයි. ඇමැතිලා, මන්ත්‍රීලා දීපු නම්වලින් තමයි බඳවා ගත්තේ. මේ ළඟදී පළාත් සභා පරිශ්‍රය ආශ්‍රිත රෝහලකට ඔහොම දාලා තිබෙනවා සනීපාරක්‍ෂක කම්කරු සේවිකාවක්. වැඩ කරන්න ගත්තාට පස්සේ දොස්තර මහත්වරුන්ටයි, නිලධාරී මණ්ඩලයටයි වැඩ කරන්න අමාරුයි. හොයලා බැලුවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බාගෙට පිස්සු. මන්ද මානසිකයි. කවුද මෙයා එව්වේ කියලා හොයලා බැලුවා. බලනකොට එයාව පත් කිරීම් කරලා තියෙන්නේ, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ ලියුමකින්. ඉතින් එතැනින් එහා ඒ අය කථා කරන්න ගියේ නැහැ. මොකද, පත් කරපු කෙනා කවුරුත් දන්න නිසා. ඔහොම තමයි කරලා තියෙන්නේ. ඒ නිසා දැන් ගත්තොත් එහෙම මේක බෙදලා, පහළට ගිහිල්ලා -

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

රෝහල මොකක්ද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

තලංගම රෝහල. දැන් ඉන්නේ හෝමාගම.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

මොකක්ද මන්ද මානසික ලෙඩේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔබතුමාට තියෙන එකේ අනෙක් එක.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔහොම නිකම් -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔබතුමා ඉන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒ මේ සමාජයේ කොටසක්. ඒක පිළිගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔබතුමා ඉන්න. අපි ඒක කියන්නම්.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සමාජයේ කොටසක් කියලා පිළිගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක හරි. මන්ද මානසික මිනිස්සුන්ට -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේට තියෙන ලෙඩෙත් අපි දන්නවා නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පිළිගන්නවා -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේටත් තියෙනවා මන්ද මානසික ලෙඩක්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලෝකේ හොඳම සෞඛ්‍ය තත්ත්වයක් අද ලංකාවේ තියෙන්නේ .

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න කෑගහන්නේ නැතුව. ඔබතුමා -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා ලෝකේ සමීක්ෂණයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබ දෙපළම නිශ්ශබ්ද වෙලා, ඔබතුමා කථාව ආරම්භ කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කමක් නැහැ. ඒ කියන්නේ මෙහෙමයි. එවැනි රෝගයක් තිබෙන කෙනෙකුට සනීපාරක්ෂක කම්කරු තනතුරක් දෙන එක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මොකද, මන්ද මානසික ඇමැතිවරු පළාත් සභාවේ ඉන්නකොට අර වාගේ කෙනෙකුට දුන්නාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. කමක් නැහැ, ඔහොම යමු කෝ? එතකොට කාඩර් එක බඳවා ගන්න විධියක් නැහැ. දැන් ප්‍රශ්නයක් තියෙනවා. මොකක්ද? MLT ලාගේ ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් උපකරණ දීලා තියෙනවා. Urine, Blood චෙක් කර ගන්න. හැබැයි ඒකට ඕනෑ කරන නිලධාරියා නැහැ. ඒකට ඕනෑ කරන MLT නැහැ. ඒකට බඳවා ගන්න විධියක් නැහැ. දැන් මේ බලය බෙදුවා කියලා කිව්වාට, කොහේද බෙදලා තියෙන්නේ? මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමැතිවරයාගේ තිබෙන රෝහල්වලින් කොටසක් සෞඛ්‍ය ඇමැතිතුමාට නිකම් දුන්නාට වැඩක් නැහැ. බලය බෙදීමේ ප්‍රතිඵල එන්න නම් ගමේ ජනතාවට දැනෙන්න ඕනෑ ආණ්ඩුව ගමට ආවා කියලා. දැන් ඔබතුමා කල්පනා කරලා බලන්න. පාලින්දනුවර MOH එකෙයි, අරහෙත් කෙළින් කන්දෙයි, මොරපිටියෙයි Clinic දෙකක් හදන්න කියලා ගිය අවුරුද්දේ මැයි මාසේ ඉඳලා ලක්ෂ 78 ක් වෙන් කරලා තියෙනවා. අඩු ගාණේ තාම ඒ Clinic දෙකේ අලුත්වැඩියා කටයුතු ඉවර කරලා නැහැ. ඒ නිසා කඳු බැහැගෙන, කඳු නැගගෙන, දරුවා තුරුළු කරගෙන, ගර්භනී මාතාවෝ, වැඩිහිටියෝ එන්න ඕනෑ බදුරලියේ රෝහලට. දැන් මේක හදා ගන්න බැහැ. එතකොට කොහොමද ගමේ ජනතාවට දැනෙන්නේ බලය බෙදුවා කියලා. ඇමැතිතුමාට බදුරලිය රෝහල අයිති වුණා කියලා වැඩක් නැහැ. ගමේ මිනිහාට තේරෙන්න ඕනෑ, මෙන්න තමන්ගේ ගමට Clinic එක ආවා. දැන් තමයි බලය බෙදන්නේ කියලා. මේ බලය බෙදීම නොවෙයි. අපි කියන්නේ ඒකයි, පරිපාලන බලය විමධ්‍යගත කරන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පාලින්දනුවර උදාහරණයට ගන්නේ අගලවත්ත ආසනයේ එහෙම නැත්නම් කළුතර දිස්ත්‍රික්කයේ ඉතාම බරපතළ දුෂ්කර තත්ත්වයේ තිබෙන එකක්. කළුගල තාම Clinic එකක් නැහැ. Clinic එකක තියෙන්නේ ප්‍රජා ශාලාවේ. ඉඩමක් වෙන් කරලා තියෙනවා. Clinic එක හදා ගන්න බැහැ. එතකොට මොකක්ද ලැබෙන්න ඕනෑ. Clinic එක ඕනෑ කරන තැනටයි ලැබෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මේ තත්ත්වයෙන්වත් සෞඛ්‍ය පවත්වාගෙන යන්නේ අපේ MOH මහත්වරු. එතුමන්ලාට Travelling Claim එකක් දීලා තිබුණා රුපියල් 5000 යි. MOH ට රුපියල් 5000 යි. AMOH ට රුපියල් 5000 යි. පසුගිය කාලේ මොකද කළේ? MOH ගේ ගාණ කැපුවා රුපියල් 3000 ට. AMOH ට ගෙවන්නේ රුපියල් 2500 යි. කොහොමද වැඩ කරන්නේ? Clinic එක නැත්නම් MOH යන්න ඕනෑ වටේ. එතකොට එයාගේ Travelling Claim එක කපලා තියෙන්නේ. එයාගේ ඩීසල් ලීටරේ ගාණ කීයද? දැන් 150 යි. ඩීසල් ලීටර් 150 යි කියන්නේ මොකක්ද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි?

ඩීසල් ලීටර් 150 යි කියන්නේ දවස් 25 ක් වැඩ කළොත් දවසකට ලීටර් 6 යි. ලීටර් 6 න් කොහේද යන්න පුළුවන්? MOH Aria එකේ ජනතාව ළඟට යන්න තිබෙන MOH මහත්තයාට ලීටර් 150 යි. අල්ලපු ප්‍රාදේශීය සභාව වලල්ලාවිට. වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති මාසයකට රුපියල් 80,000 ක 70,000 ක ඩීසල්. ඔන්න වැඩේ. ඒ නිසා බලය දෙන්න ඕනෑ තැනට නොවෙයි දීලා තියෙන්නේ. දෙන්න ඕනෑ තැනට නොවෙයි, ප්‍රතිපාදනය දීලා තියෙන්නේ. කථා කළාට පස්සේ ගොඩක් වාහන ගත්තොත් එහෙම යන්න බැහැ. පානදුර MOH මහත්මයා පාවිච්චි කරන වාහනේ අවුරුදු 13 ක් පරණ කැබ් එකක්. යන්න පුළුවන්ද? බැහැ. ඒ නිසා ප්‍රතිපාදනය දෙන්න ඕනෑ එතැනට. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වාහන ගත්තත් විරුද්ධ වෙනවා. වාහන නැති වුණාමත් කරදරයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

නිකරුණේ කෑගහන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ පුදුම කථා කියන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

රජයේ නිලධාරීන්ට වාහන - නිකන් කෑගහන්න එපා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

වාහන ප්‍රාදේශීය සභාවට හෝ සෞඛ්‍ය -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

තමුන්නාන්සේලාට වාහන ගන්න නොවෙයි අපි විරුද්ධ වෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගන්න ගියත් විරුද්ධයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ සුදු අලියෙක් වාගේ ඇමැති මණ්ඩලය නඩත්තු කරනවාද? ඔක මේ පළාත් සභාවේ විතරක් නොවෙයි. ඕනෑම තැනක රජයේ නිලධාරීන් වැඩ කරන්න වාහන දෙන්න ඕනෑ. පහසුකම් දෙන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අද කථා කරන එක නොවෙයි හෙට කථා කරන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පොඩ්ඩක් ඉන්නකෝ කෑගහන්නේ නැතුව.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලෝකයේ සෞඛ්‍ය තත්ත්වයෙන් ඉතාම හොඳයි ශ්‍රී ලංකාව. ඒක පිළිගන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

දැන් මම කථා කරන්නද? ඔබතුමා කථා කරනවාද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ බොරු කියනවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අඩු තරමේ අයවැය පටන් ගත්තු දවසේ ඉඳලා අයවැය අවසන් වනකල් මේ වාගේ තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉස්සෙල්ලා කිව්වා රටේ ජනගහයෙන් 30% ක් - හැබැයි මෙපමණ දේවල් කරලා, දැන් රටේ හොඳම සෞඛ්‍ය කියනවා නේ? හොඳයි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ලෝකේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ලෝකයේ හොඳම සෞඛ්‍යය. දැන් අපට තිබෙන බරපතළ අභියෝගය -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තමුන්නාන්සේ අභියෝගයක් කරනවා නම් මම එනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඉන්න කෝ? කැගහන්නේ නැතුව පොඩ්ඩක්. කැගහන්නේ නැතුව මේක අහගෙන ඉන්න කෝ? මේ ඇමැතිතුමා වාගේ අහගෙන ඉන්න කෝ? ඒ සංයමය තියාගන්න කෝ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපට මේ බස්නාහිර පළාතේ තිබෙන ලොකුව අභියෝගය තමයි ඩෙංගු. මේ ඩෙංගු වෙනුවෙන් ලොකු දේවල් ආණ්ඩුව කළා. ඇත්ත. හැබැයි, අපට තවමත් ඒ අභියෝගය ජයග්‍රහණය කරන්න බැරි වෙලා තිබෙනවා. අඩු තරමේ ජයග්‍රහණයේ දිශාවට යන්න බැරි වෙලා තිබෙනවා. 2010 මුළු රටේම ඩෙංගු රෝගීන් 34,000 ක් හිටියා. බස්නාහිර පළාතෙන් 11,700 ක් වාර්තා වුණා. මම මේ ආසන්න අගයට කියන්නේ. ඒ කියන්නේ, 2010 දී රටේ මුළු ඩෙංගු රෝගීන් ප්‍රමාණයෙන් 35% ක් බස්නාහිර පළාතෙන් වාර්තා වුණේ. 2011 රටේ මුළු ඩෙංගු රෝගීන් ප්‍රමාණය 28,400 යි. බස්නාහිර

[ ගරු නලින්ද ජයතිස්ස ]

පළාතේ 15,900 යි. රටේ ඩෙංගු රෝගීන් ගණන අඩු වනකොට බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් ගණන වැඩි වෙලා තිබෙන්නේ. රටේ මුළු ඩෙංගු රෝගීන් ප්‍රමාණයෙන් 55.8% ක් බස්නාහිර පළාතෙන් වාර්තා වෙන්නේ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙන් පසුගිය මාසේ 11 විතරක් ඩෙංගු රෝගීන් 18,655 ක් දැන් වාර්තා වෙලා තිබෙනවා. ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, අවුරුදු තුනක් යනකොට 11,000 ඉඳලා 18,000 දක්වා අපේ පළාතේ ඩෙංගු රෝගීන් ගණන වැඩි වෙලා තියෙනවා. කියන්න කනගාටුයි. හොයලා බලන්න. මේ පොතේ සඳහන් වන වාර්තාවේ ඩෙංගු රෝගීන් ගැන සඳහන් වන දත්ත නැවත පරීක්ෂා කරන්න කියලා මම කියනවා. මොකද, සාමාන්‍යයෙන් අපි විශ්වාස කරනවා. අපේ රටේ සියලු දත්ත එකතු වන තැන තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ Epidemology Unit එක. Epidemology Unit එක බොරු කියනවා කියලා අපි හිතන්නේ නැහැ. මෙතැන දාලා තිබෙන්නේ අඩු සංඛ්‍යාවක්. මේකේ සඳහන් කරලා තිබෙන්නේ, 2011 සඳහා 12,000 කට ආසන්න ප්‍රමාණයක් කියලා. ඒක වැරැදියි. අඩු තරමේ ඩෙංගු මර්දනය කරන්න හිතනවා නම්, මේක එක ඒකකයකට, ඒ කියන්නේ අපේ ඩෙංගු රෝගීන් වෙන් කරන්න බැහැ. ජාතික රෝහලේ ඩෙංගු රෝගීන් මෙපමණයි. පළාත් රෝහලේ ඩෙංගු රෝගීන් මෙපමණයි කියලා. එක ඒකකයක් තිබෙන්න ඕනෑ. එක වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් නැතිකම නිසා තමයි අද වනකොට 30% ක් ජනගහනය ඉන්න බස්නාහිර පළාතට මේ ඉරණම අත් වෙලා තියෙන්නේ. ඒ නිසා මේක ජයග්‍රහණය කරන්න නම් අපි කොපමණ කැප වුණත්, කොපමණ දුම් ගැහුවත්, මහ ආණ්ඩුවේ ඇමැතිතුමා දුම් ගැහුවත්, ජනාධිපති ආර්යාව ගිහිල්ලා දුම් ගැහුවත්, කවුරු ගැහුවත්, BTI ගැහුවත් වැඩක් නැහැ. එහෙම නොවෙයි. මධ්‍යම ආණ්ඩුවේ සිට පහළ දක්වා එක අඛණ්ඩ වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. ඒකට මේ බලය බෙදලා හරි යන්නේ නැහැ. සෞඛ්‍ය වාගේ විෂයයක් එක තැනකින් දුවවන්න ඕනෑ. ඇමැතිතුමා අසරණ වෙලා තියෙන්නේ ඒකයි. සල්ලි දෙන්නේ නැහැ. කාඩර් එක බඳවා ගන්න දෙන්නේ නැහැ. 2007 ඉඳලා අලුත් කරලා නැහැ. ඉතින් කොහොමද රෝහලකට දාන්නේ?

දැන් බැලුවොත් එහෙම ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා. අපි සියල්ල මුල් වෙලා පිඹුර මූලික රෝහලක් කළා. ඒකට අවශ්‍ය කරන අත්‍යවශ්‍යම දේ තමයි Blood Bank එකයි Surgically Complex එකයි. මිලියන 300 යි යන්නේ. දැන් අවුරුදු තුනක් තිස්සේ ඕවා කථා කරනවා. පසුගිය දවසක ජනාධිපතිතුමා කළුතරට ආවා. ඒකෙත් කිව්වා. කිව්වා නේ? කිව්වාට පස්සේ කිව්වා, බලන්නම්. හැබැයි, සල්ලි නැහැයි කියලා. දැන් ඒ දෙක අත්‍යවශ්‍යයි. හැබැයි මූලික රෝහලේ බෝඩ් එක ගැහුවා. වෛද්‍ය අධිකාරීතුමා ඇතුළු සියලු දෙනා මහන්සි වෙලා වැඩ කරනවා. අපේ ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමාත් සහයෝගය දුන්නා. අපි ඔක්කෝම එකතු වෙලා කරන්න පුළුවන් දේවල් කරනවා. හැබැයි, මේක එතැනින් එහාට තව යන්න ඕනෑ. ඒක මහ ආණ්ඩුවෙන් බලා ගන්න ඕනෑ වැඩක්. ඔබතුමාට මතකයි. මේ අයවැයේදී මේක සඳහන් කරන්න ඕනෑ. අපි ගිහිල්ලා එය මූලික රෝහලක් බවට පත් කරලා සියල්ල විවෘත කරලා පොරොන්දු වෙලා ආවා. අපි පොරොන්දු වුණු දේවල් ඉෂ්ට කළා. මහ මාර්ග අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමැතිතුමා ආවා. එතුමාගෙන් රෝහල් අධිකාරී ඉල්ලුවේ මොකක්ද? අර අභ්‍යන්තර පාරවල් ටිකට තාර දාලා දෙන්න කියලා. දැන් අවුරුදු 1 1/2 ක් වෙනවා. එක තාර කට්ටයක් දාලා නැහැ. ඔන්න වැඩ. ඒ නිසා දැන් කරන්න ඕනෑ වෙන මුකුත් නොවෙයි. උදාහරණ ටික ගත්තේ අන් කිසිවකට නොවෙයි. මේ සෞඛ්‍ය වාගේ විෂයයක් බෙදලා, කෑලි කඩලා රටේ සෞඛ්‍ය හදන්න බැහැ. මේක අපි සියලු දෙනා එකතු වෙලා කරන්න ඕනෑ. එක විෂයය පථයක් ඇතුළට ගන්න ඕනෑ. ඒ නිසා මේ පළාත් සභා ක්‍රමයේ තිබෙන අවුල තමයි මේ තියෙන්නේ. මේකට මැදිහත් වෙනවාට ස්තුතිවන්ත වෙමින් මේ අඩුපාඩු පෙන්වා දෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 10.35 ]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warnakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු වැය ශීර්ෂය යටතේ කථා කිරීමට ලැබීම ගැන බොහොම සන්තෝෂ වෙනවා. ඇත්තටම අද පළාත් සභාවේ විෂයයන් අතර අධ්‍යාපනය මුල් තැනට එනවා වාගේම අපි දන්නවා, මේ පළාත් සභාවේ දෙවනුවට තිබෙන ප්‍රධාන විෂයය සෞඛ්‍ය විෂයය බව. ඇත්තටම සෞඛ්‍ය කියන්නේ, අධ්‍යාපනය වාගේම නිරෝගී මනුස්සයෙක් බිහි කරන්න ඉවහල් වන විෂයයක්. අපි කථාවට කියන්නේ, කොපමණ උගතෙක් වුණත් වැඩක් නැහැ, ලෙඩෙක් නම් කියලා. ඇත්තටම ගරු අමාත්‍යතුමා එතුමාගේ උපරිම ශක්තිය, එතුමාගේ නව අදහස් තුළ ඒ කාර්ය ඉතාමත් සාර්ථකව ගෙනියනවා කියන එකත් මම දකිනවා. මොකද, ලොකු අභියෝගයකට තමයි අපේ ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ සියලුම

නිලධාරීන් ඇත්තටම පත් වෙලා තිබෙන්නේ. දැන් මෙතැන කථා කරපු අපේ සහෝදර මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම කිව්වා වාගේ ලංකාවේ ඉන්න ජනගහනයෙන් 1/3 ක්, 28% කට අධික ප්‍රමාණයක් ඉන්නේ බස්නාහිර පළාත තුළ. ගොඩක් අඩු බිම් ප්‍රමාණයක් අපට තිබෙන්නේ. ඒ බිම් ප්‍රමාණය තුළ අති විශාල ජනතාවක් ඇත්තටම ජීවත් වෙනවා. එතකොට ඒ අයගේ අවශ්‍යතාවන් ඇති වෙනවා. ඒ ඇති වනකොට ඒ කාර්යයට මුහුණ දෙන්න සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇත්තේ ලොකු අභියෝගයක් කියන එකයි මම මතක් කළේ. නමුත් ඒ අභියෝගයට අපේ ගරු ඇමැතිතුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන් පුළුවන් ආකාරයට පෙනී සිටිනවා කියන එක ඇත්තටම මතක් කරන්න ඕනෑ. මේ අවුරුදු තුන තුනහමාර තුළ පළාත් සභාවේ මේ සෞඛ්‍ය සේවය යම්කිසි විශේෂ ස්ථානයකට ඇවිල්ලා තිබෙනවා. අද ගම්බිම්වල තිබෙන සායන ටික - අඩුපාඩු තියෙන්න පුළුවන්. අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ තව තිබෙන්න පුළුවන්. නමුත් කෙරුණු කොටස් පිළිබවඳවත් අපි ඇත්තටම කථා කරන්න ඕනෑ. විශාල වශයෙන්ම අපේ සෞඛ්‍ය සායන ටික, එක අවස්ථාවක ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මැදිහත් වෙලා අපට විශාල සායන කොටසක් හදලා දුන්නා. ඒ වාගේම අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඒ අවශ්‍ය තැනට උපරිම දේ ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. බුලත්සිංහල ආසනය ගැන විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. දුෂ්කර ආසනයක් හැටියට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, ඒ වාගේම සායන අතිවිශාල ප්‍රමාණයක් අද ගොඩනහලා තිබෙනවා. ඒ පිළිබඳව මේ පළාත් සභාව තුළ සන්තෝෂ වෙන්න ඕනෑ. ඒ වාගේම එතැනින් එහාට තව ගොඩනහන්න තිබෙන එක ඇත්ත. අපි ඒක පිළිගත යුතුයි. නමුත් අර සියලුම මන්ත්‍රීවරු මතක් කළා වාගේ පළාත් සභාව හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් වන මුදල ඇත්තටම මදී කියන එක මමත් මතක් කරන්න ඕනෑ. මීට වඩා වැඩි මුදලක් යොදනවා නම්, අපේ ගරු ඇමැතිතුමා, කාර්ය මණ්ඩලය, නිලධාරීන්, මහජන නියෝජිතයන් වශයෙන් අපි ගන්න උත්සාහය තවත් එහාට සාර්ථක කරගන්න පුළුවන් කියන එක මතක් කරන්න ඕනෑ. ඒ කෙසේ වෙතත් මේ හැම දෙයක්ම රජයට එහෙම නැත්නම් පළාත් සභාවට, වෛද්‍යවරුන්ට භාර දෙන එක නොවෙයි සාමාන්‍යයෙන් අපි දකින ක්‍රමය. ලෙඩ කියන එක හැදුනාම ලෙඩේට බෙහෙත් කරන එක තමයි මේ කාර්යයේ තියෙන්නේ. නමුත් ලෙඩ නොසැදෙන විධියට වැඩ පිළිවෙළක් ගෙන යන එක මීට එහා ගිය කාර්යයක් කියලයි මම දකින්නේ.

මොකද, අද අපි උවමනාවෙන් ලෙඩ ගන්න ජාතියක් බවට පත් වෙලා තියෙන්නේ. අහක යන ලෙඩ ඇඟට දාගන්නේ කියන එක තමයි මම දකින්නේ. ඉතින් ඒ ලෙඩ ආවාම ලෙඩට බෙහෙත් කරන එක රජයේ වැඩ පිළිවෙළක්. ඒ නිසා එදා කාපු ආහාර වේලක් අද කන්නේ නැහැ. එදා කාපු කොළ මැල්ලුමක් අද ළමයෙකුට දකින්නවත් නැහැ. ඉතිහාසයේ ඒවා තුළින් අපේ ශරීර සෞඛ්‍ය බෙහෙත්වලට එහා ගිය සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ගොඩනැගී තිබුණා. අද අවුරුදු හැට හැත්තෑවක ඉන්න වයසක කෙනෙක් බැලුවොත්, අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් බැලුවොත්, ඇත්තටම ඒ අයගේ ශරීරය ඉතාමත්ම සෞඛ්‍ය සම්පන්න ලෙස තමයි ගොඩනැගිලා තිබෙන්නේ. නමුත් අවුරුදු 20, 25, 30 ක ඉඳලා රටේම තියෙන ලෙඩ ටික අපේ ශරීරගත වෙනවා. ඇත්තටම ඒ අපිම විහින් දාගත්තු ලෙඩ කියන එකයි මම මතක් කළේ. ඒ නිසා ජනතාව මීට වඩා ඒ ගැන උනන්දු විය යුතුයි.

ඒ වාගේම තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියටත් අපි ලෙඩවලට බෙහෙත් කරනවා වාගේම ලෙඩ හැදෙන්න හේතු වන ඉඩත් අපි වහන්න ඕනෑය කියන එකත් මතක් කරන්න ඕනෑ. වැඩ සටහන්වලින් හෝ යම්කිසි ක්‍රමයකින්. මොකද, මම හිතන්නේ ලෝකයේ වැඩියෙන්ම, නිකම්ම බෙහෙත් දෙන රට ලංකාව තමයි. කොපමණ දියුණු රටවල් තිබුණත්, ඒ අය තමන්ගේ සෞඛ්‍යය වෙනුවෙන් අනිවාර්යෙන්ම වියදම් කරලා තමයි ඒ බෙහෙත් ටික ගන්න ඕනෑ. නමුත් ලංකාව වාගේ අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි මේ තරම් සල්ලි දෙන රටක් ලෝකේ කොහේවත් නැහැයි කියන එක මතක් කරන්න ඕනෑ. ඒ වගේම අපේ සහෝදර මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මැතිතුමා මතක් කළා ගිලන් රථ ගැන. ඇත්තටම ගිලන් රථ තියෙන්න ඕනෑ. එතුමා කියනවා. ගිලන් රථ තියෙන්නේ, එක තැනකින් තවත් තැනකට ලෙඩා ගෙනියන්න කියලා. ඒකත් ඉස්පිරිතාලයක් තමයි. එහෙම නම් ඒකෙත් බෙහෙත් නැති වෙන්න එපැයි. ඒක නොවෙයි. ඇත්තටම ප්‍රායෝගික වෙන්න ඕනෑ. ඒ අවශ්‍යතාවයට අවශ්‍ය ඒ දේ ලබා දිය යුතුයි. නිලධාරීන්ට වේවා, ඒ ඕනෑම කෙනෙකුට ඒ අවශ්‍යතාවය වෙනුවෙන් ඒ අවශ්‍ය දේ ලබා දිය යුතුයි. ඇත්තටම බෙහෙත් ගැන කථා කරනකොට මමත් ආණ්ඩු පක්ෂයේ වුණත් මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙනුත්, අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමාගෙනුත් ඉල්ලා සිටින්නේ, අපි මීට වඩා එහා ගිය වැඩ පිළිවෙළක් ගෙනියන්න ඕනෑ. අපට හැමදාම මධ්‍යම රජයෙන් බෙහෙත් ටික හම්බ වෙනකල් බලා ඉන්න වෙලා තියෙන්නේ. එහෙම නම් අපි පළාත් සභාවක් හැටියට අපට බෙහෙත් ටිකක් මිලදී ගන්න වැඩ පිළිවෙළක් ගොඩ නහා ගත යුතුයි කියන එක මම විශ්වාස කරනවා. මොකද, හැමදාම නැතත් අපට අවශ්‍ය වෙලාවට, නැති වෙලාවට ගන්න හරි, හදිසි අවස්ථාවකදී ගන්න හරි එහෙම වැඩ පිළිවෙළක් ගොඩ නැගිය යුතුයි. එහෙම නැති වුණොත් ඇත්තටම කවුරු හරි දෙනකල් බලා ඉන්නවා වාගේ මධ්‍යම රජයෙන් බෙහෙත් එනකල් බලා ඉන්න වෙනවා. ඇත්තටම වර්තමානයේ මේ මෑතක එවැනි ආකාරයට අඩුපාඩු වුණේ නැහැ. නමුත් ඉතිහාසයේ එහෙම අඩුපාඩු වුණු අවස්ථා බොහොමයක් තිබෙනවා කියන එක මේ වෙලාවේ ඇත්තටම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා මතක් කළා, පෝලිම්වල රෑ 01.00 ඉඳලා කට්ටිය ඉන්නවා කියලා. නමුත් අපි දකිනවා. ඉස්සර ආකාරයට නොවෙයි. සෞඛ්‍ය පද්ධතිය ඊට

වැඩිය ගොඩක් වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා පෝලිම්වලට රෑ 01.00 ට එන්නත් පුළුවන්. මොකද, කාට හරි උදේ පාන්දර යන්න උවමනාවක් තිබෙනවා නම් 01.00 ට නොවෙයි, ඉස්සෙල්ලා දවසේ රෑ 08.00 ට ඇවිල්ලාත් ඉන්න පුළුවන්. ඒක නවත්වන්න බැහැ. රෑ 01.00 ට එන කෙනාත් බෙහෙත් අරගෙන යනවා, උදේ 06.00 ට එන කෙනාත් බෙහෙත් අරගෙන යනවා කියන එක අපි කවුරුත් දන්නවා. ඒ නිසා තමගේ අවශ්‍යතාවය අනුව තමන්ගේ යම්කිසි වැඩ පිළිවෙළක් තුළ සමහර වෙලාවට එන්න බස් එකක් නැති වෙන්න පුළුවන්. ඒ ආකාරයට කවුරු හරි උදේ පාන්දර ආපහු යන්න අවශ්‍ය නිසා එහෙම වෙන්න පුළුවන්. නමුත් එහෙම වැරැද්දක් අපේ පළාතේ රෝහලක තිබෙනවා නම් අපේ සෞඛ්‍ය ඇමැතිතුමා, පළාත් අධ්‍යක්ෂතුමා ඒ වෙනුවෙන් කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. මොකද, එහෙම විය යුතුයි. අපි දැක්කා ඊයේ පෙරේදා ඉතාමත් සාර්ථක දිසා රෝහලක් බවට අපේ දොම්පේ රෝහල පත් වෙලා තිබෙනවා. අපි

[ ගරු ලලිත් වර්ණකුමාර ]

දැකපු දෙයින් ඇත්තටම ඉතාමත්ම සන්තෝෂ වුණා. ඒ එන ලෙඩාට ඉතාමත්ම සාර්ථක ආකාරයට වැඩ පිළිවෙළක් ගොඩ නඟලා තිබෙනවා.

ඒ වාගේම කාලය අවසන් වන නිසා මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව තුළ අපි ඇත්තටම ලොකු සේවාවක් කරනවා. අපේ පළාත්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලොකු සේවාවක් කරනවා. ඇත්තටම විශේෂයෙන්ම මම මතක් කරන්නේ, මේ 2012 අයවැය යෝජනාවේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් අපේ හදිසි ආපදාවලදී අපට දෙන්න පුළුවන් මුදල් ප්‍රමාණය ඇත්තටම අපට අහිමි වෙලා තිබෙනවා. ඒක පළාත් සභාවක් හැටියට අප විසින් කළ යුතු වැඩක්. පළාත් සභාවක් හැටියට මධ්‍යම රජයෙන් නොදෙනවා නම් පළාත් සභාවෙන් හරි ඒ මුදල් ප්‍රමාණය අපි වෙන් කළ යුතුයි. මොකද, හදිසි ආපදාවකදී ඒ අවශ්‍ය වෙලාවට ඒ සහයෝගය නොලැබෙනවා නම්, හදිසි අවස්ථාවක් වෙන්නේ නැහැ කියන එකයි මම දකින්නේ. ඒකෙන් උපරිම සේවයක් පළාත් සභාව හරහා ලබා දෙන්න පුළුවන් නම් - පළාත් සභාවේ නිලධාරීන් ඒ සියලුම ආයතනවල ඉන්නවා. ඒ නිසා ලොකු සේවාවක් ලබා දෙන්න පුළුවන් කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඇත්තටම අපේ ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරීතුමන්ලා, නිලධාරීතුමියන්ලා ඉතාමත්ම ඕනෑකමින් විවිධ වැඩ සටහන් තුළ ඒ අයගේ රාජකාරියට එහා ගිය දේවල් ජනතාවට කරන්න හැම වෙලේම උත්සාහ කරනවා. ඒ දේ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශ ලේකම්තුමා,පළාත් අධ්‍යක්ෂතුමා, සියලුම දෙපාර්තමේන්තුවල කොමසාරිස්තුමන්ලා, අධ්‍යක්ෂතුමන්ලා, අධ්‍යක්ෂකතුමියන්ලා මේ සෞඛ්‍ය විෂයයට සම්බන්ධ සියලුම දෙනා ඉතාමත්ම උනන්දුවෙන් කටයුතු කරනවා කියන එක ඇත්තටම මතක් කරන්න ඕනෑ. ඒ උනන්දුවට සියලුම නිලධාරීන්ගේ සහයෝගයත් ලැබිය යුතුයි කියන එක මම මතක් කරනවා. ලැබුණු සහයෝගයට වැඩිය වැඩි සහයෝගයක් ලබා දෙනවා නම් අපි කියන සෑම කාර්යයක්ම තවත් ඉදිරියට ගෙනියන්න පුළුවන් කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 10.46 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. කාල වේලාව ඉතාමත් අඩුවෙන් තිබෙන නිසා මම වැදගත් කරුණු කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ අයවැය ප්‍රකාශනය තුළ අපේ රෝහල් සංඛ්‍යාව වෙනුවෙන් රුපියල් දස ලක්ෂ 6646 ක් වෙන් කරලා තිබෙනවා. පසුගිය වසරට වැඩිය 14% ක පමණ ප්‍රතිශතයක් වැඩි කිරීම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වෙන්න ඕනෑ. කෙසේ වෙතත් අපේ සෞඛ්‍ය ඇමැතිතුමා මේ අවස්ථාවේ සිටින නිසා මා අවධානය යොමු කරනවා. නිහතමානී, වැදගත් අමාත්‍යවරයෙක් හැටියට, තිබෙන පහසුකම්වලින් කටයුතු කරගෙන යන්න උත්සාහ කරන අමාත්‍යවරයෙක් හැටියටත් ඇත්ත වශයෙන්ම එතුමාගේ සේවය අපි අගය කළ යුතුයි. අද මේ සෞඛ්‍ය සේවාව නොමිලේ ජනතාවට ලබා දීමේ නිර්මාතෘවරයා වන්නේ එක්සත් ජාතික පක්ෂය. එහි ගෞරවය අපේ පක්ෂයේ නිර්මාතෘවරුන්ටත් හිමි වෙන්නට ඕනෑ. ලෝකයේ ඇතැම් රටවල විශාල මුදලක් සෞඛ්‍යයට වැය කරනකොට අපේ ජනතාව නිරෝගීව තබාගෙන, ඒ ජනතාවගේ ශක්තිය රටේ සංවර්ධනයට ලබා ගන්න පුළුවන් කියන උතුම් පරමාර්ථයෙන් මේ නිදහස් සෞඛ්‍ය සේවය හඳුන්වලා දීලා, දශක ගණනාවක එක්සත් ජාතික පක්ෂ පාලනයෙන් පසුව දැන් මේ නිදහස් සන්ධාන ආණ්ඩුව මේ කටයුතු කරගෙන යනවා. මෙහිදී අපි ප්‍රබලව මේ වනවිට මුහුණ දීලා තිබෙන තත්ත්වය තමයි බෝවන වාගේම බෝ නොවන රෝග තත්ත්වයන් යටතේ අපේ සෞඛ්‍ය පිරිහෙන කොට ඒ සම්බන්ධයෙන් පිළිතුරු හොයලා ජනතාව නිරෝගීව තබා ගන්න අපේ ඉලක්කයක් කරා අපි යමින් සිටිනවාද? අපි දැක්කා ඩෙංගු උවදුර ඉතාම බරපතළ විධියට ව්‍යාප්ත වෙලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු කථා කරද්දී කිව්වා, ඩෙංගු සම්බන්ධයෙන් මේ වනවිට සියලුම ප්‍රතිකර්ම කරලා අවසානයි කියලා. නමුත් ඩෙංගු අවසන් වෙලා නැහැ. මම ඉන්න කොට්ඨාශවල පවා මරණ රාශියක් සිදු වුණා. මේ වනවිට මීගමුව රෝහලේ වෙනමම ඒකකයක ඩෙංගු රෝගීන් රාශියක් ඉන්නවා. පෝරුතොට ප්‍රදේශයේ මේ මෑතකදී ඉතාම විශාල ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් රෝහල්ගත කරනු ලැබුවා. මෙය අවසන් වුණු තත්ත්වයක් නොවෙයි. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අමාත්‍යවරයාට දොස් කියන්න නොවෙයි, අපි ඇවිල්ලා ඉන්නේ. අපි අමාත්‍යවරයාට පෙන්නලා දෙනවා. දඩ ගහන ක්‍රමයක් ඇති කෙරුවා. විශේෂ පනතක් ගෙනාවා. එය ඉතා හොඳ දෙයක්. ජනතාව පුංචි දෙයක් පාරට විසි කෙරුවත්, ගෙදර ටින් බෙලෙක්කයක් තිබුණත් අපි දඩ ගැහුවා වාගේම

මේ රජයේ ආයතන පිළිබඳවත් අවධානය යොමු වෙලා මදී. රජයේ රෝහල් විශේෂයෙන් ඩෙංගු උවදුර බෝ කරන මධ්‍යස්ථාන බවට පත් වෙලා තිබෙනවා. මීගමුව අවට තිබෙන කාණු ටික දිහා බැලුවොතින් අපට ඒක පැහැදිලිව සනාථ කර ගන්න පුළුවනි. විශේෂයෙන්ම අලුතෙන් බස් නැවතුම් පොළක් ඉදි කෙරුවා. ඒ ඉදිරිපිට තිබෙන කාණු පද්ධතියේ පවා මේ මදුරුවන් බෝ කරන කීටයන් ඉන්නවා.

ඒ නිසා මම එතුමාගේ අවධානය යොමු කරනවා, අධීක්ෂණ මණ්ඩලයක් මගින් විශේෂයෙන්ම රජයේ අයතන ගැන යම්කිසි අධීක්ෂණයක් කරන්න, අපට මේ රෝගය වළක්වා ගන්න ඕනෑ නම්. ඒත් එක්කම පළාත් පාලන ආයතනවලින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කිසිම විධිමත් ක්‍රමයක් නැතුව, ඩෙංගු මදුරුවන්ට තෝතැන්නක් හදලා දීලා තිබෙනවා. දවස ගාණේ ඉතා විශාල වශයෙන් ව්‍යාප්ත වෙන්න. ඒ නිසා මම කියන්නේ. අපි ඇමැතිතුමාටවත්, ජනතාවටවත් දෝෂාරෝපණය කරලා හරි යන්නේ නැහැ. මේක ජනතාවගේ වගකීමක් කියලා, ජනතාවගේ පිටම දාලා ඉඳලා හරි යන්නේ නැහැ. අපි අලුත් ක්‍රමවේද හඳුනා ගන්නට ඕනෑ. අපි ජනතාවගෙන් බදු අය කරනවා. මේ පළාත් සභාව, පාර්ලිමේන්තුව ජනතාව විසින් නඩත්තු කරනවා. යම්කිසි සේවාවක් කරන්න, ජනතාවගේ පරමාධිපත්‍ය බලය අපට දීලා තිබෙනවා. ඒ නිසා ජනතාවට බර පටවන්නේ නැතුව ඒ වගකීම අරගෙන ජනතාව සුවෙන් සැපෙන් තියන්න තමයි රජයක් හැටියටත්, විපක්ෂයක් හැටියටත් කටයුතු කරන්න අවශ්‍ය වෙන්නේ. ඒ නිසා මා විශේෂයෙන්ම, ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ඇමතිතුමාට යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. සියලුම රාජ්‍ය ආයතනවල සෞඛ්‍ය තත්ත්වය සහ පරිසරය ගැන අධීක්ෂණ මණ්ඩලයක් මගින් සොයා බලන්න කියලා.

ඒත් එක්කම අපි විදේශීය සහ බටහිර සෞඛ්‍ය සේවාවන්වලට වැඩි තැනක් ලබා දීලා තිබුණත් - අපි දන්නවා. බටහිර බෙහෙත් වර්ග ශරීරගත වුණාම අපට වෙනත් අතුරු ආබාධ ඇති වෙනවා. එක රෝගයකට බෙහෙතක් ගත්තාම අතුරු ආබාධයකින් තමයි අවසන් වෙන්නේ. ඒ නිසා දේශීය වෛද්‍ය ක්‍රමයට වැඩි තැනක් දීලා, දේශීය වෛද්‍ය ක්‍රමයේ අතුරු ආබාධ ඉතාම අවමයි. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, ශ්‍රී ලාංකික වෛද්‍ය ක්‍රමය ඉස්සරහාට ගෙනාවොත් සමහර විට - පිටරටවල අය පවා යම් යම් ප්‍රතිකාර ලබා ගන්න ශ්‍රී ලංකාවට එනවා. එය මුදල් උපයන දැවැන්ත ව්‍යාපාරයක් බවටත් - ඒ කියන්නේ, මුදල් උපයන පරමාර්ථය පෙරදැරි කරගෙන නොවෙයි. සේවාවක් සපයලා රජයට ආදායමක් ලබා ගන්න පුළුවන් තත්ත්වයකට පරිවර්තනය කර ගන්න පුළුවන්.

ඒත් එක්කම අපි දන්නවා. මේ ඩෙංගු රෝගයට පැපොල් දළු යුෂ බොන්න දෙනවා කියලා. දැනට අපේ වාර්තාවේ පවා සඳහන් කරලා තිබෙනවා. මේ පැපොල් දළු බීම ගැන මිනිස්සුන් අතර තවම විශ්වාසයක් නැහැ. මේක බිව්වොත් හොඳද, නරකද කියලා. ඒ නිසා විශේෂයෙන්ම අපේ දේශීය සෞඛ්‍ය අංශය ඒ ගැන පරීක්ෂණයක් කරලා යම්කිසි විධිමත් භාවයක් අනුව එය නිෂ්පාදනයක් බවට පත් කරලා, ශරීරයට අහිතකරද කියන එක පිළිබඳව සෞඛ්‍ය අංශවලින් පරීක්ෂණ කරලා දෙනවා නම්, එය ඉතා වැදගත් තත්ත්වයක් බවට පත් වෙනවා. මොකද, මෙතෙක් බෙහෙතක් සොයා ගන්න බැරි වුණු රෝගයක් තමයි ඩෙංගු කියන්නේ. ඒ නිසා ශ්‍රී ලංකාවෙන් එය නිෂ්පාදනය කරලා බෙදා හරින්න අපට පුළුවන් නම් වඩා හොඳයි. ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම ඉල්ලා සිටිනවා.

අපි කවුරුත් දන්නවා කොතල හිඹුටු පැළෑටිය. ඒ පැළෑටියේ කොපමණ ඖෂධීය ගුණයක් තිබෙනවාද කිව්වොත් පිටරටවලින් අරගෙන ගිහිල්ලා ඖෂධ නිෂ්පාදනය කරලා ඒ අය ලාභ ගන්නවා මිසක්, ශ්‍රී ලංකාවට එය ලබා ගැනීමට හැකියාවක් නැහැ. ඒ නිසා වෙනත් රටවලින් ඇවිල්ලා මේ බෙහෙත අරගෙන ගිහිල්ලා අපට සල්ලිවලට ගන්න වන තත්ත්වයට පත් වෙන්න ඉස්සෙල්ලා මේ පැපොල ශාකයෙන් යම්කිසි බෙහෙතක් නිෂ්පාදනය කරන්න පුළුවන් නම්, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම කියා සිටිනවා.

ඒත් එක්කම අපට කාන්තා අංශය ගැන කථා කරන්න තිබෙනවා. ඒත් එක්කම සමාජ සේවා අංශය ගැනත් කථා කරන්න තියෙනවා. අපේ ඇතැම් අයවැය විවාදවලදී එකම විෂයයක් ගැන විතරයි කණට ඇහෙන්නේ. අනෙක් විෂයයන් ගැන අවධානය යොමු වෙන්නේ නැහැ. සමාජ සේවා විෂයය ගැන කථා කළොත් අපි අනිවාර්යයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ විෂයයක්. කුඩා ආබාධිත දරුවන් විතරක් නොවෙයි. කිසිම පිළිසරණයක් නැතුව වැඩිවිය පැමිණි ආබාධිතයින් ඉන්නවා. ඒ අයට කිසිම ආයතනයක් නිර්මාණය වෙලා නැහැ. හැබැයි, බාල වයස් කෙනෙක් නම් යම් යම් ආයතන නිර්මාණය වෙලා තිබෙනවා. ඒවාවලට ගිහිල්ලා රැකවරණයක් ලබන්න පුළුවන්. මම පෙන්වා දෙන්න කැමැතියි. ඉතාම ධනවත් පවුලවල මන්දමානසික දරුවන්, ආබාධිත දරුවන් ඉන්නවා. වැඩිහිටියන් කැමැතියි, ගෙවීමක් කරලා මේ වාගේ අයව එවැනි ආයතනයක රැකවරණයට පත් කරන්න. එවැනි ආයතනයක් අපි නිර්මාණය කරනවා නම්, අපට හැකියාව තිබෙනවා සෞඛ්‍ය අංශයට තිබෙන යම් යම් වියදම් පියවා ගන්න. යම්කිසි ආදායමක් ලබා ගන්න ක්‍රමයක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන්. මෙතෙක් මේ වැඩිහිටියන්ට කිසිම රැකවරණයක් දෙන්නේ නැහැ. ඒවා නිවසේ ඉන්න අයම බලා හදා ගන්නට ඕනෑ. රජයෙන් එවැනි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන අපේ ගරු ඇමැතිතුමාගේ අවධානයට මම යොමු කර සිටිනවා.

කාන්තා අංශය ගත්තාම ස්වයං රැකියා ලබා දීපු අවස්ථා කිහිපයක් මෙම වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. ස්වයං රැකියා ලබා දීමෙන් පමණක්ම කාන්තාවන්ගේ රැකවරණය, ඒත්

එක්කම කාන්තා අවශ්‍යතාවය ඉෂ්ට වෙන්නේ නැහැ. විශේෂයෙන්ම අපි දන්නවා. කාන්තාවන්ට රැකීරක්ෂා ස්ථානවල තිබෙන දුර්වලතා. ඒ අය මුහුණ දෙන ප්‍රශ්න. සමහර විට ආයතන ප්‍රධානියාගේ යම් යම් බලපෑම් සිද්ධ වන අවස්ථා අදටත් ලංකාවේ දකින්න ලැබෙනවා. මා පසුගිය අවස්ථාවේදී සමුපකාරයක් තුළ ලිංගික අපචාරයක් කරනකොට ඒ සිද්ධිය එළියට අරගෙන ඇවිල්ලා, නඩු පැවරූ අවස්ථාවක් පෙන්වා දුන්නා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමැතිතුමාගේ අවධානය මේ ගැනත් යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ කාන්තාවන්ගෙන් රටට විශාල සේවයක් ලබා ගන්න පුළුවන්. හැබැයි, මේ පළාත් සභාවේ පවා කාන්තාවන් වීම තුළ ඉතාම අවමානයට සහ මුහුණ දෙන්න බැරි ආකාරයේ වචනවලට මේ කාන්තාවෝ ඇතැම් විට මුහුණ දෙනවා. නමුත් ඒ සඳහා ශක්තිය, ධෛර්ය අපේ ශ්‍රී ලාංකික කාන්තාවන් තුළ තිබෙනවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කරන පරිසරය හදන්න. මම දකිනවා. මේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝහල් තුළ රාත්‍රී සේවයේ යෙදෙන කාන්තාවෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අය කාන්තාවන් වීම

[ ගරු රෝස් ප්‍රනාන්දු ]

නිසාම අතවරයන්ට පත් වන තත්ත්වයන් තිබෙනවා. ඒත් එක්කම පසුගිය වකවානුවේ අපි දැක්කා. මේ වසරේ මැද හරිය වනකොට ස්ත්‍රී දූෂණ රාශියක්, ළමා අපචාර රාශියක් වාර්තා වුණා. ඉතාම විශාල ආන්දෝලනයක් සමාජය තුළ ඇති වුණා. සමහර පරිවාස ස්ථාන මගින් අපි නිරීක්ෂණය කරනකොට ඇතැම් ස්ථානවල පරිපාලන නිලධාරියා විසින් තමයි කාන්තාවන්ව දූෂණය කරලා තිබුණේ. ඒ නිසා නැවත ආන්දෝලනාත්මක තත්ත්වයන් ඇති නොවෙන්න මේ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු සෞඛ්‍ය ඇමැතිතුමාගේ අවධානයට යොමු කර සිටිනවා. ඔබතුමාගේ යෝජනාවලදී නිරීක්ෂණ, අධීක්ෂණ කණ්ඩායම්වල රාජකාරී නිසි පරිදි ඉෂ්ට වෙනවාද? ඒ සඳහා යොදලා තිබෙන ප්‍රතිකර්ම මොනවාද කියන කාරණයත් ලබන වසරේ වාර්තාවේ ඇතුළත් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම මට පෙන්වා දෙන්න ගොඩාක් කරුණු තිබෙනවා. කාල වේලාව මදිකම පිළිබඳව ඉතාම කනගාටුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමියට විනාඩියක් ලබා දෙන්න පුළුවන්. කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ නිසා තවදුරටත් පෙන්වා දෙන්න ඕනෑ. හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ ගෙවීම් සම්බන්ධව කියනවා නම්, ගිය පෙබරවාරි මාසේ ඉඳලා බස්නාහිර පළාතේ හදිසි මරණ පරීක්ෂණකවරුන්ගේ ගෙවීම් කරලා නැහැයි කියලා මට දැන ගන්න ලැබුණා. ඒ ගැනත් අපේ ගරු ඇමැතිතුමාගේ අවධානය මම යොමු කර සිටිනවා. ඒ අය සුවිශාල මෙහෙවරක් කරනවා. හදිසි මරණ පරීක්ෂක නිලධාරීන් කොයි වෙලාවක මරණයක් සිද්ධ වුණත්, ඒ සෑම වෙලාවක සේවය කරන්න වුණත් දුවගෙන ඇවිල්ලා ඒවා කරනවා. ඒ අයට මහ ලොකු ගෙවීම් අපි කරන්නේ නැහැ. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒත් එක්කම මේ රජයේ රෝහල්වල දුර්වලතා වැඩි වෙන්න වැඩි වෙන්න පෞද්ගලික රෝහල් කරා තමයි මිනිස්සු යන්නේ. අපේ මන්ත්‍රීවරු වුණත් මොකක් හරි අමාරු තත්ත්වයක් වුණු ගමන් ගිහිල්ලා ඇතුළත් වෙන්නේ පෞද්ගලික රෝහලකට. මම අහලා නැහැ අපේ මන්ත්‍රීවරු කවුරුවත් රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබපු අවස්ථාවක්. හදිසියේ ප්‍රභූවරයෙක් මිය ගියත් මිය යන්නේ, පෞද්ගලික රෝහලක. ඒ නිසා රජයේ රෝහල්වල තත්ත්වය නඟා සිටුවන්න උනන්දු වෙන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

[ පූ.භා. 10.58 ]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලබා දීලා තිබෙන කාල සීමාවට මා ස්තුතිවන්ත වෙනවා. කෙසේ වෙතත් බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කරන්න ලැබීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. මෙන්න මේ අමාත්‍යාංශ යටතේ කථා කිරීමේදී බොහෝ වෙලාවට –

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා අඩු වනකොට වෙලාවකට හොඳයි. වැඩි වනකොට වෙලාවකට නරකයි වාගේ. ගරු මන්ත්‍රීවරයෙකුට කථාව ආරම්භ කරලා ඒ කථාව කරගෙන යන්න ඉඩ සලසන්න. කථා කළත් කමක් නැහැ ඝෝෂාවක් නොවන අන්දමට.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මේ කථාව අතරමගදී ඇත්තටම විපක්ෂය වෙතින් ආපු චෝදනා සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාණයකට එකඟතාවයක් මම දක්වනවා. අපේ අර Ambulance මන්ත්‍රීතුමාගේ චෝදනා සම්බන්ධයෙන් නම් මා එකඟතාවයට පත් වෙන්නේ නැහැ. එතුමා දැක්ක, එතුමාට දැනුනු පෙනුනු දේත් එක්ක චෝදනා කළාට, මේ රටේ ග්‍රාමීය රෝහල්, දිස්ත්‍රික් රෝහල්, මූලික රෝහල් යනුවෙන් රෝහල් පද්ධතියක් තිබෙනවා. ඒ පවතින රෝහල් පද්ධතියේ ඒ ඒ ධාරිතාවට අනුව ඒ අයගේ ධාරිතාවත් එක්ක තමයි මේවා ක්‍රියාත්මක වෙන්නේ. ඒත් එක්ක මේ ගිලන් රථ දීම රෝගීන්ට ප්‍රතිකාර කිරීමෙන් බේරෙන්න හදන අවස්ථාවක් හැටියට සලකනවා. නමුත් මේක ලෝකයේ කොහෙත්, නගරය මූලික වුණාම නගරයට සෞඛ්‍ය පහසුකම් එනවා. නගරය මූලික වුණාම නගරයට සෞඛ්‍ය පහසුකම් අධික වෙනවා. ඊළඟට විශේෂඥ වෛද්‍ය සේවා සපයන තැන්වලට රෝගීන් යොමු කිරීම

තිබෙනවා. ඒ නිසා එය නොදැන වාගේ කථා කිරීම සම්බන්ධයෙන් මා කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පොදුවේ ආපු චෝදනාව තමයි සෞඛ්‍ය අංශයට, ආයුර්වේද දෙපාර්තමේන්තුවට, අනෙකුත් අංශවලට ප්‍රතිපාදන වෙන් නොවීම සම්න්ධයෙන්. එය බරපතළ කනගාටුදායක තත්ත්වයක්. සියයට සියයක් ඒ සම්බන්ධයෙන් එකඟතාවය දක්වනවා. කාර්ය මණ්ඩලය පත් කිරීමේදී වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව, භාණ්ඩාගාරය, විවිධ වූ ආයතන මේ සම්බන්ධයෙන් නොසලකා හැරීම, ඔවුන්ගේ වැරැදි නිර්ණායක පාවිච්චි කරලා, යල් පැන ගිය නිර්ණායක පාවිච්චි කරලා, ඒ යල් පැන ගිය නිර්ණායකවලට අනුව කාර්ය මණ්ඩල පත් කරන්න දරන උත්සාහය, මධ්‍යම රජයේ හිතුවක්කාරී බලපෑම, හස්තය මේ සෞඛ්‍ය පාලනය කරන්න යොදන ආකාරය සම්බන්ධයෙන් මම බරපතළ විධියට කනගාටු වෙනවා. ඒ වාගේම මගේ විරෝධය පළ කරනවා. මෙය දෙවරක් සිතා බැලිය යුතු දෙයක්. මෙය ජනතාවගේ ජීවිත සම්බන්ධයෙන්, නිලධාරී මට්ටමෙන් ගන්න තීන්දු සම්බන්ධයෙන් මා යෝජනා කර සිටිනවා. ඒ සම්බන්ධයෙන් වෙනත් බලපෑම් කළ හැකි තත්ත්වයකට අපි යා යුතුව තිබෙනවා. කොහොම වුණත්, හිඟන්නාගේ පාත්තරේට හෙනහුරා පාත් වුණා වාගේ වියදම් කරන්න මුදල් හදල් නැති සෞඛ්‍ය අමාත්‍යාංශයට දැන් අලුතෙන් තිබෙන ඊළඟ බලපෑම තමයි - සියලු දෙනා ඩෙංගු මර්දනය සම්බන්ධයෙන් කථා කළා. බෝ නොවන රෝග සම්බන්ධයෙන් කථා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෝ නොවන රෝග සම්බන්ධයෙන් කථා කරනවා නම්, බෝ නොවන රෝග පාලනය කිරීමට නොහැකි මානයක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය ඉන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයට එහි තියෙන හැකියාව දුෂ්කර වෙන්න මූලික හේතුව තමයි අද ඩෙංගු රෝගියෙක් මියගියොත් අපි PHI මහත්වරුන්ට බණිනවා. ආණ්ඩුවට බණිනවා. ප්‍රාදේශීය සභාවට, නගර සභාවට බණිනවා. හැබැයි බෝ නොවන රෝගියෙක්, ඩෙංගු රෝගියෙක් මිය යන සංඛ්‍යාවට සාපේක්ෂව සිය දහස් ගුණයෙන් බෝ නොවන රෝගීන් දෛනිකව මිය යනවා. වාර්ෂිකව මිය යන ප්‍රමාණය ලංකාවේ සුනාමියකින් මියගිය ප්‍රමාණයට වඩා හතර ගුණයකට වැඩියි. බෝ නොවන රෝගවලින් වාර්ෂිකව මියයන සංඛ්‍යාව සුනාමිවලින් මියගිය සංඛ්‍යාව වාගේ හතර ගුණයකින් වැඩියි. එවැනි සංඛ්‍යාවක් මිය යන රෝගය සම්බන්ධයෙන් ඇඟිල්ල දික් කරන්න රෝගියාට පුළුවන්කමක් නැහැ. කිසිම කෙනෙකුට පුළුවන්කමක් නැහැ. බෝ නොවන රෝග වැළඳෙන්නේ රෝගියාගේ සහ රෝගියාගේ පවුල් තත්ත්වයේ වරදින්මයි. ඒ නිසා අද ළදරුවාගේ පටන් අධික ස්ථූලභාවය, දියවැඩියා රෝගය වැනි දේවලට ළදරුවන් පත් වීම මේකට අවශ්‍ය කරන සමාජ වටපිටාව, මිනිසුන්ගේ තිබෙන සිතුවිලි මට්ටම මේ සියල්ල වෙනස් කිරීමේ බරපතළ වගකීම මම හිතන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇවිල්ලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට සීමා කළ නොහැකි, පාලනය කළ නොහැකි සීමාවකයි තියෙන්නේ. ඒකට මිනිසුන්ගේ හදවත් වෙනස් කරන්න වෙනවා. මිනිසුන් හිතන පතන ක්‍රමය වෙනස් කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය මධ්‍යම රජය මඟින් ලබන අවුරුද්දේ මේ සම්බන්ධයෙන් විශේෂ තීන්දුවක් ගනීවි. මම හිතන්නේ, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයත් එයට බරපතළ විධියට මැදිහත් විය යුතුව තිබෙනවා. මැදිහත් වෙලා ඒ කටයුත්ත කළ යුතුව තිබෙනවා. ලබන අවුරුද්දේ ඉඳලා, මේ අවුරුද්දේ අවසානයේ ඉඳලා බෝ නොවන රෝග සම්බන්ධයෙන් ස්වෙච්ඡා කණ්ඩායම් සකස් කරලා, ඒ ස්වෙච්ඡා කණ්ඩායම් ගම්වලට ගෙනියන්න මා නියෝජනය කරන දිවුලපිටිය කොට්ඨාශයේ යම් සූදානමක් තිබෙනවා. ගරු අමාත්‍යතුමාගේ ආශිර්වාදය මැද අපට ඒ හැකියාව ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

ඊළඟට දැනටත් මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් ෂඩ්රස අසිරිය කියන වැඩ සටහන මඟින් ජනතාවට අවශ්‍ය කරන ආහාර වට්ටෝරු, ජනතාවගේ ඇවැතුම් පැවැතුම්, ජනතාවගේ චාරිත්‍ර වාරිත්‍ර, අතීතයට ගැළපෙන ආකාරයට, අතීතයේ ක්‍රමෝපායන් පාවිච්චි කරමින් යම් උත්සාහයක යෙදෙනවා. එතැනදී ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් යම් ප්‍රමාණයක් ඉන්නවා. මම විශ්වාස කරන්නේ නැහැ එය ප්‍රමාණවත් කියලා. ප්‍රජා සෞඛ්‍ය සහායක වෛද්‍යවරු, අද දවසේ උතුරු - නැගෙනහිර ප්‍රදේශයෙන් මේ පළාතට දාන්න සූදානමින් ඉන්න වෛද්‍යවරුවත් භාර ගන්න අපේ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට හැකි වෙලා නැහැ. ඒ නිසා වැඩි සෞඛ්‍ය නිලධාරීන් ප්‍රමාණයක්, වැඩි වෛද්‍යවරු ප්‍රමාණයක් ඒ සම්බන්ධයෙන් අරගෙන මේ ෂඩ්රස අසිරිය වැඩ සටහන්, ඒ වාගේම ප්‍රජා සෞඛ්‍ය මට්ටමින් ගම් මට්ටමින් ගෙයින් ගෙට ගිහිල්ලා මේ දැනුවත් කිරීම, මැදිහත්වීම හා බලපෑම් කිරීම් සියල්ල මා හිතන්නේ, මීට වඩා සාර්ථකව කළ යුතුව තිබෙනවා. එතැනදී අද දරන උත්සාහයට මගේ ප්‍රශංසාව හිමි වෙනවා. ඒ වාගේම මේ හැම දෙයකදීම මූලිකව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙනියන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළට අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබන සෙදුරු පවුල නැමැති ව්‍යාපෘතිය - ඒ සොඳුරු පවුල නැමැති ව්‍යාපෘතියේදී ඔවුන් මුලින්ම අමතන්නේ ගර්භනී මාතාවට. අපි හොඳාකාරවම දන්නවා, දරුවෙකුගේ මුල් ළමා විය ආරම්භ වන්නේ කළල සංසේචනයේ සිටමයි කියලා. කළලයේ ඉඳලා ඒ දරුවා බිහි වනතෙක්ම අවශ්‍ය කරන පවුල් පසුබිම, ඒ මවට අවශ්‍ය කරන සෞඛ්‍ය, පෝෂණය, මානසික වටපිටාව, මේ සියල්ල ගොඩනැගිය යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් මහ අත්වැලක් වෙනවා, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබන සොඳුරු පවුල නැමැති ව්‍යාපෘතිය. මම හිතන්නේ, මෙවැනි ඵලදායී ව්‍යාපෘති දිගින් දිගට ආදර්ශමත්ව ගෙන යා යුතුව තිබෙනවා. මෙතැනදී සෞඛ්‍ය අමාත්‍යාංශය නිසි උදව් උපකාර ඒ සමාජ සේවා දෙපාර්තමේන්තුවට ලබා දෙයි කියා මා විශ්වාස කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සිද්ධ වන අතහිත ව්‍යාපෘතිය. වැඩිහිටි සුභසාධන අසරණ සරණ ව්‍යාපෘතිය. මම හොඳාකාරවම දන්නවා. අද මේ රටේ ජ්‍යෙෂ්ට පුරවැසියා කියලා කියන්නේ අත්දැකීම් බහුල, ගුණයෙන්, වයසින්, ඒ වාගේම

අත්දැකීම්වලින් පරිපූර්ණ අය බව. දැනුමෙන් බහුශ්‍රැතයෝ. ඔවුන් සතුව තිබෙන විනය තවමත් අපට නැහැ. ඔවුන් සතුව තිබෙන හික්මීම සහ වැඩක් සැලසුම් කරන පිළිවෙළ, මම හොඳාකාරව දන්නවා. ගම්පහ දිස්ත්‍රික්ක වැඩිහිටි ත්‍යාග ප්‍රදානෝත්සවය හෙට දවසේදී දිවුලපිටියේ පවත්වනවා. ගම්පහ දිස්ත්‍රික් උත්සවය. මා මේ අවුරුද්දේ දිවුලපිටියේ දිස්ත්‍රික් උත්සව හතරක් පැවැත්වූවා. ඒ පැවැත් වූ දිස්ත්‍රික් උත්සව හතරම සැලසුම් කළේ අපේ තරුණ නිලධාරීන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කිත්සිරිට කිව්වේ නැද්ද?

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

සියලු දෙනාට කියලා තිබෙනවා. තරුණ නිලධාරීන්. මේ තරුණ නිලධාරීන්ට වඩා අර වැඩිහිටි දිස්ත්‍රික් බල මණ්ඩලය ක්‍රියාත්මක වෙලා, සියල්ල සැලසුම් කරලා ඉතාමත් විනිවිධ භාවයකින් යුක්තව කටයුතු කරන ආකාරය දැක්කාම අපට

[ ගරු නෙලුක් මල්ලව ]

තවමත් (බාධා කිරීමක්) ඒ නිසා මේ වැඩිහිටියන්ගෙන් ගත යුතු ආදර්ශ තිබෙනවා. ඒ නිසා ඔවුන් මැදිහත් කර ගන්න. ඔවුන් එක්ක ගමනක් යන්න. ඔවුන් හරහා ලැබෙන ආදර්ශය සමාජයට දුන්නොත් හෙට දවසේදී වැඩිහිටි පරපුර අපට තවදුරටත් ශක්තියක් වේවි. අද වැඩිහිටියා සතුව තමයි, අපේ තිබෙන ඒ ඒ ගෘහයන්ට වෙන් වුණු සෞඛ්‍ය පුරුදු, චාරිත්‍ර වාරිත්‍ර ඒ සියල්ල තිබෙන්නේ. අද ඔවුන් මුළු ගන්වලා, මිත්‍යාවේ සළුවෙන් ඔවුන්ගේ දැනුම වහලා දාලා, ඔවුන් අද ගේ මුල්ලට ඇදලා දාලා තිබෙනවා. එදා හැම අම්මා කෙනෙකුටම යම් ප්‍රමාණයකට හරි වෛද්‍යවරයෙකුගේ දැනුම තිබුණා. අද ඇයට ඇයගේ දැනුම ප්‍රායෝගිකව භාවිතා කළ නොහැකි මට්ටමක් තිබෙනවා. එයට තිබෙන මූලික හේතුව අද විද්‍යාත්මක දැනුම දරුවන්ට ඇවිල්ලා, ඒ තුළින් මව ළඟ තිබුණු අත් බෙහෙත් සියලු දේ අයින් වෙලා තිබෙනවා. නමුත් ඇත්ත තත්ත්වයට නොවෙයි ඇවිල්ලා තිබෙන්නේ. ව්‍යාජ වාණිජකරණයටයි මේ සියල්ල හසු වෙලා තිබෙන්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවසාන අංගය පැහැදිලි කරන්න දෙන්න. පසුගිය කාලය තුළ එක්තරා රූපවාහිනී නාලිකාවක් මගින් පරිවාස භාරයේ ඉන්න දරුවන් සම්බන්ධයෙන් කථා කළා. පරිවාස භාරයේ ඉන්න දරුවෝ පරිවාසගත කරන්න මූලික වුණු හේතු තමයි අද දවසේ පවතින අපචාර සහ අපයෝජන. මේ අපයෝජන සම්බන්ධයෙන් මීට වඩා බරපතළ මැදිහත්වීමක් සමාජයට යොමු කළ යුතුව තිබෙනවා. මම ඊයේ දවසේත් කථා කළා. අද අපේ දරුවා යම් ප්‍රමාණයකට හුදෙකලා වෙලා තිබෙන්නේ. අපේ දරුවන් යම් යම් ප්‍රමාණවලින් හුදෙකලා වීම තුළ අපයෝජනයට ලක් වෙන්න තිබෙන ඉඩකඩ අපි විවෘත කරලා දීලා තිබෙන්නේ. එදා දවසේදී මවගේ ඇකයේ සිටි දරුවාව තවත් තැනක හුදෙකලා කරලා දාලා අද දවසේ මවට පුළුවන් භෞතික සම්පත් සොයාගෙන යන්න. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සොයා බලන්න අද දවසේදී පරිගණකය තිවසේ තියෙන්නේ කොතැනද? ගෙදර මුල්ලක පරිගණකය තියෙන්නේ. අම්මාට රූපවාහිනිය බලන්න ඕනෑ නිසා. අම්මාගේ ඇහේ මානයට, තාත්තාගේ ඇහේ මානයට පරිගණකය ගේන්නේ නැතුව, ඒ පරිගණක දැනුම දරුවාට නොදී අයින් කරනවා, පරිගණකය නිසා දරුවාගේ මනස විකෘති වෙනවා කියලා. මම යෝජනා කරනවා පරිගණකය දෙමව්පියන්ගේ ඇහේ මානයට ගෙනැල්ලා පරිගණකය දරුවාට දිය යුතුයි. අම්මාට රූපවාහිනිය බලන්න තිබෙන කරදරය නිසා, තාත්තාට මැච් එක බලන්න තිබෙන කරදරය නිසා දරුවාව පරිගණකයත් එක්ක කාමරයට දාන්න තිබෙන ඉඩකඩ උඩ මේ අපයෝජන අවස්ථා, දරුවා පිරිහෙන්න තිබෙන අවස්ථා වැඩි කරලා තිබෙනවා. ඒ නිසා අද දවසේ පරිවාස භාරයට පත් වන දරුවන් ගරු ඇමතිතුමා ලබා දුන් ප්‍රකාශනය තුළ කියැවෙනවා, දරුවන් පුනරුත්ථාපනය කරනවා කියලා. නමුත් පරිවාස භාරයේ ඉන්න දරුවන් පුනරුත්ථාපනය කිරීමේ ඍජු වැඩ පිළිවෙළක් අපට නැහැ. අද කරන්නේ දරුවා ඍජුවම පරිවාසයට ගේනවා. ගේන දරුවා පරිවාසයේදී යම් යම් පුහුණු කිරීම් සහ යම් යම් දේවල් කරනවා මිසක් නියම අවශ්‍ය කරන සමාජයීය, මානසික පුනරුත්ථාපනය සිද්ධ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විටක ගරු ඇමැතිතුමා මා හා අපේ ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ගියා පරිවාස භාරයේ ඉන්න දරුවන් බලන්න. එක අවස්ථාවක පරිවාස භාරයේ සිටි පුංචි දැරියක්, අවුරුදු 06 ක දැරියක්. ලංකාවේ නීතිය තිබෙන්නේ අවුරුදු 08 දරුවෙක් පමණයි පරිවාසගත කරන්න පුළුවන් කියලා. ඒ පරිවාසගත කරන්න පුළුවන් දරුවන්. මීටත් වඩා අවුරුදු 06 ක සීමාවේ දරුවෙකු අධිකරණය මගින් පරිවාසගත කරලා තිබුණා. හැබැයි, ඒ පරිවාසගත කරපු දරුවන් කොහොමද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි පුනරුත්ථාපනය කරන්නේ? සමහර විට ඒ පරිවාස භාරයේ ඒ දරුවාගේ රැකවරණයට ඉන්න වැඩිමහල් දරුවා ළමා ගණිකාවක් වෙන්න පුළුවන්. ඒ අයත් අපේ පරිවාස භාරයේ ඉන්නවා. අපේ පරිවාස භාරයේ ඉන්න පියා අතින්, බාප්පා අතින්, මාමා අතින්, කඩේ මුදලාලි අතින් අපයෝජනයට ලක් වුණු කුඩා දැරියත් ඉන්නේ අර ළමා ගණිකාවත් එක්කමයි. මේ සමාජ ශෝධනය කරන්න. මේ ශෝධනය කිරීමේ ආයතන නිර්මාණය කිරීමේදී මා හිතන්නේ වෙනම ගත්තු පුනරුත්ථාපන ආයතන නිර්මාණය කළ යුතුයි. මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට යෝජනා කරනවා. එය බරපතළ කටයුත්තක් හැටියට අරගෙන මධ්‍යම රජයෙන් වේවා, අනෙක් පළාත්වලින් පවා පරිවාස භාරයට ගෙන එන්නේ බස්නාහිරට නම්, මේ බස්නාහිර පරිවාස භාරයේ ඉන්න දරුවන් වෙනුවෙන් පුනරුත්ථාපන ආයතන හැදෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් විෂයය දැනුමෙන් පරිපූර්ණ වුණු, ප්‍රායෝගික දැනුමෙන් පරිපූර්ණ වුණු නිලධාරී මණ්ඩලයක් ගොඩනගන්න

ඕනෑ. එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ, හැම වෙලාවකම විටින් විට ප්‍රශ්න ගොඩ නැගෙන ආයතනයක්. ඒ සඳහා පැහැදිලිවම නිරපේක්ෂ විසඳුම් ලබා දෙන්න බැහැ. ඒ නිසා සෞඛ්‍ය සම්බන්ධයෙන් ලබා දිය හැක්කේ සාපේක්ෂ විසඳුමක් පමණයි. එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට වඩාත් ධෛර්යමත්ව තමන්ගේ නිලධාරී මණ්ඩලය සමග කටයුතු කරගෙන යන්න වඩාත් ශක්තිමත්ව ඒ වෙනුවෙන් පෙනී සිටින්න හැකියාව, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.10 ]

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කෙටි කාලය ලබා දීම සම්බන්ධයෙන් මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය මම හිතන්නේ, අධ්‍යාපනයට පසුව මෙම අයවැයේදී විශාලතම මුදල් සංඛ්‍යාවක් වෙන් කරලා තිබෙන්නේ මෙම අමාත්‍යාංශයට. මම හිතන්නේ 19% ක වාගේ ප්‍රතිශතයක් මේකට වෙන් කරලා තිබෙනවා. ඊයේ දවස පුරා සියලුම මන්ත්‍රීවරු අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කළා. ගොඩක් අය කියන්නේ අධ්‍යාපනය ඉතාම වැදගත් කාරණයක් හැටියට. ඒ වාගේම මේ ප්‍රතිශතය බැලුවාම අපට තේරෙනවා අධ්‍යාපනයට පසුව අපේ පළාත් සභාව සෞඛ්‍ය සම්බන්ධව ඉතාම විශාල කාර්යයක් ඉටු කරන නිසා වෙන්න ඇති මේ වාගේ විශාල මුදලක් අපි වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම අපේ ගරු ඇමැතිතුමා මේ අවස්ථාවේදී නැහැ. නමුත් එතුමා අපත් සමග බොහොම සමගියෙන් කාරක සභාවේ කටයුතු කරන ඇමැතිවරයෙක්. ඒ නිසා පළමුවෙන් මම එතුමාට ප්‍රණාමය පුද කරන්න කැමැතියි. අපේ සාමාජිකයන්ගෙන් අදහස් උදහස් අරගෙන හැම වෙලාවේම පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරන ගරු ඇමැතිවරයෙක්. ඒ නිසා ඉදිරි කාලයේදී සෞඛ්‍ය සම්බන්ධව ප්‍රශ්න විසඳා ගැනීමට උපරිම සහයෝගය අපි එතුමාට ලබා දෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි. මෙතැන අපට අඩුපාඩුත් කථා කරන්න තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ඩෙංගු මර්දනය සම්බන්ධව විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගියවර අයවැයේදී මම දැක්කා. සියලුම මන්ත්‍රීවරුන් සෞඛ්‍ය සම්බන්ධව කථා කරද්දී ඩෙංගු සම්බන්ධව කථා කළා. නමුත් මම දවස් කිහිපයකට පෙර රූපවාහිනියේ දුටුවා ලංකාවේ දැන් ඩෙංගු රෝගයට බෙහෙතක් හඳුනාගෙන තිබෙන බවට. ලංකාවේ ආයුර්වේද වෛද්‍යවරියක්. ඒ කියන්නේ සිංහල වෙදකම තුළින්, ආයුර්වේද වෙදකම තුළින් බෙහෙතක් හඳුනාගෙන තිබෙනවා. එය නීත්‍යානුකූල කර තිබෙන බවට රූපවාහිනියෙන් මම දැක්කා. අපේ රටේ තිබෙන වෛද්‍ය ක්‍රමය ගැන අපි බොහොම ආඩම්බර වෙන්න ඕනෑ. ඒ කියන්නේ අපි සමහර වෙලාට අගය කරන්නේ නැහැ. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ හොඳ පැත්තත් තිබෙනවා. අද ඉංග්‍රීසි බෙහෙත්වලින් සනීප කරන්න බැරි රෝගවලටත් අපේ රටේ බෙහෙතක් හඳුනාගෙන තිබෙනවා කියන එක අපට ලොකු ආඩම්බරයක්. ඒ නිසා මම හිතන්නේ අපේ අමාත්‍යාංශය තුළින් මේ සම්බන්ධව කටයුතු කරන්න ඕනෑ. ඩෙංගු රෝගය මුළුමනින්ම නැති කරලා දාන්න අපි සියලු දෙනාම එකතු වෙන්න ඕනෑ. ඒ වාගේම මේ ඩෙංගු මර්දනයට අපි පනතක් සම්මත කර ගත්තා. ඒ කියන්නේ දඩ ගැසීමේ ව්‍යාපාරයක් තිබෙනවා. නිවසක් පරීක්ෂා කරලා අපි මහජන සෞඛ්‍ය නිලධාරීන්ට බලය දීලා තිබෙනවා වැරැදි කරපු අයට රුපියල් 50,000 දක්වා දඩය නියම කරන්න පුළුවන් කියලා. ඒ බලතල දීලා තිබෙනවා. මම හිතන්නේ ඒ සම්බන්ධව ගරු ඇමැතිතුමා ළඟදී අවවාද කෙරුවා. ඒ මහජන සෞඛ්‍ය නිලධාරීන් නිවාසවලට ගිහිල්ලා, ඒ නිවැසියන්ට හරියාකාරයෙන් කථා කරන්න ඕනෑ. නියම විධියට ඒ ජනතාවත් එක්ක හැසිරෙන්න ඕනෑ කියලා. ඒක හොඳ පැත්තක්. එහෙම තමයි ඉන්න ඕනෑ. ඒ වාගේම සමහර මහජන සෞඛ්‍ය නිලධාරීන් තමන්ගේ රාජකාරිය හරියට ඉටු කරන්නේ නැහැ. ඒ කියන්නේ සමහර රජයේ නිලධාරීන් දඩයක් ගහන්න ඕනෑ තැනකට ගිහිල්ලා තමන්ගේ වාසිය තකා දඩය නොගහ වැඩ කරනවා. එතැනින් මොනවා හරි ලබා ගන්න බලනවා. එම නිසා ඒ නිලධාරී මහත්වරුන්ගේත් වගකීම - දඩ ගැසීම සම්බන්ධයෙන් මම කියන්නේ. ඒ සම්බන්ධව හරියාකාරව වැඩ කරන්න ඕනෑ. ගරු ඇමැතිතුමා ඒ සම්බන්ධව හොඳ ස්ථාවරයක ඉන්නවා.

ඒ වාගේම පළාත් පාලන ආයතනවලට වගකීමක් තිබෙනවා. අපි මහජනයාට පමණක් සියයට සියයක් වැරැදි පෙන්වා දුන්නාට මදී. සමහර තැන්වල පොදු කාණු පිරිසිදු කරලා නැහැ. පස් පිරිලා තිබෙනවා. කුණු කන්ද එහෙම්ම තිබෙනවා. ඉතින් පළාත් පාලන ආයතනවලටත් වගකීමක් තිබෙනවා, මේවා පිරිසිදු කරන්න. මම ළඟදී දැක්කා, රූපවාහිනියෙන් කාන්තාවක් පෙන්නලා දෙනවා. අපි වැරැද්දක් කෙරුවාම දඩ ගහනවා. උසාවියට අරගෙන යනවා. නමුත් මේ බලන්න මේ කුණු කන්ද. මේවා කවුරුත් සුද්ධ කරන්නේ නැහැයි කියලා. ඉතින් ඒකේ ඇත්තක් තිබෙනවා. අපි වැරැද්ද පෙන්නලා සියයට සියයක් මිනිසුන්ට පමණක් ඒ වැරැද්දේ බර දෙන්න බැහැ. පළාත් පාලන ආයතනයත් මේකට එකතු වෙන්න ඕනෑ. කුණු පිරිසිදු කිරීම, කුණු කසළ හරි වේලාවට එකතු කිරීම, ඉවත් කිරීම, කාණු පිරිසිදු කිරීම, මේවා ඉෂ්ට වෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මේ ඩෙංගු මර්දනය හරියාකාරව ඉටු කරන්න පුළුවන් වෙන්නේ.

ඒ වාගේම රැකියා අවස්ථාවන් සඳහා ගොඩක් කාන්තාවෝ අද අපේ රටේ විදේශගත වන කාලයක්. ආර්ථික ප්‍රශ්න නිසා ඒ අය විදේශගත වනකොට තමන්ගේ දරුවෝ පියාට හෝ අසල්වැසියන්ට භාර දීලා යනවා. එම නිසා තමයි මම හිතන්නේ,

රටේ ලිංගික අපචාර, ළමා අපචාර ඉතාම ඉහළ මට්ටමකමක තිබෙන්නේ. මම හිතන්නේ ඇමැතිවරයෙකුට පමණක් මේක නැති කරන්න බැහැ. නිලධාරීන්ට පමණක් මේක නැති කරන්න බැහැ. සමහර අය මේ ප්‍රශ්න ගැන කථා කරනකොට කියනවා මරණ දඬුවම රටේ ගේන්න ඕනෑ කියලා. ළමා අපචාර අවම කරන්න. සමහර මන්ත්‍රීවරු කථා කරනවා ගණිකා සේවය නීත්‍යානුකූල කරන්න ඕනෑ කියලා. සියලු දෙනාම හොයන්නේ කොහොම හරි මේ ප්‍රශ්නය අවම කර ගන්න. එක එක විධියේ විසඳුම් ගේනවා. ඒ කියන්නේ මේ ප්‍රශ්න ඉතාම උග්‍ර විධියට අද රටේ තිබෙනවා. අපි දන්නවා හැමෝම කථා කරන්නේ ජාතික ප්‍රශ්න ගැන. මම හිතන්නේ දැන් ජාතික ප්‍රශ්නවලට වඩා විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා මේ ළමා අපයෝජන. මොකද, අපි හැමදාම පුවත්පත් බලනකොට මම හිතන්නේ පොඩි ළමුන් දූෂණය කරන ආකාරය පිළිබඳ සිද්ධීන් හතරක් හරි අපට කියවන්න ලැබෙනවා. අපි දේශපාලඥයෝ හැටියට මේක අවම කර ගන්න අපට විශාල වගකීමක් තිබෙනවා. නමුත් අමාත්‍යාංශය පැත්තෙන් මදි. දේශපාලන පැත්තෙන් මදි. මේක සමාජය පැත්තෙනුත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට වැඩිපුරත් කාලය ලබා දීලා තිබෙනවා.

**ගරු ජේම්ස් ප්‍රිමිලස් කොස්තා**
Hon. James Primilus Costa

එම නිසා ඒ සම්බන්ධව මම සුභ පතනවා. අපේ ගරු ඇමැතිතුමාත් එක්ක ඉදිරි අවුරුද්දේත් අපට සහයෝගයෙන් වැඩ කරන්න වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.16 ]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස, ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ විවාදයට එක් වෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ විෂයය පථය තුළින් විශාල කාර්ය භාරයක්, අධ්‍යාපනයට පසුව විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන අමාත්‍යාංශය වශයෙන් මෙම අමාත්‍යාංශය අපට හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයත්, ඒ හා සමාන අනෙකුත් අමාත්‍යාංශවලටත් මේ මුදල් ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ ජීවත් වන ජනතාවගේ ජන ජීවිතය නහා සිටුවලා, නීරෝගීමත් සහ ශක්තිමත්, දෙපයින් නැඟී සිටිය යුතු ජනතාවක් බවට පත් කිරීමේ අභිලාසය ඇතිව.

විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය ගත්තාම බස්නාහිර පළාත තුළ රෝහල් 41 ක්. මධ්‍යම බෙහෙත් ශාලා සහ මාතෘ සායන 78 ක ප්‍රමාණයක් තුළින් ජනතාවගේ සෞඛ්‍ය ගැටළු සඳහා විසඳුම් ලබා දෙන්න කටයුතු කරනවා. අපි දන්නවා. බස්නාහිර පළාත් සභාව තුළ පවතින රෝහල්වල ජනතාව වෙනුවෙන් එදිනෙදා රෝගීන් සහ නේවාසික රෝගීන් වෙනුවෙන් ඉතා විශාල සේවාවක් ලබා දෙනවා. මේ සඳහා වෛද්‍යවරු, රෝහල් කාර්ය මණ්ඩලය විශාල සහායක් ලබා දෙනවා. විශේෂයෙන්ම මධ්‍යම රජයෙන් ඒ සඳහා අවශ්‍ය කරන සේවක සේවිකාවන් ලබා දීමේ කටයුතු කරගෙන යනවා. නමුත් අපි දන්නවා දැනට තිබෙන රෝහල්වලත් කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නැහැ. ඒ රෝහල්වල ජනතාවට අවශ්‍ය කරන සේවාව ලබා දීමට සම්පත් ප්‍රමාණවත් නැති තත්ත්වයක පවතිනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් මම යෝජනා කරනවා විශේෂයෙන්ම මේ රෝහල්වල තිබෙන සේවක පුරප්පාඩු අවම කරලා අවශ්‍ය කරන හෙදියන්, සාත්තු සේවක සේවිකාවන් තවත් වැඩි කරලා ජනතාවට අවශ්‍ය කරන සේවය ලබා දෙන්න කටයුතු කරන්න කියලා. මොකද, අපි දන්නවා වෛද්‍යවරයෙක්, සේවකයෙක් ඒ රෝහල්වලට නිතර පැමිණෙන රෝගීන් සඳහා කරන කටයුත්ත. ඒ කටයුත්තෙන් සමහර වෙලාවට රෝගීන් දහස් ගණනක් සුවපත් කළත් එක රෝගියෙකුට සිදුවන මොකක් හෝ අඩුපාඩුවක් නිසා ඒ කටයුත්ත ඒ අවස්ථාවේ සිදු වුණේ නැත්නම්, එක්කෝ ඒ අවස්ථාවේ ඉන්න සේවකයින් ප්‍රමාණවත් නොවීම නිසා කරන සෞඛ්‍ය කටයුත්ත ප්‍රමාණවත් නොවුණොත්, රෝගියෙක් මිය ගියොත් මුළු බස්නාහිර පළාත් සභාවම බැණුම් අහනවා. ඒ රෝහල, වෛද්‍යවරු කරපු සේවය ඇගයීමට ලක් වෙන්නේ නැහැ. ඒ වෙලාවට අපට අහන්න වෙන්නේ සම්පූර්ණ දෝෂාරෝපණයක්. මොකද, මම නියෝජනය කරන හෝමාගම ප්‍රාදේශයේ හෝමාගම රෝහල ගත්තාම අතිවිශාල සේවයක් කරනවා. විශාල වශයෙන් දානපතීන් ගොඩනැගිලි ලබා දීලා, විශාල සම්පත් සහිත, බස්නාහිර පළාතේ තිබෙන හොඳම රෝහලක මට්ටමට, මධ්‍යම රජය යටතේ පවතින රෝහල්වල මට්ටමට හෝමාගම රෝහල ගෙනැවිත් තිබෙනවා. සමහර අවස්ථාවල වන සුළු අඩුපාඩුවක් නිසා සම්පූර්ණ සෞඛ්‍ය ක්‍රමයම, පළාත් සභාව එහෙම නැත්නම් රජයම අපහසුතාවයට පත් වන කටයුතු වෙනවා. ඒ නිසා මේ පවතින සේවක අඩුව පිරවීම සඳහා කටයුතු කරන්න ඕනෑ කියන එක මම මේ සභාවට ගෞරවයෙන් යෝජනා කර සිටිනවා. ඒ වාගේම -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

රස්සාවල් කීයක් දීලා තියෙනවාද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කොහොමත් අපි රස්සාවල් දෙනවා නේ? ප්‍රශ්නයක් නැහැ. අපේ රජය හරහා ජනතාවට රස්සාවල් ලබා දෙන්න මේ වනකොට කටයුතු කරගෙන යනවා. ලක්ෂ 12 කට 13 කට වැඩිය රජයේ සේවකයෝ පත් කරලා තිබෙනවා. තවත් පත් කරන්න

මේ ආණ්ඩුවට කටයුතු කරන්න පුළුවන්. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මධ්‍යම බෙහෙත් ශාලා සහ මාතෘ සායනවලින් කෙරෙන සේවය අපි ඉතාමත් අගයන්න ඕනෑ. මොකද, දරුවෙක් ලැබෙන්න ඉන්න මාතාවකට අවශ්‍ය කරන සම්පූර්ණම සේවය මාතෘ සායනවලින් ලබා දෙනවා. අපි දන්නවා. මේ සේවය පෞද්ගලික අංශයෙන් අපි ලබා ගන්න ගියොත්, පෞද්ගලික රෝහලකට ගියොත් අතිවිශාල මුදල් ප්‍රමාණයක් මේ සඳහා වැය කරන්න වෙන බව. ඒක එසේ නොකර අපේ පළාත් සභාව තුළින් පවත්වාගෙන යන මාතෘ සායනවල සේවය තව තවත් වැඩි කරලා තිබෙනවා. අපි දන්නවා. පසුගිය වසරවල අපේ පළාත් සභාවට විශාල ශක්තියක් වෙමින් ගරු ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා මාතෘ සායන අලුත්වැඩියා කරන්න යම් මුදල් ප්‍රමාණයක් ලබා දුන්නු බව. මේ වසරේදීත් ඒ සඳහා බස්නාහිර පළාත් සභාවට තව ශක්තිය ලබා දීලා, ප්‍රතිපාදන ලබා දීලා, ඒ මාතෘ සායන දැනට තිබෙන තත්ත්වයට වඩා ගුණාත්මක සහ වටිනාකමක් සහිත අංගයක් බවට පත් කරන්න සහාය ලබා දෙන්න කියලා අපි මධ්‍යම රජයෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මොකද, පළාත් සභාවේ තිබෙන මුදල් ප්‍රමාණය, ප්‍රමාණවත් නොවන නිසා. විශේෂයෙන්ම දරුවෙක් බිහි කරන්න හදන මාතාවකට, මේ රටට ඒ දරු සම්පත ගෙන එන මාතාවකට විශාල ශක්තියක් ලබා දෙන්න ඒ අවශ්‍ය කරන සියලුම නවීන පහසුකම්වලින් සමන්විත වන ආකාරයේ මාතෘ සායන හැම ගමකම ඇති කළ යුතුයි. මොකද, අපි දන්නවා. අද පෞද්ගලික බෙහෙත් ශාලාවකට ගියොත්, ඒ Clinic එකට සහභාගී වුණොත් ඒ හැම අවස්ථාවකදීම භාවිතා කරන උපකරණ සමහර විට අපේ ගම්වල මාතෘ සායනවල නැහැ. ඒ අවස්ථාවේ අපට සිද්ධ වෙනවා. ඒ මාතෘ සායනයට ගිය මවටත්, ඒ සහාය ලබා ගැනීම සඳහා පෞද්ගලික අංශයට ගිහිල්ලා Scan පරීක්ෂණ ඒ වාගේ දේවල් කරගෙන එන්න කියන්න. ඒ නිසා මම හිතන්නේ අපි විශේෂයෙන්ම අවධානය යොමු කරලා මේ වර්ෂවලදී, ඉදිරි වර්ෂවලදී ඒ සියලු පහසුකම් සහිත නවීන පන්නයේ තාක්ෂණය එක් කළ මාතෘ සායන ගම් මට්ටමින් ඇති කරන්න ඕනෑ කියන එක මම යෝජනා කරන්න කැමැතියි.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හරහා අපේ බස්නාහිර පළාත් සභාව තුළ පවතින දේශීය වෛද්‍ය ආයතනවලින්, රෝහල්වලින් අපි විශාල සේවයක් කරගෙන යනවා. ඒ නිසා ඒ කරගෙන යන කටයුත්ත තවත් දියුණු කරන්න, ඒ වාගේම කොමසාරිස්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයේ අරමුණු ඉෂ්ට කරගෙන ඉදිරියට ගෙනයන්න කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. මොකද, දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව පවතින කටයුතු තව තවත් දියුණු කරගත යුතු වෙනවා. ඒ නිසා එයට අවශ්‍ය කරන සම්පත් ලබා දීලා අපේ රටේ අතීතයේ ඉඳලා ආපු පාරම්පරික වෛද්‍ය ක්‍රමය දියුණු කරලා, ඒ සඳහා අවශ්‍ය කරන නිෂ්පාදන ඇති කරලා, බෙහෙත් වර්ග ඇති කරලා කටයුතු කළ යුතුයි. ඒ සඳහා ශක්තිය ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ පවතින සමාජ සේවා දෙපාර්තමේන්තුව, සමාජ සුභසාධන කටයුතු, කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා විශාල සේවයක් කරනවා. විශේෂයෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා බස්නාහිර පළාත් සභාව තුළ අසරණ පුද්ගලයින් විශාල පිරිසකගේ ජීවිතය නඟා සිටුවන්න කටයුතු කරගෙන යනවා. ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය කරන ආධාර විශාල ප්‍රමාණයක් - තමන්ට තමන්ගේ දෙයක් තනියම කර ගන්න බැරි ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න හැම කෙනෙකුටම මහජන ආධාර ලබා දීම කෙරෙන්නේ මෙම අමාත්‍යාංශයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා පසුගිය වසරවල රුපියල් 150 ට තිබුණු මහජන ආධාරය, අවමය රුපියල් 250 දක්වා ගෙන එන්නත්, උපරිමය රුපියල් 500 දක්වා ගෙන එන්නත් කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා කරගෙන යන වැඩ සටහනුත් ඉදිරියට ගෙනිහිල්ලා, බස්නාහිර පළාත් අමාත්‍යාංශය තුළින් කෙරෙන මේ කටයුතු ගරු ඇමැතිතුමා ඇතුළු නිලධාරීන් මණ්ඩලයට ඉතා සාර්ථකව ඉදිරියට ගෙන යන්න ශක්තිය, ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[ පූ.භා. 11.24 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව ලබා දීම ගැන. සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කථා කළොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කනගාටුවෙන් හෝ කියන්න ඕනෑ. අපේ ඇමැතිතුමාට ලැබෙන ප්‍රතිපාදන කෙසේවත් ප්‍රමාණවත් නැහැයි කියලා. අපි එතුමාට දොස් කියලා වැඩක් නැහැ. හැබැයි එතුමාගේත් රාජකාරියක් තිබෙනවා, ඒ අවශ්‍ය ප්‍රතිපාදන ගරු මහ ඇමැතිතුමාගෙන් හෝ මහ ආණ්ඩුවෙන් ලබා ගන්න. ඒ අවශ්‍ය ප්‍රමාණයට. නමුත් යම්තාක් දුරට අපි සතුටු වෙනවා, 2013 වසරට එතුමාගේ ප්‍රතිපාදන 14% කින් වැඩි වෙලා තිබෙනවා. මම හිතන්නේ රටක සංවර්ධනය මනින ඒකකවලින් බැලුවොත් අධ්‍යාපනයයි, සෞඛ්‍යයි ප්‍රධාන තැනක් ගන්නවා. සෞඛ්‍ය සම්පන්න ජනතාවක් රටේ බිහි වුණේ නැත්නම්, අධ්‍යාපනය හරියාකාරව ලැබෙන ජනතාවක් බිහි වුණේ නැත්නම් මම හිතන්නේ, සංවර්ධනය කියන එක අපට ඉතාමත් අපහසු දෙයක්. විශේෂයෙන් සංවර්ධනය වන රටක් කියලා කියන්න. ඒ නිසා තායිලන්තය වාගේ ගණිකා වෘත්තියෙන් සංවර්ධනය වුණු රටක් නොවෙයි අපට අවශ්‍ය වෙන්නේ. දකුණු පළාතේ මන්ත්‍රීවරයෙක් කරපු ප්‍රකාශයක් ගැන මෙතුමා කිව්වා වාගේ, අපට අවශ්‍ය වෙන්නේ සෞඛ්‍ය සම්පන්න හොඳ උගත් ජනතාවක් බිහි කරන රටක්. සංවර්ධනය වුණු රටක් තමයි අපට අවශ්‍ය වෙන්නේ. ඒක නිසා අපේ ගරු ඇමැතිතුමා විශේෂ කාර්ය භාරයක්

ඉටු කරන්න, මේ රටේ සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහි කරන්න එතුමා ශක්තිය, ධෛර්ය යෙදෙව්වාට එතුමාට අවශ්‍ය ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැ. අපි දන්නවා, දැන් හදිසි අනතුරක් වෙලා රෝහලකට ගියත්, වෛද්‍ය රසායනාගාරයකින් ලේ ටික Check කර ගන්නත් තුණ්ඩුවක් දෙනවා. ඒක රුපියල් 70 ක් විතර වෙන්නේ. ගිහිල්ලා Pharmacy එකෙන් අරගෙන එන්න කියනවා. එවැනි තත්ත්වයක තමයි අද අපේ සෞඛ්‍ය තිබෙන්නේ. ඒක නිසා මම එතුමාට දොස් කියනවා නොවෙයි. නමුත් විශාල වශයෙන්ම අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රෝහල්වල අඩුපාඩු තිබෙනවා. පුංචි පුංචි දේවල් තමයි වැඩියෙන්ම වැදගත් වෙන්නේ. හදිසියක් වෙලා රෝහලකට ගියාම ඒකෙන් කරගන්න බැරි නම්, ශල්‍යකර්මයක් වත් කරන්න බැහැ. මොකද, තමන්ට සීනි තියෙනවාද කියලා සොයා ගන්න ඕනෑ ශල්‍යකර්මයක් කරන්නත්. ඒක නිසා අවශ්‍ය පුංචි දේත් නැත්නම් ඒක විශාල අඩුපාඩුවක්.

ඒ වාගේම මම මීට පෙරත් අපේ සෞඛ්‍ය ඇමැතිතුමාට ප්‍රශ්නයක් මතු කළා. ගම්පහ රෝහලේ පරිසර බලපත්‍රයක් නොමැතිවීම ගැන. මම හිතන්නේ එතුමා ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ගම්පහ රෝහලේ පමණක් නොවෙයි. මම හිතන්නේ අනෙකුත් රෝහල්වලත්, පළාත් සභාවට අයිති සියලුම රෝහල්වල අවශ්‍ය මූලික දේවල් කර ගැනීමට එතුමාට මම හිතන්නේ අවශ්‍ය මුදල් බැලුවොත් - මට මේ හදිසියේ කථා කරන්න වුණේ. මම Calculator යක් හොයා ගන්න

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

බැලුවා. හම්බ වුණේ නැහැ. ඒක නිසා මේ පොතේ කියලා තිබෙන විධියට ලක්ෂ 16 ක ජනතාවක් ජීවත් වන බස්නාහිර පළාතේ වෙන් කරලා තිබෙන්නේ දස ලක්ෂ 6650 යි. මේක බෙදලා බැලුවොත් ඉතාමත් සොච්චමක්. නමුත් අඩුම ගාණේ හදිසියකට ඉස්පිරිතාලයට ගියාම ලේ බලන කට්ට ගන්නත් රුපියල් 80 ක් 90 ක් විතර යනවා. රුපියල් 90 ක් යනවා. ඒකත් අද නැහැ. ඉතින් ජනතාව වෙනුවෙන් වෙන් කරලා තිබෙන මුදල මම හිතන්නේ, ඉතාමත් සුළු ප්‍රමාණයක්. ඔබතුමාට දොස් කියනවා නොවෙයි. නමුත් ඔබතුමාට මීට වැඩිය ප්‍රතිපාදන ලැබිය යුතුයි. අපි කියන්නේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට තමයි ප්‍රධාන වශයෙන් ප්‍රතිපාදන ලැබිය යුත්තේ. ඒක නිසාබස්නාහිර පළාත තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉතාමත් හොඳින්ම තබා ගන්න ඔබතුමාට වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. දේශීය වෛද්‍යවරුන් ගැනත් කථා කළා. ඉතාම හොඳ තත්ත්වයක තිබෙනවා. අපට ඉතාමත් දක්ෂ දේශීය වෛද්‍යවරු ඉන්නවා. නමුත් අවශ්‍ය දේවල් - මම හිතන්නේ, අංග සම්පූර්ණ වෙන්න අවශ්‍ය සියලුම දේ ඒ අයටත් ලැබිලා නැහැ. ඒ නිසා අවශ්‍ය දේවල් ලබා ගන්න ප්‍රතිපාදන ඕනෑ. අපි පාරවල් හැදුවාට, සිංගප්පූරුවක් කරන්න හැදුවාට වැඩක් නැහැ. අපේ ජනතාව ලෙඩින් දුකින් පෙළෙන ජනතාවක් වුණොත්. අපේ අනාගත පරම්පාරවට ඒක එපමණ හොඳ දෙයක් නොවෙයි. අපි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ අපේ ජනතාවගේ අධ්‍යාපනයයි, සෞඛ්‍යයි ගැන බලා ගන්න එක. ඒක නිසා ඔබතුමාට වාසනාව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එතුමාට වාසනාව තියෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වාසනාව නම් තියෙනවා. ඇත්ත. නමුත් මුදල් තමයි නැත්තේ. මුදල් ලබා ගැනීමේ වාසනාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

දේශීය වෛද්‍යවරු අගයන්න වැඩ පිළිවෙළට සල්ලි වෙන් කළා. මේ 31 වෙනිදාට ඔබතුමාත් එන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොහොම හොඳයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඒක අගය කරනවා. නමුත් ඔබතුමා වෙන් කරන මුදල නොවෙයි මම කියන්නේ. ඊට වැඩිය ලොකු මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා මේකට. එතුමාට ආධාර ගන්න පුළුවන් ස්ථාන ගොඩක් තිබෙනවා. මම හිතන්නේ Private NGO හරහා විශාල ආධාර ලබා ගන්න පුළුවන්. මම දන්නේ නැහැ, ඔබතුමා ඒ සම්බන්ධව උත්සාහයක් දරලා තිබෙනවාද නැද්ද කියලා. නමුත් අපි අද මේ රටේ NGO ගැන කථා කරන්නේ වැරැදි විධියට. නමුත් අපි දන්නවා, සිංහ සමාජය සෞඛ්‍ය මෙහෙවරට විශාල සේවයක් කරන බව. සිංහ සමාජය වාගේ ආයතන ඇස් කණ්ණාඩි දෙන්න, වෛද්‍ය සායන කරන්න මේ රටේ විශාල දායකත්වයක් දෙනවා. ඒ නිසා අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්කත් සම්බන්ධ වෙලා මම හිතන්නේ හැකි තරම් උදව් අරගෙන, බස්නාහිර පළාතේ ජනතාවගේ සෞඛ්‍ය නහා සිටුවන්න ඒ දායකත්වය ලබා ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරමින් මම නැවත වරක් ඔබතුමාට මතක් කරනවා. පළමුවෙන්ම අපේ නීති රාමුව ඇතුළේ අවශ්‍ය පරිසර බලපත්‍ර, ඒ සියලුම දේවල් රෝහල්වලට ලබා දීලා අපට තිබෙන රාජකාරිය ඉස්සෙල්ලා ඉෂ්ට කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බස්නාහිර පළාතේ ජනතාව ලක්ෂ 16 ට වඩා ගොඩක් වැඩියි. අද හොඳට කථා කළා. ඊළඟ දවසේ අපට සංඛ්‍යාත්මකව පැහැදිලි කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 07 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ පූ.භා. 11.30 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කථා කරන්නට බලාපොරොත්තුවක් නොතිබුණත්, කථාවක් ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ඒ වාගේම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය කියන්නේ ඉතාම වැදගත් විෂයයක්. ඒ වාගේම අපේ ඇමැතිතුමා ඒක ශක්ති ප්‍රමාණයෙන්, හොඳින් කරන්නට උත්සාහ ගන්නවා. නමුත් තව බොහෝ දේවල් වැඩි දියුණු කර ගත යුතුව තිබෙන බව මම විශේෂයෙන් සිහිපත් කරන්න කැමැතියි. අද අපේ රටේ සෞඛ්‍ය තත්ත්වය බලනකොට සෞඛ්‍ය විෂයය සඳහා විශාල වියදමක් දරන්න වෙලා තිබෙනවා. ඒ වාගේම අද බෝ නොවන රෝග පිළිබඳව ඉතාම නරක තත්ත්වයක් රටේ තිබෙනවා. ඒක මම හිතන්නේ, අතීතයේ ඉඳලා ආපු ආහාර රටාව නිසා ඇති වෙලා තිබෙන දෙයක්. ඒ ආහාර රටාව සකස් කරන්නට, බොහෝ අවස්ථාවලදී රජය උත්සාහ ගත්තත්, ඒවායේ ගැටළු සහගත තත්ත්වයක් තිබුණා. නමුත් මම දැන් එක පැත්තකින් සන්තෝෂ වෙනවා. පාසල්වල දරුවන්ට ක්‍රමානුකූලව කෑම ගේන්න ඕනෑ. එක් එක් දිනයට ධාන්‍ය වර්ග සහ ලෙඩ රෝගවලට තුඩු නොදෙන විධියේ ආහාර චක්‍රලේඛයක් ලබා දෙනවා. මම හිතන්නේ අනාගතයේදී ඒ තත්ත්වය උඩ අපට සතුටු වෙන්නට පුළුවන්, සෞඛ්‍ය තත්ත්වයක් ගොඩ නැගෙයි කියලා. ඒ සඳහා දෙමව්පියන් උනන්දු කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වාගේම රටේ ජනතාව දැනුවත් කරන්න විශාල මුදලක් වෙන් කරලා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මඟින් කරනවා. සමහරු පාන් ගෙඩිය ගණන් යනකොට ලොකු උද්ඝෝෂණ කළත් දැන් මම හිතන්නේ, ඒ උද්ඝෝෂණ කරපු අයටත් වැටහිලා තිබෙනවා, මේ වාගේ ආහාර නිසා අපේ රටට ඇති වෙලා තිබෙන දුර්විපාක. ඒක නිසා ඒ තත්ත්වය ගැන මහජනයා දැනුවත් කරන්නට තව තවත් මහන්සි ගන්නට ඕනෑ කියන එක මම විශ්වාස කරනවා.

ඒ වාගේම සෞඛ්‍ය ගැන කථා කරනකොට කොලොන්නාවේ ජීවත් වන කෙනෙක් හැටියට කුණු ගැන කථා නොකර ඉන්න මට පුළුවන්කමක් නැහැ. මොකද, කොලොන්නාවට විශාල ලෙස වද දෙන කුණු කන්දේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශයත් යම්කිසි දුරකට භාර ගන්න ඕනෑ. මොකද, විශාල ජනගහන ගණත්වයකින් යුත් කොලොන්නාවට අර වාගේ ලොකු කුණු කන්දක් දායාද කිරීම නිසා අපට ඩෙංගු රෝගයෙන් පීඩා විඳින්න සිද්ධ වෙලා තිබෙනවා. ඒවාට අවශ්‍ය කටයුතු සිදු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයටත් මැදිහත් වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. තෙල් ටිකක් ගැහුවාට –

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමියට තෑග්ගක් දීලාද?

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

කුණු තෑග්ගක්. ඒවා තමයි අපට හම්බ වෙන්නේ. ඒ වුණාට අපි ඒවායෙන් අධෛර්යමත් වෙන්නේ නැහැ. කුණු ගොඩේ ඉඳගෙන හරි කරන්න ඕනෑ වැඩ ටික අපි කරනවා. ඒක නිසා මම කියන්නේ, කොලොන්නාව විතරක් නොවෙයි. ලංකාවටම ඒක කරදරයක්. ඒක නිසා මම හිතන්නේ, ඉතා ප්‍රබල විධියට සෞඛ්‍ය අමාත්‍යාංශය වනිතා කටයුතු පැත්ත උපයෝගී කරගෙන මේ පාරට දමන කුණු ටික අඩු කරගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද, මේ කුණුවල තෙත කුණු ඇරුණු කොට, පොලිතීන් වෙනමම ගෙවල්වල එකතු කරන්න ක්‍රමයක් – මම දන්නවා කඩුවෙල මහ නගර සභාවේ ඒ කුණු වර්ග කරන්නේ නැතුව ගන්නේ නැහැ. මම කියනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයත්, පළාත් පාලනයත් මේ සියල්ල එකතු වෙලා එහෙට විතරක් නොවෙයි. මුළු ලංකාවේම පළාත් පාලන ආයතනවලට නීතියක් දාන්න බැහැර කළ යුතු කුණු මොනවාද? නැවත ප්‍රතිචක්‍රීයකරණය කරන්න කොටස් කරලා වෙළඳ පොළට යවන්න පුළුවන් කුණු මොනවාද? මේවා වර්ග කරලා ඒ කටයුත්ත කරන්න. විශේෂයෙන්ම ගෙදර ඉන්න කාන්තාවට යම් බලයක් දීලා, යම් ක්‍රියා මාර්ගයක් හදලා දීලා වැඩ කරන එක තුළින් මේ කුණු ප්‍රශ්නය බොහෝ දුරට අවම කර ගන්න පුළුවන් කියන එක මම විශ්වාස කරනවා. ඒකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් හවුල් කර ගන්න පුළුවන්. තෙතමනය සහිත කුණු පොහොර හදන්න, ප්ලාස්ටික් ටික වෙන් කරලා වෙළඳ පොළට යවන්න, කාඩ්බෝඩ් ටික, කොළ ටික වෙළඳ පොළට යවන්න, වීදුරු කටු ටික මේ හැම දෙයක්ම වර්ග කරනවා නම් මම හිතන්නේ, කුණුවලින් ලැබෙන වදය යම් දුරකට අඩු කර ගන්න පුළුවන්. ඒ නිසා මම සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ ලංකාව පුරා ඒක කරන්න තමුන්නාන්සේට බැහැ. නමුත් අදාළ අංශත් එක්ක සාකච්ඡා කරලා සියලු පළාත් පාලන ආයතනවලට අණ කරන්න. සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ට මේ පිළිබඳව පසු විපරමක් කරන්න කියන්න. කසළ ගෙනැල්ලා පාර මැද්දට හලනවා වෙනුවට, නැත්නම් පළාත් පාලන ආයතනයට වදයක් දෙනවා වෙනුවට ඒක කරන්න. මොකද, ඒක සෞඛ්‍ය කටයුත්තක්. සෞඛ්‍යයටත් ඒක සෘජුව බලපානවා. නැත්නම් ඔය යෝගට් කෝප්ප වාගේ දේවල් කුණු ගොඩට විසි කරනකොට තමයි ඩෙංගු උවදුර ඇති වෙන්නේ. ඩෙංගු උවදුරේ පීඩාව වින්දා මගේ පවුලේ පස් දෙනෙක්. ඒ නිසා මේකේ තිබෙන භයානකකම, ඒ ලෙඩේ හැදුනාම ගෙදර මිනිස්සුන්ගේ තිබෙන මානසික තත්ත්වය, සියල්ල ගැන මට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒක නිසයි මම මේ වාගේ තත්ත්වයකට මේ සියලු දෙනාටම එකතු වෙන්න කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමියට බොහොම ස්තුතියි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

වෙලාව ඉවරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන්න. මේ මොහොත වන විට වේලාව පිළිබඳව මූලාසනයට සැලකිමත් වෙන්න වෙනවා. ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා, පරිවාස හා ළමා රක්ෂක සේවා අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂයේදී අදහස් කිහිපයක් දක්වන්නට ලැබීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අද ආපු ගමන් මන්ත්‍රීවරුන්ගේ ලේ Check කරනවා. ඒ වාගේම කෑද එකක් දෙනවා. අපේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කිව්වා අපේ තියෙන්නේ, වැරැදි ආහාර රටාවක් කියලා. අතීතයේ තිබුණු එක නොවෙයි කියලා. හැබැයි, කැන්ටිමට ගියාම කන්න තියෙන්නේ පාන් පිටි. මේක තමයි තත්ත්වය. ඒ නිසා මම මේ කියන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී අපි වැරැදි ආහාර රටාව පිළිබඳව කථා කරනවා නම්, ඇමැතිතුමා කැද එක දුන්නා වාගේ ඒකත් බැලුවා නම් වටිනවා. ඒ නිසා මම මතක් කරන්න

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

කැමැතියි. මෙතැන බොහෝ දෙනෙක් කිව්වා වාගේ ඇත්තෙන්ම මේ වසරේ සමස්ත අයවැය ලේඛනයෙන් මෙතුමාගේ අමාත්‍යාංශයට 19% ක මුදලක් තමයි වෙන් වෙලා තියෙන්නේ. එහෙම නැත්නම් මිලියන 8003 යි. අපි මෙතුමාට කොපමණ බැන්නත්, කොපමණ දොස් කිව්වත්, ඒක සාධාරණයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. දැන් බලන්න ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අධ්‍යාපන අමාත්‍යාංශය. අධ්‍යාපනයට 54% යි. මුළු Budget එකනේ එතුමාගේ අමාත්‍යාංශයට සම්පූර්ණයෙන්ම 71% ක්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒ වුණාට ඉස්කෝල කඩාගෙන වැටිලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හැබැයි, අපි මතක් කරන්න කැමැතියි. මේ පළාත තුළ අධ්‍යාපනය වාගේ සෞඛ්‍යයත් වැදගත්. එයට හේතුව තමයි. එක පැත්තකින් පාසලකට දරුවෝ යන්නේ. ඒ සමස්ත ජනගහනයෙන් අඩකටත් වඩා අඩුයි. හැබැයි, බස්නාහිර පළාතේ රෝහල්වලට මේ රටේ මේ පළාත තුළ සමස්ත ජනගහනයම සේවාවන් ලබා ගැනීමට එනවා. අපි දන්නවා. ඇමැතිතුමාට උවමනාව තිබෙනවා. එතුමාට හොඳ ලේකම්වරයෙකුත් ඉන්නවා. ඒ වාගේම මේ පළාත තුළ කාර්යක්ෂම පළාත් අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. අනෙක් පැත්තෙන් හොඳ සෞඛ්‍ය සේවා නිලධාරියෙක් සහ පල්ලෙහා ඉන්න සියලුම නිලධාරීන් හොඳ සේවාවක් ලබා දෙනවා, මේ අමාත්‍යාංශය ඉතාම හොඳින් ක්‍රියාත්මක කරන්න. මේ සියලු දෙනාටම මූලික ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හිතුවට කරන්න සල්ලි නැහැ. කරන්න හිතේ තියෙනවා. උවමනාව තියෙනවා. හැබැයි සල්ලි නැතිකම ගැටළුවක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය පිළිබඳව මේ පළාත් සභාවේ අයවැය සකස් කරන වෙලාවේදී මීට වඩා වැඩි සැලකිල්ලක් දක්වනවා නම්, ඒක ජනතාවගේ හිතසුව පිණිස වඩා වැදගත්ය කියලා අපි කල්පනා කරන්නට ඕනෑ. ඒ නිසා මගේ කාලයත් එක්ක මම මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම අපේ තිබෙන රෝහල් පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කළා. අද රෝහල්වල අනන්ත අප්‍රමාණ අඩුපාඩු තියෙනවා. මම පුද්ගලිකව දන්නවා. හෝමාගම රෝහල මේ පළාතේ තිබෙන හොඳම රෝහලක් බවට අද පරිවර්තනය වෙමින් යනවා. ඒ අපේ මැදිහත්වීමට වඩා, පුද්ගලික දානපතියන්ගේ මැදිහත්වීම මත. ඒ නිසා ඒ රෝහලේ අලුත් වාට්ටු සංකීර්ණයක් හැදිලා සම්පූර්ණයෙන්ම අලුත් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේක ආදර්ශයට අරගෙන, තිබෙන මුදල් එක්ක හරි මම හිතන්නේ, ඇමැතිතුමාට පුද්ගලික දානපතියන්ගේ මැදිහත් වීම මත මේ රෝහල් දියුණු කිරීමේ කටයුත්තට මැදිහත් වෙන්න වෙනවා. මේක මේ විධියට වුණොත් අනාගතය තුළ මේ තත්ත්වය බරපතළ කඩා වැටීමකට පත් වෙනවා කියන එක අපි මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම තමයි සමහර රෝහල්වල සිව් කාව එහෙම නැත්නම් ඇස්වලට කාච දාන්න ගිය තැන්වලදී අපි දැකලා තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර වෙලාට සිංහ සමාජවලින් විවිධ දානපතියෝ දුප්පත් මනුස්සයෙකුට ඒ කාචය අරගෙන දුන්නාම, ඒක වෛද්‍යවරයාට ගිහිල්ලා දුන්නාම මේ වෛද්‍යවරයා කියනවා, මේක මට විශ්වාසයක් නැහැ. පුළුවන් නම් අහවල් තැනින් ගිහිල්ලා කාච ගේන්න කියලා. මේ මම ලබපු අත්දැකීමක්. එක්කෙනෙකුට නොවෙයි. දෙදෙනෙකුට නොවෙයි. තුන්දෙනෙකුට නොවෙයි. ඒ නිසා මේ තත්ත්වය ඉතාම බරපතළ විධියට තිබෙනවා. සමහර රෝහල් ඉදිරිපිට Pharmacy තියෙනවා. ඒවායෙන් තමයි ඒ කාචය ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමැතිතුමා වාගේම අදාළ නිලධාරීන් ඉන්නවා. සොයා බලන්නට කියලා පුද්ගලිකව මතක් කරන්න කැමැතියි. ඒ වාගේම අනෙක් පැත්තෙන් මම දන්න විධියට මම දන්නේ නැහැ, නිවැරැදි වෙලා තිබෙනවාද කියලා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් ඉන්නවා. අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාශයට අයිති පාදුක්ක රෝහලේ ශීතාගාරය ක්‍රියාත්මක නොවෙන නිසා සමහර වෙලාට එහෙට ගේන දේහයන් එක්කෝ අවිස්සාවේල්ල රෝහලට යවන්න වෙනවා. එහෙම නැත්නම් හෝමාගම රෝහලට යවන්න වෙනවා. පුද්ගලිකවම අපි දන්නවා. එක දවසක් එහෙම වුණු මරණයක්

පස්සේ ගඳ ගහලා ඒ ගෙදර තියාගන්න බැරුව ඒ වෙලාවේම භූමදානය කරන්න තමයි සිද්ධ වුණේ. මේ පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා වේලාව පිළිබඳව සැලකිලිමත් වුණොත් හොඳයි. මොකද, ඔබතුමා අතේ ගොඩක් ලිපි ද්‍රව්‍ය තිබෙනවා. මම එකඟයි ඔබතුමා ඒවා ඉදිරිපත් කරනවාට.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතාම කෙටියෙන් මතක් කරනවා. මම ඉතාම කෙටියෙන් කියන්නම්. මීගොඩ ආයුර්වේද රෝහලේ බෙහෙත් නිෂ්පාදනාගාරය පිළිබඳව දීර්ඝ කාලයක් සාකච්ඡා තිබුණා. නමුත් ක්‍රියාත්මක වෙලා නැහැ. අනෙක් පැත්තෙන් මීගොඩ අයුර්වේද රෝහල විශාල ඉඩමකින් පරිපූර්ණ වුණු රෝහලක්. මේක අද කැලෑවට ගිහිල්ලා තියෙන්නේ. ඒ නිසා මේ පිළිබඳවත් සොයා බලා කටයුතු කරන්න කියලා ගරු ඇමැතිතුමාට මතක් කරන්න කැමැතියි. අනෙක් එක තමයි, ඉතාම කෙටියෙන් මතක් කරනවා නම් මේ ඇමැතිතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේදී අපි දැකලා තිබෙනවා. දැන් කාන්තා කටයුතු අයිති මෙතුමාට. ඉතින් මේ කාන්තා කටයුතුවල තිබෙනවා, රූපලාවන්‍ය. දැන් මේ අමාත්‍ය මණ්ඩලයේම ඉන්න සමහර ඇමැතිවරු රූපලාවන්‍ය කරනවා. එක්කෝ මම හිතන්නේ, මෙතුමාගේ දුර්වලකමක්. එහෙම නැත්නම් මෙතුමා අමාත්‍යාංශයේ ඒ විෂයය ඒ ඇමැතිවරුන්ට භාර දීලාද දන්නේ නැහැ. දැන් අපි දන්නවා. විශාල රූපලාවන්‍ය වැඩ මුළුවක් ආනන්ද විද්‍යාලයේ කුලරත්න ශාලාවේ තිබුණා. කුලිය රුපියල් 75,000 ක්. මනාලියන් දැක්මක්. ඒ නිසා මේ විකෘති තත්ත්වයකට අමාත්‍යාංශ පත් වෙලාද කියලා අපට එක වෙලාවක හිතෙනවා. එහෙම වෙලා තිබෙනවා නම් - වෙලාවට ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ආවා. ප්‍රකෘති තත්ත්වයට මේක පත් කර ගන්න කියලා අපි මතක් කරන්න කැමැතියි. ඒ නිසා මට වෙලාව නැහැයි කියලා කියන නිසා මම මීට වැඩිය දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. විශේෂයෙන්ම මේ රටේ අධ්‍යාපනය වාගේම වැදගත් අමාත්‍යාංශයක් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය. එය හොඳින් මෙහෙයවන්නට එතුමාට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා ඔබතුමාට විනාඩි 13 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ පූ.භා. 11.47 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමව අද විවාදයට දායක වුණු ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම අද විශේෂ දවසක් ගරු සභාපතිතුමනි. 1988 බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාව පිහිට වූ වෙලාවේ සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු ගරු සුසිල් මුණසිංහ මැතිතුමා පසුගියදා අභාවප්‍රාප්ත වුණා. අද දවසේ තමයි හත් දවසේ දානය සහ එම පුණ්‍ය කර්ම යෙදිලා තිබෙන්නේ. එදා මෙදා කාලය තුළ බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යවරුන් 10 දෙනෙක් මේ සභාවට සේවය කර තිබෙනවා. අවසාන වශයෙන් මට පෙර ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

සුසිල් මුණසිංහ ගරු අමාත්‍යතුමාට පස්සේ අපේ සෙල්ලසාමි මැතිතුමා.

මහින්ද සමරසිංහ මැතිතුමා.

ලෝරන්ස් මාදිවල මැතිතුමා.

ප්‍රේමරත්න ගුණසේකර මැතිතුමා.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය.

මොරිස් රාජපක්ෂ මැතිතුමා.

ලක්ෂ්මන් අබේගුණරත්න මැතිතුමා.

නන්දන මෙන්ඩිස් මැතිතුමා.

වත්මන් ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගෙන් පසුව තමයි මේ අමාත්‍යාංශයේ රාජකාරී මා වෙත පැවරුනේ. මේ හිටපු සියලුම සෞඛ්‍ය අමාත්‍යවරුන්ට, මෙතෙක් මේ පළාතේ සෞඛ්‍ය කටයුතු මෙහෙය වීමට දැරූ වෙහෙස මහන්සිය සහ කැපවීම්වලට ඔවුන්ට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද දවස ඉතාමත්ම සමබර විවේචනයට මට ඇහුම්කන් දෙන්න ලැබුණේ, අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමාගෙන්. එතුමා තමයි ඉතාම සමබර විවේචනය මා වෙත ඉදිරිපත් කළේ. ගරු සභාපතිතුමනි, මට විටෙක දුක හිතුනා. කනගාටු හිතුනා. මොකද හේතුව, එතුමාගේ බිරිඳ බස්නාහිර පළාත් සභාවේ සේවය කරන වෛද්‍යවරියක්.

ගරු සභාපතිතුමනි, ලංකාවේ පමණක් නොවෙයි. රටවල් කිහිපයක මා මේ විෂයය බද්ධ කාරණාවන්හි අවශ්‍ය කටයුතු සඳහා සංචාරය කර තිබෙනවා. ඒ සෑම රටකම ග්‍රාමීය මට්ටමේ ඉඳලා නාගරික පරිසරය දක්වා විවිධ තරාතිරම්වල රෝහල්, ආරෝග්‍යශාලා පවත්වාගෙන යනවා. කිසිම රටකට පුළුවන් වෙලා නැහැ කොළඹ මහ රෝහල තත්ත්වයේ රෝහල්, ගමේ පවත්වාගෙන යන්න. මේක ඉතා සරල, බාලාංශ පන්තියේ දරුවෙකුට තේරුම් ගන්න පුළුවන් කාරණාවක්.

ගරු සභාපතිතුමනි, කොළඹ මහ රෝහල වාගේ රෝහලක් අගලවත්තේ පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා අගලවත්තට ගැළපෙන ග්‍රාමීය රෝහල් පද්ධතිය සහ එක එක වර්ගීකරණය කරපු රෝහල් පද්ධති කිහිපයක් අපට තිබෙනවා. ඒ ඒ ආයතනවලට ගැළපෙන ආකාරයෙන් පහසුකම් සපයනවා. අගලවත්ත පාලින්දනුවර ග්‍රාමීය රෝහලේ රෝගියෙක් හදිසියේ ගහකින් ඇදගෙන වැටිලා, හදිසි අනතුරකට භාජනය වෙලා රෝහල්ගත කළාට පස්සේ ඒ රෝහල ඒ රෝගියාගේ ජීවිතේ බේරාගන්න ඊළඟ ඉහළ සේවා සැපයීම් කළ හැකි රෝහලට රෝගියාව කඩිනමින් රැගෙන යෑම අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහ විශාල වගකීමක්. ඒ නිසා ග්‍රාමීය පරිසරයට අවශ්‍ය කරන පහසුකම් දෙන්න ඕනෑ. ඊට අවශ්‍ය කරන ගිලන් රථ දෙන්න ඕනෑ. අපි ගිලන් රථ මිලදී ගත්තේ අවුරුදු 20 කට පස්සේ. ගරු සභාපතිතුමනි, මට හරි පුදුමයි. මේ කථා කරන වචන දේශපාලනික වශයෙන් ද්වේශ සහගතව කථා කරන්න වචන නැතුවාට කථා කරන වචනද, එහෙම නැත්නම් සද්භාවයෙන් යුතුව මේ සෞඛ්‍ය නඟා සිටුවීම සඳහා කරන විවේචනද කියන එක පිළිබඳව මට දැවැන්ත ගැටළුවක් මතු වුණා. ගරු සභාපතිතුමනි, මේ සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ, සේවය කරලා දිව්‍ය ලෝකේ යන්නත් පුළුවන්. පැත්තකින් ඉඳලා හොට

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

දාලා අපායේ යන්නත් පුළුවන් විෂයයක්. මම හිතන්නේ මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා නම් නිත්‍ය වශයෙන්ම දිව්‍ය ලෝකේ යනවා. මේ කරපු විවේචනයට සාපේක්ෂව. එතුමා ඉතාමත් සාධාරණ විවේචනයක් කළේ. එතුමා කළ විවේචනය පිළිබඳව මම එතුමාට හිස නමා ආචාර කරනවා. සෞඛ්‍ය විෂයයේ අභිවෘද්ධිය වෙනුවෙන් කළ යෝජනාව පිළිබඳව.

ගරු සභාපතිතුමනි, මේ විෂයය පද්ධතිය පිළිබඳව කථා කරනවා නම්, අපට පොදුවේ මතු වුණු කාරණා තමයි ඩෙංගු රෝගය පාලනය කර ගන්න බැරි වුණු නිසා බස්නාහිර පළාතේ ඩෙංගු ආපදාව දැඩි ලෙස වර්ධනය වෙමින් තිබෙනවා කියන චෝදනාව. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ කිසිම පළාත් සභාවකට මේ පළාත් සභාවේ සේවය කරන සේවක මණ්ඩලයට, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට ඉන් පල්ලෙහා සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට මේ ඩෙංගු මර්දනය කරන්න එහෙම නැත්නම් මේ වාගේ මහජන පීඩාවක් පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය කරන නෛතික බලය පැවැරී තිබුණේ නැහැ. බස්නාහිර පළාත තමයි ප්‍රථම වතාවට 2012 අංක 03 දරණ මහජන පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය සම්මත කළේ. මේ ප්‍රඥප්තිය තුළින් සෘජුවම අපි අපේ නිලධාරීන්ට බලය පැවරුවා. නීත්‍යානුකූල බලතල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒ රාජකාරිය කරන්න අවශ්‍ය බලය. දැන් ඒ නිලධාරීන් සේවය සඳහා යෙදිලා ඉන්නවා. පුංචි පුංචි අඩුපාඩුකම් පිළිබඳව එස්. රාජේන්ද්‍රන් ගරු මන්ත්‍රීතුමා එහෙම මතු කළා. ඒවා සිදු නොවන කාරණා නොවෙයි. වෙන්න පුළුවන්. නමුත් සමස්තයක් වශයෙන් මේ ක්‍රියාවලිය සක්‍රීය කරමින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පීඩා වැළැක්වීම සඳහා අවශ්‍ය කරන පූර්ණ බලය ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට බස්නාහිර පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරයි කියන එක මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් කාර්ය භාරය මා හොඳින් දන්නවා. ආණ්ඩු පක්ෂයට තියෙන්නේ වැඩ කරන්න. විපක්ෂයට තියෙන්නේ අඩුපාඩු විවේචනය කරන්න. ඒ නිසා මට හොඳ නොකිව්වාට මගේ කිසිම අමනාපයක් නැහැ. ඔවුන් ඒ කාර්ය භාරය ඉෂ්ට කිරීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා දැන උගත් විපක්ෂයේ නායකයෙක් හැටියට මම එතුමාට ගරු කරනවා. එතුමා මට කිව්වා කෙලින් කන්ද ප්‍රදේශයේ සායනය හදා ගන්න බැරුව බස්නාහිර පළාත ලත වෙනවා කියලා. එතුමා මට සායන දෙකක් නම් කළා. ගරු සභාපතිතුමනි, කෙලින් කන්ද සායනයේ වැඩ කටයුතු 70% ක් වැඩ අවසන් කරලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ BSDG අරමුදලෙන් මිලියන 3.2 ක් වෙන් කරලා තිබෙනවා. සම්පූර්ණයෙන් වැඩ අවසන් කරන්න. මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් ඒකේ වැඩ අවසන් කරලා තමුන්නාන්සේලාට භාර දෙනවා. ඊළඟ කාරණාව ලෙස කිව්වා, මොරපිටිය සායනය පිළිබඳව. මොරපිටිය එතුමා නම් කළේ පාලින්දනුවර කියලා. මම හිතනවා මොරපිටිය සායනය කියලා. මහ නැඟුම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 2.2 ක මුදල් වෙන් කරලා තිබෙනවා. මේ වර්ෂය අවසන් වනකොට ඒ සායනයේ වැඩත් නිම කරලා භාර දෙන්න පුළුවන්කම තිබෙනවා. මේ සායන දෙක පිළිබඳව එතුමා කිව්වා. එතුමාගේ අනෙක් තදබල විවේචනය වුණේ, පළාත් සභාවට මේ රෝහල් පද්ධතිය පවත්වාගෙන යාම කළ හැක්කක් නොවෙයි. මේක මධ්‍යම රජය විසින් කළ යුත්තක්. බලය විමධ්‍යගත කිරීම පිළිබඳව එතුමාගේ තිබෙන අර්බුදය, ප්‍රශ්නය, පළාත් සභා ක්‍රමය නොගැළපෙනවාය කියන ප්‍රශ්නය මගේ අමාත්‍යාංශය තුළින් විසඳා ගන්න උත්සාහ ගැනීම ගැන මම කනාගාටු වෙනවා. මොකද, හේතුව මුදල් ප්‍රශ්න

පිළිබඳව මම කථා කරන්නේ නැහැ. මට ලැබුණු මුදල් ප්‍රමාණයෙන් හැකි ප්‍රමාණයක වැඩක් කිරීම, එයින් වැඩි යමක් කරන්න පුළුවන් නම් ඒක කරන්න උත්සාහ දැරීම තමයි මගේ ප්‍රතිපත්තිය. ඒ නිසා මට ඒ පිළිබඳව අභ්‍යන්තර විවේචනයක් කරන්න, පොදු විවේචනයක් කර ගැනීමේ කිසිදු අවශ්‍යතාවයක් නැහැ. කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, දැන් මේ දවස්වල කථා කරන ප්‍රධාන කාරණාව වුණේ, 71% ක් මැරෙන්නේ බෝ නොවන රෝගවලින්. බස්නාහිර පළාත් සභාවේ තමයි දැන් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 28% ක් ඉන්නේ. එතකොට දැන් බස්නාහිර පළාත තුළ මේ මරණ සංඛ්‍යාව අවම කර ගන්න, අංශභාගය හැදෙන, හෘදයාබාධ වැළදෙන, දියවැඩියාව වැළදෙන, අධි රුධිර පීඩනයෙන් රෝගාතුර වන රෝගීන් සඳහා මොනවාද කළේ? ගරු සභාපතිතුමනි, මගේ ළඟ තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ගරු අමාත්‍යතුමා ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, ලබන වර්ෂය ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග සඳහා විශේෂව කටයුතු කළ යුතු වර්ෂය හැටියට.

*"මදුරු ගහණය සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් වසංගත සේ පැතිරී යන ඩෙංගු වැනි රෝග තත්ත්වයන් පාලනය කරනු වස් පවත්වන මදුරු මර්දන දින පහක් දෙසැම්බර් මස 11 වැනි දින සිට 15 වැනි දින දක්වා ජාතික සෞඛ්‍ය සතියට සමගාමීව ක්‍රියාත්මක වේ."*

ඊළඟට කියලා තිබෙනවා,

*"ප්‍රධාන සෞඛ්‍ය ගැටළුවක් වන බෝ නොවන රෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමද, රෝගී තත්ත්වයට ගොදුරු වීම වළක්වා ගැනීමද මෙම සෞඛ්‍ය සතියේ අරමුණ"* කියලා.

ගරු සභාපතිතුමනි, උත්තම පූජා ව්‍යාපෘතිය යටතේ, බෝ නොවන රෝග පිළිබඳව පළමුවැනි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ, බස්නාහිර පළාත් සභාව කියන එක මම ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම ඩෙංගු රෝගය මර්දනය කරන්න අවශ්‍ය නෛතික ප්‍රතිපාදන පළමු වතාවට පළාත් සභාවක් හැටියට ශ්‍රී ලංකාවේ හඳුන්වා දුන්නේ, බස්නාහිර පළාත් සභාව කියන එකත් මම සිහිපත් කරනවා. මට කනගාටුයි. මටත් හිතුනා පොඩ්ඩක් මැරිලා බලන්න. මොකද, හේතුව, ලංකාවේ මිනිස්සු මැරුණු මිනිස්සුන්ට විතරයි හොඳ කියන්නේ. ලංකාවේ ප්‍රජාව මළ ගෙදරදී තමයි හොඳ ගුණ වර්ණනාවක් කරන්නේ. ජීවත් වෙලා ඉන්නකල් මුහුණට මුහුණ කථා කරලා හොඳ කථා කරන්න ශ්‍රී ලංකාවේ ප්‍රජාවට එපමණ පුරුද්දක් නැහැ. අපි මේ අපේ තිබෙන සීමිත සම්පත් තුළ අප කරගෙන යන ක්‍රියාවලිය - ගිය අවුරුද්දේ ගිලන් රථ 10 ක් දුන්නා. මේ අවුරුද්දේත් 10 ක් දෙනවා. මේ ගිලන් රථ දෙන්නේ, මිනිස්සුන්ගේ ජීවිත බේරාගන්න. එහෙම නැතුව ගිලන් රථ ප්‍රදානය කරන්නේ මිනිස්සු වළපල්ලට එක්කරගෙන යන්න, මෝචරියට එක්කරගෙන යන්න, සුසාන භූමියට එක්කරගෙන යන්න නොවෙයි. මිනිස්සුන්ගේ හදිසි අවස්ථාවකදී, ආපදාමය තත්ත්වයකදී ඒ මනුස්සයාගේ ජීවිතය ගොඩ ගන්න. මේ කියන්නේ, සෞඛ්‍ය සේවා පහසුකම් නැති නිසා. ගරු සභාපතිතුමනි, අපේ රෝහල්ගත වන රෝගියාට සමහර විට ශරීරගත කරන එන්නතේ වටිනාකම රුපියල් එක්ලක්ෂ හැටපන්දාහයි. දෙකයි විස්සයි. ඔහොම තමයි ගණන් මිනුම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

Pharmacy එකෙන් තමයි ඒවා ගන්න වෙන්නේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඉන්ජෙක්ෂන් එක දන්නේ නැහැ. නමුත් ප්‍රෙෂර් එකට දෙන, දියවැඩියාවට දෙන ශත 10, 15 පෙත්ත නැති වෙලා මේක Pharmacy එකෙන් ගන්න කිව්වොත් එහෙම මේ පිළිබඳව තමයි කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, අසල්වැලි රාජ්‍ය ඉන්දියාව. ඉන්දියාවේවත් නිදහස් සෞඛ්‍ය සේවය නැහැ. මම පසුගිය දවසක මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ආයතන කිහිපයක් සමග එහි ගොස් ඒ රෝහල් දුටුවා. ඒ රෝහල් පද්ධතිය තුළ කිසි තැනක අපේ තිබෙන නිදහස් සෞඛ්‍ය සේවය පවත්වාගෙන යන්නේ නැහැ. චීනයට ගියාම චීනයේ ෂැංහයි නගරයේත්, බීජිං නගරයේත් රෝහල් හයකට ගියා. එක රෝහලකවත් නිදහස් සෞඛ්‍ය සේවය නැහැ. රෝහල ඉදිරිපිට අනතුරක් සිද්ධ වුණත්, ඒ අනතුර වුණු රෝගියා රෝහලට ගෙනාවට පස්සේ එයා ළඟ සෞඛ්‍ය රක්ෂණ සහතිකය නැත්නම් එයාට ප්‍රතිකාර නැහැ. නමුත් ශ්‍රී ලංකාවේ මේ දෙන සේවය මේ තරම් පහත් කොට සලකා විවේචනය කිරීම පිළිබඳව අතිශයින්ම කනගාටු වෙනවා. ගරු සභාපතිතුමනි, නොතේරෙන පුංචි දරුවෝ කියනවා නම් මේවා විඳ දරා ගැනීමේ හැකියාව හොඳටම තිබෙනවා. මම විටින් විට නැවත නැවතත් කියන්නේ, වෛද්‍යවරියකගේ පහස ලබන පුද්ගලයෙකුගේ මුවින් මේක පිටවීම තමයි කනාගටුදායක සිද්ධිය. ගරු සභාපතිතුමනි, මම විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ ආණ්ඩු පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් මට දෙන සහයෝගය පිළිබඳව මගේ ගෞරවාදර ස්තූතිය පුද කරනවා. ඒ වාගේම මේ තිරයෙන් පිටුපස ඉන්න මගේ නිලධාරීන් කණ්ඩායම, අමාත්‍යාංශ ලේකම්තුමා, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු ඒ සේවක කණ්ඩායම දහසක් දෝෂාරෝපණ, ගර්ජන, ගැරහුම් මැද්දේ ඔවුන් කරන සේවාව පිළිබඳව ඔවුන්ට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරමින් ලබා දීපු අවස්ථාව පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***පූ.භා. 11.59 ට, අංක 105, 116, 117, 118, හා 119 යන ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව අවසාන විය.***
*Discussion on the Expenditure Head Nos 105, 116, 117, 118 and 119 Was concluded at 11.59 a.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සහ සභා කටයුතු

අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 105, 116, 117, 118 සහ 119 වැය ශීර්ෂයන්ට අදාළව පැවැති විවාදය මෙයින් අවසන් වෙනවා. මේ පිළිබඳව සභාවේ බෙදීමක් පවතිනවාද?

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් පවතිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව,***

***ශීර්ෂ අංක 105 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 65 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount stated at Head No. 105 should be approved was put and the Committee of the Whole Council was divided under Rule 61 (3) as 65 for, 22 against, 00 decliners.*

***ශීර්ෂ අංක 116 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 65 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount stated at Head No. 116 should be approved was put and the Committee of the Whole Council was divided under Rule 61 (3) as 65 for, 22 against, 00 decliners.*

***ශීර්ෂ අංක 117 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 65 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount stated at Head No. 117 should be approved was put and the Committee of the Whole Council was divided under Rule 61 (3) as 65 for, 22 against, 00 decliners.*

***ශීර්ෂ අංක 118 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 65 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount stated at Head No. 118 should be approved was put and the Committee of the Whole Council was divided under Rule 61 (3) as 65 for, 22 against, 00 decliners.*

***ශීර්ෂ අංක 119 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 65 යි, විරුද්ධව 22 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount stated at Head No. 119 should be approved was put and the Committee of the Whole Council was divided under Rule 61 (3) as 65 for, 22 against, 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂයෙන්ම ගරු සෞඛ්‍ය අමාත්‍ය ජගත් අංගගේ මැතිතුමා "*සෞඛ්‍ය සම්පන්න ජාතියක්, සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් තුළ නිරෝගී මිනිසුන් බිහි කරමු*" යන මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ, බෝ නොවන රෝග පිළිබඳ පොත් හයකුත්, පෝෂණය පිළිබඳ පොතකුත් ලබා දීලා තිබෙනවා. මම හිතන්නේ මන්ත්‍රීතුමන්ලාටත් ලැබිලා ඇති. ඉතාමත්ම වැදගත්. නිර්මාණශීලී පොත් ටිකක් ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා මේ අවස්ථාවේදී සියලුම පොත් ලබා දීම පිළිබඳව, ඒ පොත් කට්ටල නිර්මාණය කිරීමේදී ගරු ඇමැතිතුමා, ලේකම්තුමා ඇතුළු සහාය වූ සියලුම අයට පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේත් ගෞරවය මම මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

| | |
|---|---|
| **ශීර්ෂ අංක107** | **ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක 122** | **මෝටර් රථ ප්‍රවාහන දොපර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 123** | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක 103** | **සමූපකාර සේවක කොමිෂන් සභාව** |
| Head No: 107 | Ministry of Transport, Sports and Youth Affairs, Arts and Cultural Affairs, Co-operative Development, Food Supplies and Distribution and Rural Development |
| Head No: 122 | Department of Motor Transport |
| Head No: 123 | Department of Co-operative Development |
| Head No: 103 | Co-operative Employees' Commission |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, අහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශීර්ෂවලින් රුපියල් 10/- බැගින් කපා හැරිය යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම වැය ශීර්ෂයන් පිළිබඳ අදහස් දැක්වීමට විපක්ෂය වෙනුවෙන් ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 12.09 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට මා ඉතාම ස්තුතිවන්ත වෙනවා. ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය තුළ පසුගිය කාලයේ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් සහ නව සමූපකාර ප්‍රඥප්තියක් සම්මත කරන්නට මේ සභාවට හැකියාවක් ලැබුණා. ඒ පිළිබඳව ගරු ඇමැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම වර්තමානයේ නිරන්තරයෙන්ම අපට මේ අමාත්‍යාංශය පිළිබඳව විවිධ සමාජයීය වශයෙන් නොයෙක් කටයුතු පිළිබඳව ඇහෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශය ගැන නිතරම සුභදායී නොවෙයි, අසුභදායී ආරංචි තමයි ලැබෙන්නේ. ඒ වාගේම සමූපකාර ව්‍යාපාරය පිළිබඳව කථා කරනකොට මේ සභාවේදී මම මීට කලිනුත් මතක් කළා. සමූපකාර ව්‍යාපාරය, විශේෂයෙන්ම එතුමාගේ අවධානය මීට වඩා යොමු කරන්න ඕනෑ ව්‍යාපාරයක් වුණත්, රේඛීය අමාත්‍යාංශයෙන් යම් යම් දේවල් සිද්ධ වන නිසාද මම දන්නේ නැහැ, සමූපකාර ව්‍යාපාරය අද අඩාල වීමේ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම රජය ගත්තු වැරැදි තීරණ නිසා අද සමූපකාර සමිතිවල පාරිභෝගික අංශය ශුද්ධ පාඩුවක් හැටියට, විශාල පාඩුවක් හැටියට යන එකෙන් කාරක ප්‍රාග්ධන ඌනතාවයක් ඇති වෙලා තිබෙනවා. ඒක නැහැයි කියලා කාටවත් කියන්න බැහැ. ඒ නිසා විශේෂයෙන්ම සමූපකාර පාරිභෝගික අංශය පිළිබඳව ගරු ඇමැතිතුමාගේත්, දෙපාර්තමේන්තුවේත් අවධානයට යොමු කරන්න මම කැමැතියි. එතුමා උත්සාහ කළත්, ඒ පාරිභෝගික අංශයේ සිදු වෙලා තිබෙන සිදුවීම් දිහා බැලුවාම අපට කනාගටුදායක තත්ත්වයක් ඇති වෙනවා. මේ ව්‍යාපාරය තුළින් නිර්මාණය වුණු පුද්ගලයෙක් හැටියට මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද උදේ ප්‍රවෘත්තිවලින් මට අහන්න ලැබුණා, කඩුවෙල මහ නගර සභාවේ සභාපතිතුමා හේවාගම් කෝරළයේ සමූපකාර සමිතියේ සිදු වෙලා තිබෙන වංචාවක් පිළිබඳව. ලක්ෂ 26 ක මූල්‍ය වංචාවක් හැටියට ඒ ප්‍රවෘත්තිය ගියේ. ඒ කියන්නේ සෝලා යන්ත්‍ර මිලදී ගැනීමේදී හරියට මිලදී ගැනීම් සිදු නොවුණු නිසා ඒ බඩු තොගයම ගබඩාකරණය කරලා තිබෙන්නේ ලක්ෂ 26 කට. මහ නගර සභාවේ නගරාධිපතිතුමා ගිහිල්ලා ඊයේ නිරීක්ෂණය කරලා අද ප්‍රවෘත්තිවල දාලා තිබුණා. ඒ සම්බන්ධව ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ වාගේ සමූපකාර සමිතිවල තවමත් ඒ අඩුපාඩුකම් තිබෙනවා. අලුත් ප්‍රඥප්ති සම්මත වුණත්, තවමත් අපි දේශපාලනීකරණය දිහා බලනකොට ඡන්දය පැවැත්වුවත් මහ සභාවලට ඒ අවස්ථා අහිමි වන තත්ත්වයක් තවමත් තිබෙනවා. ඒ නිසා ප්‍රමාද වෙලා හරි කමක් නැහැ. ගරු සභාපතිතුමනි, එතුමා ඡන්දය පැවැත්වීම් කටයුතු කළා. විශේෂයෙන්ම බේරුවල. අපි ඉල්ලීම් කරලා අවුරුදු 2 1/2 කට පස්සේ හරි කටයුතු කිරීම පිළිබඳව එතුමාටත්, කොමසාරිස්තුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ අතරතුර සභාපතිවරයෙකුත් පත් කරලා, අධ්‍යක්ෂ මණ්ඩලයට තවත් තුන් දෙනෙක් පත් කරලා තිබෙනවා. එහෙම නම් ප්‍රජාතන්ත්‍රවාදී සමූපකාර ව්‍යාපාරය තවදුරටත් පවත්වාගෙන යන්න, ප්‍රජාතන්ත්‍රවාදී විධියට ඒ මහජන නියෝජිතයාට අපි ඉඩ දෙමු. එතැන අලියාගෙන්, පුටුවෙන්, බුලත් කොලයෙන් කවුරුත් ඉදිරිපත් වෙලා නැහැ. ගමේ ප්‍රාදේශිකවලට ඒ අවස්ථාව දෙන ගමන්ම නැවත නැවතත් පුන පුනා කියනවා, පාරිභෝගික ජනතාවගේ භාණ්ඩ බෙදා හැරීමේ සේවාව මීට වඩා පුළුල් වෙන්න ඕනෑ. හැම සමූපකාර සමිතියක්ම වත්කම් ඌනතාවයත් එක්ක, ඒ වාගේම අයිරාවෙන් පාරිභෝගික අංශය සම්පූර්ණයෙන් පවත්වාගෙන යනවා. ග්‍රාමීය බැංකු අංශය මුදල් පරිහරණය කරනවා. ග්‍රාමීය බැංකු අංශයේ මුදල් යොදවා ගැනීමෙන් වෙන්නේ පොදු ජනතාවගේ මුදල්වලට විශාල හානියක්. විශ්වාසයක් නැති වන තත්ත්වයක් උදා වෙනවා.

ඒ නිසා නැවත වරක් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. ඒ වාගේම සණස සමිති සම්බන්ධව, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සම්බන්ධවත්, දිස්ත්‍රික් බැංකු සම්බන්ධවත්, වෙස්කෝ ආයතනය සම්බන්ධවත් මතක් කරන්න ඕනෑ. වෙස්කෝ එකට හැම දෙයක්ම පවරලා. ක්‍රීඩා භාණ්ඩ සැපයීමත් පැවරුවාම වැඩක් වෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. එතැන බඩු ගේන්න ගියාම ඒ අය දෙන්නේ, මම හැමදාම පුන පුනා මේ සභාවේ කියනවා. ඒ චිට් එක දෙනවා, අහවල් තැනට ගිහිල්ලා බඩු ගන්න කියලා. ඒ ක්‍රමය වෙනස් කරලා අපට යම් මූල ධනයක් සොයා ගන්න පුළුවන් නම්, ප්‍රාග්ධනයක් සොයා ගන්න පුළුවන් නම් අඩු තරමින් අපට හැකියාව තිබෙනවා යම් යම් භාණ්ඩ මිලදී ගැනීම් කරන්න. ජාතික සමූපකාර මණ්ඩලයට කාලයක් හැකියාව තිබුණා, ඒ භාණ්ඩ මිලදී අරගෙන බෙදා හැරීම් කටයුතු කරන්න. නැවත වරක් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ගමේ නිෂ්පාදන මිලදී ගෙන ඒ ප්‍රාදේශික මට්ටමෙන් අලෙවිකරණයක් ආරම්භ කරන්න පුළුවන් නම් විශේෂයෙන්ම එය ගමේ පාරිභෝගික ජනතාවට විතරක් නොවෙයි, නිෂ්පාදන අලෙවිය. ඒකයි පරමාර්ථය වෙලා තිබුණේ. ඒකයි විවිධ සේවා සමූපකාර සමිති ක්‍රමය ඇති කළේ. එහෙම නම් ඒ කටයුත්තටත් ඔබතුමාගේ මාර්ගයෙන් අවධානයට යොමු කරන්න ඕනෑ. ඒ වාගේම සමූපකාර ව්‍යාපාරය තුළ මීට වඩා යම් ප්‍රගතියක් දකින්න අවශ්‍ය නම් මේ සමූපකාර ව්‍යාපාරය ඒකාබද්ධ වැඩ පිළිවෙළක් හැටියට යා යුතුයි. කලින් යෝජනා වුණා. අරමුණු ඇති කළත් ඒ අරමුණෙන් බැහැරව අපි තවමත් ඉන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා භාණ්ඩ මිලදී ගැනීම විතරක් නොවෙයි. බෙදා හැරීම්, ඒ වාගේම නිෂ්පාදන මිලදී ගැනීම්, විශේෂයෙන්ම සහල් නිෂ්පාදනයේදී තවමත් අපට ගැටළු මතු වෙලා තිබෙනවා. සමූපකාර සමිතිවල තිබෙනවා. අපි කොහෙන් හරි ගේන එක තමයි විකුණන්නේ. ගමේ නිෂ්පාදකයාගේ වී ටික මිලදී අරගෙන සමූපකාර සමිතිය මගින් නිෂ්පාදනය කරලා එය අලෙවි කරන්න

පුළුවන් නම් ගමේ ගොවියාට කරන ලොකුම රුකුලක් හැටියට මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා කටයුතු පිළිබඳව වචනය කිහිපයක් කථා කරන්න ඕනෑ. ක්‍රීඩා කටයුතු ජාත්‍යන්තර මට්ටමින්, පළාත් මට්ටමින්, මොනවා වුණත් අපි මෙවර බස්නාහිර පළාතේ දෙවැනි තැනටද කොහේද ආවේ.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

නැහැ, නැහැ. පළමුවෙනියා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ඒ නිසා ක්‍රීඩා -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අපි පළමු තැනට ආවේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

පිළිගන්නවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තනි තරග ඔක්කෝම අපි පරාදයි. කණ්ඩායම් තරගවලින් විතරයි දිනුවේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සාමූහිකව ආවත් - ඒකයි මම කිව්වේ. එහෙම නම් ක්‍රීඩා අංශය පිළිබඳව, ඔබතුමා ක්‍රීඩා භාණ්ඩ බෙදුවාට මදී. මේ ක්‍රීඩා පුහුණු කිරීම් ඒකක මීට වඩා ශක්තිමත්ව ක්‍රමවත්ව පිහිටුවන්න පුළුවන් නම්, ඒ අයට අවශ්‍ය පුහුණුව නිසි ලෙස ලබා දෙන්න පුළුවන් නම්, ඔවුන් ශාරීරික වශයෙන් ලබා ගන්නා ආහාර පාන, විටමින් හරියට ලබා දෙන්න පුළුවන් නම් අපට පුළුවන් වෙයි හොඳ දක්ෂ ක්‍රීඩකයෝ බිහි කරන්න. ඒ වාගේම ක්‍රීඩා පිටි සකස් කිරීමේදීත් මීට වඩා අවධානය යොමු වෙනවා නම් වඩාත් හොඳයි. ග්‍රාමීය ක්‍රීඩා පිටි පිළිබඳව. වොලිබෝල් ක්‍රීඩාව තිබෙනවා. ෆුඩ්බෝල් ක්‍රීඩාව තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි. මේ ක්‍රීඩාව තුළ ගැන විවිධ අංශ ඇති කරගෙන පොදු අභ්‍යාස මධ්‍යස්ථාන, පුහුණු කිරීම් මධ්‍යස්ථාන සම්බන්ධව අවධානය යොමු කරන්න කැමැතියි. නමුත් මේ ඔක්කෝම කථා කළාට ඔබතුමාගේ අමාත්‍යාංශයට ලැබිලා තිබෙන්නේ 2.6% යි. ප්‍රාග්ධන වියදමත්, පුනරාවර්තන වියදමත් දෙකම. කරන්න දෙයක් නැහැ. ලැබෙන දේ කාලා, වෙන දෙයක් බලාගෙන, තිබෙන ප්‍රමාණය තුළ තමයි ඔබතුමාට කටයුතු කරන්න වෙන්නේ. අපි එය පිළිගන්නවා. තර්කයක් නොවෙයි. මම හිතන විධියට ඔබතුමා කැමැතියි අපි මේ අඩුපාඩුකම් පෙන්නුම් කරලා දෙන එකට.

ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කළොත් හැමදාම ලොකුම ලෙඩක්. හරිම හිසේ ඇම්මක්. කරදරයක්. ප්‍රවාහන අංශයේ මාසයකට ස්ට්‍රයික් දෙකක් තුනක් යනවා. විවිධ හේතුන් දක්වනවා. විවිධ කට කථා යනවා. ප්‍රචාර යනවා. ඒ කේසේ වෙතත් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රවාහන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙන්න මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් නම්, හැමදාම පුද්ගලික බස් රූට්වල ප්‍රශ්න මතු වන එක විසඳන්න පුළුවන් නම් හොඳයි. ප්‍රශ්න මතු වෙන්නේ, රූට් පර්මිට් එක දීම සම්බන්ධව. ඒ නිසා කමිටුවක් පත් කරලා, ඒ පාරවල් හඳුනාගෙන, ඒ පාරවල්වල අවශ්‍යතාවය ගැන කල්පනා කරලා ඒ බලපත්‍ර නිකුත් කිරීම යම් ඒකකයකට සම්බන්ධව සිදු කරනවා නම් ගැටළු අඩු වෙනවා. ඒකයි අද තිබෙන ලොකුම ගැටළුව. ඔබතුමාටත් චෝදනා එනවා. නිලධාරීන්ටත් චෝදනා එනවා. සභාපතිටත් එනවා. ඒ නිසා බලපත්‍ර දීමේ ක්‍රමවේදය පිළිබඳව විශේෂයෙන්ම අවධානය යොමු වෙනවා නම් මගියාට කරදරයකුත් නැහැ. ඔබතුමාගේ අමාත්‍යාංශය නිතරම විවේචනය වෙන්නෙත් නැහැ. විශේෂයෙන්ම ඒක මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම විශාල ආයෝජනයක් කරලා ප්‍රවාහන අමාත්‍යාංශයට ගොඩනැගිල්ලක් ඉදි කරලා තිබෙනවා. හොඳයි. නමුත් අළුත්ගම කඩ කාමර ඉදි කළාට තමවත් කඩ කාමර ටික වැහිලා තිබෙනවා. ආරවුලක් තිබෙනවා. මම හිතන විධියට කඹ ඇදිල්ලක් තිබෙනවා. මේ ආයෝජනයේ ප්‍රතිඵලයක් ගන්න විධියක් නැහැ. දෙවැනි කාරණාව, මම නිතරම යනකොට දකින දෙයක් තමයි, පානදුර බස් නැවතුම් පොළේ ඉහළ මහල්වල කුලී ගෙවන අය ඉන්නවාද දන්නේ නැහැ. කඩ කාමර ටික තවම වැසී ගොස් තිබෙනවා. ඉතින් නගරයට, පළාතට ගැළපෙන විධියේ සැලසුම් එක්ක යන්න පුළුවන් නම්, බස් නැවතුම් පොළවල ආදායමක් ලබා ගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් නම් කෝටි ගණන් ආයෝජනය කරන, මේ ප්‍රාග්ධනය යෙදීමේදී යම් ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, ඉදි කිරීමේදී ඒ පිළිබඳව සොයා බැලීමක් කරලා - ඊයේ ඔබතුමාත් එක්ක සාකච්ඡා කරපු වෙලාවේත් ඔබතුමා කිව්වේ, මට කලින් හිටපු ඇමැතිවරු සැලසුම් කරපු ඒවා මම ක්‍රියාත්මක කරනවා කියලා. ඇත්ත. ඒ සැලසුම්කරණය හොඳයි. නමුත් වර්තමානයට ගැළපෙන විධියට ඉන්න ඇමැතිවරයා හැටියට ඔබතුමාගේ වගකීමක් තිබෙනවා, ඒ සැලසුම් සංශෝධනය කරන්න. ඒ සැලසුම් නිර්මාණය කිරීමේ බලය ඔබතුමාට තිබෙන නිසා ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. මේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ රාත්‍රී කාලයේ බස් සේවාවක් යොදවන්න අපට තවමත් බැරි වෙලා තිබෙනවා. තනියෙන් හෝ පෞද්ගලික අංශයේ බස් සේවාව

තවම ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒකාබද්ධ කාල සටහන් ගැන කථා කරලා, ක්‍රියාත්මක කරන දවසට පමණයි ඒක තියෙන්නේ. සතියක් යනකොට ඒකාබද්ධ කාල සටහනට වියදම් කරපු මුදලේ වටිනාකමක් නැහැ.

මට මතකයි. මේ සභාවේ මහ ඇමැති හැටියට සුසිල් ප්‍රේමජයන්ත ඇමැතිතුමා ඉන්න කාලේ වෙන්න ඕනෑ. දැන් අවුරුදු දහයකට පහළොවකට පෙර විශ්ව විද්‍යාලයට විශාල මුදලක් යොදවලා අවුරුදු 10 කට 15 කට උඩදී කාල සටහන් හැදුවා. ඒ කාල සටහන්වලින් තවමත් වැඩක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම ලංගමයි, පෞද්ගලික අංශයයි අතරට ඒකාබද්ධ කාල සටහනක් හෝ සම්බන්ධ කරගෙන රාත්‍රී බස් සේවාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. අඩු ගාණේ රෑ 11.00, 12.00 වනකල් හරි බස් සේවාවක් අවශ්‍ය වෙනවා. මගී ප්‍රවාහන සේවය කියන්නේ ඒකයි. පෞද්ගලික අංශය පිහිටුවා ගත්තෙත් විශේෂයෙන්ම මගියාගේ මේ ප්‍රශ්නය විසඳන්න. එහෙම නම් ඒ ඒකාබද්ධ සේවාව තුළ බස් හිමියාට හානියක් නොවන විධියට, බස් හිමියාට පාඩුවක් නොවන විධියට ඒකාබද්ධ සේවයේ කාල සටහන් නිසි ලෙස අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් බස්නාහිර පළාත් සභාව හැටියට ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් වෙනවා. 2013 වර්ෂය ඔබතුමා මේවා ශක්තිමත් කරන්න ඕනෑ කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ප්‍රවාහන අංශයේ තවමත් ඒ ආරවුල් වන සේවකයන්ගේ ගැටළුව.

මම හිතන විධියට තරුණ කටයුතුවලට ඔබතුමාගේ වැඩි අවධානය යොමු කරලා තිබෙනවා. තරුණයින්ට ක්‍රීඩාව අවශ්‍යයි වාගේම සමාජයීය වශයෙන් රැකියාවක් නිර්මාණය කරගෙන යන්න, ඔවුන්ගේ වෘත්තීය දැනුම ලබා දීලා, රජයේ රැකියාවක් නොවෙයි. ස්වයං රැකියාවක් තුළට ඔවුන්ට නැඹුරු වෙන්න තරම් හැකියාව ඔබතුමා නිර්මාණය කරන්න කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. එහෙම නම් ගරු සභාපතිතුමනි, පොදුවේ ගත්තාම ආහාර සැපයීම් කටයුතු මේ අමාත්‍යාංශයෙන් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ගෙවී ගිය වර්ෂවලට වඩා ඉදිරි වර්ෂය තුළදී අපේ සභාව තුළ මන්ත්‍රීවරු පෙන්නුම් කරන අඩුපාඩුකම්, විවේචන සැලකිල්ලට අරගෙන මේ අඩුපාඩු නිවැරැදි කිරීමට ඔබතුමා වග බලා ගන්න කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.21 ]

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒත් එක්ක මේ වෙලාවේ මම අවස්ථාවක් කර ගන්නවා ගරු අමාත්‍යතුමාට ස්තුතියක් කරන්නට. මොකද, පසුගිය අවුරුද්දේ මතුගම බස් නැවතුම් පොළ හදන්නට රුපියල් මිලියන 42 ක පමණ මුදලක් ලබා දීලා පළමුවැනි අදියර අවසන් කළා. ඒ වාගේම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, පළමුවෙනි අදියරය අවසන් වෙලා භාගෙට ඉදි වෙලා තිබෙන නැවතුම් පොළේ ඉතිරි කටයුතු නිම කරන්නට 2013 අවුරුද්දේ ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා. ඒ වාගේම දැනට මාස කිහිපයකට උඩදී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ප්‍රවාහන ඇමැති එහේ.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

නෑබඩ බස් නැවතුම් පොළ සඳහා - ප්‍රවාහන ඇමැති එහේ වුණාට, මේක අයිති පළාත් සභාවට. දැනට මාස කිහිපයකට උඩදී නෑබඩ බස් නැවතුම් පොළ සඳහා මමත්, අපේ කෙබුවන පියනන්ද හාමුදුරුවෝත්, ඔබතුමාත් ගිහිල්ලා මුල්ගල තිබ්බා. තවම නම් වැඩ ආරම්භ වුණේ නැහැ. ඒ නිසා අඩුම තරමින් මේ අවුරුද්ද අවසන් වෙන්නට ඉස්සෙල්ලා - අපේ විකුම් මන්ත්‍රීතුමාත් ගියා. වැඩ ආරම්භ කරලා ඒ වෙලාවේ ඔබතුමා පොරොන්දුවකුත් දුන්නා. ජනාධිපති පදවි ප්‍රාප්තියට මේක විවෘත කරනවා කියලා. ඒ නිසා ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන හැටියටත් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ රටේ යටිතල පහසුකම්වල සුවිශේෂී වැදගත්ම කාර්ය භාරයක් සිද්ධ වෙන්නේ ප්‍රවාහනය තුළ. ප්‍රවාහනය අර්ථ දැක්වීමේදී කියැවෙන්නේ, නිශ්චිත කාල සීමාවක් තුළදී, ආරක්ෂාකාරීව, සැප පහසුව ඇතිව මගීන් ප්‍රවාහනය කිරීම. මගීන් යම් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කරවීම. අද බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට තමයි මේ කාර්ය භාරය පැවැරෙන්නේ. විශේෂයෙන් අපි දන්නවා බස්නාහිර පළාතේ රටේ ජනගහනයෙන් 30% ක් විතර නියෝජනය කරන පළාතේ ජනතාවත්, ඒ වාගේම රටේ නොයෙක් පළාත්වලින් බස්නාහිර පළාත තුළින් නොයෙක් සේවාවන් සපයා ගැනීම සඳහා පැමිණෙන ජනතාවගේත් ප්‍රවාහන අවශ්‍යතා සපුරන්නට අපට බොහෝ ලෙසින් මැදිහත් වෙන්න වෙලා තිබෙනවා. ඒ වනකොට විශේෂයෙන්ම ප්‍රවාහනය අර්ථ දැක්වීම තුළම තිබෙන ආරක්ෂාව, නිශ්චිත කාල සීමාව, ඒ වාගේම සැප පහසුව කියන මේ තේමාවන් තුන අපි කොතෙක් දුරට ඉටු කරනවාද කියන එක සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න වටිනවා කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ගරු ඇමැතිතුමනි, මම මේ විවේචනයක් කරනවා නොවෙයි. අපි ආයතන හැටියට තව ශක්තිමත් වෙන්නට ඕනෑ. ඒ වෙනුවෙන් තමයි මේ ප්‍රකාශය කරන්නේ. විශේෂයෙන්ම බොහෝ වෙලාවට නිශ්චිත කාල සීමාවක් තුළ ගමන් කරන්නට අවශ්‍ය කරන ක්‍රමවේදය අප තුළ ඇත්තේම නැහැ. පෞද්ගලික බස් රථ බොහෝ වෙලාවලදී නිතරම මග කොටන කථා, අදාළ කාල සීමාවට වැඩියෙන් ගත කිරීම වාගේ බොහෝ චෝදනා එනවා. ඒ නිසා අපට වැඩ පිළිවෙළක් සකස් කරන්න වෙනවා.

මේ නිශ්චිත කාල සීමාව තුළදී ආරම්භයේ සිට ගමනාන්තය දක්වා ගමන් කරවීමේ කාර්ය භාරය කරන්න.

ඒ වාගේම තමයි සැප පහසුව. සැප පහසුව ගැනත් ඒ මට්ටමම තමයි තිබෙන්නේ. සමහර විට Semi luxury කියලා බස් වාගේකුත් දුවනවා. සියයට 150 ක් අය කරලා. එය අන්තර් පළාත්වලත් තිබෙනවා. එතැනදීත් බොහෝ වෙලාවදී සැප පහසුවට වැඩිය, සාමාන්‍ය බස් රථයකට පටවනවාටත් වඩා ජනතාව පටවනවා. ආරක්‍ෂාව සම්බන්ධයෙන් ගත්තාම අද මේ රටේ රිය අනතුරුවලින් වර්ෂයකට 2500 ක් විතර සාමාන්‍යයෙන් මිය යනවා. මේ ප්‍රමාණයෙන් බහුතරයකට දායකත්වය - විශේෂයෙන්ම පෞද්ගලික බස් රථත්, ත්‍රීවීලුත් දායකත්වය සපයනවා. ඒ නිසා මේ අනතුරු සම්බන්ධව ආරක්‍ෂාකාරී භාවයේත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ සියල්ලට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ, අපි ප්‍රවාහනයේදී සැලකිය යුතු දර්ශකයන් පිළිබඳව අවධානය යොමු නොකිරීම තුළයි. හොඳම උදාහරණය බලන්න. අද වර්තමානයේ තිබෙන ප්‍රබලම ප්‍රශ්නය, මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ කාරණාවේදී ඔබතුමාට නිතරම මැදිහත් වෙන්න වෙනවා. අපි බොහෝ වෙලාවට මාර්ග බලපත්‍රයක් නිකුත් කරනකොට - මන්ත්‍රීවරයෙකුගේ ඉල්ලීමක් වෙන්න පුළුවන්. ජනතාවගේ ඉල්ලීමට කන් දුන්නා වෙන්න පුළුවන්. ඒ වෙලාවේ අපි කියන්නේ, ප්‍රාදේශීය කළමනාකරුගෙන් වාර්තාවක් ගන්න. ඒ ඇරෙන්න අපි කල්පනා කරලා බලනවාද? අපි මොන ක්‍රමවේදයකින්වත් මේ දක්වා සොයාගෙන තිබෙනවාද? ඒ රූට් එකේ තිබෙන Passenger Demand එක. මගී ඉල්ලුම කොපමණ තිබෙනවාද? කියලා. කවදාවත් අපි පරීක්‍ෂණයක් කරලා තිබෙනවාද? ඒ විතරක් නොවෙයි. ඒ මාර්ගයේ දැනට ධාවනය කරන බස්වල කිලෝ මීටරයේ ආදායම කොපමණද? RPKM එක. Revenue per Kilometer කොපමණද? අපි හොලා තියෙනවාද? අපි ඒක කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. අනෙක් පැත්තෙන් Load Factor එක. ඒ කියන්නේ පැටවුම්

[ ගරු ඩී.ඒ. චන්ද්‍රභානු ]

සාධකය. මේ බස්වල කොපමණ ජනතාවක් යනවාද? බස් එකේ Seating Capacity එක. සීට් ගණනයි, Standing Capacity එක. හිටගෙන යන ගාණයි ගත්තාම මුළු ප්‍රතිශතය හදනකොට Load Factor එක කොපමණ තිබෙනවාද? අපි රූට් පර්මිට් එකක් දෙන්න ඉස්සෙල්ලා මේ එකක්වත් බලනවාද? ඒ වාගේම ඒ මාර්ගයේ කිලෝ මීටරයට ගාස්තුව කොපමණද? මේ දේවල් පිළිබඳව අපි මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑ. එහෙම මගී ඉල්ලීම, පැටවුම් සාධකය, කිලෝ මීටරයේ ආදායම, කිලෝ මීටරයේ ගාස්තුව, මේ දේවල් පිළිබඳව අවධානය යොමු කරලා නිසි අධ්‍යයනයකින් මාර්ග බලපත්‍ර නිකුත් කරන්න යනවා නම් මම හිතන්නේ නැහැ, කාටවත් මේ දේවල් සම්බන්ධව තර්ක කරන්න පුළුවන් වෙයි කියලා. තාම අපි කරන්නේ, ප්‍රාදේශීය කළමනාකරුගෙන් අහනවා. වාර්තාවක් ගන්නවා, මේ පාරේ දැන් බස් කීයක් දුවනවාද? දුවන්නේ නැද්ද? තව එකක් දාන්න හොඳද? මේ දේ විතරයි අපි සාකච්ඡා කරන්නේ. හැබැයි මීන් එහාට ගිහිල්ලා මේ ප්‍රශ්නයට නියම විසඳුමක් දෙන්න නම් ප්‍රවාහනයේදී අපි ආදර්ශයට ගන්නා මූලික දත්තයන් පිළිබඳව අවධානය යොමු කරන්න වෙනවා කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ.

අනෙක් කාරණාව හැටියට ගරු සභාපතිතුමා මගින් ගරු ප්‍රවාහන ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා. වාහනයක සාමාන්‍ය උපයෝගීතාවය, අද පෞද්ගලික අංශයේ AVU එක. Average Vehicle Utilization එක. වාහන උපයෝගීතාවය සාමාන්‍යයෙන් ලංගම බස් එකට වඩා කිලෝ මීටර් 70 ක් 80 ක් අඩුවෙන් තියෙන්නේ. සමහර විට 100 ක් විතර අඩු වෙනවා. ඇයි එහෙම වෙන්නේ? අද හුඟක් බස් උදේට කොළඹ ගිහිල්ලා, ගමින් පිටත් වෙලා ඇවිල්ලා, හවස තමයි ආපහු පිට වෙන්නේ. පැය ගණනක් බස් එක Park කරලා තිබෙනවා. කිසිම සේවාවක් ඉටු වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා තවත් විනාඩි 02 ක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

විනාඩි 10 ගියාද ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩි 02 යි තියෙන්නේ.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, අපට පුළුවන් නම් හොඳ කාල සටහනක් තුළ නිකම් Park කරලා තිබෙන වෙලාවේත් අවශ්‍යතාවයන් තිබෙන පාරවල්වලට, කලින් කියපු නිර්ණායක ඔස්සේ මේ සේවාව ලබා ගන්න කටයුතු කළොත් එහෙම විශේෂයෙන් අර නිකම් තිබෙන බස් ප්‍රමාණය සේවයට යොදා ගන්න පුළුවන්. එහෙම වුණොත් බස් ආනයනය කරන්න යන වියදම, විදේශ විනිමය වාගේ දේවල් ඉතුරු කර ගැනීමේ අවස්ථාවත් ලැබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, රාත්‍රී සේවාවන් සම්බන්ධවත් අපි මීට වඩා - විශේෂයෙන්ම ඈත එපිට දුෂ්කර ගම්මානවල ඉන්න අපි නියෝජනය කරන මතුගම, අගලවත්ත, බුලත්සිංහල වාගේ ආසනවල මිනිස්සුන්ට රාත්‍රී සේවාවන් සැපයීමේදී බොහෝ වෙලාවට පෞද්ගලික බස්වලින් වන සේවාව පහළ මට්ටමක තමයි තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම පෞද්ගලික බස් රථ ගැන කථා කරනකොට මේ දේවල් ගැනත් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. අපි දන්නවා, අද හොඳ සේවාවක් ඉෂ්ට

වෙනවා. ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ හොඳ ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, මේ දාලා තිබෙන සංඛ්‍යා ලේඛන පිළිබඳව නම් පොඩ්ඩක් පැහැදිලි මදී. හේතුව වෙලා තිබෙන්නේ, හුඟක් වෙලාවලදී මේ සංඛ්‍යා ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගන්නවා, මෙන්න මෙපමණ බලපත්‍ර ගාස්තු හිඟයක් තිබෙනවා කියලා. මේ විදියේ ගාස්තු හිඟයක් තිබෙනවා. හැබැයි බොහෝ වෙලාවලදී නිවැරදි අගය ඊට වඩා හුඟක් පහළ මට්ටමක තිබෙන්නේ. ඒකට හේතුව තමයි අද ඉදිරියට ගෙනාපු ශේෂය. RMV එකෙන් ගත්තු ශේෂයන් පිළිබඳව තමයි අපි කථා කරන්නේ. ඒ ශේෂයන් තුළ මේ වනවිට බොහෝ වාහන ධාවනයෙන් අයින් වෙලා. එහෙම නැත්නම් එක තැන ලියාපදිංචි වාහනය, තව තැනකට Open Payments යටතේ විකුණලා තිබෙනවා. සමහර වෙලාවලදී අපේ ඉදිරියට ගෙනාපු ශේෂය වැඩි වුණාට ඇත්තටම සත්‍ය ශේෂය ඊට වඩා අඩු මට්ටමක තිබෙන්නේ. අනෙක් කාරණාව තමයි. තවමත් කටාන, මීගමුව සහ පානදුර කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා හොඳ සේවාවක් තිබෙනවා. බස්නාහිර පළාතේ ඕනෑම වාහනයක ආදායම් බලපත්‍රය ගන්න පුළුවන්කම තිබෙනවා. අපි ඒකට ප්‍රශංසා කරන්න ඕනෑ. ඒ වාගේම මේ ජාලය පළාත තුළ තිබෙන සමස්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා බලපත්‍ර ලබා ගන්න, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයිති බලපත්‍රය වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගැනීම දක්වා දියුණු කරන්න කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද පළාත් සභාවේ අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම පාරවල් හදන්න විශාල වියදමක් යනවා. ඊළඟට සංඥා පාලනවලට විශාල වියදමක් යනවා. මාර්ගවල ගමන් කිරීම නිසා, වාහන තදබදය නිසා විශාල පරිසර දූෂණයක් සිද්ධ වෙනවා. වාහන හසුරුවන්න පොලිස් නිලධාරීන් දාන්න වෙලා තිබෙනවා. නමුත් බස්නාහිර පළාත ගත්තාම අලුත්ගම ඉඳලා බෙන්තර පාලමේ ඉඳලා මීගමුව දක්වාම තිබෙන්නේ මුහුද. ගරු සභාපතිතුමනි, අපට පුළුවන්කමක් තිබෙනවා නම්, විශාල මගී ඉල්ලුමක් තිබෙන මාර්ගය අලුත්ගම ඉඳලා මීගමුවට. ඒ අතරතුර පානදුර, කළුතර ඒ ඔක්කෝම නගර ටික තිබෙනවා. අපට පුළුවන් නම් මුහුදු යාත්‍රා සේවයේ යොදවන්නට. එහෙම වුණොත්, බොහොම පැහැදිලිව මේ වන පරිසර හානිය වෙන්නේ නැහැ. මාර්ග නඩත්තුව සඳහා යන වියදම අඩු වෙනවා. ඒ විතරක් නොවෙයි. පොලිස් නිලධාරීන් අවශ්‍ය කරන්නේ නැහැ. ඔක්කෝටම වඩා වැඩි ආරක්ෂාවක් සැපයෙනවා. අනතුරු නැහැ. මාර්ග තදබදය අඩු වෙනවා. මේ සියල්ල නිසා ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරනවා, අඩු ගාණේ 2013 අවුරුද්දේ මේ වාගේ අලුත් යෝජනාවක් ක්‍රියාත්මක කරන්නට යොමු වේවායි කියන බලාපොරොත්තුවත් අපි සතුව තිබෙනවා. එහෙම නම් තවත් කථා කරන්න කාරණා ගණනාවක් තිබුණත්, කාලයේ හරස් වීම නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.32 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, පසුගිය වසර කිහිපයේම මේ අදාළ අමාත්‍යාංශය පිළිබඳව මම විවාදවලට එක් වුණේ නැහැ. අද මම උපාලි කොඩිකාර ගරු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය සඳහා –

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

නාගන්නේ නැතුව කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇයි ඔබතුමාද වතුර ගේන්නේ? මම සබන් ගේන්නම්. ගරු සභාපතිතුමනි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. මූලාසනයට කථා කරන්න. එදත් කථාව කරන්න බැරි වුණා නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මෙතුමාටයි හික්මීමක් නැත්තේ. මට නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම දන්නවා බණ්ඩාරගම අලුතින් ක්‍රමයක් දාලා තිබෙනවා, සබන් නැතුව නාන්න. ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා සම්බන්ධයෙන් මාධ්‍යවල, විවිධ ස්ථානවල විවධ ප්‍රකාශ නිකුත් වුණා. නමුත් එතුමා සම්බන්ධයෙන් මට එහෙම කිසිදු අදහසක් ප්‍රකාශ කිරීමේ අයිතියක් ඇතියි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මොකද, මේ පළාත් සභාව තුළ සිටින මේ තනතුරට සුදුසුයැයි හිතෙන, සුදුසුම අමාත්‍යවරයා මේ ආණ්ඩුව විසින් පත් කරලා තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒ තුළ මම ඒ අමාත්‍යාංශය සම්බන්ධයෙන්, අමාත්‍යවරයා සම්බන්ධයෙන් හෝ කිසිදු වචනයක් ප්‍රකාශ කරන්නේ නැහැ. අදත් මම විශ්වාස කරනවා. මේ පළාත් සභාව තුළ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉඩ මදි නිසා විපක්ෂයේ පැත්තෙත් ඉන්න මන්ත්‍රීවරු ගත්තාම මේ අය සියලු දෙනාගෙන්ම සුදුසුම පුද්ගලයා විධියට එතුමාව අමාත්‍යවරයා ලෙස පත් කිරීම පිළිබඳව අපි එකඟයි. ඒ පිළිබඳ ගැටළුවක් නැහැ. හැබැයි ගරු සභාපතිතුමනි, සමූපකාර කොමිෂන් සභාව

පිළිබඳව කථා කරන්න තමයි අද මම මගේ කාලය වැය කර ගන්න උත්සාහ කරන්නේ.

මොකද, විශේෂයෙන්ම මම මේ සභාවේ අමාත්‍යතුමාට හතර පාරක් මේ කාරණය සම්බන්ධයෙන් යොමු කළා. ඒ තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ 197/96 කියන නඩු තීන්දුව යටතේ 1998.05.20 කොමිෂන් සභාවට සහ බෝකුන්දර විවිධ සේවා සමූපකාර සමිතියට නිකුත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව චන්ද්‍රලතා මාගම්මුදලි කියන සේවිකාවට පරිපාලන කළමනාකරු තනතුරේ පිහිටා අදාළ ගෙවීම් සියල්ලම ගෙවන ලෙසත්, මෙය පමාවීමෙන් ඇගේ මානව හිමිකම් කඩවී ඇති බවත් කියලා ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නු නියෝගය අනුව ඇයට ගෙවීම් කරන්න තිබුණා. නමුත් අද වනතුරු ඒ ගෙවීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ සේවිකාව ඉතාමත්ම දැඩි මානසික තත්ත්වයකින් පෙළිලා සිටිනවා. අවසානයේදී මට සිද්ධ වුණා අමාත්‍යාංශ ලේකම්වරයාට මේ පිළිබඳව කරුණු යොමු කරන්න. ඊට පස්සේ මට සිද්ධ වුණා ගරු සභාපතිතුමනි, මගේ මිත්‍ර උදය ගම්මන්පිල ගරු අමාත්‍යවරයාටත් කියන්න පොඩ්ඩක් මේ ගැන හොයලා බලන්න කියලා. මම ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාට කිව්වාම එතුමා කිව්වා මොකද වෙන්නේ කියලා බලමු කියලා. ගරු සභාපතිතුමනි, මේ කොමිෂන් සභාවට මේ රටේ මහජනතාවගේ මුදල් වියදම් කරලා අපි නඩත්තු කරනවා. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් පිළිගන්න තරම් මේ කොමිෂන් සභාවේ ඉන්න නිලධාරීන්ට හැකියාවක් නැත්නම්, මේකේ එක පුද්ගලයෙක් - මේකේ ඉන්න ලේකම්තුමා මම අවුරුදු ගණනක ඉඳලා දන්නවා. කැස්බෑව ප්‍රාදේශීය ලේකම්වරයා විධියට කටයුතු කළා. ගරු සභාපතිතුමා හරහා ගරු අමාත්‍යතුමාට කියනවා. එතුමාට මම මේ පිළිබඳ සියලු වාර්තා ගෙනිහිල්ලා පෙන්නුවා. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය. ඊට පස්සේ මම අමාත්‍යාංශ ලේකම්වරයාට කථා කළාම විශේෂ සාකච්ඡාවක් දුන්නා. අදාළ පුද්ගලයාත්, කොමිෂන් සභාවේ සභාපතිවරයාත් ඉදිරියේ ඒ සියලු කාරණා සැලකිල්ලට ගෙන ඇයව එම තනතුරේ පිහිටා ගෙවීම් කරන්න කිව්වා. අද වනතුරු ගරු සභාපතිතුමනි,

[ ගරු නිරෝෂන් පාදුක්ක ]

ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව ශත පහක සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඒ කොමිෂන් සභාවේ එක මහත්මයෙක් ඉන්නවා. එතුමාගේ නම ටී.ජී.එල්. වීරරත්න. එතුමා තමයි මේ වැඩේ කරන්නේ. සභාපතිවරයා මේ තීන්දුවේ පිහිටා කටයුතු කරන්න කැමැතියි. ලේකම්, බර්නාඩ් වසන්න මහතා මේ පිළිබඳව තීන්දුවක් දෙනවා. පැහැදිලිව ලියලා තිබෙනවා මේ තනතුරේ පිහිටා ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව කටයුතු කරන්න කියලා. හැබැයි මේ සේවිකාවට මේ ගෙවීම් කරන්නේ නැහැ ගරු සභාපතිතුමනි. මෙලෙස නම් මේ කොමිෂන් සභාව, මම සමූපකාර ක්‍රමවේදය ගැන කථා කරන්නේ නැහැ. මම සමූපකාර ක්‍රමයේ අනන්ත අප්‍රමාණ දූෂණ, වංචා දැකලා තිබෙනවා. සිමෙන්ති ලොරිය ගෙනැල්ලා, පිළියන්දල හන්දියේ කඩේට බාලා එතැනින් කොමිස් ගත්තු සභාපතිවරු අපි ඉතිහාසයේ දැක්කා. අපි ඒවා පිළිබඳව පැමිණිලි කරලා තිබුණා. මම දකින විධියට අපේ අමාත්‍යවරයාට කරපු එකම දුර්වලතාවය තමයි අපි දන්නවා, බස් සම්බන්ධයෙන් විවිධ පුද්ගලයෝ විවිධ ප්‍රකාශ කරනවා. මම ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. මේ අමාත්‍යතුමා රජය සුදුසු යැයි පිළිගන්නා අමාත්‍යතුමා නිසා. හැබැයි ගරු සභාපතිතුමනි ඔබතුමා හරහා ගරු අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම එතුමා උත්තර දෙන්න ගන්න කාලය වැඩියි. සමහර අවස්ථාවලදී සමහර ප්‍රශ්නවලට අපි බලාපොරොත්තු වුණු කාලයට වඩා වැඩි කාලයක් ගන්නවා. ඒ හැර එතුමාගෙන් මම හිතන්නේ, ඉතා හොඳ සේවාවක් බස්නාහිර පළාතේ ජනතාවට සිද්ධ වෙනවා කියන එක තමයි මම විශ්වාස කරන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගෙන් නැවතත් ඉල්ලනවා. කරුණාකර, මම කියපු කාරණය පිළිබඳව අවධානය යොමු කරන්න. ගරු සභාපතිතුමනි, මේ සේවිකාවගේ අවුරුදු 34 ක සේවා කාලය සැලකිල්ලට ගෙන එතුමියගේ විශ්‍රාම පාරිතෝෂිකව ගෙවන්න කියලා නියම කළාම ඒක ගෙවන්න තරම් හෘද සාක්ෂියට එකඟ නැති කොමිෂන් සභාවක් නම්, අහිංසක සේවකයෙකුට ගෙවීම් කරන්න මේ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ පපුව උණු වෙන්නේ නැත්නම් කෝටි ගණන් වංචා දූෂණ වන සමූපකාර ව්‍යාපාරයේ මම අහනවා, කොතැනටද මැරුණාට පස්සේ යන්න ආස කියලා. ගරු සභාපතිතුමනි, මෙහෙම නම් නිලධාරීන් ක්‍රියා කරන්නේ මේ කොමිෂන් සභාව තුළ මෙවැනි නිලධාරීන් රඳවා ගැනීමත් මෙලොව එල දෙන දිට්ඨධම්මවේදනීය කර්මයක් විධියට තමයි විශ්වාස කරන්නේ. ගරු සභාපතිතුමනි, -

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

රනිල් වාගේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ කථාව කරගන්න ඉඩ දෙන්න කියන්න කියලා. මම හිතුවා ඇඟ තුළම හමුදා විනයක් ඇති කියලා. බැලුවාම හමුදා විනයක් තිබෙන කෙනෙක් අතන ඉන්නවා. හැබැයි, මෙතැන ඉන්න කෙනාට හමුදා විනය නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටින්නේ, උපාලි කොඩිකාර කියන ඒ දැවැන්ත චරිතය බස්නාහිර පළාතේ අපි යන යන පාරක් අයිනේ ඉන්නවා. අපි යන යන පාරක් උඩ එතුමාගේ නම පේනවා. බස් එකක් දැම්මොත් බස් එකේ එතුමාගේ නම තියෙනවා. පාරක ගියොත් පාරේ එතුමාගේ නම තියෙනවා. එතුමාට විවිධ චෝදනා කරනවා. මම කරන්නේ නැහැ. මොකද, ඒ චෝදනා

අධිකරණයකට ගිහිල්ලා ඔප්පු කරන තුරු. මොකද, එතුමා නිවැරැදි නිසා.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

පර්මිට් එකක් ගන්න ඕනෑද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම කවදාවත් Business කරලා නැහැ. ඒ නිසා මට Business කිරීමේ අදහසකුත් නැහැ. ඒ නිසා මට පර්මිට් ඕනෑත් නැහැ. ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට අනාගතයේදී -

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ක්‍රීඩා බඩු ටිකක් ඕනෑද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඔබතුමාට දෙන්න නම් ඇද වුණු බෝලයක්. ගරු සභාපතිතුමනි, දවසක් ඇද වුණු බෝලයක් දුන්නාම මෙතුමා අහනවා රගර් ගහන්න ඇද වුණු බෝලයක් දුන්නේ ඇයි කියලා. රගර් ගහන්නේ ඇඳ වුණු බෝලයෙන් කියලා බණ්ඩාරගම එවුන් දන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, අහනවා සල්ලි දීලා ඇද බෝලයක් ගෙනාවේ ඇයි කියලා.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ඔබතුමා මගේ අල්ලපු ආසනයේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා මට කියන්න තිබෙන්නේ මෙවැනි උදාර ගති පැවතුම් ඇති අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න ඉඩ නොදීමත් ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සභාවේ මේ වාගේ දක්ෂ ඇමැතිවරයෙක්, ඒ වාගේම අත්දැකීම් බහුල - අපි පාසල් යනකොටත් දැක්කා උපාලි කොඩිකාර කියන පළාත් සභා මන්ත්‍රීවරයා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉතාමත් දක්ෂ මන්ත්‍රීවරයෙක් විධියට මම එදා කිව්වා දුර්වල කැබිනට් එකක් තමයි ප්‍රසන්න රණතුංගට හම්බ වුණේ. අපි දන්න ඉතිහාසයේ. මම ඊයේ කිව්වා, දුර්වලතම කැබිනට් මණ්ඩලය තමයි බස්නාහිර පළාතේ මේ ඉන්නේ කියලා. ඒ දුර්වල අමාත්‍යාංශ තුළ ඉන්න දක්ෂම ඇමැතිවරයෙක් හැටියට තමයි උපාලි කොඩිකාරව මම හඳුන්වන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා මම ඔහු පිළිබඳව මීට වැඩිය ගුණ වර්ණනා කරන්නේ නැහැ. මට මතක් වෙන්නේ අවමඟුල් උත්සවවලදී මැරිණු මිනිස්සු ගැන කියන ගුණ වරුණ. ඒ නිසා එවැනි යථාර්ථයක් තුළ ඔහු ඉතා දක්ෂ, ප්‍රායෝගික දේශපාලඥයෙක් විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 03 ක කාලයක් විපක්ෂයෙන් දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

දුර්වල විපක්ෂයේ දක්ෂතම කථිකයා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මට කථා කරන්න කාලය දෙන එක ගැන මම සතුටු වෙනවා. හැබැයි මම ඔය පුටුවට ගරු කරනවා. ඉතිහාසයේ ඔය පුටුවේ වාඩි වෙලා හිටපු සමහරු මේ පල්ලෙහා පුටුවල ඉඳන් දෙක බී ළඳ බොළඳ මාස්මෙලෝ ජුජුස් වාගේ රහපාන එක ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ලබන පාර කොළඹට මහ ඇමැති අපේක්ෂකයා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා ගරු සභාපතිතුමනි, උපාලි කොඩිකාර ගරු අමාත්‍යවරයා ප්‍රවාහන අමාත්‍යවරයා විධියට මෙතුමා ඉදිරිපත් කරන අයවැය බලන්න. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මේක ග්‍රෑම් 350 කට වැඩිය බර පොතක්.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කිරුවද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ පොත් පිංචත් ගහලා

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඕක උස්සගෙන යන්න බැරිද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අයියෝ මන්ත්‍රීතුමිය, මොකක්ද මේ රෝගය. ගරු සභාපතිතුමනි, විවිධ රෝග තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ මට කථා කරන්න බැරි වුණා. මම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයේ සිටියා නම්, බැරි බැරියාව රෝගය ගැන මම එයාට කථා කරලා පෙන්වනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මම විශ්වාස කරනවා. පැළියගොඩ පාලමෙන් එහා අයට විනය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකන් එයාර් ලයින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඔබතුමාගේ විශ්වාස භංගය කෝ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කවුද ඒ? කැතයි. චිකේ කැතයි. අධිකරණය ඉස්සරහාත් ඔය වාගේ වැඩ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා දැන්ද ආවේ ? මම උදේ ඉන්නවා දැක්කෙත් නැහැ. දැන් ඇවිල්ලා මයික්‍රෆෝන් එක On කරගෙන බාධා කිරීම් කරනවා. කරුණාකරලා ඕක නවත්වන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මට තව කාලය තිබෙනවා නේ? මේ පොත -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 05 ක් දුන්නා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හරි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විපක්ෂයේ හොඳම කථිකයා කථා කරන්නේ. ඔයිට වැඩිය හොඳ මිනිහෙක් නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගන්න මේ පොත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පොත ගැන අදහස් දක්වන්න එතුමාට ඉඩ දෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ පොත අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය පොතට වැඩිය ලොකුයි ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. බාධා කිරීම් කරන්න එපා. ආණ්ඩු පක්ෂයේ වේලාව තිබෙනවා. කැ ගහන්න ඕනෑ නම් මම වේලාව දෙන්නම්. අවශ්‍ය නම් කියන්න. කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මාගේ විනාඩි 05 න් විනාඩියක් දෙන්න ඒ අයට කෑ ගහන්න. ඊට පස්සේ මට කථා කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක හොඳ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා හැමදාම වැරදි ක්‍රියාවක් මේ කරන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ පොත බැලුවාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයට විනාඩි 60 යි තිබෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සිරිලිය, සිරිජය යෝජනා ක්‍රම. කාටද මේ වාගේ අදහස් මතු වෙන්නේ? දාර්ශනිකයන්ට විතරයි. මේ වාගේ දක්ෂ අමාත්‍යවරයෙක් යටතේ, අපි දන්නවා මෙතුමා ගැමි දිරිය ආදී විවිධ ක්‍රම පටන් අරන්. Co-op City ආරම්භය. අද Cargills ව්‍යාපාරයට පවා තර්ජනය වන විධියට Co-op City ව්‍යාපාරය

අද මෙතුමා නිර්මාණය කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, සමූපකාර මේලා. ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මේ රටේ විශාල ප්‍රශ්නයක් තිබුණා. හැමදේම මෙගා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඕවා ඊර්ෂ්‍යාවට කියන කථා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කොකා කෝලා තිබෙනවා නේ? කොකා කෝලා බඩී තිබෙනවා. ඊට පස්සේ සාමාන්‍ය තිබෙනවා. ඊට පස්සේ මෙගා තිබෙනවා. ලොකුම Size එක. අපේ රටේ විදේශ සංචාර යන කොටත් යනවා නේ මෙගා සංචාර. 150 ක් විතර අරගෙන. ඒවායේ කොඩිකාර ගරු ඇමැතිතුමාත් යනවා මම දැකලා තිබෙනවා. එතුමාගේ ඒ අත්දැකීම් පරිහරණය කර ගනිමින් එතුමා ඉදිරිපත් කරනවා සමූපකාර මේලා. මෙගා ඒවා.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Morice Wejerathna

ගාමිණී ලොකුගේ මහත්තයාත් ගියා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එයත් හැමදාම යනවා නේ? ඔබතුමන්ලා ඉපදෙන්නත් කලින් එතුමා ගියේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා අද මේ කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ විවාදයේදී අවංකවම ගරු සභාපතිතුමනි, අපි එතුමා පිළිබඳව සතුටු වෙනවා. එතුමාට අදහස් පිරි සැබෑ චින්තනයක් තිබෙන එකම ශ්‍රී ලාංකිකයා විධියට මම විශ්වාස කරන්නේ උපාලි කොඩිකාර කියන එක මම බොහොම සතුටින් මතක් කරනවා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, දවසක් මේ මන්ත්‍රීවරු පුහුණු වැඩ සටහනකට යන කොට කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාත්, මමත් ඉන්න කොට අපි එක්තරා නාට්‍යයක් ගැන කථාවක් හැදුවා. ඒ කථාවේ එක චරිතයක් අපි මෙතුමාට භාර දුන්නා. ඒ කියන්නේ කවුරු හරි අද බස්නාහිර පළාත් සභාව ගැන කථා කරනවා නම්, ඒ කථා කරන විනාඩි පහකට තුන් වරක් කෑමට පෙර පසු උපාලි කොඩිකාරගේ නම කියනවා. ඒ තරමට උපාලි කොඩිකාර අද බස්නාහිර පළාතේ ජනප්‍රියම දේශපාලන චරිතය බවට පත් වෙලා තිබෙනවා කියන එක තමුන්නාන්සේට මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අද පෞද්ගලික බස් රථ සංගම්වල අය මොනවා කිව්වත්, ආයතනවල අය මොනවා කිව්වත් එතුමා අලුතෙන් යමක් කරන්න ගියා. ඒ නිසා එතුමාට විරුද්ධව කැරැළි නිර්මාණය වෙනවා. නමුත් එතුමා අලුතෙන් යමක් පෞද්ගලික බස් සේවා ක්‍රමය තුළ ක්‍රියාත්මක කරන්න ගියා. අපේ 255 මාර්ගයේ පසුගිය කාලයේ ප්‍රශ්න තිබුණා. නමුත් ගරු සභාපතිතුමනි, අපි දේශපාලනය ඇඟට අරගෙන කොඩිකාර ඇමැතිතුමාට විරුද්ධ වෙන්න ගියේ නැහැ. අපි දැනගත්තා. ඔහු සද්භාවයෙන් තමයි අලුතෙන් යමක්බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් ඉදිරිපත් කරන්නේ කියලා. ඒ නිසා මම සතුටු වෙනවා. මම බලාපොරොත්තු වෙනවා, උපාලි කොඩිකාර කියන ඒ සැබෑ දේශපාලඥයාව ලබන පාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව ඔහු පිළිබඳව සැබෑ ලෙසම Evaluation එකක් කරයි කියලා. එහෙම නැත්නම් ඔහු පිළිබඳව නිවැරදි තක්සේරුවක් කරලා ඔහුව තියන්න පුළුවන් උපරිම තැන තියන්න බස්නාහිර පළාත් සභාවේ මිනිස්සු ක්‍රියා කරයි කියලා. අර හිනාව මට සල්ලිවලට ගන්න බැහැ ගරු සභාපතිතුමනි.

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

මඩ. මඩ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කෝට් එක අස්සේ මඩ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා අද මම සතුටු වෙනවා. මේ පළාත් -

[සභාවේ ඝෝෂා]

සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා කරන ඒ කැපවීම් -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

තනිකර මඩ. මඩ කථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පැය 24 ම වැඩ කරන දේශපාලඥයෙක් බස්නාහිර පළාත් සභාවේ ඉන්නේ. ඒ අපේ අමාත්‍යවරයා කියමින් එතුමාට මීට වැඩිය හොඳ අදහස් පහළ වෙලා තව තවත් එතුමා මේ අමාත්‍ය ධූරයෙන් ලබන අත්දැකීම් තුළින් බස්නාහිර පළාත් සභාවට අර

සමහර සම්ප්‍රදායික ඇමැතිවරු මේ සභාවේ ඉන්නවා. සම්ප්‍රදායික ඇමැතිවරු නැතිව අලුතෙන් හිතන උඩුගම් බලා පීනන අපේ රැඩිකල් දේශපාලන චරිතය බවට පළාත් සභාවේ පත් වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.50 ]

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

2013 අයවැය වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මාගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, ඉතිහාසය කාලයෙන් කාලයට වීරයන් බිහි කරනවා. මේ බිහි කරන වීරයන්ට ඉතිහාසය විසින් යම්කිසි කාර්ය භාරයක් නියම කරනවා. ඒ නියම කරන කාර්ය භාරය ඔවුන් ජීවත් වෙලා ඉන්න කාලය තුළ ඔවුන්ගේ කාර්ය භාරය මොන විධියට අර්ථ දැක් වුණත් ඉතිහාසය විසින්ම ඒ කාර්ය භාරය නිරීක්ෂණය කරලා, අපට ඉතාමත්ම සාධාරණ ලෙස මේ වීරයන්ව ඉතිහාසය විසින් දායාද කරනු ලබනවා. ගරු සභාපතිතුමනි, ඒ දායාද කරපු වීරයන්ගෙන් කීප දෙනෙක් මම මතක් කරන්නම්. එක් කෙනෙක් තමයි අපේ කුඩාපොළ නායක හාමුදුරුවෝ. ඉන් අනතුරුව -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උපාලි කොඩිකාර

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාත් වීරයෙක් අපට. එක්කෙනෙක් තමයි වීර මොණරවිල කැප්පෙටිපොළ මහ නිලමේතුමා. ඊට අමතරව වීර පුරන් අප්පු. ගොන්ගාලේගොඩ බණ්ඩා. භූටාවේ රටේ රාළ වැනි වීරයන්. වර්තමානයේ ඔවුන් අපට වීරයන් වන්නේ අපේ ආදරණීය මාතෘ භූමිය වෙනුවෙන් ඔවුන් කළ වීර ක්‍රියා සම්බන්ධයෙන්. මෙහෙවර සම්බන්ධයෙන්. මෙම ජාතික මෙහෙවර ගැන නොදන්න එස්.එම්.එස්. වලට පමණක් සීමා වුණු පරම්පරාවක් අපේ රටේ නිර්මාණය වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එය කනගාටුවට කාරණාවක්. ඔවුන් කුමන දිශාවකට යොමු විය හැකිද කියන විචිකිච්ඡාව,

[ ගරු රොජර් සෙනෙවිරත්න ]

කල්පනාව අපි හැමෝගෙම හිත්වල තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙන්න මේ දරු දැරියන් නිවැරදි දිශාවකට යොමු කිරීමේ වගකීම, ඒ දරු දැරියන්ගේ දෙමව්පියන්ට තිබෙනවා වාගේම ඒ ඒ විෂයයන්වලට අදාළ මැති ඇමැතිවරුන්ගෙත් වගකීමක් වී තිබෙනවා. ඒ ඇමැතිවරුන්ගේ වගකීම වාගේම ඒ ඒ පළාත්වල තමන්ගේ දේශපාලන කටයුතු ඉෂ්ට සිද්ධ කරන ගරු මන්ත්‍රීවරුන්ගෙත් වගකීම බවට පත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මිනිස්සුන්ට, තරුණ තරුණියන්ට නොයෙකුත් ජීවන පරමාර්ථ තිබෙනවා. ඒවා එකිනෙකට වෙනස් වාගේම එකිනෙකාටත් වෙනස් පරමාර්ථ. මේවා විවිධයි. විෂමයි. ගරු සභාපතිතුමනි, ඔවුන් ඒ පරමාර්ථ මුදුන් පමුණුවා ගන්න නෙයෙක් දේ කරනවා. වෙර වීරිය දරනවා. විශාල කළබැගෑනිවලට ලක් වෙනවා. නමුත් වට පිටාවෙන් ඔවුන්ට නියම ශක්තිය නොලැබුණාම ඔවුන්ගේ පරමාර්ථ ඇතුළේ ඔවුන් තනි වෙනවා. මේ පරමාර්ථත් එක්ක ඔවුන් උපන් ගෙයි මැරෙනවා. අන්න එතැන කුමන්ත්‍රණය හට ගන්නවා. ගරු සභාපතිතුමනි, කුමන්ත්‍රණය එතැනින් පටන් ගන්නවා. සමහරුන් තමුන්ගේ උතුම් පරමාර්ථ හේතුකොටගෙන සමාජයේ ඉතාමත්ම ඉහළින්, සියලුමදෙනාට උඩින් වැජඹෙන්න පටන් ගන්නවා. සෑම විෂයයකටම මෙය අදාළයි ගරු සභාපතිතුමනි. ලෝකයේ බොහෝ රටවල් කණපිට හරවපු කලාකරුවන් ඉන්නවා. මාධ්‍යවේදීන් ඉන්නවා. අපේ රටෙත් හිටියා. කලාකරුවන් හිටියා. මාධ්‍යවේදීන් හිටියා. නමුත් ඔවුන්ගේ පරිකල්පන ශක්තිය භාවිතා කරලා පවතින ලෝකය ප්‍රතිනිර්මාණය කරන වේලාවේ දේශපාලනය විවේචනය කරමින් අලුත් නිර්මාණ ලෝකයට බිහි කරන්න උත්සාහ කරපු හැම අවස්ථාවකම දේශපාලඥයින්ගේ මැදිහත්වීම, ක්‍රියාකාරීත්වය හේතුකොටගෙන ඔවුන්ගේ ජීවිත පවා ඔවුන්ට අහිමි වෙලා තිබෙනවා. ලෝකයෙත් එහෙමයි. අපේ රටෙත් එහෙමයි. ඒ වාගේම තවමත් අපේ රටේ ඒ වාගේ ජීවත් විය යුතු කලාකරුවන් ඉන්නවා. ඒ සියලු දෙනාට බස්නාහිර පළාත් සභාවේ සහ මගෙත් උපහාරය පුද කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඔවුන් සැබෑ සමාජ මෙහෙවරක් ඉෂ්ට සිද්ධ කරපු නිසා ගරු සභාපතිතුමනි, ඔවුන්ගේ පරමාර්ථ තේරුම් ගන්න බැරි, ඔවුන්ගේ සමාජ මෙහෙවර කරදරයක් සේ සලකපු බොහෝ දේශපාලඥයින් ඔවුන්ව විනාශ මුඛයට ඇද දාලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙලෙස වටිනා කියන කලාකරුවන් රාශියක් ලෝකයට අහිමි වුණා. ලෝකයට අහිමි කළා. ගරු සභාපතිතුමනි, දැන් ඒ කාලය අවසන්. තමන්ගේ පරමාර්ථ ඔස්සේ වැඩ කටයුතු කරන්න ඉතාමත්ම හොඳ වටපිටාවක්, හොඳ පරිසරයක් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නිර්මාණය කරලා දීලා තිබෙනවා. මධ්‍යම රජය හරහා ජ්‍යෙෂ්ඨ කලාකරුවන්ට විශාල ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා. නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල ජාත්‍යන්තර තලයේ රඟහලක්. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. ටවර් රඟහල විශාල මුදලක් වැය කරලා සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරලා තිබෙනවා. එලිෆින්ස්ටන් රඟහල විශාල මුදලක් වැය කරමින් ප්‍රතිසංස්කරණය කරනවා. ඒ විතරක් නොවෙයි. මධ්‍යම රජය හරහා අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම යටතේ සියලු ජ්‍යෙෂ්ඨ කලාකරුවන්ට රුපියල් ලක්ෂ 12 ක මුදලක් ඔවුන්ට වාහනයක් ගැනීම සඳහා ලබා දීලා තිබෙනවා. මේවා මේ කලාකරුවන්ට ඉතාමත්ම වටිනා සහන ගරු සභාපතිතුමනි. මේවා සහන. කලාකරුවන් සතුටට පත්වන සහන. මා විසින් බස්නාහිර පළාත් සභාවේදී මීට අවුරුද්දකට විතර කලින් අයවැය

ශීර්ෂයේදී කථා කළා, චිත්‍රා වාකිෂ්ට මහත්මියට සහ හරුන් ලන්ත්‍රා මහත්මයාට නිවසක් සම්බන්ධ ප්‍රශ්නය ගැන. ඉතාමත්ම සතුටට කාරණාවක්. ගරු සභාපතිතුමනි, අපේ වත්මන් නිවාස අමාත්‍යතුමන් විමල් වීරංශ මැතිතුමන් චිත්‍රා වාකිෂ්ට මැතිනියටත්, හරුන් ලන්ත්‍රා මැතිතුමාටත් ඔවුන්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ කර දීලා තිබෙනවා. ඒක අපේ කලාකරුවන්ට ඉතාමත්ම විශාල සහනයක් සහ සතුටට කාරණාවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොඩිකාර ඇමැතිතුමා

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

කොඩිකාර ඇමැතිතුමා මතුවට කරමින් පවතිනවා. අපි ඒක දන්නවා. මෙවැනි කාරණා කලාකරුවන්ට විශාල මානසික සහනයක් ගරු සභාපතිතුමනි. තමුන්ගේ මුළු ජීවිත කාලයම කලාව වෙනුවෙන් කැප කරපු පිරිසක් මේ කලාකරුවන් කියන්නේ. මම වරක් අයවැය විවාදයකදී ප්‍රකාශ කළා. අවුරුදු 273 කට පෙර තෙරුක්කුරල් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මූලාසනය පැත්තට අවධානය යොමු කරන්න. පුටු හරවාගෙන අනික් පැතිවලට ඉන්න එපා. මූලාසනයට ගරු කරන්න. ඔබතුමන්ලාට කථාව අහන්න පුළුවන් නේ?

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

ගරු සභාපතිතුමනි, අවුරුදු 273 කට කලින් අපේ රටට සංක්‍රමණය වුණු තෙරුක්කුරල් නැටුම් සම්ප්‍රදාය හරහා අපේ නාට්‍ය කලාව ආරම්භ වුණත්, ඒ සම්ප්‍රදාය කොහොම උතුරේ සිට දකුණට ආවත් ඒ තුළින් ජාතික සමගිය ඇති කරන්න පුළුවන් ආකාරයට එය ප්‍රයෝජනයට ගැණුනේ නැහැ. ඒ එවකට තිබුණු සමාජ වටපිටාව නිසා විය හැකියි. නමුත් ගරු සභාපතිතුමනි, අද දවස වන විට එහි අවශ්‍යතාවය ඉතා දැඩි ලෙස පැන නැඟිලා තිබෙනවා. නීතීඥ එස්.ජී. පුංචිහේවා මහතා විසින් රචිත උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමේ නිර්දේශ මා සඳහන් කළ අවශ්‍යතාවය ඉතාමත්ම මැනැවින් සාකච්ඡා කරලා තිබෙනවා. මම කලාකරුවෙක් හැටියට යෝජනා කීපයක්, ඔබතුමා මගින් මේ පළාත් සභාවේ අපේ සංස්කෘතික හා කලා කටයුතු ඇමැතිතුමන් වෙත ඉදිරිපත් කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, සියලු තරුණ නාට්‍යකරුවන්ට පැමිණිය හැකි ස්ථානයක් බවට –

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා ගැන කියන්න කෝ අනේ !

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

කියනවා. කියනවා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා බස්නාහිර –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා පළාත් සභා වැය ශීර්ෂයට කථා කරන්න. මම හිතන්නේ ඒක වැඩිය හොඳයි.

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

අපි දන්නවා, උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා බස්නාහිර පළාතේ ජනතාවට කරලා තිබෙන සේවය පිළිබඳව. කරමින් යන සේවය පිළිබඳව. ඒ පිළිබඳව මේ පොතේ මැනවින් තිබෙනවා. මේක අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මේක කියෙව්වොත් කාටත් දැනගන්න පුළුවන් වෙයි මොනතරම් සේවයක් කරලා තිබෙනවාද කියලා. ඇඟ හිරි වැටෙන සේවයක්. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කලා කටයුතු හා සංස්කෘතික අංශයට එතුමන් කරලා තිබෙන සේවය අතිමහත්. වචනවලින් කියන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

How many pages?

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

So many pages. ගරු සභාපතිතුමනි, සියලු තරුණ නාට්‍යකරුවන්ට, අපට හොඳ තෝතැන්නක් තිබෙනවා. බස්නාහිර පළාතේ සෞන්දර්ය නිකේතනය.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක දැන් ඉවරයි.

**ගරු රොජර් සෙනෙවිරත්න**
Hon. Roger Senevirathne

ඒක ඉවර නැහැ. ඒක අපි මැනවින් සුද්ද බුද්ද කරලා ඉතාමත්ම නිර්මාණාත්මක ස්ථානයක් බවට පත් කරනවා. ඒක දෙකක්

නැහැ. ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා ඔබතුමා මහින් ගරු ඇමැතිතුමාට. බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය අපට තිබෙන හොඳ තෝතැන්නක්. තරුණ තරුණියන්, නාට්‍යකරුවන් මේ ස්ථානයට රැස් කරන වැඩ පිළිවෙළක් ඒ හරහා දියත් කළ යුතුයි. හැකි පමණ ඉක්මණින් එය කළ යුතුයි. ඔවුන් සම්බන්ධ කරලා වසරක ඩිප්ලෝමාවක් සහිත නාට්‍යකරණ හා රංග කලාවට අදාළ පාඨමාලාවක් මෙම ස්ථානයේ ආරම්භ කළ යුතුයි. ගරු සභාපතිතුමනි, අපේ අධ්‍යාපන අමාත්‍යතුමන් සමඟ සාකච්ඡා කරලා බස්නාහිර පළාතේ ඇති සියලු පාසල්වල දරු දැරියන් සියයකගෙන් සමන්විත සාහිත්‍ය කණ්ඩායමක් නිර්මාණය කරන්න මම යෝජනා කරනවා. ඒ යෝජනාව මම කරන්නේ ගරු සභාපතිතුමනි, එහෙම කණ්ඩායමක් සම්බන්ධ කරලා, සංවිධානය කරලා ඔවුන්ට ඉතා හොඳ පුහුණුවක් ලබා දිය යුතුයි. නායකත්වය පිළිබඳව, රසඥතාවය පිළිබඳව, රංග කලාව සහ සාහිත්‍ය පිළිබඳව. දරුවන් ලවා තම පාසලට ළමයින් ප්‍රවාහනය කරන සියලුම වෑන් රථවල ශබ්ද රසයට පමණක් සීමා වුණු විශාල ගීත තැටි ප්‍රචාරය කරනවා. ඒ ගීත තැටි වෙනුවට ඉතාමත් ගුණාත්මක හරයක් සහිත ගීත, දේශාභිමානී ගීත ඒ වෑන් රථවල ප්‍රචාරය කරන්න, වැඩ කටයුතු සලසවන්න ඒ දරු දැරියන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා මම ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. ඒ හරහා ගුණාත්මක මනසක් සහිත දරු දැරියන් පිරිසක් හෙට දිනයේ අපේ ආදරණීය මාතෘ භූමිය භාර ගන්න සමාජගත වෙනවා. මේ කටයුත්තට අපි හැමෝටම සහභාගි විය හැකි නම්, හැමෝටම සහභාගි වෙන්න පුළුවන් නම් ගරු සභාපතිතුමනි, සමස්ත ජාතියේම ගෞරවය ආදරය පළාත් සභාවටත් අපි සියලු දෙනාටමත් ලැබෙනවා නිසැකයි.

ඒත් එක්කම මම මුලින් සඳහන් කළා වාගේ ඉතිහාසය වීරයන් බිහි කළා. ඔවුන් අපට ජාතික වීරයන් වුණා. අනාගත දරු දැරියන් ගරු මහ ඇමැතිතුමාවත්, ගරු උපාලි කොඩිකාර මැතිතුමාවත්, මේ බස්නාහිර අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්වත් ජාතික වීරයන් ලෙස දකීවි. ඔවුන්ට නිසි මඟ පෙන්වලා මෙම කටයුත්ත සාර්ථක කර ගන්න පුළුවන් වුණොත් - ගරු සභාපතිතුමනි, මම උපාලි කොඩිකාර මැතිතුමන්ට ස්තුතිවන්ත වෙනවා. මෙතෙක් ඔහු කරලා තිබෙන සේවය ඉතාමත්ම වැදගත්. 2013 අයවැයේදී කළ යෝජනාව ඔහු විසින් ක්‍රියාත්මක කරයි කියලා මම විශ්වාස කරනවා. ඔහුට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 01.03 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම විශිෂ්ට, සුවිශේෂී අමාත්‍යවරයෙක් ගැන අපේ ජනාධිපති උපදේශක උපාලි කොඩිකාර මැතිතුමාගේ අයවැය ශීර්ෂය ගැන කථා කිරීමට කාලය ලබා දීම ගැන සතුටු වෙනවා. දැන් මට පෙර කථා කරපු අපේ සහෝදර මන්ත්‍රීවරු දෙදෙනාම මට තේරුණේ (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මම කල්පනා කළා මම සාමාන්‍ය කථාවක් කළොත් මට ලොකු අසාධාරණයක් වෙනවා කියලා. මොකද දැන් මට වෙලා තිබෙන්නේ, අසාමාන්‍ය කථාවක් කරන්න. මම හැමදාම ඇත්ත කියපු පුද්ගලයෙක් හැටියට දැන් මට ඒක කරන්න බැරි වෙලා තිබෙනවා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, දැන් මම දැක්කා, දෙන්නෙක් අර නළුවෝ වාගේ හොඳම සම්මානයට තරග කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එක්කෙනෙක් නළුවෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක්කෙනෙක් නළුවෙක්. හැබැයි අපේ පැත්තෙන් තරග කරපු එක්කෙනාට වැඩිය කලාකරුවා ඊට වැඩිය හොඳ රඟපෑමක් කළා. හැබැයි, මම මේ සභාවට මතක් කරලා දෙන්න ඕනෑ. ඔය කොච්චර රඟපෑම් කළත් වැඩක් නැහැ. අපේ කොඩිකාර ගරු ඇමැතිතුමාගේ රඟපෑම තරම් විශිෂ්ට රඟ පෑමක් කාටවත් කරන්න බැහැයි කියලා. ගරු සභාපතිතුමනි, අපට හැමදාම කියනවා, හොඳ කියන්නේ නැහැයි කියලා. ඔන්න අද තොග පිටින් අපි හොඳ කියනවා. අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මළ පිටින් දුන්නා. දැන් මටත් වෙලා තිබෙන්නේ හොඳ කියන්න. මොකද නැත්නම් මම මෙතැන නරක මිනිහෙක් වෙනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

කියන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා වරින් වර ඔය වැඩේ කරන්න එපා. ඔබතුමා නිතරම මයික්‍රෆෝනය පාවිච්චි කරලා බාධා කිරීම් කරනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

ගරු සභාපතිතුමනි, මගේ නම කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා නිරන්තරයෙන්ම ඔය වැඩේ කරනවා. මම හැමදාම දැකලා තිබෙනවා. කරුණාකර ඒ දේ කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසා ගරු සභාපතිතුමනි, අපේ ගරු මහ ඇමැතිතුමාගේ අයවැය ප්‍රකාශනයේ 04 වැනි පිටුවට ඔබතුමාගේත්, සභාවේත් අවධානය යොමු කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන ඇමැතිතුමාගේ වැය ශීර්ෂය නොවෙයි තිබෙන්නේ. ප්‍රවාහන අමාත්‍යාංශයේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මල්ලේ පොල්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකේ ඔක්කොම අමාත්‍යාංශ ගැන තිබෙනවා. අයවැය ප්‍රකාශය. මේකේ කොච්චර බොරු කියලා තිබෙනවාද කිව්වොත් ගරු සභාපතිතුමනි, මේකේ තිබෙනවා, 4 වැනි පිටුවේ 01 වැනි එක හැටියට ව්‍යාපෘති අවිච්ඡේද වීමේ වැඩි වීම. ඊට පස්සේ තිබෙනවා, ඇස්තමේන්තු තාත්වික නොවීම. සැලසුම් නොකිරීම. මම මේ කෙටියෙන් කියන්නේ. ඒකාබද්ධ සැලසුම් නොමැති වීම. ඉතින් අපි මේ අමාත්‍යාංශය ගැන බලපුවාම ගරු මහ ඇමැතිතුමා කොච්චර බොරු කියලා තිබෙනවාද? එතුමාම කිව්වා එතුමාගේ අමාත්‍යවරු තමයි හොඳම අමාත්‍ය මණ්ඩලය කියලා. එහෙම කියලා මේ වාගේ 10 ක් තිබෙනවා. කියන්න ගියොත් මගේ කාලය යනවා. ඒ නිසා මම මීට වැඩිය කියන්න කැමැති නැහැ. ගරු සභාපතිතුමනි, අපට ලැබිලා තිබෙන මේ සුවිශේෂී අවස්ථාව. සුවිශේෂී අමාත්‍යවරයා ගැන ඊයේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සභාවේදී කොච්චර හොඳ කිව්වාද? එතුමා බස් රථ -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඔබතුමාට හොඳ කියපු එක ගැන කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කියන්න යන්නේ ඒ විස්තරේ. ඔබතුමාගේ හොඳ එතුමා කියන්න යන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන්නේ ඔබතුමාට කියපු හොඳ ගැන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අර Photo Copy මැෂින් එකත් බොරුවක්. ඒක ඉස්කෝලෙට දීලා නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපි භක්ති ගීත කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමා කොච්චර හොඳ කිව්වාද කිව්වොත් මම හිතන්නේ, එතුමාට කොන්දක් පණ තිබෙනවා නම් අද ඡන්දය දෙද්දී මෙතුමාට පක්ෂව ඡන්දය දෙන්න ඕනෑ. නැත්නම් එතුමා කරන්නේ විශාල අසාධාරණයක්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම මේ සභාවේ මෙතෙක් කල් මම අහගෙන සිටියා, මෙතුමාට නොයෙකුත් අවලාද, ඒ වාගේම චෝදනා ඉදිරිපත් කරපු අය අද මෙතුමාට පක්ෂව ඡන්දය දෙන්න ඕනෑ. නැත්නම් අපි කරන්නේ ලොකු අසාධාරණයක්. මොකද, අපි මෙතුමා ගැන මෙච්චර හොඳ කියද්දී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය දෙන්නත් දෙනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමන්ගේ පක්ෂයේ අය එතුමාට අත උස්සලා ඡන්දය දුන්නේ නැත්නම් ලොකු අසාධාරණයක් කරන්නේ. ගරු සභාපතිතුමනි, ක්‍රීඩාව ගැන සුළු වශයෙන් මම කථා කරන්න කැමැතියි. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයෙක් කාය වර්ධන තරගයකට ගියා. ආසියාවේ හොඳම කෙනා හැටියට තේරුණා. එතුමා මටත් ආරධනා කළා, ලංකාවට එන දවසට එන්න, පොඩ්ඩක් මාව මීගමුවේදී පිළිගන්න කියලා. ඉතින් මමත් ගියා. මම ගිය වෙලාවේ එතුමා මට කිව්වා. මන්ත්‍රීතුමා, අපට මේක කරන්න. විශාල ලෙස මේ පළාත් සභාවේ අමාත්‍යවරයා විසින් ප්‍රතිපාදනද, ඒ අවශ්‍ය මොනවාද සියලුම දේ ලබා දීලා තිබෙනවා කියලා. ඒ වාගේම අනික් දවසේ කථා කරලා ඒ ක්‍රීඩකයාව මෙතුමා ජනාධිපතිතුමා ළඟටත් එක්කගෙන ගිහිල්ලා තිබුණා. කොච්චර විශිෂ්ටද බලන්න. හැමෝටම කරන්න පුළුවන් දෙයක්ද මේක. තිබෙන පහසුකම් ඔක්කෝම දීලා මේ ක්‍රීඩකයාට. ක්‍රීඩකයාට දෙන්න පුළුවන් පහසුකම් ටික - මේ ක්‍රීඩකයාට ටිකට් එක පවා අරන් දීලා තිබෙන්නේ ඇමැතිවරයා සම්බන්ධ වෙලා. ඔබතුමා නේද? ඒ තරගයට යන්න ටිකට් එකත් අරන් දුන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන්. එතරම් සේවයක් ක්‍රීඩාවට කරනවා.

මේ අමාත්‍යතුමා ගැන අපි හොඳ කියන්නේ නැතිව නරක කියන්න කියලද මේගොල්ලෝ කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමා දන්නෙත් නැහැ නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා දන්නවා. එතුමා නේ ටිකට් එකත් අරන් දුන්නේ යන්න. එද්දී පිළිගන්නත් ආවා. එද්දී කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට පිළිගන්නත් මෙතුමා ආවා. නැද්ද කියලා අහන්න. ගරු සභාපතිතුමනි, දැන් ඒ ක්‍රීඩකයයි, වත්තල ඉන්න කාය වර්ධන ක්‍රීඩකයයි මේ දෙන්නා දැන් ලෝක ශූරතාවයට ගිහිල්ලා තිබෙනවා. එතුමන්ලාටත් මම හිතන්නේ ටිකට්, ඔක්කෝම දේවල් ලබා දෙන්න ඇති නේද? ගරු ඇමැතිතුමා. ලෝක ශූරතාවයට යද්දී දුන්නාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කථා කරන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඇමැතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නේ. ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අහන්න බැහැ. අදහස් ඉදිරිපත් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමා වෙත මම මේ ප්‍රශ්නය අහනවා. එතුමාගේ කථාවේදී පිළිතුරක් බලාපොරොත්තුවෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කථාවේදී පිළිතුරු දෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි,

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

නරක පූර්වාදර්ශයක් දෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කථා කරන්න පුළුවන්. ඇමැතිතුමාට පුළුවන් උත්තර දෙන්න.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අහන්න බැහැ. ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ කථාවේදී -

[සභාවේ ඝෝෂා]

ගරු ඇමැතිතුමාගේ කථාවේදී ඒකට උත්තරයක් දෙයි. දැන් කියුබාවට ගිහිල්ලා ඔක්කෝම වියදම්, කන්න බොන්න, ඉන්න දීලා, ඔක්කෝම වියදම් දරලා -

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ෆොටෝ කොපි මැෂින් එක දීලත් නැහැ මෙතුමා. බොරු කිව්වේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාට ඒ ගැන අපි හොඳ කියන්න ඕනෑ. මොකද හදිසියේවත් ලෝක ශූරතාවයවත් අරගෙන ආවොත්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට නම් පිළිගන්න ඉඳියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසයි මම ඇහුවේ. ගරු සභාපතිතුමනි, දැන් සමූපකාර පද්ධතිය ගැන අපේ විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාම එතුමාට මේ අවුරුද්ද පුරාම ප්‍රශංසා කළා. ඉතින් ඔච්චර ප්‍රසංශා කරද්දී අපි කොහොමද Joke එකක් කරන්නේ.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ෆොටෝ කොපි මැෂින් එක දීලත් නැහැ මෙතුමා. බොරු කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා, කරුණාකර මයික්‍රෆෝනය Off කරන්න. මයික්‍රෆෝනය පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් එතුමා කලාවට කරපු සුවිශේෂී සේවාව ගැන අපේ අර ගරු මන්ත්‍රීතුමා කොච්චර කථා කළාද? කොච්චර කථා කළාද? එතුමාගේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා කොච්චර හොඳ කිව්වාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි 02 ක කාලයක් දෙන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම තමයි අපේ හොඳ ඇමැති කෙනෙක් හිටපුවාම. අපි හොඳ කියන්න ඕනෑ. අපට මෙච්චර කල් බැන්නා හොඳ කියන්නේ නැහැයි කියලා. ගරු ඇමැතිතුමාගේ හොඳ කියද්දී පොඩ්ඩක් අහගෙන ඉන්න. ගරු සභාපතිතුමනි මට තව විනාඩියක්, එකහමාරක් තිබෙන නිසා මම පොඩි කථාවක් කියලා මගේ කථාව අවසන් කරන්න කැමැතියි. ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ක්‍රීඩා අංශය ගත්තාම අවුරුද්ද අවසානයේ තමයි ඒ සම්බන්ධයෙන් Prizes දෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

වර්ණ රාත්‍රියක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වර්ණ රාත්‍රියක්. Colours' Night. මම එච්චර උගත් කෙනෙක් නොවෙයි නේ. මට වචන පොඩ්ඩක් දන්නේ නැහැ. වර්ණ රාත්‍රියක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් දැන් අපි ක්‍රිකට් ක්‍රීඩාව ගත්තාම මේකට – දැන් ඉස්කෝලවල ක්‍රිකට් ක්‍රීඩාව ගන්න කෝ. දැන් මේකට තෝරනවා, හොඳම, දක්ෂතම ක්‍රීඩකයාව. ප්‍රසිද්ධම ක්‍රීඩකයාව. ඒ වාගේම දැන් කලාවටත් තිබෙනවා හොඳම නළුවා. දක්ෂතම නළුවා. ජනප්‍රිය නළුවා මේ වාගේ රාශියක් තිබෙනවා නේ. ඉතින් මම හිතන්නේ අර ජනතාව විසින් තෝරාගන්න ප්‍රසිද්ධතම නළුවා තමයි. අපි ප්‍රසිද්ධතම නළුවා කියන්නේ හොඳම නළුවා නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කුපන්වලින් එන එක්කෙනා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කුපන්වලින් එන එක්කෙනා. අපේ කොඩිකාර ගරු ඇමැතිතුමා ඇවිල්ලා දක්ෂතම නළුවා, දක්ෂතම ක්‍රීඩකයා හැටියට තමයි මේ කැබිනට්ටුවේ අපි දකින්නේ. අපේ අනික් අමාත්‍යවරු ඒ ගැන කනගාටු වෙන්න එපා. අපේ පළාත් සභාවේ ඉන්න, කැබිනට්ටුවේ ඉන්න දක්ෂතම පිතිකරුවා. දක්ෂතම ක්‍රීඩකයා. දක්ෂතම පන්දු යවන්නා. හැබැයි ප්‍රසිද්ධම කෙනා නොවෙයි වෙන්න පුළුවන්. ඒකනේ ආණ්ඩු පක්ෂයේ කට්ටිය හැමදාම එතුමාට බණින්නේ. අරහේ පර්මිට් දීලා. මෙහේ දීලා නැහැ. ඕවා කියලා බණින්නේ. හැබැයි එතුමා තමයි හොඳම ක්‍රීඩකයා බව කියමින් මම මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. මෙම අවස්ථාවේදී සභාව දිවා විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.15 ට යළිත් රැස්විය.***

*Accordingly the Whole Council Suspended and. it resumed at 02.15 p.m.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.16 ]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරුසභාපතිතුමනි, දිවා කාලයෙන් පස්සේ හා හා පුරා කියලා මෙම අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම මම ඉතා අගය කොට සලකනවා. අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා විෂයයන් රාශියක් භාර අමාත්‍යවරයෙක් හැටියට ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් හා ග්‍රාම සංවර්ධන, මම හිතන්නේ විෂයයන් දහයක්, දොළහක් තිබෙන අමාත්‍යවරයෙක් හැටියට එතුමා කළ කී දේවල් පිළිබඳව වර්ණනා කරනවා වාගේම, එතුමාට ඉදිරියේදී කෙරෙන්න තිබෙන කාරණා කීපයක් පිළිබඳව මම අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා විශේෂයෙන් සමූපකාර විෂයය පිළිබඳ අමාත්‍යවරයා හැටියට කටයුතු කරන නිසා මටත් යම් අයිතියක් තිබෙනවා සමූපකාරය

පිළිබඳව කථා කරන්න. එක වකවානුවක මමත් සමූපකාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු නිසා. මම ඒ වකවානුවේ සමූපකාර අමාත්‍යවරයා වුණාම මම හිතුවා මේ විෂයය ඉතාම ලෙහෙසි පහසු කාර්යයක් කියලා. නමුත් මේ අමාතය ධූරයේ වැඩ කටයුතු කරගෙන යන කොට තමයි ඒකේ භාරදූර කාර්යය සහ එහි භාරදූරකම මට දැනුණේ. ඒ වාගේම සමූපකාරයේ පරමාර්ථ අරමුණු රාශියක් තිබුණත් සැබෑවින්ම පාරිභෝගිකයාට, නැත්නම් අපේ සාමාන්‍ය දිළිඳු ජනතාවගේ ජන ජීවිතය උසස් කරන්න, සමූපකාරයේ තිබෙන තේමාව තුළ කටයුතු කරන්න මම අමාත්‍යවරයා හැටියට කටයුතු කරන අවධියේදී හුඟක් වේලාවට අසීරු වුණා. ඒ අවස්ථාවේදී නොයෙක් ක්‍රමවේදයන් අපි පාවිච්චි කළා. යම් යම් ක්‍රමවේදයන් සාර්ථක වුණා. යම් යම් ක්‍රමවේදයන් අසාර්ථක වුණා. නමුත් අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා සමූපකාර අමාත්‍යවරයා හැටියට සමූපකාර ක්ෂේත්‍රයේදී යම් යම් එඩිතර තීන්දු තීරණ ගැනීම පිළිබඳව මම මේ අවස්ථාවේදී ප්‍රශංසා කරන්න ඕනෑ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට වැඩිය ගොඩක් හොඳයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම ඒක කිව්ව නේ ගරු සංවිධායකතුමා. ඒක නේ කිව්වේ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට වඩා දාහකින් හොඳයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක නේ කිව්වේ?

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක නේ ඇමැතිකම නැති වුණේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු සංවිධායකතුමා. බාධා කරන්න එපා. ඔබතුමාට ඕනෑ තරම් කාලය දෙන්නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පී.ඩී. ජෝර්ජ් වෙන්න එපා. ජෝර්ජ් පෙරේරා වෙන්න. පී.ඩී. ජෝර්ජ් කියන්නේ පැනලා දෙන ජෝර්ජ් වෙන්න එපා. හැබැයි, හිතාගෙන ඉන්නේ ජෝර්ජ් බුෂ් කියලා. ජෝර්ජ් බුෂ් කියලාද හිතේ. වාඩි වෙන්න. ගරු සභාපතිතුමනි, මේ ඇට මැස්සට වාඩි වෙන්න කියන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක තමයි ඇමැතිකමත් දාල යන්න වුණේ. ඇට මැස්සාගේ වැඩ හින්දා තමයි. ඒ ඇට මැස්සා තමයි විශ්වාසභංග යෝජනාව ගෙනාවේ. මතකද එදා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු මන්ත්‍රීතුමා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. අනවශ්‍ය විවාදවලට යන්න එපා. ඔබතුමා අදාළ මාතෘකාවට කථා කරන්න කෝ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මෙතුමා දන්නේ නැතිව ඇති මම පළාත් සභා දෙකක අවුරුදු 10 කට ආසන්න කාලයක් ඇමැතිකම් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු සංවිධායකතුමා, ඔබතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. එතුමාට බාධා කිරීම් කරන්න එපා. බාධා කිරීමේත් සීමාවක් තිබෙනවා නේ? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ලොකු තරහක් තිබෙනවා. ඔයා ශ්‍රීනාත් වෙන්න යනවා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මම කියාගෙන ගියේ මේ බධා කිරීම්වලට ඉස්සෙල්ලා –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

36(1) යටතේ මොකක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතැන ඉන්න එකම ශ්‍රීනාත් මම. මේ සභාවේ ඉන්න එකම ශ්‍රීනාත් මම. ගරු සභාපතිතුමනි,

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මගේ කාලය. වටිනා කාලය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම භය නැහැ. ඔබතුමා නම් හිරුණිකා කිව්වොත් භය වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආයේ පටන් ගත්තා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හිරුණිකාගේ වැඩ මෙතැන කරන්න හදන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්දව වාඩි වෙන්න කෝ. අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩි කෙල්ලෝ කරන වැඩ කරන්න හදන්න එපා. ලජ්ජා නැති වැඩ කරන්න හදන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කලබල වෙන්න එපා. ශ්‍රීනාත්ලා ගොඩක් ඉන්නවා. ඔබතුමා ලස්සන කථාවක් කළා නේ. මට පැහැදිලියි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මාගේ කාලය ඔබතුමා සටහන් කරගන්න. මගේ කාලය ගියා. ඉතින් ගරු සභාපතිතුමනි, මම කියාගෙන ගියේ සමුපකාර විෂයයේ තිබෙන බැරෑරුම්කම මට එවකට තේරුම් ගියා කියන කාරණාව. ඒ අස්සේදී තමයි අපේ යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පැන්නේ.

**ගරු යූ. ජෝර් පෙරේරා – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

දැනුත් පනිනවා. අර මොන්ටෙරෝ

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අර බියගම විලේජ් කථාව නේ. මම ඒක පස්සේ කියන්නම්.

[සභාවේ සෝෂා]

එතුමාට බියගම විලේජ් කිව්වාම කේන්ති යනවා.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

[සභාවේ සෝෂා]

හරි හරි. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. පළාත් සභාවේ හිටපු ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්. ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවල පැටලෙන්න යන්න එපා. ඔබතුමා විෂයයට අනුව කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මට ඕනෑ වෙලා තිබුණේ, මේක සංසන්දනය කරලා දෙන්න. මම ඉතාම සතුටු වෙනවා. මගේ වකවානුවට වඩා සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා හැටියට ඉතාමත්ම තීක්ෂණ බුද්ධියෙන් සමූපාකාරයේ නියම අරමුණ කරා සමුපකාරය ගෙනි යනවා කියන කාරණය තමයි පාර්ලිමේන්තුවට පමණක් දෙවැනි වන මේ උත්තරීතර සභාවේදී මට කියන්න ඕනෑ. එතුමා කිසි භයක් නැතිව යම් යම් තීන්දු ගන්නවා. ඒ හැම තීන්දුවක්ම ගන්නේ කවුරු වෙනුවෙන්ද? අහිංසක පාරිභෝගික ජනතාව වෙනුවෙන්. එතුමා මහරගම සමුපකාරය පිළිබඳ ප්‍රශ්නයකදී නිර්භයව තීන්දුවක් ගත්තා. යාළුකම් බැලුවේ නැහැ. පක්ෂ පාට බැලුවේ නැහැ. එතුමාට එන කරුණු කාරණා තුළ හරියි කියලා තීන්දුවක් ගත්තා. මහරගම. ඒක එතුමා කාගෙන්වත් තරහ පිරිමහන්න නොවෙයි. කාටවත් අකටයුත්තක් කරන්නවත් නොවෙයි. තිබෙන නීති පද්ධතිය තුළ එතුමා තීන්දුවක් ගත්තා. හැබැයි, උසාවියෙන් ඒක අභියෝගයට ලක් කරලා, ඒක වැරැදියි කියලා සභාපතිතුමාව යළිත් වරක් එතැන ස්ථාපනය

කළා. මම මේ කියන්න යන්නේ එතුමාගේ තීන්දු ගැනීමේ තිබෙන නිර්භයකම.

ගරු සභාපතිතුමනි, අපට කඩුවෙල සමූපකාර සමිතිය කියන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ ගෞරවයට පාත්‍ර වුණු ලංකාවේ තිබෙන ඉහළම ප්‍රමිතියෙන් යුතු සමූපකාරය. ඒ සමූපකාරයේ වර්තමාන සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී මේ සිය දෙනාම ගෞරව බහුමානයට පාත්‍ර වෙලා තිබෙන්නේ, ඒ සමුපකාරයෙන් වන සුවිශාල සේවය නිසයි. හැබැයි මේ සමූපකාරය කන්න ජරා අධිපති කෙනෙක් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නගරාධිපති කෙනෙක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු මන්ත්‍රීතුමා නගරාධිපති කියලා නොවෙයි කිව්වේ. ජරා අධිපති කියලා. ජරා අධිපති කෙනෙක් උත්සාහයක යෙදෙනවා. ඡන්දයක් තියන්න. හැබැයි, ඡන්දය සියලුම සාමාජිකයන්ගෙන් පරිපූර්ණ වුණු ඡන්දයක් වෙන්න ඕනෑ. එහෙම නොවී තිබෙන ඡන්දයක් වලංගු වෙන්නේ නැහැ. මේ අය ප්‍රචාරයක් ඇරියා, මේක මම මෙතුමාට අගෞරවයක් වෙන්න කියන දෙයක් නොවෙයි. මේ සභාවේ දැන ගැනීමට කියන්නේ. සිරසේ ගියේ. ගරු ඇමැතිතුමාට හාල් මුට්ට පහක් ඇරියා නම් ඕනෑ වේලාවක ඡන්දේ කල් දා ගන්න පුළුවන් කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ ඇමැතිතුමා එහෙම වැඩ කරන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එහෙම එතුමා කරන්නේ නැහැයි කියලා එතුමා ඡන්දයකට ගියා. ඡන්දයක් දුන්නා. මම මේ කියන්න යන්නේ, ඒකේ කිව්වා කොමසාරිස්ටත් එකක් කියලා. ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, එතුමා නිර්භීත පියවරක් ගත්තා. උඹලා එහෙම කියනවා නම් මම එහෙමනම් ඡන්දය තියනවා කියලා, ඡන්දයකට යන්න ලක ලැහැස්ති කළා. හැබැයි සාධාරණ ඡන්දයකට නොවෙයි. ඒ කැදරකමට ඉන්න මිනිස්සු ලක ලැහැස්ති වුණේ. අද ඒ ප්‍රදේශයේ ජනතාව උසාවියට ගියා. මහධිකරණයට ගියා. අද තීන්දුවක් දුන්නා කඩුවෙල විවිධ සේවා

[ ගරු හෙක්ටර් බෙත්මගේ ]

සමූපකාර සමිතියේ ඡන්දය අත්හිටුවන්න ඕනෑය කියලා. මම ගරු ඇමැතිතුමාට ප්‍රශංසා කරනවා. එතුමා අපට නිදහසේ තීන්දු තීරණ ගන්න, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ කටයුතු කරන්න අද එතුමා කටයුතු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම සමූපකාර ඇමැති කාලයේ මේ වාගේ අභියෝග මට ආවේ නැහැ. මම කියන්න ඕනෑ අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මේ වාගේ සංකීර්ණ ප්‍රශ්නවලදී ඉතාමත්ම බුද්ධිමත්ව කටයුතු කරනවයි කියන කාරණාව. මම මගේ පොදු සාකච්ඡාව අවස්ථාවේදී ප්‍රකාශ කළා. එතුමා ප්‍රවාහන අමාත්‍යවරයා හැටියට මේ රටේ දුගී දුප්පත් මගී ජනතාව වෙනුවෙන් TNL එකේ ජන හඬට ඉදිරිපත් වෙලා එතුමා තර්ක විතර්ක කරමින් පස් දෙනෙකුගේ මැද්දේ තනියෙන් ඉඳගෙන සීගිරි ගල වාගේ උත්තර දෙන කොට මට එතුමාගේ අනුගාමිකයෙක් වෙන්න හිතුනා. ඒ මොකද එතුමා ඉතාමත්ම කෘතහස්ත, ප්‍රශස්ථ අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කළේ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම මෙතැන හිටියේ නැහැ. අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා එක්තරා කාන්තාවක් පිළිබඳව දෝෂාරෝපණයක් කරලා තිබෙනවා. මම ඒ කාරණාව දන්නවා. මොකද මම සමූපකාර අමාත්‍යවරයා වශයෙන් සිටින කාලයේ ඉඳන් තමයි ඔය චන්ද්‍රලතා මාගම්මුදලි කියන කාන්තාවගේ ප්‍රශ්නය තිබුණේ. අවුරුදු 36 ක් ඇයගේ සේවය තිබුණත් අවුරුදු 3 1/2 යි සේවය කරලා තිබෙන්නේ.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මාගම් සෝළියක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම එහෙම වචන කියන්නේ නැහැ. අවුරුදු 36 න් අවුරුදු 3 1/2 යි සේවය කරලා තිබෙන්නේ. හැබැයි අද එයා එයාට නොගැළපෙන තනතුරු ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒ විනාඩි දෙකේදී මම කියන්න ඕනෑ දේ කියන්නම්. ගරු සභාපතිතුමනි, මෙතුමා නම් කරලා තිබෙනවා, ඉතාමත්ම ගැළපෙන සමූපකාර කොමිෂන් සභාවක්. මගේ කාලයේ කොමිෂන් සභාවක් තිබුණා. ඒක පණ නැති කොමිෂන් සභාවක්. මම ලජ්ජා නැතිව කියන්නම්. අද එතුමා කොමිෂන් සභාවට හොඳ සභාපතිවරයෙක් පත් කරලා තියෙනවා. හිටපු ප්‍රාදේශීය ලේකම්වරයෙක් එහි ලේකම් වශයෙන් පත් කරලා අද හොඳ

සමුපකාර කොමිෂන් සභාවක් බවට පත් කරලා තිබෙනවා. එහි හොඳට වැඩ කටයුතු සිදු වෙනවා. මේ සමුපකාර ක්ෂේත්‍රයේ ඉන්න ඉස්සර සේවක සේවිකාවන් ඉතාම කණස්සලෙන් හිටියේ, තමන්ගේ ප්‍රශ්න විසඳෙන්නේ නැති නිසා. ඔවුන්ගේ වැටුප් වර්ධකයක ප්‍රශ්නයක් තිබුණාම අවුරුදු ගණන් ෆයිල් එක තිබෙනවා. අද උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ උපදේශකත්වයෙන් පත් කරලා තිබෙන සමුපකාර කොමිෂන් සභාව ඉතාමත්ම කාර්යක්ෂම කොමිෂන් සභාවක්. ඒ කාර්යක්ෂම කොමිෂන් සභාව අර කාන්තාවගේ වන්දි මුදල් දීමේදී සාධාරණ තීන්දුවක් ගත්තා. මොකක්ද? ඇය උපරිමාධිකරණයට ගිහිල්ලා අභියෝග කරපුවාම ඒ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව තමයි අද ක්‍රියාත්මක කරන්නේ. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මෙතැන නැහැ. මෙතැන හිටියා නම් මට කරුණු කියලා දෙන්නයි උවමනා වෙන්නේ. ඉතින් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාට කියනවා, මේ චන්ද්‍රලතා මාගම්මුදලි කියන කාන්තාව පිළිබඳව ගත්ත තීන්දුව සමුපකාර කොමිෂන් සභාව කිසිසේත්ම වෙනස් නොකළ යුතුයි කියන කාරණාවයි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. තරුණ කටයුතු අමාත්‍යවරයා හැටියට තරුණයෙක් නොවුණත් තරුණයෙක් වාගේ කටයුතු කරනවා. එතුමාට කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරයත් තිබුණා නම් තමයි වඩා හොඳ කියලා මම කල්පනා කරනවා. මොකද, මමත් කාලයක් කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරය දැරුවා. ඒ වාගේම එතුමාගේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ පිළිබඳ විශේෂඥයෙක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මම එතැනින් එහාට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද සභාව මාව නොමඟ යවලා මගේ ගරු අමාත්‍යතුමාව සමච්චලයට ලක් කරන්නයි හදන්නේ. ඒකට මම කවදාවක්වත් අවස්ථාවක් දෙන්නේ නැහැ. අවසාන වශයෙන් උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි දෙකක් දෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නිරෝෂන් මන්ත්‍රීතුමා ඇවා. දැන් කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම මෙතුමාගේ නම සඳහන් කළා. අර ඔබතුමා දුක්බරව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

කථා කරපු කාන්තාවගේ නියම තත්ත්වය.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ලෝකයේ තවම පිරිමි ගැබ්වෙලා නැහැ. වුණා නම් මෙතුමා විතරයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නැහැ, මම කිව්වේ හැඟීම්බරව. සමාවෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගැබ්බර එහෙමනම් ඉවත් කර ගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම ගැබ්බර වචනය ඉවත් කර ගන්නවා. හැඟීම් බරව කථා කරපු කාරණාව පිළිබඳව. ගරු සභාපතිතුමනි, එතැනින් එහාට කථා කරනවා නම් අපේ ග්‍රාම සංවර්ධන විෂයය. ග්‍රාම සංවර්ධන විෂයය කියන්නේ, ජනතාවට ඉතාමත්ම සමීප වුණු විෂයයක්. හැබැයි, මේ ග්‍රාම සංවර්ධන විෂයයේදී අපේ ඇතැම් ග්‍රාම සංවර්ධන විෂයය භාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න නිලධාරින් ජනතාවට ඒ සම්පූර්ණ සහයෝගය දෙනවාද කියන කාරණාව මට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, මැත යුගයේ කෙසේද කියලා. ඒ නිසා ග්‍රාම සංවර්ධන කටයුතුවලදී ඒ නිලධාරින් අපේ ජනතාවට වඩා සමීප වෙන්න ඕනෑ. ඊළඟ කාරණාව තමයි ඒ නිලධාරින් දැන ගන්න ඕනෑ, මේ රට පාලනය කරන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ රජය කියන කාරණාව. ඒ නිසා පක්ෂයට පක්ෂපාති වෙලා නොවෙයි. රජයට පක්ෂපාති වෙලා කටයුතු කරන්න ඕනෑ. එහෙම නොකරන අවස්ථා තිබෙන නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව සුවිශේෂ තීන්දුවක් ගන්න කියලා.

අවසාන වශයෙන් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා හැටියට කලාවට සුවිශාල සේවයක් කරනවා. ඒ වාගේම සංස්කෘතික අංශයෙන් අපේ දහම් පාසල්වලට සුවිශාල සේවයක් කරනවා. ඒ කරුණු කාරණා දිහා බලපුවාම මට හොඳකාරවම විශ්වාසයි, ලබන පළාත් සභා මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයේ මහ ඇමැති ධූරය දෙනවා නම් ඒකේ වඩාත්ම

ඉස්සරහෙන් ඉන්නේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අජ්මාල් මවුජුඩ් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභා ගර්භයේ නොමැති නිසා එතුමාගේ කාලය අහෝසි වෙනවා.

ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ අ.භා. 02.31 ]

**ගරු ලාල් කුලරත්න**
Hon. Lal Kularathne

ගරු සභාපතිතුමනි, මට මගේ කථාව ආරම්භ කරන්න සිද්ධ වෙන්නේ පොඩි සෞන්දර්යාත්මක ගෝරියකින්. අපේ ගරු මන්ත්‍රීතුමෙක් එක්ක පොඩි රණ්ඩුවක් අල්ලන්න තිබෙනවා. ඊයේ මේ සභාවේදී ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, එතුමා පාසල් 28 කට ගියාය. ඒවායේ දෙමව්පියෝ හිටියාය. දරුවෝ හිටියාය. ඒ සියලුම දෙනා හැමදාම හැන්දාවට ටෙලි නාට්‍ය බලනවා කියලා අත ඉස්සුවා කියලා. දැන් ජයනාත් ගරු මන්ත්‍රීතුමා හය වෙයි මම ගෝරියක් කරන්න යනවා කියලා. ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන් කියනවා නම් ජයනාත් ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය සම්බන්ධයෙන් එක වරක් නොවෙයි, සියක් වරක් නොවෙයි, දෙසීයවරක් මම එතුමාත් එක්ක එකඟ වෙනවා. සමහරවිට රංගන ශිල්පියෙක් විධියට මේ වාගේ තීන්දුවක් ගත්ත එක සම්බන්ධයෙන් කෙනෙකුට ප්‍රශ්නයක් මතු වෙන්න ඉඩ තිබෙනවා. නමුත් සෞන්දර්ය විෂයය කියලා කියන්නේ, සෞන්දර්යය නිර්වචනය කරලා තිබෙන්නේ ආනන්දයෙන් ප්‍රඥාවට කියලා. ඒ කියන්නේ විනෝදයෙන් ප්‍රඥාවට. අද තිබෙන්නේ තනිකරම විනෝදය පමණයි. ප්‍රඥාවක් නැහැ. ඒක එකක්. අනික් කාරණය තමයි අම්මලා තාත්තලා කොච්චර ටෙලි නාට්‍ය බැලුවත්, ඉගෙන ගන්නා දරුවෝ හොඳ ටෙලි නාට්‍යයක් වුණත් ඒ පැය තුන බලනවා නම් ඒගොල්ලන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වෙනවා. හොඳ ඒවා නැහැ. ඒක තවත් කාරණයක්. දැන් අපේ සෞන්දර්ය ගැන කථා කරනකොට ඒ සම්බන්ධයෙන් මම එතුමාත් සමඟ එකඟ වෙනවා. එතුමා ඉල්ලීමක් කෙරුවා, රාජ්‍ය ආයතන දෙකෙන්වත් මේක අඩු කරන්න කියලා. මම ඒ ඉල්ලීම කරන්නේ නැහැ. මම කරන්නේ, දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටිනවා. කරුණාකර දරුවන් මේ ව්‍යසනයෙන් ගලවාගන්න කියලා. මොකද, ගරු සභාපතිතුමනි, ලංකාවේ ජනගහනයෙන් කුඩුවලට ඇබ්බැහි වෙලා තිබෙන්නේ සියයට දශම ගණනයි. නමුත් මේකට ඇබ්බැහි වෙලා තිබෙන ගණන අසාමාන්‍යයි. අසීමිතයි. ඒ නිසා එතුමාගේ කාරණය සම්බන්ධයෙන් මම එකඟ වෙනවා. ඒ ගැන ක්‍රියා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

[ ගරු ලාල් කුලරත්න ]

ඊළඟට අපේ උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරනවා නම්, එතුමා පොතක් අපට ඉදිරිපත් කරලා තිබෙනවා. එක ගරු මන්ත්‍රීතුමෙක් මේ පොතේ ග්‍රෑම් ගණන කියලා - මේ පොත කියෙව්වාද මම දන්නේ නැහැ. ග්‍රෑම් ගණන කියලා උත්ප්‍රාසයෙන් කථා කළා. මම කියනවා,

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයා බෝතල් පත්තරකාරයෙක්.

**ගරු ලාල් කුලරත්න**
Hon. Lal Kularathne

මම දන්නේ නැහැ කොහොමද කියලා. මම දන්නේ නැහැ කිරලා මැනලා දැනුම ලබා ගන්න පුළුවන්ද කියලා. නමුත් මේ පොත හරියට කියෙව්වා නම්, මම විශ්වාස කරනවා එතුමා සම්බන්ධයෙන් හොඳ බුද්ධිමත් තීරණයක් ගන්නවා කියලා. මම කථා කරන්නේ සංස්කෘතික අංශය සම්බන්ධයෙන්. එතුමාගේ පොතේ තිබෙන දේවල් මම කියන්නේ. කලායතන සංවර්ධනය කිරීම. පළාත් සාහිත්‍ය උළෙල පැවැත්වීම. පළාත් කලා උළෙල සංවිධානය කිරීම. කෙටි නාට්‍ය වැඩමුළුව. පුද්ගලික බස් කොන්දොස්තරවරුන්ට රසාස්වාදය ලබා දීම. ඊළඟට බලි ශාන්ති කර්ම දියුණු කිරීම. දැන් මේක මම කිව්වාම අපේ නූතනවාදී අදහස් තිබෙන අය කියයි බලි ශාන්ති කර්ම කියන එක මොකක්ද යකෝ. දැන් මේ ආයේ පරණ යුගයට යනවාද? කියලා ප්‍රශ්නයක් මතු වෙයි. මා ළඟ පුවත්පතක් තිබෙනවා. මේකේ දිනය 2010 පෙබරවාරි මාසයේ 21 වැනිදා. මේකේ තිබෙනවා, ලංකාවේ ඉන්න ඉහළම හෘද රෝග විශේෂඥතුමා රුවන් ඒකනායක මැතිතුමා සහ සුමිත් සමිත සිරිතුංග කියන විශේෂඥ වෛද්‍යවරයා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා තිබෙනවා. ඒගොල්ලන් කියන දේ මම වෙනම අරන් ඇවිල්ලා තිබෙනවා. මේ බලි ශාන්ති කර්ම කියන එක සම්බන්ධයෙන් මම කියන්නම්. ඒකේ මෙන්න මෙහෙම එක ප්‍රකාශයක් තිබෙනවා. මොකක්ද?

*"පළමුවන ලෝක සංග්‍රාම කාලයේ රෝහල්වල ප්‍රතිකාර ලබන යුධ සෙබලුන්ගේ හිතසුව පිණිස සංගීත බණ්ඩ වාදනය කිරීම හා නැටුම් රඟ දැක්වීම සිදු කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ තුවාල සහ ලෙඩ රෝග සුව වීමේ සීඝ්‍රතාවය ඉහළ ගොස් ඇත."*

බැරි වෙලාවත් අපේ කොඩිකාර ගරු ඇමැතිතුමා කිව්වා නම් එහෙම සංගීතය සහ නැටුම් නැටුවාම තුවාල හොඳ වෙනවා කියලා, අර උදේ අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ වෙන කතන්දරයක් එතුමාට කියයි. මේක අපි නොවෙයි කියන්නේ. ලංකාවේ ඉන්න ඉහළම හෘද රෝග විශේෂඥ රුවන් ඒකනායක මැතිතුමා කළ පර්යේෂණයක් මේ තිබෙන්නේ. අපි එකක් කියනවා. අපි කියනවා, හොර කට්ටඩියෝ ඉන්නවා.

ඇත්තයි. දැන් මෙහෙම අපි කල්පනා කරමු කෝ. මම මේ ළඟදී දැක්කා හොර වෛද්‍යවරු තිස් පන්දාහකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා කියලා. හොර වෛද්‍යවරු. අපි එහෙම හිටියා කියලා වෛද්‍ය විද්‍යාව ප්‍රතික්ෂේප කරනවාද? නැහැ. හැබැයි අපේ එක කට්ටඩි මහත්මයෙක් හොරකමක් කරලා, මොකක් හරි වැරැද්දක් කළොත් එහෙම මුළු ශාන්ති කර්ම ක්‍රමයම අපහාසයට ලක් කරනවා. ක්‍රමයම. අපි මේ කියන්නේ මේවා සොයාගත්ත විශේෂඥ වෛද්‍යවරු කියන්නේ මේ සංගීතය, නාදය, සෞන්දර්යය කියන එක අපේ මනස සුවපත් කරනවා. ඒ මනස සුවපත් කරනවා හා සමානවම ලෙඩ රෝගත් සුවපත් කරනවා. මේ තව තිබෙනවා. මේ හැමෝටම වැදගත් වෙනවා. අපේ ඉන්න වයස් කාණ්ඩයේ අයට. මේකේ තව තැනක තිබෙනවා,

*"මිනිසාගේ හෘද ස්පන්ද වේගයට සමාන ලයක් ඇති මද වේගී සංගීතය ශ්‍රවණය කිරීමෙන් අධික රුධිර පීඩනය, ස්වසන අපහසුතා පාලනය කළ හැකි අතර එමෙන්ම ඇදුම, දියවැඩියව, මානසික අසහනය සහ පාකිංසම් රෝගය වැනි රෝග සුව කිරීමේ දාකත්වයක් ලය අඩු සංගීතයෙන් ලබාගත හැක."*

කවුද මේ කියන්නේ? රුවන් ඒකනායක මැතිතුමා, එතුමාගේ හෘද රෝග වාට්ටුවේ උදයට විනාඩි 20 යි. හැන්දෑවට විනාඩි 20 යි. ලය අඩු සංගීත අස්සන්ට සලස්සනවා. ඒකේ ප්‍රතිඵලය මොකක්ද? අර බෙහෙත් විතරක් දෙන අයට වඩා අර සංගීතය අහන කට්ටියගේ හෘද රෝග සුව වීමේ වේගය ඉතාම ඉහළයි. ඉතින් මම කියන්නේ අපේ මේවා තිබුණා. ඊළඟට මේකේ තව තැනක කියනවා,

*"මේ සඳහා සංගීතය පමණක් නොව මිනිස් හඬද වඩා සුදුසු බව කිව හැකියි."*

දැන් මෙතුමා කියනවා බලි ශාන්ති කර්ම ක්‍රමය දියුණු කරනවා කියලා. ගරු සභාපතිතුමනි, බලි ශාන්ති කර්ම ක්‍රමයෙහි සෞන්දර්යයට අවශ්‍ය කරන විෂයන් තුනම තිබෙනවා. චිත්‍ර තිබෙනවා. නැටුම් තිබෙනවා. සංගීතය තිබෙනවා. මිනිස් හඬ පාවිච්චි කරන්න පුළුවන් කියලා මේ ගොල්ලෝ කියනවා. අපේ ජාතිය උපන්දා ඉඳලම, උපතේ ඉඳලම මිනිස් හඬ පාවිච්චි කරලා සෞන්දර්ය භාවිතා කරපු කට්ටිය. උපන්දා ඉඳලම දරු නැලවිලි ගීත. කුඹුරට බැස්සාම නෙළුම් කවි. කරත්තයට නැග්ගාම කරත්ත කවි. පාරු කවි. පැල් කවි. ඔය නොයෙක් කවි කියලා අපේ සෞන්දර්ය සඳහා මිනිස් හඬ පාවිච්චි කළා. ඒකයි මම හිතන්නේ අපේ පැරැන්නෝ නිරෝගී වෙලා හිටියේ. අපේ නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ විද්‍යාවේ සළුවෙන් අපේ පැරැණි සියලුම දේ වහන්න හදනවා කියලා. ඒ කාරණය ඇත්ත. අපේ තිබුණු ශාන්ති කර්ම, අපේ තිබුණු ජන කවි සැම දෙයක්ම උපයෝගි වුණා, මේ අපේ නිරෝගී භාවයට. ඉතින් මම විශ්වාස කරනවා අපේ ගරු ඇමැතිතුමා මේ බලි ශාන්ති කර්ම දියුණු කිරීම, ඒ වාගේම අද වන කොට දන්නවා. අපේ ගරු මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා. ඩෙංගු රෝගයට ආයුර්වේද වෛද්‍යවරියක් එතුමියගේ පියාණන් විසින් සොයා ගන්නා ලද විෂ වෛද්‍ය ක්‍රමය එකතු කරගෙන බෙහෙතක් හොයාගෙන තිබෙනවා කියලා. ඒක නිසා අපි කියන්නේ, අපේ පැරැණි හොඳ දේවල් තිබෙනවා. ඒවා අපි අරගෙන ඒවාට හිනා වෙන්නේ නැතිව, ඒවා පර්යේෂණය කරලා අපට මොකක්ද කරන්න පුළුවන් කියලා සොයා ගන්න සිද්ධ වෙනවා.

ඒ එක්කම මම තව දෙයක් කියන්න ඕනෑ. මෙතුමා අපිත් එක්ක එකතු වෙලා මේ ළඟදී කෙටි නාට්‍ය වැඩමුළුවක් පැවැත් වූවා. ගරු සභාපතිතුමනි, ගම්පහ උත්සවයට ඔබතුමාත් සහභාගි වුණා. ඒ වාගේම 21, 22 දවස්වල ඒකේ අවසාන තරගය නාඩා ආයතනයේ පවත්වනවා. ඒ විතරක් නොවෙයි. අනාගතයේ ලබන අවුරුද්දේ සැලසුම් කරලා තිබෙනවා නාඩා ආයතනයේ බස්නාහිර පළාතේ, විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල නවය වසරෙන් ඉහළ සෑම ළමයෙකුටම අඩුම ගණනේ මාසයකට වතාවක්වත් හොඳ නාට්‍යයක් පෙන්වීමේ වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න. සකස් කරලා තිබෙනවා. මෙතුමාගේ අමාත්‍යාංශයේ මෙතුමාට සහයෝගය දක්වන අයෙක් ඉන්නවා. ශරීරයෙන් පොඩි වුණාට ඉතා දැවැන්ත රසිකයෙක් මෙතුමාගේ අමාත්‍යාංශයේ ඉන්නවා. ඒ ලේකම් බර්නාඩ් වසන්ත මහත්මයා. එතුමා වාගේ තවත් අය ඉන්නවා. හොඳ රසිකත්වයක් තිබෙන අය. අපි මොනවාද යෝජනා කරන්නේ. ඒගොල්ලෝ ඉතා ඉහළින් ඒක පිළිගන්නවා. මෙතුමාට හොඳ ශක්තියක් එතුමන්ලා. ඒ නිසා අපි ස්තුතිවන්ත වෙනවා. මෙතුමා හරහා ඒ අමාත්‍යාංශයේ වැඩ කරන පිරිස සංස්කෘතික අමාත්‍යාංශයේ අවශ්‍ය කරන කලා කටයුතු දියුණු කරන්න, සෞන්දර්ය දියුණු කරන්න, මිනිස්සුන්ගේ මානසික සුවය හදන්න මහන්සි වෙනවා. දැන් මෙතැන අද උදේ කථා වුණා. කථා දෙකක් තිබෙනවා. එකක් තමයි බෝ නොවන රෝග සම්බන්ධ කතන්දරය. ඒකට උත්තරය මම මෙහිදී කිව්වා. අනික් එක තමයි ළමා අපයෝජනය. දැන් අද වන විට අපි විශ්වාස කරන්නේ අධ්‍යාත්මික පැත්ත - භෞතික පැත්ත දියුණු වෙලා තිබෙනවා. දියුණු වෙමින් පවතිනවා. නමුත් ආධ්‍යාත්මික පැත්ත කඩා වැටෙනවා. අද ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, සමහර තැන්වල තාත්තට දුව පේන්නේ නැහැ. බාප්පාට දුවව පෙන්නේ නැහැ. සීයට මිනිපිරීව පේනේනේ නැහැ. අඳුරන්න බැහැ. ඒ තත්ත්වයට ගිහිල්ලා තිබෙනවා. කලාකරුවන් වශයෙන් අපි විශ්වාස කරනවා. සෞන්දර්ය අධ්‍යාපනය අපේ පාසල්වලින් අයින් කිරීම තමයි මේකට පළමුවැනි හේතුව වුණේ. අනික් පැත්තෙන් මේක හදන්න පුළුවන් එක ක්‍රමයක් තමයි හාමුදුරුවනේ අපේ දහම් පාසල් අධ්‍යාපන ක්‍රමය. අනික් එක තමයි මේ සෞන්දර්ය දියුණු කිරීම. සෞන්දර්ය රස විඳීම දියුණු කිරීම. ඒක නිසා මම විශ්වාස කරනවා. අපේ කොඩිකාර ගරු ඇමැතිතුමා සම්බන්ධයෙන් සමහර ගරු මන්ත්‍රීතුමන්ලා උත්ප්‍රාසනයෙන් කථා කළා. මම විශ්වාස කරනවා, එතුමා මේ දැන් කරන වැඩත්, අනාගතයේ කරන්න යන වැඩ ගැනත් බැලුවාම එතුමා ඉතා බුද්ධිමතෙක් කියලා මම විශ්වාස කරනවා. ඒක නිසා එතුමාගේ වැඩ කටයුතුවලට උදව්වන පිරිසක් ඉන්නවා.

ඒ සැම දෙනාටම ස්තුති කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.45 ]

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින මට මෙම අවස්ථාව ලබා දුන් ඔබතුමියටත් මෙම අමාත්‍යාංශය භාරව කටයුතු කරන අපගේ මිත්‍ර උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මම 2004 එක්සත් ජාතික පක්ෂයෙන් මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරිපත් වෙලා, මෙම පළාත් සභාව තුළ වසර 1 1/2 ක් වැනි කෙටි කාලයකින් එම පළාත් සභාවෙන් ඉවත් වුණා. එවකට පක්ෂය තුළ යම් යම් ගැට මතු වෙලා තමයි මම එදා ඉවත් වුණේ. එහෙම නැතිව යම් යම් චෝදනාවලට ලක් වෙලාවත් ඒවාවලින් ගැලවෙන්නවත් නොවෙයි ඉවත් වුණේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

අපිත් එක්ක තරහා වෙලා.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

තමුන්නාන්සේලාත් එක්ක කිසිම තරහක් තිබුණේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී දේශපාලනයේ යෙදෙද්දී නායකත්වයේ යම් යම් ගැටලු මතු වුණා. එදා නායකත්වය පිළිගත්තේ නැහැ. ඒ නිසා අපට කටයුතු කරන්න බැරි තත්ත්වයක් උදා වුණු නිසා ඉවත් වෙලා එදා එක්සත් ජාතික පක්ෂය තුළ රටේ ජාතික දේශපාලනය තුළ ගත්ත යම් ක්‍රියාමාර්ගත් මීට හේතුවක් වුණා. මොකද තමුන්නාන්සේලා පොදුවේ දන්නවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පැනලා යන හැම එකාම ඔහොම තේ කිව්වේ.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

නැහැ. අපි එහෙම පැනලා ගියේ නැහැ. පැනලා ගිය කට්ටිය ඉන්නවා. අපි පක්ෂයට කියලා ඉවත් වුණේ. රට දෙකඩ වීමේ අවදානමක් එදා පැවැතුණා. තමුන්නාන්සේලා පොදුවේ පිළිගන්නවා. අපේ ජෝර්ජ් සහෝදරයා ඒ ගැන මාත් සමඟ පෞද්ගලිකව කථා කරලාත් තිබෙනවා. රට දෙකඩ වීමේ තත්ත්වයක් එදා උදාවෙලා තිබුණා. එදා ඒකට නියම විසඳුම දෙන්න පුළුවන් නායකයෙක් සොයාගෙන තමයි අපි එදා එළියට බැස්සේ. එහෙම නැතිව යම් යම් චෝදනාවලට ලක් වෙලා නොවෙයි එළියට බැස්සේ. එහෙම එළියට බැහැලා ඒ නායකත්වය 2005 අපි ඇති කර ගත්තා. මේ රටට සුදුසුම, මේ රට ගොඩගන්න පුළුවන්, වසර 35 ක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් කරන්න පුළුවන්, රටට සාමය ගෙනෙන්න පුළුවන් සැබෑ නායකයෙක් නිර්මාණය කරගන්න අපට හැකියාව ලැබුණා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඕනෑම මාතෘකාවක් යටතේ කථා කරන්න පුළුවන්ද? මෙතුමාගේ මාතෘකාව මොකක්ද?

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මේ මාතෘකාව ඊට අදාළයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එහෙමනම් අපිත් කථා කරනවා. මේක පොදු සාකච්ඡාවේ එකක්.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මේක එක්සත් ජාතික පක්ෂයට රිදෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමා චෝදනාවලට ලක් වුණේ මේ මෑත කාලයේ.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

එක්සත් ජාතික පක්ෂයට රිදෙන්න පුළුවන්. මොකද,

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

චෝදනාවලට ලක් වුණේ, ඒ කාලයේ නොවෙයි. ඒ නිසා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

පෞද්ගලිකව මන්ත්‍රීවරුන්ට චෝදනා කරන්න එපා. විපක්ෂ නායකතුමා ඔබතුමා සදාචාර සම්පන්න වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

චෝදනාවලට ලක් වුණේ ඒ කාලයේ නොවෙයි.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

කිසිම පෞද්ගලික කාරණා නැහැ. මේක කියන්නේ, නායකත්වය අපි ඇති කරගෙන මේ රට තුළ සැබෑ සාමයක් ඇති කර ගත්තා. ඒ සාමය ඇතුළේ තමයි අද –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමිය permission දෙනවාද මෙහෙම කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල – විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ මොනවාද? කථා කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ක්‍රීඩා ගැන, මොන දේ ගැන කථා කරන්නත් රටේ සාමයක් පවතින්න නෑ. ඒ සාමය ඇති කළේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රීති ප්‍රශ්නයක්.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මේ රටට සාමය ඇති කිරීම තුළ තමයි –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කන් දෙන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අද මේ සෑම ක්ෂේත්‍රයක් ගැනම තමුන්නාන්සේලාට අපට කථා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඒ නිසයි. එහෙම නැත්නම් හැමදාම භයෙන් ජීවත්වන ජාතියක් හැටියට තමුන්නාන්සේලා අපි හිටියේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රීති ප්‍රශ්නයක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඊකද පිස්ටල් අරගෙන ගියේ. අපි නම් පිස්ටල් අරගෙන යන්නේ නැහැ පාරේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා. මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දෙකයි පනහේ කථා කියන්නේ නැතිව කථා කරන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මාතෘකාවට අදාළව කථා කරන්නේ. අද ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු වෙන්නත්, මොනා ඇති වෙන්නත් රටේ සාමය ඇති කළේ මේ ආණ්ඩුව. එදා භයේ හැංගිලා සිටිය යුගයක් තිබුණේ. මේ ආණ්ඩුව කරපු විශාල වැඩ කොටසක් තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාවට මහින්ද චින්තන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රීඩා අමාත්‍යවරයෙක් පත් කරලා තිබෙනවා. අද එතුමා ගැන කියනවා නම්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ඉතා සමීපම අමාත්‍යවරයෙක් වශයෙන් අපට හඳුන්වන්න පුළුවන්. අද ක්‍රීඩා ක්ෂේත්‍රය බස්නාහිර පළාත තුළ ඉහළට ගෙන යන්න, බස්නාහිර පළාත තුළ ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කරන්න එතුමා විශාල කැපවීමක් කරනවා. අපි එතුමාගෙන් තවදුරටත් ඉල්ලා සිටින්නේ, 2013 එතුමා යෝජනා කරලා තිබෙන යෝජනාවලිය ක්‍රියාත්මක කරලා, ඉදිරියේදීත් මේ පළාත් සභාව

තුළින් බස්නාහිර පළාතට, රටෙන් 1/3 ක් නියෝජනය වන බස්නාහිර පළාතේ ක්‍රීඩා ක්ෂේත්‍රයට ප්‍රමුඛ සේවයක් කරන්නය කියලයි.

ඒ නිසා අද එක්සත් ජාතික පක්ෂයට කථා කරන්න දෙයක් නැහැ. අද මේකේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට කථා කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලා නොකරපු දේවල් අද අපි කරලා තිබෙනවා. අද ජාත්‍යන්තර ක්‍රීඩාංගණ රට පුරාම ඉදි වෙනවා. බස්නාහිර පළාත මගින් ගම්පහ දිස්ත්‍රික්කයටත් ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලබා දෙන්න කියලා අපි යෝජනා කරනවා. මේ රටේ ප්‍රථම ටෙස්ට් ජයග්‍රහණය ගෙනාපු අර්ජුන රණතුංග වැනි ක්‍රිකට් ක්‍රීඩකයින්, ප්‍රබල ක්‍රීඩකයින් ඉන්නේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ. අද එතුමා වෙනුවෙන් බස්නාහිර පළාතේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් අපට නම් කරලා දෙන්න. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයට. අද සනත් ජයසූරිය මැතිතුමා වෙනුවෙන් නම් කරලා තිබෙනවා නම්, ගම්පහ දිස්ත්‍රික්කයට අර්ජුන රණතුංග වෙනුවෙනුත් ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් නම් කරන්න කියලා මෙතුමා හරහා බස්නාහිර පළාතේ ක්‍රීඩා අමාත්‍යාංශයට අපි යෝජනාවක් ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ජනාධිපතිතුමාට කියන්න කෝ.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අපේ ක්‍රීඩා අමාත්‍යවරයා හරහා අපි ඒක ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමා ඒක කරනවා. ජනාධිපතිතුමාට කියන්න දෙයක් නැහැ. ජනාධිපතිතුමාට, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට වාගේ ඇන ඇන කියන්න දෙයක් නැහැ. එතුමා සෑම දෙයක්ම නිවැරැදිව කරලා තිබෙනවා. ජනාධිපතිතුමාට කියන්න දෙයක් නැහැ. ජනාධිපතිතුමා තමුන්නාන්සේලා වාගේ දේශපාලනයේ පහත් තලයේ වැඩ කරන අයෙක් නොවේ. එතුමා බොහොම විශිෂ්ට ගණයේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ පක්ෂයේ මිනීමරුවන් බේර ගන්න සදාචාරයක් නැහැ.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අද -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආනමඩුවේ ද්විත්ව මිනී මැරුම-

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ආනමඩුවේ ඒවා අපි නිදහස් කරගෙන ඉවරයි. ඒවා පිළිඅරගෙන ඉවරයි. ඒවා ඒ කරපු අය භාර අරගෙන ඉවරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒවා Set කරලා ඉවරයි.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

දැන් අපි නිදහස් වෙලා ඉන්නේ. ඒවා Set කරලා නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ඒවා ඒ වකවානුවලදී සිදු වුණු දේවල්. ඒවා අපි ගණන් ගන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පක්ෂයේ තමයි. එහෙමනම් එහෙම කථා කරන්න ගියොත් බටලන්ද වධකාගාරය ගැන අපට කථා කරන්න සිද්ධ වෙනවා. බටලන්ද වධකාගාරය ගැන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

චෝදනාවලට ලක් වුණු පුද්ගලයෝ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

නිශ්ශබ්ද වන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එළිවෙන ජාමෙට හොඳ හොඳ සෙල්ලම් .

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මම අණ කළා පස්සේ එතුමා මාතෘකාවට අනුව කථා කළා. එතුමා ක්‍රීඩා අමාත්‍යාංශය ගැන කථා කරනකොට ඔබතුමන්ලායි අනවශ්‍ය කථා කිව්වේ. ඔබතුමා එතුමාන්ලාට උත්තර දෙන්න යන්න එපා. මට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා පාර්ලිමේන්තුවේ කථා නායක –

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ගරු ක්‍රීඩා අමාත්‍යතුමනි, නිරෝගී ජනතාවක් බිහි කරන්න කොතල හිඹුටු ඉදිරියේදී රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුව –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මේ කොතල හිඹුටු ඖෂධය දෙන්න. රටේ ජනතාවට දෙන්න. විශේෂයෙන්ම –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කථානායකතුමා ගැන ප්‍රකාශයක් කරන්න –

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

එක්සත් ජාතික පක්ෂයේ දියවැඩියා රෝගීන් ටිකට කොතල හිඹුටු ටික දෙන්න කටයුතු කරනවා කියලා අපි තමුන්නාන්සේලාට කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කථානායකතුමාගේ නම කිව්වා. එතුමා කථානායකතුමාගේ නම කිව්වා.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අද එක්සත් ජාතික පක්ෂයට දියවැඩියාව කියන එක ප්‍රබලව දැනිච්ච පක්ෂයක්. අද පක්ෂය දියවෙලා යන තැනට පත් වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ දියවැඩියාව ඉවත් කරන්න අපි කොතල හිඹුටු ලබා දෙන්න කටයුතු කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ඒ නිසා අපි තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්නේ බටලන්දේ මිනීමරුවන් ගැන නොවෙයි අපි කථා කරන්නේ. අපි කථා කරන්නේ මේ ක්‍රීඩා ක්ෂේත්‍රය ගැන. බටලන්දේ මිනීමරුවන් ගැන අපට කථා කරන්න අවශ්‍යතාවයක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔයා බටලන්දේ මිනී මරන කාලයේ හිටියේ රනිල් එක්ක.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අපි හිටියා. ඒකයි අයින් වුණේ. අපි භයට අයින් වුණේ. අපිවත් මරයි කියලා භයට අපි අයින් වුණේ. ඒ නිසා තමුන්නාන්සේට අපි කියන්නේ –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

භයට අයින් වුණේ. ජෝර්ජ්ලා ගුටි කකා හිටියාට අපි ගුටි කකා හිටියේ නැහැ. අපට කොන්දක් තිබෙනවා. අපට කොන්දක් තිබෙන නිසා අපි අයින් වුණා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

අපි ගුටි කාලා එතැන රැඳුනේ නැහැ. මෙතැන ඉන්න ඔක්කෝම කොන්දක් නැති අය කියලා මම කියන්නේ නැහැ. විපක්ෂයේ කොන්දක් තිබෙන අයත් ඉන්නවා. නමුත් ගුටි කාලත් එතැන හිටපු අය සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ක්‍රීඩා ක්ෂේත්‍රය ගැන කියනවා නම් –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාඩි වෙන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, 2013 අපේක්ෂාවන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රය ඉදිරියට පවත්වාගෙන යන්න සෑම මන්ත්‍රීවරයෙකුටම ඒ යෝජනා කරලා තිබෙන රුපියල් ලක්ෂයේ ප්‍රතිපාදන අපි ලබා දෙන්න සූදානම්. ඒ වාගේ දේවල් අරගෙන ක්‍රීඩා ක්ෂේත්‍රය ඉදිරියට අරගෙන ගිහිල්ලා බස්නාහිර පළාත තුළ අර්ජුන රණතුංග නමින් ජාත්‍යන්තර ක්‍රීඩා පිටියක් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය තුළ. ඒ ඉල්ලීමත් ඉදිරිපත් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඊළඟට –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

පූජ්‍ය තෙඹුවන පියනන්ද හිමි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමියට ඇහෙන්නේ නැද්ද මන්දා. ඔබතුමියත් අර කොඩිකාර ඇමැතිතුමා වාගේ ඇහෙන්නේ නැතිව වාගේ නිකන් රහපානවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

තමුන්නාන්සේ කලබල වෙන්න එපා. මූලාසනයට කථා කරන්න ඉගෙන ගන්න. තමුන්නාන්සේගේ වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ කථා කරපු ගරු මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේදී කථානායකතුමෙක්ගේ නමක් කියලා මොකක්ද ප්‍රකාශයක් කළා. කිසියම් ප්‍රකාශයක් කළා, කථානායකතුමා කියලා. ඒක වහාම හැන්සාඩ් එකෙන් ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

මම දන්නේ නැහැ, තාත්තා කථානායක කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

එහෙම දෙයක් ඇහුණේ නැහැ. එහෙම එකක් තිබුණොත් අයින් කරන්න කියලා මම කියනවා. අපේ ගරු තෙඹුවන පියනන්ද ස්වාමීන් වහන්සේට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 02.55 ]

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අමාත්‍යාංශය යටතේ කථාවක් වෙන් වෙලා තිබුණේ නැහැ. නමුත් දැනුම් දීලා තිබුණා, සංස්කෘතික අංශය නිසා ඉඩක් තිබෙනවා නම් අවස්ථාවක් ලබා දෙන්න කියලා. ඒ නිසා මම ඔබතුමියට ප්‍රථම කොටම ස්තුතිය පිරිනමනවා, මේ අමාත්‍යාංශය යටතේ වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා පිළිබඳව අපේ මන්ත්‍රීවරු හුඟක් අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම නිර්මාණශීලී ඇමැතිවරයෙක්. අපේ සංස්කෘතිය පිළිබඳව කථා කරනකොට අපේ ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමා කරුණු කිහිපයක් සඳහන් කළා. අවධානය යොමු නොකරන හුඟාක් පැතිවලට අපේ ගරු ඇමැතිතුමා අවධානය යොමු කරනවා. මම භික්ෂූන් වහන්සේ කෙනෙක් හැටියට විශේෂයෙන්ම ශාසනාරක්ෂක මණ්ඩල ක්ෂේත්‍රය පිළිබඳව වචනයක් මතක් කරන්නට ඕනෑ.

අවුරුදු 10 ක් 15 ක් මම ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේඛකාධිකාරිවරයෙක් හැටියට කටයුතු කළා. මේකේ භාරදූරකම අපි හොඳට දන්නවා. සෑම වර්ෂයකම දහම් පාසල් සිසුන්ගේ දක්ෂතා ඇගයීම සඳහා සිසු නිපුණතා ඇගයීම් වැඩ සටහනක් සෑම ශාසනාරක්ෂක මණ්ඩලයකම දිවයින පුරා ක්‍රියාත්මක කෙරෙනවා. නමුත් මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමක් මම හිතන්නේ, 2012 අවුරුද්ද වනතුරු තිබුණේ නැහැ. මේ වතාවේ සියලුම ශාසනාරක්ෂක මණ්ඩලවලට ඒ අවශ්‍ය කරන ලිපි ද්‍රව්‍ය සකස් කර ගැනීමට, ඒ වාගේම ඒ පැමිණෙන කාර්ය මණ්ඩලවලට ආහාර පාන සපයා ගැනීමට ආදී ලේඛකාධිකාරී හාමුදුරුවරු විවිධ අය පසුපස ගිහිල්ලා මේවාට ආධාර එකතු කරගෙන බොහොම වෙහෙස මහන්සි වෙලා කටයුතු කරපු තත්ත්වයක් තුළ අපේ ගරු ඇමැතිතුමා රුපියල් 25,000 බැගින් සිසු නිපුණතා ඇගයීම් පැවැත්වීම සඳහා සෑම ශාසනාරක්ෂක මණ්ඩලයකටම මුදල් වෙන් කරලා දීලා තිබෙනවා. ඒක අපේ ශාසනාරක්ෂක මණ්ඩල ඉතිහාසයේ ප්‍රථමවතාවට සිද්ධ වුණු දෙයක්. ඒ නිසා ඉතාමත්ම සුවිශේෂයෙන් ඒක අගයමින් කථා කරන්නට ඕනෑ.

ඒ වාගේම විශේෂයෙන් අපි කවුරුත් දන්නවා. මේ අමාත්‍යාංශයෙන් නොවුණත් අපේ ගරු මහ ඇමැතිතුමාගේ සංකල්පයක් අනුව ඉතිහාසයේ ප්‍රථමවතාවට බස්නාහිර පළාතේ සියලුම දහම් පාසල්වලට රුපියල් ලක්ෂය බැගින් ලබා දෙන්න මේ වර්ෂය තුළ කටයුතු දැනට සිද්ධ කරලා තිබෙනවා. මම හිතන්නේ, මේ මාසයේ 30 වැනිදා වන විට ඒ මුදල් ලැබෙනවා. එතකොට ඒකත් මම මේ වේලාවේ සිහිපත් කරන්නේ, දහම් පාසල් ක්ෂේත්‍රය නඟා සිටුවන්න මේ පළාත් සභාවෙන් මහ ඇමැතිතුමාත් ඒ වාගේම විශේෂයෙන්ම සංස්කෘතික ඇමැතිතුමාත් විශාල සහයෝගයක් මේ වන විට ලබා දීලා තිබෙනවා. මම ගිය වතාවේ මේ අමාත්‍යාංශය යටතේ කථා කරන වේලාවේදී අදහසක් ඉදිරිපත් කළා, ගරු ඇමැතිතුමනි.

විශේෂයෙන් ශාසනාරක්ෂක මණ්ඩලවල කටයුතු කිරීමේදී වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සව පැවැත්වීම සඳහා. මම හොඳටම දන්නවා. හැම ශාසනාරක්ෂක මණ්ඩලයකම වාගේ වාර්ෂිකව පවත්වන ශ්‍රේණි විභාග, සිසු නිපුණතා ඇගයීම්වලින් දක්ෂතා ලබා ගන්න දරුවන්ට සහතික පත්‍ර ටික දෙන්න, ත්‍යාග පිරිනමන්න විධියක් නැතිව හරි අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා මම ගිය වතාවේ යෝජනාවක් කළා. හැම ශාසනාරක්ෂක මණ්ඩලයකටම අඩුම ගණනේ වර්ෂයකට රුපියල් ලක්ෂය බැගින්වත් ත්‍යාග ප්‍රදෝනාත්සව පැවැත්වීම සඳහා මුදල් ලබා දීමක් කරන්න පුළුවන් නම් හොඳයි කියලා. ගරු ඇමැතිතුමා, ඒ පිළිබඳව අවධානයක් යොමු කරලා තිබුණා. නමුත් ඇත්තටම අර සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව කථා කරන අවස්ථාවේදී කිව්වා වාගේ මේ අමාත්‍යාංශයටත් තිබෙන කනගාටුව තමයි ඇමැතිතුමාට කරන්න වැඩ හුඟාක් තිබුණත්, කරන්න හොඳ සංකල්ප ගොඩක් තිබුණත් අමාත්‍යාංශයට ප්‍රමාණවත් තරම් මුදල් ලැබෙන්නේ නැහැයි කියන එකනම් පැහැදිලියි. එතුමාට ඕනෑකම තිබුණා. මම මේ අවුරුද්දේ මුලදී සාකච්ඡා කළා. හැම ශාසානාරක්ෂක මණ්ඩලයකටම රුපියල් ලක්ෂයක බැගින් ලබාදෙන තීරණයක් එතුමාගේ තිබුණා. නමුත් අමාත්‍යාංශයට ලැබුණු මුදල් ප්‍රතිපාදනත් එක්ක ඒක එතුමාට ක්‍රියාත්මක කරගන්න බැරි වුණා. මම ඉල්ලීමක් කරනවා. ශාසනාරක්ෂක මණ්ඩලවල අවුරුදු 4, 5 සහතික ගොඩගැහිලා තිබෙනවා. ළමයින්ට පුංචි තෑග්ගක් සමඟ මේක දීගන්න විධියක් නැතිව. ඒ නිසා හැකියාවක් තිබෙනවා නම් 2013 වර්ෂයේදී ඒ සඳහා අවස්ථාව උදා කරලා දෙන්න කියලා අපි විශේෂයෙන් මතක් කරනවා.

ඊළඟට කළුතර දිස්ත්‍රික්කය හැටියට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ හොරණ කලා කෙත පිළිබඳව. මම හිතන්නේ හොරණ කලා කෙත කළුතර දිස්ත්‍රික්කයේ කලාව පිළිබඳව හදාරන දරුවන්ට ඉතාමත්ම හොඳ අවස්ථාවක් මේකෙන් ලබා දීලා තිබෙනවා. කණ්ඩායම් දිස්ත්‍රික් ඒ වාගේම පළාත් ජාතික මට්ටමේ තරගවලදී විවිධ අවස්ථාවන්හිදී විවිධ ජයග්‍රහණ ලබා ගනිමින් අප අමාත්‍යාංශයට ගෞරවනීය කීර්තියක් ලබා දී ඇත. මේ ඒ විධියට සඳහන් කරලා තිබෙන්නේ. ඒ දක්ෂතා දක්වන දරුවන්ට හොරණ කලා කෙත මඟින් තමන්ගේ දක්ෂතා තවදුරටත් මූර්තිමත් කරගන්න, වැඩි දියුණු කරගන්න හොඳ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ නිසා කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් අපි අමාත්‍යතුමාට මේ වේලාවේදී හොරණ කලා කෙත සම්බන්ධයෙන් ලබා දීලා තිබෙන සහයෝගය සඳහා අපේ ස්තූතිය මේ වේලාවේදී පිරිනමන්නට ඕනෑ.

ඒ වාගේම මම කිව්වේ, නිර්මාණශීලී අමාත්‍යවරයෙක් කියලා. හුඟාක් වේලාවට අවධානය යොමු නොකරන කාරණා පිළිබඳව එතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා. අද විශේෂයෙන් අපි ජ්‍යොතිෂය. ඒ වාගේම මඟුල් පෝරුවේ චාරිත්‍ර ඉෂ්ට කිරීම කියන කාරණා. මේ වාගේ අපේ සාම්ප්‍රදායික සිරිත් මේවා බොහෝදුරට අද අඩපණ වෙමින් යනවා. අක්‍රිය වෙමින් පවතිනවා. සමහරවිට සමාජයේ හුඟක් දෙනෙක් මේවා අඳුරන්නෙත් නැහැ. දන්නෙත් නැහැ. එතුමා මේ වන විට කණ්ඩායම් දෙකක්, විශේෂයෙන්ම මඟුල් පෝරුවේ චාරිත්‍ර ඉෂ්ට කරනවා කියන එක චාරිත්‍රානුකූලව, සම්ප්‍රදායානුකූලව හොඳ අවබෝධයකින් යුක්තව කළ යුතු කටයුත්තක්. මේවා නිසා තමයි අපේකම රැකුණේ. අපේ සංස්කෘතිය ආරක්ෂා වුණේ. ඒ නිසා මේක අභාවයට යන නිසා, මේවා පිළිබඳව හැකියාව, දැනුම තිබෙන අය සමාජයේ අභාවයට යමින් පවතින නිසා එතුමා විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා, එබඳු කණ්ඩායම් පුහුණු කරන්න. පනස් දෙනෙකුගේ පළමුවැනි කණ්ඩායම පුහුණු කරලා දැන් අවසාන කරලා තිබෙනවා. දෙවැනි පනස් දෙනාගේ කණ්ඩායමත් දැන් පුහුණු කිරීම් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මම හිතන්නේ හුඟාක් දෙනෙක් අවධානය යොමු කරන්නේ නැහැ. මේවා ඉතාම සුළු කාරණා හැටියට කෙනෙකුට පෙනේනන පුළුවන්. නමුත් අපි සංස්කෘතිය ගැන කථා කරනවා නම්, අපේකම ගැන කථා කරනවා නම් අපේ පෞරාණික චාරිත්‍ර විධි පිළිබඳව කථා කරනවා නම් අපේ සමාජය තුළ මේවා ආරක්ෂා වෙන්නට ඕනෑ.

ඒ වාගේම තමයි එතුමා ආගම් භේදයක්, ජාති භේදයක් නැතිව, විශේෂයෙන් සිංහල අවුරුදු උත්සව පැවැත්වීමේදී, ඒ වාගේම හැම ආගමික කටයුත්තකටම සම්බන්ධව ආගමික උත්සව පැවැත්වීමේදී මම හිතන්නේ, විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. හැම ආගමකටම අදාළ උත්සව පිළිබඳව. විශේෂයෙන්ම සම්බුද්ධ ජයන්ති වර්ෂයේදී ඒ උත්සවය පිළිබඳව, ඒ වාගේම පොසොන් උත්සවය පිළිබඳව විශේෂ වැඩ සටහන් පළාත තුළ ක්‍රියාත්මක කළා. ඒ වාගේම රාමසාන්, දීපවාලී, නත්තල්, පාස්කු මේ සෑම උත්සවයක් සඳහාම පළාත් මට්ටමෙන් වැඩ සටහන් පවත්වන්න එතුමා විධිවිධාන යොදලා ඉතාමත්ම සාර්ථකව ඒ කටයුතු කරගෙන යනවා. ඒ නිසා ජාති භේදයක්, ආගම් භේදයක් නැතිව හැම ආගමකටම, හැම ජාතියකටම සමාන ලෙස ඒ තමන්ගේ ආගමික අවස්ථාවන්, සංස්කෘතික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරගන්න ඇමැතිතුමා අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. ඒ ගැන අපේ ස්තූතිය එතුමාට අපි පිරිනමන්නට ඕනෑ. ක්‍රීඩාව පිළිබඳව වචනයක් මතක් කරන්නට ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

දහම් පාසල් සඳහා තූර්ය වාදන කණ්ඩායම්.

**පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර**
Hon. Revrn. Thebuwana Piyannada Thero

ඔව්. ඇත්තටම. දහම් පාසල් වශයෙන් වාගේම, ශාසනාරක්ෂක මණ්ඩල මට්ටම වාගේම, පනස් දෙනෙකුගෙන් යුක්තව පළාතේ තූර්ය වාදන කණ්ඩායමක් ආරම්භ කරලා තිබෙනවා. ජාතික උත්සවයකට, පළාත් උත්සවයකට සම්බන්ධ කරගන්න පුළුවන් වන විධියට ඒ සෑම අංශයක්ම එතුමා සංවර්ධනය කරලා තිබෙනවා. ක්‍රීඩා පිළිබඳව කථා කරන්නට ඕනෑ. හාමුදුරු කෙනෙක් හැටියට ක්‍රීඩාව පිළිබඳව කථා කිරීම සමහරවිට කෙනෙකුට අමුත්තක් වෙන්න පුළුවන්. නමුත් නිරෝගීකම රැකෙන්න ප්‍රධාන කාරණයක් ක්‍රීඩාව. ක්‍රීඩා කඳවුරු පවත්වන්න මම හිතන්නේ අපේ ගරු මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 1 1/2 බැගින් ලබා දුන්නා. මම තෙඹුවන අපේ ක්‍රීඩා පිටියේ පසුගිය දවස්වල ඒ ක්‍රීඩා පුහුණු කඳවුර පැවැත් වූවා. ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක්. රුපියල් ලක්ෂ 01 1/2 ක් අපි දෙදින නේවාසික පුහුණු කඳවුරක් හැටියට ඒ ක්‍රීඩා කඳවුර පැවැත් වූවා. දක්ෂතා තිබෙන, නමුත් අවස්ථාව නොලැබී යන අපේ ගම්බද ප්‍රදේශවල දරුවන්ට ඉතාම හොඳ අවස්ථාවක්. අපි ජාතික මට්ටමේ පුහුණුකරුවන් ඒ අවස්ථාවට සහභාගි කරවාගෙන, ඔවුන්ගේ සහාය ලබාගෙන ඒ ක්‍රීඩා පුහුණු කඳවුර පැවැත් වූවා. ඉතාමත් හොඳ අවස්ථාවක්. ගම්බද දක්ෂතාවයන් තිබෙන, නමුත් අවස්ථාවක් නොමැති දරුවන්ට ක්‍රීඩාවන් දියුණු කර ගැනීමට.

ඒ වාගේම තවත් එක බේදවාචකයක් තමයි, ගරු ඇමැතිතුමාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. රටේ මුදල් තත්ත්වය වැඩිවන ආකාරය අනුව බැලුවායින් පස්සේ වියදම් තත්ත්වය අනුව අපේ ක්‍රීඩා අමාත්‍යාංශය විතරක් නොවෙයි, අනික් අමාත්‍යාංශවලටත් වාර්ෂිකව අපේ උපමාන පාදක හරහා මන්ත්‍රීවරුන්ට වෙන් කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය තුළ ලැබෙන මුදල ඉතාමත්ම ප්‍රමාණවත් මදී. උදාහරණයක් වශයෙන් ගත්තොත් ක්‍රීඩා අංශයට ඉතාමත්ම සුළු මුදලක්, මන්ත්‍රීවරයෙකුට 10% ක් තමයි උපමාන පාදක යටතේ සංස්කෘතික හා ක්‍රීඩා යන දෙංශයටම වෙන් කරන්න ලැබෙන්නේ. මේක හොඳටම ප්‍රමාණවත් මදී. ඇත්තටම. මම ගිය වතාවේත් මතක් කළා. අපෙන් ක්‍රීඩා සඳහා දක්ෂතා තිබෙන දුප්පත්, අහිංසක දරුවෝ යම් යම් දේ ඉල්ලනවා. ක්‍රීඩා උපකරණ ඉල්ලනවා. මම හිතන්නේ මම ගිය පාරත් මතක් කළා. එතකොට මගෙන් ක්‍රීඩිකාවක් සපත්තු කුට්ටමක් ඉල්ලුවා. පළාත් මට්ටමෙන් ජයග්‍රහණ ලබපු ක්‍රීඩිකාවක්. සපත්තු කුට්ටමේ වටිනාකම රුපියල් 12,000/- ක්. නමුත් පළාත් ක්‍රීඩකයෙකුට ක්‍රීඩා උපකරණ ලබා දෙන්න වෙන් කරන්න පුළුවන් උපමාන පාදක ප්‍රතිපාදන යටතේ රුපියල් 5000/- ක් පමණයි. ඉතින් මේක අපට විශාල ගැටලුවක්. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. ඉදිරි කාල පරිච්ඡේදයේදී, ලබන වර්ෂයේදී ඒ සඳහා අපට තිබෙන පහසුකම් - (බාධා කිරීමක්) ඒ විධියේ අවශ්‍යතාවයන් පිළිබඳව ඊට වඩා

[ පූජ්‍ය ගරු තෙඹුවන පියනන්ද ස්ථවිර ]

වැඩි සැලකිල්ලක් දක්වන හැටියට විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම පළාතේ ක්‍රීඩාවේ දියුණුව සඳහා ගරු ඇමැතිතුමා විශේෂ වැඩ පිළිවෙළවල් රාශියක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා පිටි සංවර්ධනය පිළිබඳව මතක් කරන්නට ඕනෑ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම ක්‍රීඩා පිටියක් සංවර්ධනය කරගන්න අවශ්‍ය කරන පහසුකම් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන් ගරු ඇමැතිතුමාට මේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරගෙන යෑමේදී විශේෂයෙන්ම අපේ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් හැටියට අපි මතක් කරන්න ඕනෑ. එතුමාට ලැබිලා තිබෙන අමාත්‍යාංශ ලේකම්වරයා මම හිතන්නේ, ඉතාමත්ම දක්ෂ, ඒ වාගේම අවස්ථාවෝචිතව ක්‍රියාත්මක කරන්න පුළුවන් ඉතාමත්ම හොඳ දක්ෂ නිර්මාණශීලී ලේකම්වරයෙක් ඇමැතිතුමාට ලැබිලා තිබෙනවා. ඇමැතිතුමා කරන කටයුතු වඩාත් සාර්ථකව සිද්ධ කරන්න ලේකම්තුමාගේත්, ඒ වාගේම ඒ සියලුම ක්ෂේත්‍රවල හැමදෙනාගේම සහයෝගය ලැබිලා තිබෙනවා.

ඒ වාගේම ප්‍රවාහන අංශය පිළිබඳවත් මේ කෙටි වේලාවේදී වචනයක් මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මම පදිංචිවෙලා ඉන්න දොඩන්ගොඩ කොට්ඨාශයේ එකම බස් නැවතුම් පොළයි තිබෙන්නේ. ඒ බස් නැවතුම්පොළ ඇත්තටම ගරා වැටුණු තත්ත්වයක තිබුණේ. මම ඇමැතිතුමාට මතක් කළා. ඒ අනුව පසුගිය දවස්වල ඇවිල්ලා ඒ බස් නැවතුම් පොළ සඳහා මුල් ගල තියලා කටයුතු ආරම්භ කළා. අපි බලාපොරොත්තු වුණා, ඉතාමත් ඉක්මණින් ඒක කෙරෙයි කියලා. නමුත් තවම වැඩ ආරම්භ වුණේ නැහැ. ඒ නිසා බස් නැවතුම්පොළ දියුණු කරගන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු ඇමැතිතුමාට ස්තුතිය පිරිනමනවා. ඒ කටයුතු ඉක්මණින් ආරම්භ කරලා අවසන් කරන හැටියටත් මතක් කරනවා. ඒ නිසා නිර්මාණාත්මක ඇමැතිවරයෙකුගේ අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනයේ ගරු මන්ත්‍රීතුමියට මගේ ස්තුතිය පිරිනමමින්, හැමදෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනය කරමින් මගේ වචන කීපය අවසන් කරනවා.

[ අ.භා. 03.08 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මේ ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කථා කිරීමට ලැබීම ගැන -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දෙමළෙන් කථා කරන්න.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

දෙමළෙන් කථා කළොත් ඔයගොල්ලන්ට Head Phone දාන්න වෙනවා. මම කැමැති නැහැ ඔබතුමන්ලාට ඒ වදේ දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා කැමැති භාෂාවකින් කථා කරන්න.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම කථාව පටන් ගන්නේ, මම හිතන්නේ අර ගරු මන්ත්‍රීතුමා වධකාගාර ගැන කථා කළා. මම හිතන්නේ එතුමා මිනී මැරුම් චෝදනාවකට ලක් වෙලා ඉන්න මන්ත්‍රීවරයෙක්. එතුමා වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්න ගියොත් -

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන්නේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ හින්දා පරිස්සම් වෙන්න කියලා කියන්න ඕනැ.

**ගරු තුෂාර පෙරේරා**
Hon. Thushara Perera

ඒ ගල් වැදිලා ඉවරයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු මොහොමඩ් මුජිබූර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

විශේෂයෙන්ම ප්‍රවාහනය ගැන අපි කථා කළොත්, කොළඹ දිස්ත්‍රික්කය තුළ අද අපේ ප්‍රවාහන සේවය ගැන, මගී ප්‍රවාහන සේවය ගැන එහෙම සන්තෝෂ වෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මම හිතන්නේ, මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු පිළිගන්නවා. පසුගිය කාලයේම මේ ප්‍රවාහන සේවය සඳහා රජය යම් යම් දේවල් කරන්න උත්සාහ කළත් තවමත් මේවා කළමනාකරණය කරගන්න බැරිව, ඒ වාගේම තවම මේවා උසස් තත්ත්වයකට, ගුණාත්මක වර්ධනයකට ගෙනෙන්න බැරිව මෙම ප්‍රවාහන සේවය අඩපණ වෙලා තිබෙනවා. මොකද, උදේ වරුවේ, සවස් වරුවේ කාර්යාල වේලාවන් වලදී අපි බැලුවොත් මගී ජනතාව කොයිතරම් අපහසුවෙන් මේ ප්‍රවාහන සේවය භාවිතා කරනවාද කියලා අපට බලාගන්න පුළුවන්.

විශේෂයෙන්ම සමහර මාර්ගවල ධාවනය වුණු බස් රථ විශාල ප්‍රමාණයක් අද ධාවනය වෙන්නේ නැහැ. 132 මාවරමණ්ඩිය - දෙහිවල බස් රථය අද ගමන් කරන්නේ නැහැ. ඒ වාගේම 131 මහරගම - කොළොන්නාව අද ඒ බස් රථය නැවතිලා තිබෙනවා. ඒ වාගේම 134 අංගොඩ - ගල්කිස්ස බස් රථය ධාවනය වෙන්නේ නැහැ. 167 කොටලහ - දෙහිවල ඒ බස් රථය ගමන් කරන්නේ නැහැ. 195 හෙට්ටියාවත්ත - නුගේගොඩ බස් රථය ගමන් කරන්නේ නැහැ. 116 පිළියන්දල - මට්ටක්කුලිය බස් රථය ගමන් කරන්නේ නැහැ. ඒ වාගේම 151 අඹතලේ - පිටකොටුව බස් රථය ගමන් කරන්නේ නැහැ. මේ මම කිව්වේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ගමන් කරන බස් රථ කීපයක් පමණයි. මේ බස් රථ විශේෂයෙන්ම අඩු ආදායම් ලාභීන් ජීවත්වන ප්‍රදේශවලින් පටන් ගන්නා බස් රථ. ඒ හින්දා අද ඒ ප්‍රදේශවල ජනතාව, මේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත්වන ජනතාව මේ බස් රථ ගමන් නොකිරීම නිසා ඔවුන්ගේ ගමන් බිමන් යෑමේදී අද විශාල අපහසුතාවයන්ට පත් වෙලා තිබෙනවා. මේකට විකල්ප ක්‍රියාමාර්ග යොදලා නැහැ. මේ බස් රථ එහෙමම නැවතුණා. කුමක් හෝ හේතුවක් නිසා ඒවා එහෙමම මැරිලා ගියා. ඒවා ගැන කිසිම කථාවක් නැහැ. ඒවා ආයේ පණ පොවන්න, ඒවාට විකල්ප ක්‍රම යොදන්න මම හිතන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය හෝ ප්‍රවාහන අධිකාරිය සමත් වෙලා නැහැ.

ඒ වාගේම තමයි සමහර බස් රථ තිබෙනවා, උදාහරණයකට අපි 140 වැල්ලම්පිටිය - කොල්ලුපිටිය බස් රථය ගත්තොත් සවස 05.30 න් පසු පෞද්ගලික බස් රථ දුවන්නෙත් නැහැ. CTB එක දුවන්නෙත් නැහැ. මම හිතන්නේ, ඔබතුමියත් ඒ ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට ඔබතුමියත් ඒක පිළිගන්නවා ඇති. විශේෂයෙන්ම 140 මාළිගාවත්ත හා මරදාන, ටවුන්හෝල් හරහා කොල්ලුපිටියට ගමන් කරන බස් රථය. විශාල පිරිසක් භාවිතා කරනවා. සවස 05.30, 6.00 න් පස්සේ එක බස් රථයක්වත් ධාවනය වෙන්නේ නැහැ. මම පෞද්ගලිකව ප්‍රවාහන අධිකාරියට පැමිණිලි කරලා තිබෙනවා. ඇයි මේ බස් රථ 05.30 න් පස්සේ ගමන් කරන්නේ නැත්තේ කියලා. ඉතින් මේ වාගේ ප්‍රවාහනය ගැන ගැටලු රාශියක් අද අපි ඉදිරියේ තිබෙනවා. මම කියන්නේ, නිර්මාණශීලිව අපි මීට විකල්ප ක්‍රියාමාර්ගයන් යොදා ගත්තේ නැත්නම් මේ ප්‍රවාහනය අපට ගොඩ යන්න බැහැ. බෝට්ටු සේවයක් ගැන අපට කථා කරන්න පුළුවන්. මම හිතන්නේ මේවා අපි කථා වුණා. මීට කලිනුත් මේ පළාත් සභාවේදීත්, ගිය පළාත් සභාවේ අයවැය විවාදයේදීත් මේවා ගැන අපි සාකච්ඡා කළා. නමුත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේවා අපේ සභාව තුළ වාද විවාදවලට පමණක් සීමා වෙලා තිබෙනවා. මම හිතන්නේ ගරු ඇමැතිතුමා රටවල් ගණනාවකම සංචාරය කරලා තිබෙන ඇමැතිවරයෙක්. එතුමා දැකලා ඇති විදේශ රටවල්වලදී මේ ප්‍රවාහන පොදු සේවය මහජනතාවගේ යහපත වෙනුවෙන් කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා. මම හිතන්නේ එතුමා දැකලා ඇති. නමුත්

ඒවාවල අත්දැකීම් අරගෙන අපේ රටට උචිත ආකාරයේ, අද මේ මගී ජනතාව දුක්විඳින ආකාරයෙන් ඒගොල්ලන්ට ගොඩ යන්න පුළුවන් විධියේ ක්‍රමයක් හා නිර්මාණශීලී ක්‍රමයක් අත්හදා බලන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. අපි හැමදාම පෞද්ගලික බස් රථ හා CTB එකේ බස් රථ උඩ පමණයි අද රැඳිලා ඉන්නේ. ඒක අපට පෙනෙනවා. ඒකෙන් අපට මේ ප්‍රශ්නය විසඳගන්න බැහැ. අද කොයිතරම් පෞද්ගලික බස් රථ ගෙනැල්ලා දැම්මත් ඒ බස් රථ ගමන් කරන්නේ නිශ්චිත කාලසීමාවකට හා නිශ්චිත වේලාවන්වලට විතරයි. ඊට එහා ඔවුන් ගමන් කරන්නේ නැහැ. එහෙමනම් රෑ වනතුරු වැඩ කරලා ගෙවල්වලට යන උදවියට විකල්ප ප්‍රවාහන මාර්ගයක් නැහැ. ඒ මිනිස්සු අද මහ පාරවල්වල අතරමං වෙලා ඉන්නවා. මම හිතන්නේ මේ පිළිබඳව අපි අවධානය යොමු කළ යුතුයි.

අනික් එක තමයි බස් රථවල ගමන් කරන මගී සංඛ්‍යාව. අද ඉතා අසීරුවෙන් අපි දැක්කොත් අපට පෙනෙනවා. උදේට සවසට මිනිස්සු එකා පිට එකා අර නිකන් සත්තු ගෙනියනවා වාගේ තමයි, පොල් පටවනවා වගේ තමයි බස්වල අද ගමන් කරන්නේ. ඉතින් ඒකට හේතුව මොකක්ද? මේවා විසඳන්න පුළුවන් වන්නේ කොහොමද කියලා. ඒවා ගැන අධ්‍යයනයක් කරලා මම හිතන්නේ යම් යම් තීන්දු ගත යුතුයි. එහෙම නැත්නම් හැමදාම මේ යන සාම්ප්‍රදායික ක්‍රමය උඩ අපි ගිහිල්ලා මේ තිබෙන ප්‍රවාහන සේවය ගොඩ ගන්න බැහැයි කියන එක තමයි මගේ අදහස. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගේ මාර්ගයෙන් අපේ ප්‍රවාහන ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

ඒ වාගේම මම අර කලින් කියපු මාර්ගවල ධාවනය වුණු බස් රථ අද ගමන් කරන්නේ නැති හින්දා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාව අද දැඩි පීඩාවට ලක් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම මම කියපු ඒ සියලුම ප්‍රදේශ අඩු ආදායම් ලාභීන් ජීවත් වන උතුරු - කොළඹ, මැද කොළඹ හරහා ගමන් කරපු ඒ බස් රථ, මම කලින් කියපු ඒ හැම බස් රථයක්ම. ඒ හින්දා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාව මේ ප්‍රශ්නය උඩම අද ඔවුන්ට සිදු වෙලා තිබෙනවා ත්‍රිවිල්වල ගමන් කරන්න. අපි දන්නවා, අඩුම ගණනේ ත්‍රීවිල්වල කිලෝමීටරයක් යන්න ගියත්, මීටර් ත්‍රීවිලයකින් ගියත් අඩුම කුලිය රුපියල් 50/- ක්, රුපියල් 80/- ක් වෙනවා. ඒ නිසා අද ඒ ජනතාවට මේ පොදු ප්‍රවාහන සේවය නැති හින්දාම අද ඔවුන්ට විකල්ප මාර්ගයක් හැටියට ත්‍රීවිල්වල යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒකට විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමිය මාර්ගයෙන් ගරු ප්‍රවාහන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම කලින් කියපු මේ මාර්ගස්ථ අංක සඳහන් මාර්ග සඳහා විකල්ප, එහෙම නැත්නම් නැවත මේ බස් රථ ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක කරවන්න කියලා. ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 03.15 ]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳව අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමියට මගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඒ වාගේම මගේ කථාව ආරම්භ කරන්නට පෙර අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳව එතුමා සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියලා. හැබැයි මේ සම්බන්ධව එතුමා කිසිම දෙයකට සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියලා අපේ රෝස් ගරු මන්ත්‍රීතුමියත් මාත් එක්ක කිව්වා. ඒ කියන්නේ මොන දේ කෙරුවත් වැඩක් නැහැ. එතුමිය කිව්ව කථාව අනුව නම් මෙතුමා කිසිම සෑහීමකට පත් වෙන්නේ නැහැ.

ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ආඩම්බර වෙනවා. කවුරු කෙසේ කුමන ආකාරයෙන් කිව්වත් ඉතාමත්ම හොඳින් වැඩ කරන, ඒ වාගේම ජනතාවට සමීප වුණු ගරු අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයන් පිළිබඳව කථා කරන්නට ලැබීම පිළිබඳව මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. මම හිතන්නේ විවිධ ක්ෂේත්‍රයන් අල්ලා අපේ ගරු මන්ත්‍රීවරු කථා කළා. මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය පිළිබඳවත්, තවත් අමාත්‍යාංශ කීපයක් පිළිබඳවත් කථා කරන්න. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්ත මොහොතේ ඉඳලාම ඔහු දන්නා ශිල්ප ක්‍රම භාවිතා කරමින් මේ අමාත්‍යාංශයට, විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ විවිධ පහසුකම් ගම් මට්ටමේ ඉන්න අපේ ආදරණීය තරුණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දීමට කටයුතු කළා. ඒ නිසා අපි ගම්බද ජීවත්වන ඒ අහිංසක ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් අපේ ගෞරවනීය ප්‍රණාමය ස්තුතිය ගරු ඇමැතිතුමාට අපි පුද කර සිටිනවා, අද ක්‍රීඩාව ගමට යන්න පුළුවන් මට්ටමට දියුණු වීම සම්බන්ධව. ගමේ ඉන්න අපේ අහිංසක අම්මා තාත්තාගේ දුවා පුතා අද කොළඹට ඇවිල්ලා, කොළඹ ජයග්‍රහණ කරලා, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලැබීමට ලොකු හයියක්, ශක්තියක් දුන්න අමාත්‍යාංශයක් හැටියටයි මම මේ අමාත්‍යාංශය දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඒකට පුංචි උදාහරණයක් කියන්නම්. මේ ඊයේ පෙරෙයිදා අවසන් වුණු අපේ ජාතික ක්‍රීඩා උළෙල. කළුතර දිස්ත්‍රික්කයටම රන් පදක්කමක් සහ ලෝකඩ පදක්කමක් හම්බ වුණේ. කළුතර දිස්ත්‍රික්කයටම පදක්කම් දෙකයි. ඒ පදක්කම් දෙකම ජයග්‍රහණය කරන්නට හැකියාව ලැබුණේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට. මේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කියන්නේ, එහා පැත්තෙන් ගත්තායින් පස්සේ දකුණු පළාත් සභාවේ කෙළවර. මේ පැත්තෙන් ගත්තායින් පස්සේ බස්නාහිර පළාත් සභාවේ කෙළවර. ඒ නිසා අපට සමහර අවස්ථාවලදී

සමහර විවිධ ජාතික මට්ටමේ නායකයින්ගෙන් මේ ආසනයට ලැබෙන්නේ කුඩම්මාගේ සැලකිලි. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා, මෙවැනි ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහි කිරීමට මේ අමාත්‍යාංශය දායකත්වය ලබා දීම සම්බන්ධව. ඒ වාගේම තමයි අපේ ගරු ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළ පරිදි මේ මෑත භාගයේදී මෙතුමා ලක්ෂ 01 1/2 ක මුදලක් ලබා දීලා ග්‍රාමීය මට්ටමේ ඉන්න අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතාවයන්, කුසලතාවයන් මතු කරන්නට අපට හොඳ අවස්ථාවක් ලබා දීම පිළිබඳව. ඒ අවස්ථාව ලබා දුන්න අවස්ථාවේදී අපට දුන්න ලක්ෂ 01 1/2 ට තවත් මුදලක් එකතු කරලා - අපේ බර්නාඩ් වසන්ත ලේකම්තුමා දන්නවා. තවත් ලක්ෂ 01 1/2 කට වැඩි මුදලක් මම පෞද්ගලික මට්ටමෙන් යොදවලා ලංකාවේ ඉන්න ටෙස්ට් ක්‍රීඩකයින්, ඒ වාගේම ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ ටෙස්ට් පුහුණුකරුවන් ගෙනැල්ලා බේරුවල මහා දැවැන්ත ක්‍රිකට් කඳවුරක් කළා. දැනටත් බේරුවල ආසනයේ හාඩ් බෝල් එහෙම නැත්නම් ලෙදර් පන්දු ක්‍රීඩාව කෙරෙන්නේ එකම එක පාසලක පමණයි. ඒ අලුත්ගම ජාතික පාසලේ පමණයි. අපට අද හැකියාව ලැබිලා තිබෙනවා, තවත් පාසල් පහක මේ ක්‍රීඩාව ආරම්භ කරලා ඒ ක්‍රීඩාවෙන් ජාතික කණ්ඩායම සහ අපේ පළාත් කණ්ඩායම නියෝජනය කරන්න ක්‍රීඩකයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න. ඉතාමත්ම සාර්ථක ලෙස අපට එය ක්‍රියාත්මක කරන්න හැකියාව ලැබුණා.

ඒ වාගේම තමයි අපි මේ ක්‍රීඩාව දිහා අරගෙන බැලුවාට පස්සේ ගරු ඇමැතිතුමනි, අපි ඒ ඒ අවස්ථාවන්වලදී යම් මුදලක් ප්‍රදානය කළත්, අපි විවිධ වැඩ සටහන් ඒ ඒ කාල වකවානුවලදී ක්‍රියාත්මක කළත් දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් නොමැති වීම නිසා ජාතික ක්‍රීඩා උළෙලේ මතු වුණු, විශේෂයෙන්ම තාරිකා කුමුදුමාලි ප්‍රනාන්දු රන් පදක්කමක් දිනා ගත්තේ. නිමේෂා තනුජා කුමාරි ලෝකඩ පදක්කම දිනා ගත්තේ. අපට පුංචි සැකයක් තිබෙනවා. දීර්ඝකාලීන වැඩ පිළිවෙළක් මේ අය වෙනුවෙන් යෙදුවේ නැති වුණොත් මේ සම්පත්වලින් ඉදිරියේදී අපට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙයිද කියලා. ඒ නිසා මම හිතන්නේ දීර්ඝකාලීන සැලැස්මකට වැඩ පිළිවෙළක් දියත් කරනවා නම් ක්‍රීඩා අමාත්‍යාංශය අපට මීට වඩා දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කරන්නට පුළුවන්. ඒ වාගේම තමයි මෙවැනි ක්‍රීඩකයින් බිහි කරන බේරුවල ආසනයේ ක්‍රීඩාංගණ ටික අරගෙන බැලුවායින් පස්සේ, මේ අය වෙනුවෙන් යෙදුවේ නැති වුණොත් ඉදිරියේදී මේ සම්පත්වලින් අපට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වෙයිද කියලා. ඒ නිසා මම හිතන්නේ, දීර්ර්ඝකාලීන සැලැස්මකට වැඩ පිළිවෙළක් දියත් කරනවා නම්, ක්‍රීඩා අමාත්‍යාංශය අපට මීට වඩා දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කරන්න පුළුවන්. ඒ වාගේම තමයි මෙවැනි ක්‍රීඩකයින් බිහි කරන බේරුවල ආසනයේ ක්‍රීඩාංගණ ටික අරගෙන බැලුවායින් පස්සේ, අපේ සුමිත්ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා දන්නවා. අපට තිබෙන්නේ එකම එක ක්‍රීඩාංගණයයි. ඒ ක්‍රීඩාංගණයේ විතරයි මීටර් 200 සීමාවේ ධාවනය පථයක් නිර්මාණය කරන්න පුළුවන්. ඒකත් ඉතාමත්ම අපහසුතාවයෙන්. ඒ අලුත්ගම මහජන ක්‍රීඩාංගණයේ අඩු පහසුකම් තිබෙන්නේ. මම හිතන්නේ ඒ ක්‍රීඩාංගණයේ ක්‍රීඩා කිරීමවත් සුදුසු නැති මට්ටමක් තිබෙන්නේ. අපේ බේරුවල ආසනයට ක්‍රීඩාංගණයකට අවශ්‍ය කරන ප්‍රතිපාදන ටිකක් ලබා දීමට කටයුතු කරන්නය කියලා මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි අපි සමහර ක්‍රීඩා සමාජ ශක්තිමත් කරන්න යනවා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරමින්. අපට මේ ක්‍රීඩා සමාජ ඉතාමත්ම හොඳින් ශක්තිමත් කරගන්න පුළුවන්. අපි දන්නවා, විවිධ ග්‍රාමීය සංවර්ධන කටයුතුවලදී ස්වේච්ඡා සංවිධානවලට කොන්ත්‍රාත් ලබා දෙනවා. ඒ කොන්ත්‍රාත් ලබා දීමත් එක්ක ඒ සංවිධානය බොහොම ශක්තිමත් වෙනවා. ඒගොල්ලෝ පෞද්ගලික මට්ටමින් - අපි හිතමු සමෘද්ධි බලකාය නම්, ඒ බලකාය ශක්තිමත් වෙනවා. ඊළඟට ග්‍රාම සංවර්ධන සමිතිය නම්, එය ශක්තිමත් වෙනවා. හැබැයි, මේ ක්‍රීඩා සමිති, ශක්තිමත් සංවර්ධන සමිතිය නම් එය ශක්තිමත් වෙනවා. හැබැයි, මේ ක්‍රීඩා සමිති අපට ශක්තිමත් කරන්න පුළුවන් මෙන්න මේ ක්‍රීඩා සමිතියට කොන්ත්‍රාත් එකක් අපට ලබා දෙන්න පුළුවන් නම්. එයින් ලැබෙන 5% ඒ ක්‍රීඩා සමාජයේ දියුණුව වෙනුවෙන් යොදවා ගෙන ඒ ක්‍රීඩා සමාජය සංවර්ධනය කරන්නට හැකියාව ලබා දෙන්න පුළුවන්. ඒ නිසා මම විශේෂයෙන්ම ඒ යෝජනාව කරනවා.

ඒ වාගේම තමයි අපි ජාතික, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් ගැන කථා කරනකොට - අපි ක්‍රීඩා සමිති කොයිතරම් දුරට ශක්තිමත් කරන්න උත්සාහ ගත්තත් වැඩක් නැහැ, අපේ පාසල් ක්‍රීඩාව නංවන්න බැරි නම්. අද මේ පාසල් ක්‍රීඩාව නංවන්න නම් විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත්, ඒ වාගේම අපේ බස්නාහිර පළාතේ ක්‍රීඩා අමාත්‍යාංශයත් එකතු විය යුතුයි. මේ එකතුවීමත් එක්ක තමයි, ඒ වැඩ සටහන් ක්‍රියාත්මක කරලා මම හිතන්නේ, මේ ක්‍රීඩාව නංවන්නට පුළුවන් වන්නේ. ජාතික මට්ටමේ, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් බිහි කරන්නට පුළුවන් වන්නේ. ඒ නිසා පාසල් මට්ටමේ, විශේෂයෙන්ම නිවාසාන්තර ක්‍රීඩා උත්සවවලදී, පළාත් ක්‍රීඩා උත්සවවලදී ඒ වාගේම කොට්ඨාශ ක්‍රීඩා උත්සවයේදී පළාත් සභාවේ ප්‍රතිපාදන ලබා දෙන්න කියලා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම කලා කටයුතු පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. අපේ සහෝදර ප්‍රවීන කලාකරුවන් දෙපළ ඉතාමත්ම හොඳින් මේ සම්බන්ධව කථා කරන්න ඇතියි කියලා මම විශ්වාස කරනවා.

මම ඊළඟට කථා කරන්නේ සමූපකාරය පිළිබඳව. සමූපකාරය ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ පිළිබඳව ආඩම්බර වෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. මේ රා කර්මාන්තය පිළිබඳව. ස්කාගාරය බේරුවල. අපි හිතන්නේ ස්වාභාවික රා ටික තමයි ලැබෙන්නේ කියලා. මම හිතන්නේ ගරු ඇමැතිතුමා හිතන්නෙත් ඒ මට්ටමෙන්. ස්වාභාවික රා මදින්නාගේ රා ටික තමයි ගෙනැල්ලා මේ ස්කාගාරයේ,

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මල තලල ගන්න ඒවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මල තලලා ගන්න ඒවා. අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාගේ තලන්නේ නැතිව නොවෙයි. ඉතින් මේ ස්වාභාවික රා ටික නොවෙයි අද මේ ස්කාගාරයට වැඩි වශයෙන් ලැබෙන්නේ. මම හිතන්නේ අර ඇතිහිටියා කියන වර්ගය තමයි දැන් ඒ බේරුවල ස්කාගාරයේ - ඒකට යොදන දේවල් තමයි වතුර ලීටර් 2000 කට සීනි දානවා. ඊස්ට් දානවා. යූරියා පොහොර දානවා. ඇමෝනියා දානවා. මේවා දාලා අවසානයේ හදන දේ බීලා අපි නැති වෙනවා. ඉතින් ඒක නිසා විශේෂයෙන්ම මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම පැහැදිලිවම කියනවා. නැත්නම් ඊළඟ විවාදය තුළ මහා දැවැන්ත උද්ඝෝෂණයක් කරන්න අපි ලැහැස්ති වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මතක් කරමින්, මම හිතන්නේ මේ ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක කරන්නට ගරු ඇමැතිතුමා අපට මහා දැවැන්ත සහයෝගයක් අමාත්‍යාංශය හරහා දෙනවා වාගේම විශේෂයෙන්ම බේරුවල ප්‍රාදේශීය ලේකම් හැටියට ඉන්න කාලයේ සිටන්ම අපි බොහොම අඳුරන අපේ ලේකම්තුමා, ඒ වාගේම අනිකුත් සියලුම අමාත්‍යාංශවල නිලධාරීන්, ඒ වාගේම පෞද්ගලික ලේකම් හැටියට අපේ දුමිඳු කොඩිකාර මැතිතුමා ඇතුළු ඒ පෞද්ගලික කාර්ය මණ්ඩලයට සමස්ත මන්ත්‍රීවරු වෙනුවෙන් අපේ ස්තුතිය පුද කරනවා. අපේ ස්කාගාරය සම්බන්ධවත් අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිමින් ඔබගේ අමාත්‍යාංශයේ මේ 2013 දී 2012 වඩා සාර්ථක වැඩ පිළිවෙළක් දියත් කරන්නට ඔබතුමාට වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින්, අපේ පූර්ණ සහයෝගය ලබා දීමට ප්‍රතිඥා දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 03.26 ]

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාමීය සංවර්ධන කටයුතු පිළබඳ අමාත්‍යාංශයේ 2013 අයවැය ලේඛනය හා ඒ සම්බන්ධව කටයුතු කරන මේ සභාවේ, අයවැය විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මම හිතන්නේ, අපගේ ගරු මන්ත්‍රීවරුන් විසින් මේ විෂයය පිළිබඳව ඉතා දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡාවට භාජනය වුණා. එක කාරණාවක් හැටියට අපි දකිනවා. සමාන්‍යයෙන් මෙවැනි විවාදයකදී පාලක පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝවිට ඒ පාලක පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට තමන්ගේ වගකීමත්, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ඒ වගකීමත්

[ ගරු ගාමිණී සිල්වා ]

නිසියාකාරව කටයුතු කළාද කියන එක පිළිබඳව අපට යම්කිසි ප්‍රශ්නයකට භාජනය වෙනවයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරලා දෙන්න ඕනෑ. උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ මෙම අමාත්‍යාංශ විවාදයේදී ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳව කථා කරන විට ගම නගරය අතර පරතරය අවම කිරීම මෙම පළාත් සභාව සතු වගකීමක් හැටියට අපි දකිනවා. මධ්‍යම රජයෙන් යම්කිසි මෙහෙවරක් ඉෂ්ට කරනකොට ඒ හා සමානවම බස්නාහිර පළාත් සභාවේ ඒ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳව, ග්‍රාමීය සංවර්ධනය, සමිති ගොඩනැඟිලි නිමා කිරීම, ග්‍රාම සංවර්ධනය තුළින් ගමේ දියුණුව සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳව අපට මෙහිදී සිහිපත් කළ යුතුව තිබෙනවා. අපි දන්නවා. ග්‍රාම සංවර්ධන සමිති හරහා තමයි පළාත් පාලන ආයතනවල, එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ කටයුතු කරගෙන යැමේදී ජාතික සවිය, ගම නැඟුම, එක ගමකට එක වැඩක් වැනි වැඩ සටහන් අතිගරු ජනාධිපතිතුමාගේ ඒ සංකල්පයන්ට අනුව බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාගේ මෙහෙයවීමෙන් මුදල් ලබා දීමේ කටයුතු පසුගිය කාලය තුළ කළ බව අපි දන්නවා.

විශේෂයෙන් ඒ කටයුතු කිරීමේදී ශ්‍රම ශක්තිය මෙහෙයවන්න කියලා 10% ක හෝ 20% ක මුදලක් ඒ කටයුතුවලින් ඉවත් කරනකොට, ගමේ ග්‍රාම සංවර්ධන සමිතියට මේ වැඩ කටයුතු භාරදෙන කොට ඒ ග්‍රාම සංවර්ධන සමිතිය විසින් තවත් 5% ක මුදලක් ඒ ග්‍රාම සංවර්ධන සමිතියට අය කර ගන්නවා. අපි මෙතැනදී දැකපු දෙයක් තිබෙනවා. පසුගිය කාලයේ මේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතිවලට පොඩි අපල කාලයක් ලැබුවයි කියන එක අපි දැක්කා. ඒකට හේතුව තමයි මේ 5% යේ කොටස් මුදල ගෙවීමේදී ගමේ ග්‍රාම සංවර්ධන සමිතියට මේ වැඩ කටයුතු ලැබුණේ නැහැ. මේවා වෙනත් ආකාරයකින් සමෘද්ධි සංවර්ධන සමිතිවලට, එහෙම නැත්නම් ගමේ වෙනත් පොදු සමිති සමාගම්වලට මේ වැඩ කටයුතු පැවරුණායි කියන එක අපි දැකපු කාරණයක් වෙනවා. ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය නඟා සිටුවමින් ඒ 5% යේ මුදල අඩු තරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් 2% දක්වා හෝ අඩු කළා නම් මේ ග්‍රාම සංවර්ධන සමිතිවලටත් මෙහෙම ව්‍යාප්තීන් ලබා ගැනීමේ හැකියාව තිබුණා. ඒ ව්‍යාප්ති ග්‍රාම සංවර්ධන සමිතිවලට ලැබුණේ නැහැයි කියන එක අපි දැක්කා. මා මේ කියන කථාව පිළිබඳව යම්කිසි සොයා බැලීමක් කළොත් උදාහරණයක් හැටියට මට කියන්න පුළුවන් කැස්බෑව ආසනය තුළ තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්බන්ධ කරගෙන, එහෙම නැත්නම් කැස්බෑව නගර සභාව සම්බන්ධ කරගෙන, බොරලැස්ගමුව නගර සභාව සම්බන්ධ කරගෙන මේ කටයුතු පිළිබඳව සොයා බැලුවොත් පසුගිය කාලයේ ග්‍රාම සංවර්ධන සමිතිවලට, ඒ ක්‍රියාත්මක සමිතිවලට කොපමණ මුදලක් ලැබුණාද කියන එක පිළිබඳව සොයා බැලීම අපේ යුතුකමක් වෙනවා.

ඒ වාගේම තමයි ගමේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිතිය නඟා සිටුවන්න අපි හැම විටම උත්සාහ කරනවා. ඒ සමිති සමාගම්වල

ඉන්න ක්‍රියාකාරින් දැනුවත් කරලා, ඒ අයට අවශ්‍ය කරන උපකරණ ලබා දීලා, අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ පසුගිය කාලයේ අපි දැක්කා, ග්‍රාම සංවර්ධන සමිතිවලට පුටු, ඒ හා සමානව හට් ලබා දීලා ගමේ පොදු අවශ්‍යතාවයන් ඉෂ්ට කරගන්න ග්‍රාම සංවර්ධන සමිතිවලට විශාල සහන රැසක් ලබා දෙනවා. අද ග්‍රාම සංවර්ධන සමිතිවල ලක්ෂ ගණනින් මුදල් එක් තැන් වෙලා තිබෙනවා. ඒ මුදල්වලින් ගමේ පොදු වැඩ කටයුතුවලට අවශ්‍යතාවය ලබා දුන්නා. ඒ වාගේම ගමේ දහම් පාසලට, පාසලේ දරුවාට අවශ්‍ය කරන උපකරණ ලබා ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඒ අවශ්‍ය කරන නිර්දේශ ලබා දීලා ඒ මුදල් වෙන් කරලා දුන්නා. අද සිද්ධ වෙන්නේ ඊට වඩා හාත්පසින් වෙනස් දෙයක්. ගමේ ග්‍රාම සංවර්ධන සමිතියක සල්ලි ටිකක් තිබෙනවා දැක්කාම ඒ හා සමානවම නිලධාරින් ගිහිල්ලා, විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු කරන අවස්ථාවලදී ගමේ යම් පොදු අවශ්‍යතාවය සඳහා නොවෙයි. ඒ මුදල් ටික අරගෙන වෙනත් වෙනත් විකල්ප කටයුතුවලට යෙදෙව්වාය කියන එක අපි දැක්කා. උත්සවවලට. උත්සව හා සම්බන්ධ වන ඒ ක්‍රියාකාරකම්වලට ඒ සමිති නිලධාරීන්ගෙන් අනුමැතියකින් තොරව, මේ මුදල් නිදහස් කරගෙන සමහරවිට ඒ සමිතිවල මුදල් ඉල්ලනකොට ඒ නිලධාරින් අකැමැත්තෙන් මේකට කැමැත්ත දෙනවා. නමුත් ගමේ දියුණුව සඳහා නොවෙයි ඒ මුදල් යෙදවුණේ කියන එක අපි දැක්කා. මේ පළාත් සභාවට පමණක් සීමා වුණු කාරණාවක් නොවෙයි. ගමේ දියුණුව වෙනුවෙන් ඒ කටයුතු කරන ග්‍රාම සංවර්ධන සමිතිවලට අවශ්‍ය දේ ලබා දෙන්න, විශේෂයෙන්ම උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය හැම වේලාවේම බැඳී සිටියා කියන එක අපි දැකපු දෙයක්. ප්‍රජා ශාලා ඉදි කිරීමේදී මුදල් ලබා දුන්නා. ගමේ ප්‍රජා ශාලාවක් ඉදි කරන්න කියලා කවුරු හරි ඉල්ලීමක් කළොත් කිසිම දවසක එතුමා ඒක ප්‍රතික්ෂේප කළේ නැහැ. ඒකට අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම එතුමාගේ කාර්ය භාරයක් වුණා. එතුමා යටතේ පැවැත්වෙන අමාත්‍යාංශය තමන්ට පැවැරුණු කාර්යයක් හැටියට සලකලා ඒ කටයුතු ඉෂ්ට කළයි කියන එක අපි දැක්කා. ඒ වාගේම ගමේ දියුණුව වෙනුවෙන් ගෙන යන ඒ ග්‍රාම සංවර්ධන සමිති හරහා කෙරෙන වැඩ කටයුතුවලදී ඉදිරි කාලය තුළ මුදල්වලින් යම්කිසි ව්‍යාපෘති ලබා ගැනීම ටෙන්ඩර් පටිපාටියට පරිබාහිරව සිදුවන කාර්යයක්. අපි දන්නවා, ලක්ෂ 10 කට, 20 කට අඩුවෙන් යන යම්කිසි ව්‍යාපෘති කිරීමේ හැකියාව ඒ ග්‍රාම සංවර්ධන සමිතිවලට තිබෙනවා. නමුත් මම අර මීට ප්‍රථම මතක් කරපු ඒ ජාතික සවිය, ගම නැඟුම වාගේ වැඩ සටහන්වලදී, මුදල් කපා හැරීමේදී නියමිත සංවර්ධනයක්, ප්‍රතිඵලයක් ගමට ලැබෙන්නේ නැහැ. ගමේ කෙරෙන වැඩේ අංගසම්පූර්ණ වැඩක් හැටියට කෙරෙන්නේ නැහැ. ඒක තවත් කොමිස් මුදලක් හැටියට ගිහිල්ලා සමිතියට **5%** කුත් දීලා ඒ කටයුත්ත කළොත් ඒ මුදල්වලින් ඒ ලැබෙන ප්‍රතිඵලය ලබා ගන්න බැරි වෙන බව අපි දැකපු දෙයක්.

ඒ වාගේම තමයි එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන තරුණ කටයුතු අමාත්‍යාංශය. ග්‍රාමීය කාන්තාවන් වෙනුවෙන් විශාල වැඩ කොටසක් එතුමාගේ ඒ අමාත්‍යාංශය යටතේ පසුගිය කාලයේ සිද්ධ වුණා. ස්වයං රැකියා ආධාර ලබා දුන්නා. මැෂින් ආධාර ලබා දුන්නා. රූපලාවන්‍ය, මනාලියන් හැඩ ගැන්වීම, කොණ්ඩා මෝස්තර වැනි වැඩ සටහන් ගමේ කාන්තාවන් වෙනුවෙන් ස්වයං රැකියාවක් කරගෙන යන්න පුළුවන් අවස්ථාවක් ලබා දෙන්න, ඒ අයට යම්කිසි පුහුණු පාඨමාලාවක් ලබා දීමේ වැඩ කොටසක් පසුගිය කාලයේ එතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වුණා. අපි දන්නවා, විශාල වශයෙන්ම අද මේ රටේ පාසල් අධ්‍යාපනය හැර යන දරුවාට සමහර වේලාවට රැකියාවක් නැහැ. ඒ දරුවා මහ පාරට යන්නේ. ඒ දරුවා රස්සාවක් සොයනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

අම්මෝ. මම හිතන්නේ මට බොහොම අසාධාරණ කාලයක් තමයි ලබා දුන්නේ. තරුණයෝ වෙනුවෙන් අපි කටයුතු කරනකොට ඒ තරුණයින්ට රියැදුරු පුහුණු රැකියාව තුළින් තමන්ට රැකියාවක් ලබා ගැනීමේ අවස්ථාවක් ලබා දීම වැනි මෙම අමාත්‍යාංශය යටතේ විශාල වශයෙන් වැඩ කොටසක් ඉෂ්ට වුණයි කියන එක අපි දැක්කා. විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍යතුමා ඒ සඳහා විශාල වැඩ කොටසක් කරගෙන ගියයි කියන එක අපි දැක්කා. විශාල තරුණයින් පිරිසකට ස්වයං රැකියා ආධාර යටතේ රියැදුරු පුහුණුව ලබා දෙන්න, බර වාහන පුහුණුව ලබා දෙන්න එතුමා කටයුතු කළයි කිව්වොත් ඒක නිවැරැදියි. අපි දන්නවා, අද අපේ ගමකට ගියාම අපට බස්නාහිර පළාත් සභාවක් තිබෙනවයි කියලා පෙනෙන අවස්ථාවක් තමයි උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය. පාරට ගියාම බස් හෝල්ට් එකක් හරි පේනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එච්චර තමා.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

එච්චර කියන්න බැහැ. එතුමාගේ අමාත්‍යාංශය තුළින් ඊට වැඩිය හොඳට වැඩ කරනවා. අපි දැකපු දේවල්. බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. එතුමාට ඒකට නියම ශක්තිය ලැබුණේ නැහැයි කියන එක අපි දැක්කා. අර මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය කාලයේ බස්නාහිර පළාතේ තිබුණු බස් සේවාවල් රාශියක් නැති වෙලා තිබෙනවා කියලා. මමත් ඒක සත්‍යයක් ලෙස දකිනවා. අපට මතකයි එදා 116 පිළියන්දල - මට්ටක්කුලිය කියලා හොඳ බස් සේවාවක්

තිබුණා. ඒ වාගේම 425 කළුතර - පිළියන්දල බස් සේවාවක් තිබුණා. අද මේ එක බස් සේවාවක්වත් අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි 1977 -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ගාමිණී සිල්වා**
Hon. Gamini Silva

පිහිටවපු එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුව. මේ තුළ තමයි මේ රටේ බස් සේවාවන් කඩා වැටුණේ. ලංගමයට තිබුණු තැන (බාධා කිරීමක්) ඒක ගොඩගන්න බැහැ දැන්. අද බස් එකකට පර්මිට් එකක් දුන්නොත් හෙට බස් කාරයෝ ස්ට්‍රයික් කරනවා. මේ නව බස් සේවාවන් ඇති කරන්න නම් මෙන්න මේ මාර්ග සේවාවන් හොයලා නැවත ඒ සේවයේ පිහිටුවන්න කියන එකයි අපි කියන්නේ. එතකොට පුළුවන් වෙයි ජනතාවට නියම සේවාවක් ලබා දෙන්න. අද ලංගමය නැති කරපු එක තමයි මේ රටේ සිදුවුණු විශාලම පාපය කියන එක මම මතක් කරනවා. මේක ගොඩගන්න තිබුණා නම්, මේ පුද්ගලික ප්‍රවාහන සේවය අපට අවශ්‍ය වෙන්නේ නැහැයි කියන එක අපි මතක් කර දෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න මන්ත්‍රීවරු හැටියට අපි නිතරම ශක්තිය ලබා දෙනවා කියමින්, මේ සඳහා අපට කථා කිරීමට අවශ්‍යතාව ලබා දීම පිළිබඳව සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 03.39 ]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. ඇත්තටම වසර 25 ක ඉතිහාසයක් තිබෙන මේ බස්නාහිර පළාත් සභාවේ අපේ කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධව කථා කරන්න ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා. ගිය වර මම ඒ සම්බන්ධව කථා කළා. ඒත් මම එදා එතුමාගේ උපදේශක කාරක සභාවේ හිටපු මන්ත්‍රී කෙනෙක් නොවෙයි. ඒත් අද මෙතුමාගේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රී කෙනෙක් තමයි මමත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. එදා බස්නාහිර පළාත් සභාවේ අයවැය විවාදයේදී මෙතුමාට මම තරම් විරුද්ධව කථා කරපු පුද්ගලයෙක් නැහැ. මම සංඛ්‍යා ලේඛන ඇතුව, ඒ වාගේම දත්ත ඇතුව, ඒ වාගේම විශාල පොත් පත් ගෙනැල්ලා, නොයෙකුත් වංචාවන් සම්බන්ධව, විදේශ ගමන් යාම සම්බන්ධව, ඒ වාගේම අක්‍රමිකතා සම්බන්ධව, ඒ වාගේම ගැමුණු විජේරත්න මැතිතුමා කියපු දේවල්, ඒ වාගේම පිටරට වුණු දේවල් සම්බන්ධව විවෘතව චෝදනා කළා. ඒත් මම උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් අද දවසේ වෙනස් විධියකට කථා කරන්නේ. හේතුව ඇයි?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඉන්දුනීසියා එක්කත් ගියා නේ? ඒක නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා පළාත් සභා ශක්තිමත් කරන්න ඉන්න ඇමැති කෙනෙක්. අද අපේ පළාත් සභාවේම ඉන්නවා, පළාත් සභා ක්‍රමය එපා කියන අමාත්‍යවරු. එහෙමනම් මම මොනවාටද මෙතුමාට බණින්නේ? මම මොකටද මෙතුමාට බණින්නේ? මම මොකටද මෙතුමාව විවේචනය කරන්නේ? එතැන තමයි මගේ තර්කය. අද පළාත් සභා එපා කියද්දී, පළාත් සභාවේ තිබෙන වරප්‍රසාද ඔක්කෝම අරගෙන, යාන වාහන අරගෙන, රට සවාරි ගිහිල්ලා, ත්‍රීවිල්වලට මීටර් බෙදනවා. ඒ වාගේ තිබෙන ඔක්කෝම දේවල් කරලා මෙතැනම ඉඳගෙන කියනවා පළාත් සභා එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජෝර්ජ් එකම දේ කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපේ මේ අමාත්‍යතුමා ක්‍රීඩා භාණ්ඩ බෙදනවා. ග්‍රාම සංවර්ධන සමිතියට ගිහිල්ලා පුටු ටිකක් බෙදනවා. මේ ඔක්කෝම කරන්නේ අපේ පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන්න. ඒකයි මම කියන්නේ. එහෙමනම් අපේ විවේචන අපි හොඳ විධියට කරලා මේ අමාත්‍යාංශයේ දේවල් ගෙනියන්න තමයි මම අදහස් කරන්නේ. මේක තමයි ඇත්ත දේ. ඒ වාගේම කියන්න ඕනෑ, පළාත් සභාවේ හිටපු සමූපකාර අමාත්‍යතුමා. හෙක්ටර් බෙත්මගේ මැතිතුමා මෙතුමා සම්බන්ධයෙන් දීර්ඝ වර්ණනාවක් කළා. එතකොට එතුමාත් පළාත් සභාවේ හිටපු සමූපකාර ඇමැති කෙනෙක්. එහෙමනම් එතුමා මොනවත් කරලා නැතිව ඇති දෙයියනේ. දැන් මේ ඉන්න ඇමැතිතුමා මේ වාගේ දේවල් හරි කරන්න, මොනවාද එයා කරලා තිබෙන්නේ? එදා අපි බස්නාහිර පළාත් සභාවේ ප්‍රශ්නයක් ඇහුවා. ඉඩම්, සමූපකාර ඇමැති. පළාත් සභාවේ ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් තිබෙනවාද? ඉඩම් නැහැ. දුන්නු උත්තරේ. විශ්වාස භංගයට ආපු පළමුවැනි චෝදනාව. එහෙම ඇමැති කෙනෙක්. අද අපි සතුටු වෙනවා. ඒ ඇමැතිතුමාම අද අපේ කොඩිකාර ගරු අමාත්‍යතුමා සම්බන්ධව ඉතාම දක්ෂ විධියට කථා කළා. හැබැයි කිව්ව කැත කථාව, හාල් මිටි පහක් දුන්නොත් නම් ඡන්දයක් කල් දාගන්න පුළුවන් වෙයි කියලා. ඒ කථාවත් කිව්වා. මේ ඇමැතිතුමාට හාල් මිටි පහක් දුන්නා නම් ඡන්දයක් කල් දාගන්න පුළුවන් කියලා කිව්වා. ඒ ගැනත් අපි මතක් කරන්න ඕනෑ. එහෙමම කියපු ඇමැතිතුමා තමයි ඒ විධියට කථා කළේ.

කෙසේ වෙතත් ගරු අමාත්‍යතුමාට සඳහන් කරන්න ඕනෑ, සමූපකාර කොමිෂන් සභාව ගැන කථා කරනවා නම් ඒක තනිකර

දේශපාලනීකරණය වෙලා. උසස්වීම් දෙනකොට ඒ තත්ත්වය වෙනස් කරන්න කියලා මේ අයවැය විවාදයේදී මම ඉල්ලීමක් කරනවා. යම් යම් සේවකයන්ට, යම් යම් සමූපකාර නිලධාරීන්ට මේ අක්‍රමිකතාවලට ගොදුරු වෙන්න වෙලා තිබෙනවා. යම් යම් නිලධාරීන්ට, නැත්නම් මේ කොමිෂන් සභාවේ යම් යම් උදව්යට අල්ලස් වාගේ දීලා තමයි ඒ වාගේ දේවල් කරගන්න වෙලා තිබෙන්නේ. එය දේශපාලනීකරණය වෙලා. උදාහරණයක් ලෙස කියනවා නම්, එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් තනතුරක් ගන්න ඉන්නවා නම්, ඒ උදව්යට ඒක ලැබෙන්නේ නැහැ. ඒ දේ නොකර ස්වාධීන තත්ත්වයට පත් කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම සමූපකාරයෙන් දේශපාලනය ආරම්භ කරපු මන්ත්‍රී කෙනෙක් වශයෙන් පිලපිටිය සමූපකාරයෙන් ඇවිල්ලා, කැලණිය සමූපකාරයේ අධ්‍යක්ෂ වෙලා, අද ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට පැමිණි මන්ත්‍රී කෙනෙක් වශයෙන් සමූපකාරයට ලැදි පුද්ගලයෙක්. ඒ දවස්වල ඉඳන් මම කැලණිය සමූපකාරය, දළුගම සමූපකාරය, මහර විවිධ සේවා සමූපකාරය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් ප්‍රකාශ කළා. ඒ වාගේම කැලණිය ග්‍රාමීය බැංකුවල තිබෙන දූෂණ සම්බන්ධව කථා කළා. ලක්ෂ 100 ක වංචා සම්බන්ධව කථා කළා. සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාත් කැලණියේ ඉන්නේ. හැබැයි ඒවා සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ වෙලත් කථා කරන්නේ නැහැ. විපක්ෂයේ යුතුකම් අපි කළා. ඒත් අද මම කියන්න සතුටුයි. ඒ දේවල් ඒ විධියටම වෙනවා විතරයි. කිසි වෙනසක් නැහැ. ඒවා යථා තත්ත්වයට පත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පරීක්ෂණ කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පරීක්ෂණ කළාට, ඒ පරීක්ෂණ තවම යථා තත්ත්වයට පත් වෙලා නැහැ. ඒ වාගේම මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. අපේ මහර ආසනයේ සමූපකාර ණය දෙන සමිතිය වැබඩ – උතුර බටහිර. ඒ සම්බන්ධව මම එදා කථා කළා. ඔබතුමා අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න පස්සේ භාර ගත්තා. මේ සම්බන්ධව මම මේ විවාදයේදී මතක් කරනවා. ඒ සමූපකාර ණය දෙන සමිතිය කියන්නේ ලක්ෂයක් වටින ඉඩමට ලක්ෂ 10 ක් මේ සමූපකාරයෙන් ණය දෙනවා. ලක්ෂයයි වටින්නේ. බූදල් වාගේ. ඒ වාගේම තැන්පතුවක් ගන්න විසිපාරක්, තිස් පාරක් යන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, විශ්වාසය නැති වෙලා තිබෙනවා. එහෙමනම් මේ සම්බන්ධවත් විශේෂ පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධවත් මේ වේලාවේ මතක් කරනවා.

ඒ වාගේම ක්‍රීඩාව සම්බන්ධයෙන් පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. ගම්පහ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුර අද ඇබෑර්තු වෙලා තිබෙනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරී තනතුරත් ඇබෑර්තු වෙලා තිබෙනවා. හැබැයි කළුතර එක්කෙනෙක් තමයි වැඩ බලන්නේ ගම්පහ. සුමනා මහත්මිය. එහෙමනම් මම ඉල්ලීමක් කරනවා. එතුමිය කළුතර දිස්ත්‍රික්ක ක්‍රීඩා නිලධාරී තනතුරට පත් කරලා, ගම්පහ දිස්ත්‍රික්කයට විවෘතව සම්මුඛ පරීක්ෂණයක් කැඳවලා ඒ අවශ්‍ය සුදුසුකම් තිබෙන නිලධාරීන්ගෙන්, ක්‍රීඩා නිලධාරීන් වෙන්න පුළුවන්. ක්‍රීඩා පුහුණු නිලධාරීන් වෙන්න පුළුවන්. නැත්නම් එයට ගැලපෙන නිලධාරීන් වෙන්න පුළුවන්. විනිවිද පෙනෙන ආකාරයට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරලා ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරී තනතුර දේශපාලනීකරණය නැතිව පත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. දැනට වෙන්නේ නම් එක එක්කෙනාට ඕනෑ විධියට තමයි වැඩ බලන්න දීලා තිබෙන්නේ. ඒ දේ වෙනස් කරන්න කියලා මේ වේලාවේ අවංකව ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අපේ ග්‍රාම සංවර්ධන සමිති ගැන පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මම සතුටු වෙනවා. ඔබතුමාගේ මේ පොත් පිංචේ මගේ ෆොටෝ එකකුත් දාලා තිබෙනවා. පුදුමයි.

[සභාවේ සෝෂා]

මේ පොත් පිංචේ කැලණිය, හුණුපිටියේ නාහේන ග්‍රාම සංවර්ධන සමිතිය විසින් නිවාස ව්‍යාපෘතියක් කළා. මෙතුමාත් ඒකට සම්බන්ධ වුණා. මමත් පළාත් සභා ප්‍රතිපාදනවලින් ඒ නිවාස ව්‍යාපෘතියට උදව් උපකාර කළා. ගරු අමාත්‍යතුමා දන්නවා. ඒ ෆොටෝ එකත් මේකේ තිබෙනවා. සතුටු වෙනවා. (බාධා කිරීමක්) මම විතරයි ඉන්නේ. කෙසේ වෙතත් ඒ ග්‍රාම සංවර්ධන සමිතියක තිබෙන වැදගත්කම අපි අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ග්‍රාම සංවර්ධන සමිතියක් කියන්නේ ජනතාව අතර තිබෙන සමිතියක්. අද ග්‍රාම සංවර්ධන සමිතිය කියන්නේ, කොන්ත්‍රාත් කරන සංවිධානයක්. මේක තමයි ඇත්ත දේ. ඒ දේ වෙනස් කරන්න කියන එක තමයි මම ඔබතුමිය මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කෙටියෙන් මම ඉවර කරනවා. අද ඒ ග්‍රාම සංවර්ධන සමිති ගම නැඟුම, මග නැඟුම, නැත්නම් ප්‍රාදේශීය සභා, පළාත් සභා ව්‍යාපෘති කොන්ත්‍රාත් කරන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. එහෙත් අද මේ අමාත්‍යාංශයේ හොඳ නිලධාරී මණ්ඩලයක් ඉන්නවා. බර්නාඩ් වසන්ත මැතිතුමා. උපුල් අල්විස් මැතිතුමා. දේශප්‍රිය මැතිතුමන්ලා වාගේ හොඳ නිලධාරී මණ්ඩලයක් ඉන්නවා. ඒ අයගේ සහයෝගයත් අරගෙන ඔබතුමාගේ අමාත්‍යාංශයේ අඩුපාඩු ඉදිරියේදී හදා ගන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වුයෙන් ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 11 ක් තිබෙනවා.

[ අ.භා. 03.49 ]

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම 05 ක් දුන්නා. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එහෙම බැලුවොත් ඔබතුමාට කථා කරන්න වෙලාවක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, අද අපේ බස්නාහිර පළාත් සභාවේ 25 වැනි අයවැය විවාදයත්, ඒ වාගේම මම අමාත්‍යවරයා වෙලා තුන් වැනි අයවැයත් අද අපේ සභාවේ විවාදයට යොමු කරලා අපි පසුගිය වසරේ කරපු වැඩත්, ඉදිරියට කරන්න යන වැඩ පිළිබඳවත් සාකච්ඡා කරමින් මන්ත්‍රීවරු 14 දෙනෙක් කථා කරලා තිබෙනවා. විපක්ෂයෙන් 05 දෙනෙක් සහ ආණ්ඩු පක්ෂයෙන් 09 දෙනෙකුත් 14 දෙනෙක් කථා කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම සතුටු වෙනවා. මේ අයවැය සම්බන්ධ විවාදයේදී අපේ අමාත්‍යාංශය ගැන තිබුණු විවේචන, ඒ වාගේම සුභවාදී කරුණු ඒ සියල්ලටම මට මුහුණ දෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම අපේ එක්සත් ජාතික පක්ෂයේ නිරෝෂන් පාදුක්ක මැතිතුමා ඇහුවා, නිරෝෂන් පාදුක්ක මැතිතුමා සභාවේ නැති වුණත්, සභාවේ ඉන්න මන්ත්‍රීවරු ප්‍රජාතන්ත්‍රවාදීව ඇහුම්කන් දෙන මන්ත්‍රීවරු වැරැදි මතයකට ගමන් කරන්න පුළුවන් නිසා මම මේකට උත්තරයක් දෙන්න කැමැතියි. පිළියන්දල විවිධ සේවා සමූපකාර සමිතියේ චන්ද්‍රලතා මාගම්මුදලි මහත්මිය සම්බන්ධව මෙතැන ප්‍රශ්නයක් නැඟුවා. ඇයගේ සේවා කාලය සම්බන්ධව, වැටුප් සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවා. එතුමියගේ රැකියාව සම්බන්ධව උසාවියට ඉදිරිපත් කළාම එතුමියට

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

රුපියල් 35,000 ක් දෙන්න තමයි සභාවෙන් නියම කරලා තිබුණේ මම සමූපකාර සේවක කොමිෂන් සභාවට කථා කරලා, උසාවිය ඒකපාර්ශවිකව තීරණයක් දීලා තිබුණා. උසාවිය ඒකාපර්ශවිකව තීරණයක් දුන්නාම අපේ සමූපකාර කොමිෂන් සභාව මම කැඳවලා නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා සහ තව මන්ත්‍රීවරු රාශියක් මට මේ ප්‍රශ්නය පිළිබඳ කථා කළා. හෙක්ටර් බෙත්මගේ ගරු ඇමැතිතුමාගේ කාලයේ, සුනිල් ජයමිණි ගරු ඇමැතිතුමාගේ කාලයේ ඉඳලා දීර්ඝව ආපු ප්‍රශ්නයක් මේක.

[සභාවේ ඝෝෂා]

**ගරු හෙකටර් බෙත්මගේ**

අපි සතුටු වෙනවා. අනික් අය වාගේ ඊර්ෂ්‍යා කුහකම් නැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම සාධාරණව කථා කරලා මෙතුමියට රුපියල් දෙලක්ෂ අනුදාහක චෙක්පතක් යැවුවා. රුපියල් දෙලක්ෂ අනුදාහක්. දැන් එතුමිය ඒක ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මම නැවත එතුමියට කියලා තිබෙනවා, එහෙමනම් උසාවියට ගිහිල්ලා සාධාරණත්වයක් ඉල්ලන්න කටයුතු කරන්න කියලා. මම උපරිම සාධාරණත්වයක් කරලා තිබෙනවා.

අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇහුවා. අපේ ලෝක කුසලාන කායවර්ධන තරග සඳහා අපේ තරගකරුවන් දෙදෙනෙක් තරගාවලියකට ගිහිල්ලා තිබෙනවා. අපි පළාත් සභාවෙන් කීයක් දුන්නාද කියලා. ගරු සභාපතිතුමනි, මම කියන්න නෑ. අවුරුදු 25 කට පළාත් සභා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි මෙහෙම ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලියකට යන්න ලක්ෂය ගණනේ මම ලක්ෂ දෙකක් දුන්නේ. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මට කියලා. මම මගේ ක්‍රීඩා අමාත්‍යාංශයේ නිලධාරීන් කටුනායකට එක්කන් ගිහිල්ලා, කටුනායක ගුවන්තොටුපලේ එතුමාට උපහාරයක් තියලා, මල් මාලා දාලා වාහන පෙළපාලියකින් දිගටම පිළිඅරන් ආවේ. ලංකාවට කීර්තියක් ගෙනාව නිසයි. රන් පදක්කම් දිනාගෙන අපේ රටට කීර්තියක් අත් කර දුන්න නිසයි. ඒ වාගේම තමයි මම කැරම් සම්මේලනයේ සභාපති වෙලා ලංකාවට පළමුවැනි වතාවට ජාත්‍යන්තර කැරම් ක්‍රීඩා තරගාවලියේ රන් පදක්කම ගෙනැල්ලා දුන්නා. ඔහුට මම ජනාධිපතිතුමාට කියලා මිලියනයක් අරන් දුන්නා.

[සභාවේ ඝෝෂා]

ඒ වාගේම අපේ ජෝර්ජ් පෙරේරා, විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පුරප්පාඩු ක්‍රීඩා නිලධාරීන් සම්බන්ධව සඳහන්

කළා. මම අනිවාර්යෙන්ම පත් කරන්නේ, සම්මුඛ පරීක්ෂණයකින්. දක්ෂයාට අපි තැන දෙන්න නෑ. නැත්නම් ක්‍රීඩාව කරන්න පුළුවන්කමක් නැහැ. ගරු සභාපතිතුමනි, අද විශේෂයෙන්ම මේ පළාත් සභාවේ වැඩිම ආදායම උපයන්නේ මම. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයෙන් අපි මිලියන -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඝෝෂා කිරීම් කරන්න එපා. ගරු ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එතකොට මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයෙන් 2012 සැප්තැම්බර් මාසය වන විට අපි දළ වශයෙන් රුපියල් මිලියන දෙදහස් පන්සිය එකයි හත් ලක්ෂ දාහතර දහස් හාරසිය තුනයි ශත අසූ හතයි.

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් නිශ්ශබ්දව අහන් ඉන්න. දැන් බලන්න. අපේ සමූපකාර දෙපාර්තමේන්තුව ලංකා ඉතිහාසයේ අවුරුදු එකසිය පනස් ගණනක් පරණයි. සමූපකාර ව්‍යාපාරය ගැන කථා කළා. මම මේකේ දාලා තිබෙනවා, සමූපකාර නිවාස සංවර්ධන ක්‍රමවේදයක්. සෑම නගරයකම අපේ ඉඩකඩම් තිබෙනවා. නමුත් අපි මේ ඉඩම් සම්බන්ධයෙන් කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. මොකද, සමූපකාරයෙන් ආපු අය හැටියට මංජු මන්ත්‍රීතුමා. ඒ වාගේම ජෝර්ජ් පෙරේරා. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා. අපේ පැත්තේ ඉන්නවා, ජයමිණි ගරු සභා නායකතුමා. හෙක්ටර් බෙත්මගේ හිටපු ගරු ඇමැතිතුමා. (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපේ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මහරගම සමූපකාරයේ ලක්ෂ හයසිය පනස් ගණනක් වංචා කරලා, දූෂණය කරලා ඡන්දය තියන්නේ නැතිව - අපේ ගරු මහ අමැතිතුමාත්, ආණ්ඩුකාරතුමාත් සමඟ කථා කරලා, රැස්වීමක් තියලා. ඒ කාලයේ ඡන්දය තිබුණේ නැති නිසා අපි ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කළා. එතකොට අපි ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කිරීම තුළින් ඊයේ උසාවියේදී අපේ ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු වැරැද්දක් අනුව මොකක්ද වුණේ? අපේ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ උගත් බුද්ධිමත් - මම කනගාටු වෙනවා, අර නීතිඥ මහත්මයා නැති එක සම්බන්ධව. ඒ කාරක සභාව කරපු වැරැද්දක් තුළ තමයි උසාවියේ දී අපි නඩුව පැරදුණේ. ඒ නීතිඥ මහත්වරු - ඒකේ හිටියා අපේ කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා. අපේ නීතිඥ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. එතකොට -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර එතුමාට බාධා කිරීම් කරන්න එපා. ගරු ඇමැතිතුමා ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එක්සත් ජාතික පක්ෂයේ

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අද පළාත් සභාවේ මට මෙපමණ වැඩ කොටසක් කරන්න හම්බ වුණේ. අපේ ගරු මහ ඇමැතිතුමා විශේෂයෙන්ම මට වෙනම රුපියල් ලක්ෂ 200 ක් දුන්නා වැඩ කරන්න. අපේ අයවැයට අමතරව ලක්ෂ 200 ක් දුන්න නිසා තමයි බස්නාහිර පළාත් සභාවේ දිස්ත්‍රික්ක තුනට අපි අපේ පාසල් දූ දරුවන් සඳහා පිහිනුම් තටාක තුනක් පළමුවැනි වතාවට අපට ගෙනෙන්න පුළුවන්කමක් ලැබිලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. අද සෑම ගමකටම වොලි බෝල් පිට්ටනියක් අපට දෙන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මට තව විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න බැහැ. වෙලාව අවසන්.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කොට අමාත්‍යාංශට සම්බන්ධ සියලුම අංශවල නිලධාරීන්ට මම ස්තුතිය ප්‍රකාශ කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙලාව අවසන්. ගරු ඇමැතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අංක 107, 122, 123 හා103 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ බෙදීමක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න.

***ශීර්ෂ අංක 107 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 24 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No.107 should be approved was put and the Committee of theWhole Council was divided under Rule No 61(3) as 64 for, 24 against and 00 decliners.*

***ශීර්ෂ අංක 122 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 24 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 122 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 24 against and 00 decliners.*

***ශීර්ෂ අංක 123 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභා පක්ෂව 64 යි, විපක්ෂව 24 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 123 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 24 against and 00 decliners.*

***ශීර්ෂ අංක 103 හි සඳහන් මුදල අනුමත කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පූර්ණ කාරක සභාව පක්ෂව 64 යි, විපක්ෂව 24 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*The question that the amount indicated in the Head No. 103 should be approved was put and the Committee of the Whole Council was divided under Rule No. 61(3) as 64 for, 24 against and 00 decliners.*

| | | |
|---|---|---|
| **ශීර්ෂ අංක** | **108** | **මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු අමාත්‍යාංශය** |
| **ශීර්ෂ අංක** | **124** | **සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** |
| **ශීර්ෂ අංක** | **125** | **නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව** |
| Head No: | 108 | Ministry of Road Development, Animal Production and Livestock Development, Housing and Construction, Fisheries and Tourism Affairs |
| Head No: | 124 | Department of Animal Production and Animal Health |
| Head No: | 125 | Department of Commissioner of Houses |

***[සංකේත කපා හැරීම]***
*[Symbolic write-off]*

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක 108, 124 හා 125 වැය ශිර්ෂයන්ගෙන් රුපියල් 10/- ක මුදලක් අඩු කරන මෙන් යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම විපක්ෂයේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට විවාදයට සම්බන්ධ වන ලෙස ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 04.07 ]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ 2013 ආදායම් වර්ෂය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. ඇත්ත වශයෙන්ම ඉතාමත් ක්‍රියාශීලී අමාත්‍යාංශයක් හැටියට මේ අමාත්‍යාංශය හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම ජනතාවගේ එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය දේ සැපයීම, ඒ වාගේම ආර්ථික සංවර්ධනය, රටේ සංවර්ධනයට බෙහෙවින් බලපාන කාරණා

කිහිපයක් මේ අමාත්‍යාංශයට ගැබ් වෙලා තිබෙනවා. ඒ කාර්ය සාධනය ඉගෙන ගැනීමේදී ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය දක්වන උත්සාහය, උනන්දුව මත ඉතාම ක්‍රියාශීලීව කඩිනමින් වැඩ කටයුතු කරන අමාත්‍යාංශයක් හැටියට මට හඳුන්වන්න පුළුවන්.

අපේ බස්නාහිර පළාත තුළ මේ රටේ ජනගහනයෙන් තුනෙන් එකක් ජීවත් වෙනවා. ඒ වාගේම ප්‍රධාන අග නගරය පිහිටලා තිබෙනවා. ජනගහනයෙන් විශාල පිරිසක් අපේ ප්‍රදේශයෙන් එහා මෙහා යනවා. ඒ නිසා අපේ මාර්ග පද්ධතිය ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. ඒ මාර්ග පද්ධති සකස් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවට ලොකු වගකීමක් තිබෙනවා. මේ වැඩ පිළිවෙළේදී මාර්ග විශාල ප්‍රමාණයක් සම්බන්ධ වෙලා තිබෙනවා. පසුගිය වසර තුන තුළ මාර්ග විශාල ප්‍රමාණයක සංවර්ධන කටයුතු කළත් මේ වර්ෂයට ඉදි කරීමට තිබෙන මාර්ග ප්‍රමාණය විශාල වුවත්, අපේ අයවැය වාර්තාව දිහා බැ වාම මාර්ග පුනරුත්ථාපනය සඳහා මිලියන 600 කුත්, තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා මිලියන 526 කුත් ලැබිලා තිබෙනවා. මෙයිනුත් මිලියන 142 ක් පළාත් පාලන ආයතන මාර්ග සඳහා වෙන් වශයෙන් ලබා දෙන්න යෝජනා වෙලා තිබෙද්දී, ඒ ලැබෙන ප්‍රතිපාදන වැඩ කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

ඒ වාගේම මම ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. අපේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය තුළින් හුහාක් මාර්ග කොන්ත්‍රාත් දීමේ පදනම මත කරන්නේ. ග්‍රාමීය පාරවල්වල කටයුතු කරන අවස්ථාවන්හිදී ශ්‍රමය උපයෝගී කරගෙන, ශ්‍රමදාන මට්ටමෙන් කටයුතු කරනවා නම් මීට වැඩිය විශාල මාර්ග ප්‍රමාණයක් සකස් කිරීමට හැකියාව ලැබෙනවා. අපට ලැබෙන රුපියල් 35,000/- ක ප්‍රතිපාදනවලින් මාර්ග සංවර්ධන කටයුතු කිරීමේදී අපට අත්දැකීමක් තිබෙනවා. ගමේ ජනතාවගේ ශ්‍රම පදනම ගත්තාම විශාල වැඩ කොටසක් කරගන්න පුළුවන්. මට ගියවර ලැබුණු මුදල්වලින් රුපියල් ලක්ෂ දෙකක් රත්මල්ගොඩ ධීරානන්ද මාවතට වෙන් කළා. ගමේ සමෘද්ධි සංවර්ධන සමිතිය විසින් ඒ කොන්ත්‍රාත්තුව අරගෙන, මම ශ්‍රමදාන පදනමින් කරද්දී ඒ ගොල්ලෝ අඩි 08 ක් පළලට අඩි 35 ක් දුර කරලා තිබුණා. මම ඒ අවස්ථාවේදී ඒකට විරෝධය දක්වලා ඒ ශ්‍රමදාන මට්ටමින් කරන්න ආපසු භාරගත් වේලාවේ - සමෘද්ධි සමිතිය කොන්ත්‍රාත් පදනම මත අඩි 35 ක් දිග, අඩි 08 ක් පළලට දාන්න රුපියල් 35,000/- ක මුදලක් වැය කරලා තිබුණා. ඉතිරිවෙලා තිබුණේ 15% ක්. ප්‍රාදේශීය සභාවට කපාගෙන රුපියල් එක් ලක්ෂ හතළිස් තුන්දාහක මුදලක්. මේ එක් ලක්ෂ හතළිස් තුන්දාහක මුදලින් ගමේ ජනතාවගේ ශ්‍රමයෙන් වැලි ටිකත් සපයාගෙන අඩි 10 ක් පළලට, අඩි 245 ක් දිගට දා ගන්න පුළුවන්කම ලැබුණා. යෝජිත ප්‍රමාණයටත් වැඩිය විශාල කොටසක් කරන්න පුළුවන්කම ලැබුණා. එම අත්දැකීමත් තුළ ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. නගරවල මේක කරන්න පුළුවන්කමක් නැහැ. ග්‍රාමීය ප්‍රදේශවල මේ මාර්ග වැඩ පිළිවෙළ කරනකොට ගමත් එක්ක සම්බන්ධ කරලා, ශ්‍රමයත් උපයෝගී කරගෙන ශ්‍රමදාන මට්ටමින් කරනවා නම්, ඔබතුමා බලාපොරොත්තු වෙනවා වාගේ දෙගුණයක් වැඩ කරගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම මාර්ග සතිය වැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, අපේ පළාත් මාර්ග අමාත්‍යාංශයට විශාල යන්ත්‍රෝපකරණ රාශියක් තිබෙනවා. අපේ ප්‍රදේශවල එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තෝරලා සතියක් නම් කරලා, සතියක් පුරා විහිදුනු වැඩ පිළිවෙළක් ගෙනි යනවා නම් ජනතාවට මාර්ගය ගැන හොඳ අවබෝධයක් ලැබෙනවා. පාර අපෙයි කියන අවබෝධය ලැබෙනවා. ඒ වාගේම විශාල වැඩ කොටසක් කරගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේ වැඩ පිළිවෙළක් කළොත් - ජනතාව පාර ආණ්ඩුවේ දෙයක් හැටියට සලකන්නේ. ගේන කුණු ගොඩවල් ටික දාන්නේ පාරට. අතුගාන කුණු ටික දාන්නේ පාරට. කම්බි වැට ගහන්නේ පාරේ. මේ වාගේ හේතු උඩ ගමේ පාරවල් හුහාක් වැහීගෙන යනවා. පාරවල්වල තදබදය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ වාගේ වැඩ පිළිවෙළක් හඳුන්වලා දීලා ගමේ ජනතාවත් එක්ක සමීපව සම්බන්ධ වෙලා මාර්ග වැඩ පිළිවෙළ සකස් කර ගත්තොත්, මීට වඩා ඵලදායි විධියට වැඩ කටයුතු කරන්න පුළුවන් කියන එක මම මතක් කරන්න කැමැතියි.

නිවාස වැඩ පිළිවෙළ බැලුවාම පසුගිය වසර තුනක් තුළ නිවාස 648 ක් හදලා තිබෙනවා. මේ සඳහා මිලියන 14 යි වියදම් කරලා තිබෙන්නේ. එක නිවසකට ලැබිලා තිබෙන්නේ රුපියල් 18,000/ ක්. මේ වසරේදී ගරු ඇමැතිතුමා බලාපොරොත්තු වෙනවා, නිවාස 666 ක් හදන්න. මේ සඳහා මිලියන 20 ක් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එක ගෙයකට ලැබෙන්නේ රුපියල් 30,000/- යි. අද සිමෙන්ති මිල දිහා බැලුවාම සිමෙන්ති කොට්ටයක් රුපියල් 1000/ යි. සිමෙන්ති කොට්ට 30 යි ගන්න පුළුවන්. බ්ලොක් ගල් ගහන්න ගියොත් ගල් 240 කට වැඩිය ගහන්න පුළුවන්කමක් ලැබෙන්න් නැහැ. ඒ නිසා ඒ වාගේ කටයුත්තක් තුළ මේ මුදලෙන් සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. බ්ලොක් ගල් ගැහුවොත් 1600 ක් විතර ගහන්න පුළුවන්. එතකොට අනික් වැඩ ටික කර ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අඩුම වශයෙන් නිවාසයක් සෑදීමේදී රුපියල් 50,000/- ක මුදලක් දීලා, අදියරෙන් අදියර දීලා කටයුතු කළොත් අඩුම වශයෙන් ඒ අයගේ සම්පත් එකතු කරගන්න පුළුවන්. එහෙම නැත්නම් අඩු මුදලක් දුන්නොත් ගෙයි වැඩේ භාගෙට කරලා එක්කෝ අපතේ යනවා. එක්කෝ මේ මුදල අවභාවිතයක් වෙනවා. ඒ නිසා මම ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. නිවාස ආධාර ලබා දීමේදී නිවාසයක් සෑදීමේදී යම්කිසි වැඩි මුදලක් ඒ අයට ලබා දීලා - නිවාස ප්‍රමාණය අඩු වුණත් නිවාස සම්පූර්ණ කරගන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් කළොත් මීට වැඩිය සාර්ථක වෙයි කියලා හිතනවා. නිවාස වැඩ පිළිවෙළේදී අපේ අවශ්‍යතාවය සපුරාගන්න පුළුවන්කමක් නැහැ. බස්නාහිර පළාත් සභාව තුළම අවුරුද්දටම ගෙවල් 666 ක් හදලා මේ වැඩ පිළිවෙළ කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම අපේ විමධ්‍යගත මුදල්වලින්

නිවාස ආධාර ලබා දීමේදී සියයට ගණනක සීමාවක් අපට පනවනවා. ඒ නිසා අපි දෙන මුදල අඩුයි. එම නිසා ගරු සභාපතිතුමා මාර්ගයෙන් අපේ නිවාස ගරු ඇමැතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරනවා. මේ වාගේ නිවාස සුළු ප්‍රමාණයක් අමාත්‍යාංශයට ලබා දෙන අවස්ථාවේදී අපට ලැබෙන විමධ්‍යගත පළාත් සභා අරමුදලෙන්, අපට උවමනා විධියට, ජනතා ව්‍යවස්ථාවට අනුව නිවාසයක් ලබා ගැනීමේ මුදලක් තීරණය කිරීමේදී සීමාවන් නොදා අපට අවශ්‍ය මුදල් වෙන් කිරීමට අවස්ථාව සලසා දෙන්නය කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා තමයි මේ ගෙවල් හැදෙන්නේ. එතකොට මේ ප්‍රමාණය වැඩි දියුණු කරලා අපේ මුදලත් එකතු කරගෙන විශාල ගෙවල් ප්‍රමාණයක් සකස් කරගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ තුළින් අපට සාර්ථක ප්‍රතිඵල ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම සත්ත්ව නිෂ්පාදන වැඩ පිළිවෙළ. විශේෂයෙන්ම කිරි හරක් නිෂ්පාදනය. අපේ රටේ අපේ දරුවන්ට දෙන්න කිරි නැහැ. අපේ වැඩිහිටියන්ට අවශ්‍ය කිරි ප්‍රමාණය නිෂ්පාදනය වෙන්නේ නැහැ. ඒ සඳහා විශාල අවශ්‍යතාවයක් තිබෙනවා. කිරි ගවයන් සෑදීමේ විශාල බාධකය වෙලා තිබෙන්නේ, ගොවිපළවල් නැති එක. තමුන්නාන්සේගේ පොතේ තිබෙනවා, 2012 වර්ෂයේදී ගව ගාල් 600 ක් සෑදීම සඳහා රුපියල් මිලියන 21 ක් වියදම් කරලා තිබෙනවා කියලා. ගරු ඇමැතිතුමාට මම යෝජනා කරනවා. අපේ කළුතර දිස්ත්‍රික්කය බැලුවොත් විශාල වතු ප්‍රමාණයක් තිබෙනවා. මේ ඉඩම්වලින් අක්කර සිය ගණන් සමහර ස්ථානවල කැලෑ වැවිලා තිබෙනවා. ගරු අමාත්‍යතුමා මැදිහත් වෙලා ගවයින් ඇති කරන අයට තණ බිම් බවට පත් කරන්න, මුදල් වියදම් කරලා අක්කර සිය දහස් ගණන් තණ බිම් ඇති කරගන්න පුළුවන්කම ලැබෙනවා. එහෙම තණ බිම් හැදුවොත්, එහෙම නැත්නම් ඒ ගොවීන්ට ඒ බිම් අක්කර පහ දහය කොටස් කරලා තාවලිකාව හරක් සෑදීම සඳහා අවස්ථාව සලසා දුන්නොත් කැළෑවට වැවිලා තිබෙන ඉඩම්වලින් ඉතාමත් ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් කර ගන්න පුළුවන්. කළුතර දිස්ත්‍රික්කයේ හුඟාක් වතුවල, ඉතා විශාල වශයෙන් අක්කර දහස් ගණන් තිබෙන වතුවල අද අක්කර හාර පන්සියයි වවලා තිබෙන්නේ. අනික් ඒවායේ කැළෑව වැවිලා තිබෙන්නේ. ඒ වාගේ වතුවලින් උපරිම ප්‍රයෝජනය ගන්න නම් මේ වාගේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ තුළින් විශාල ගව සම්පතක් ඇති කරලා මේ රටේ කිරි නිෂ්පාදනය වැඩි කර ගන්න පුළුවන් වෙනවා. ඒ වාගේම කිරි නිෂ්පාදනය, කිරි භාවිතය අඩුයි. නැවුම් කිරි නිෂ්පාදන ව්‍යාපාරය ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්. නමුත් ඒක ප්‍රචාරය වෙලා තිබෙනවා මදී. දෙවූ සැනින් ලබා දෙන කිරි ඉතාමත් ඉක්මණින් ලබා දෙනවා නම් ජනතාව පරිහරණය කරනවා. අපි දන්නවා. ආදි කාලයේ අපේ ගම්වල මිනිස්සු උදේට කඩේට ගියාම කඩෙන් ඉල්ලගෙන කිරි කාලක් බොනවා. අද එහෙම පුරුද්දක් නැහැ. අද කඩේට ගිහිල්ලා කිරි ඉල්ලුවාම දෙන්නේ පිටි කිරි. තිබුණත් එළකිරි දෙන්නේ නැහැ. නමුත් අපි මේ අමාත්‍යාංශය තුළින් අලුත් කිරි ගමක් ගමක් ගාණේ ප්‍රචලිත

[ ගරු පී.ඩී. අබේරත්න ]

වන වැඩ පිළිවෙළක් සකස් කරලා ගමේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. දැන් අපේ ජනතාව තුළ වැරැද්දක් තිබෙනවා. අපේ ගම්වල සමහර මිනිස්සු හිතාගෙන ඉන්නේ, එළකිරිවල සෙම තිබෙනවා කියලා. මේ පිටි කර්මාන්තශාලාවලින් දියත් කරන මත. එළකිරි ලබා දුන්නොත් ළමයින්ට සෙම හැදෙනවා. එළකිරි දෙන්නේ නැතිව පිටි කිරි දුන්නොත් හොඳයි කියන මතයක් තිබෙනවා. මේ ග්‍රාමීය ජනතාව තුළ තිබෙන මේ මත වෙනස් කරලා ලබා දෙන කිරිවලින් උපරිම ප්‍රයෝජනය අරගෙන අපේ දරුවන්ට අපේ කිරි ලබා දෙන්න පුළුවන්කම ලැබුණොත්, අපේ ගව සම්පත ආරක්ෂා කරගෙන ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත් විදේශ රටවල්වලට යන අපේ විදේශ විනිමය විශාල ගණනක් ඉතිරි කරගන්න පුළුවන්කම ලැබෙනවා. මෙය ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාත තුළ අවකාශ තිබෙනවා. ගරු ඇමැතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය විශාල උනන්දුවක්, උත්සාහයක් ගන්නවා. මේ වසරේත්, ගිය වසරේත් කිරි දෙනුන් දෙසිය තිස් දෙනෙක් ගෙන ඒම සඳහා රුපියල් පනස් හත් ලක්ෂ පනස්දාහක් වියදම් කරලා තිබෙනවා. මේ වර්ෂය තුළත් ගෙනෙන කිරි හරක් අභිජනනය කිරීමෙන් හොඳ හරක් නිෂ්පාදනය කරලා තෘණ වගා කරන්න කටයුතු කළොත් අපට කිරි නිෂ්පාදනයේ ඉලක්ක කරා යන්න පුළුවන් වෙයි කියලා මම මේ අවස්ථාවේ විශ්වාස කරනවා. හරියට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් ගරු ඇමැතිතුමාට ඒ කාර්යය සාර්ථක කරගන්න පුළුවන්මකම ලැබෙනවා කියලා මම හිතනවා.

අනික් පැත්තෙන් සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරය දේශීය විදේශීය වශයෙන් අපට නම් කරන්න පුළුවන්. විදේශීය සංචාරක ව්‍යාපාරය නංවනවා වාගේම දේශීය සංචාරකයාට අවස්ථාව සලසා දීම ඉතාම වැදගත්. අද කොළඹ ජීවත්වන ජනතාව විශේෂයෙන්ම පිට ප්‍රදේශවලට ගිහිල්ලා ස්වාභාවික පරිසරයත් එක්ක සම්බන්ධ වෙලා දවසක් ගත කරන්න විශාල වෙහෙසක් මහන්සියක් ගන්නවා. මම දන්නවා. අපේ ප්‍රදේශයේ නාච්චිමලේ සහ පරෙතොට කියලා ස්ථාන දෙකක් තිබෙනවා. ගරු ඇමැතිතුමා විශාල වියදමක් දරලා තිබෙනවා. නමුත් ඒක අංගසම්පූර්ණ වෙලා නැහැ. සතියකට දහස් ගණනක් ඒ ස්ථානයට එනවා. නාන්න කියලා දවස ගත කරන්න එනවා. නමුත් ඒ පාරවල් භාගෙට හදලා තිබෙන්නේ. ඒ වැඩ පිළිවෙළ සකස් කරලා, වැසිකිළි කැසිකිළි ඇති කරලා ඒ අයට ඇඳුම් මරු කරන ස්ථානයක් හදලා ඒ පාර සකස් කරලා දුන්නොත් ඒ වැඩ පිළිවෙළ සාර්ථක කරගන්න පුළුවන්. ඒ වාගේම ගරු ඇමැතිතුමනි, මම ඔබතුමාට යෝජනා කරනවා. මේ ප්‍රදේශයේ අය දවසක සංචාරයක් සඳහා හික්කඩුව ප්‍රදේශයේ ගිහිල්ලා සංචාරක හෝටලයකට ඉඳලා විශාල වියදමක් කරලා එනවා. අපට ඊට වැඩිය ලස්සන තැන් තිබෙනවා. නිදර්ශනයක් වශයෙන් ගත්තොත් අගලවත්තේ පාලින්ද නුවර මහුරු ඟඟ අසබඩ, අනික් පැත්තේ ගඟෙන් එගොඩ තිබෙන්නේ පුංචි සිංහරාජය. මෙගොඩ හරි ලස්සන පරිසරයක් තිබෙනවා. දිය ඇළි තිබෙනවා. ලස්සන තේ වතු තිබෙනවා. විශාල කැළෑවක්

තිබෙනවා. ඒ වාගේ ප්‍රදේශවල අක්කර හතර පහ නිවාඩු නිකේතන ඇති කරලා ඔබතුමා කටයුතු කරනවා නම් මේ ප්‍රදේශයේ අයට ගිහිල්ලා, අඩු වියදමෙන් ලස්සනට තමන්ගේ දරුවොත් එක්ක හොඳ පරිසරයක ජීවත් වෙලා, ගහෙන් නාගෙන කෑම ටිකක් කාලා දවසක් ගත කරන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේ දේවල් අපට ඇති කරන්න පුළුවන්. හොරණ ආසනයේ උඩකන්ද ප්‍රදේශයත් ඒ වාගේ ප්‍රදේශයක්. එක පැත්තකින් මුහුද පේනවා. වටේටම අහස නිල් පාටට පෙනෙනවා. කැළෑවල් පේනවා. ඉතාමත් අලංකාර ප්‍රදේශයක්. (බාධා කිරීමක්) ජනතාව කැමැති කොළ පාටට තමයි. මිනිස්සු කොළ පාට දකින්න කැමැතියි. ගස් කොළන් දකින්න. ඒ වාගේ තැන්වල ඒ වාගේ නිවාඩු නිකේතන ඇති කරලා ඒ තුළින් අපට ආදායමක් ගන්නවා වාගේම අපේ නගරවල ඉන්න ජනතාවට ගමේ පරිසරයෙන් හොඳ වාතාශ්‍රය ලබාගෙන තමුන්ගේ හැකිමිවලට අනුව කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. මගේ කාලය අනුව මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේ වාගේ දේවල් සොයලා බලලා උනන්දුවෙන් කටයුතු කරන අමාත්‍යවරයෙක් හැටියට ගරු අමාත්‍යතුමාව හඳුන්වන්න පුළුවන්. ඔබතුමා ගන්නා උත්සාහය තුළින් මේ අමාත්‍යාංශය සාර්ථකත්වය කරා යන අමාත්‍යාංශයක් හැටියට අපි දකින්නේ. ඒ නිසා ඔබතුමාට මේ වර්ෂය තුළ ගිය වර්ෂයටත් වැඩිය වැඩ කොටසක් කරලා අපේ අමාත්‍යාංශය තුළින් බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවයක් කරන්න අවස්ථාව සලසා ගන්න අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 04.20 ]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට එක්වීමට සැලැස්වීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කරන අතරම මට ඉස්සෙල්ලා කථා කරපු ප්‍රතිපක්ෂයේ අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා ඇත්ත වශයෙන්ම එම අමාත්‍යාංශයෙන් කෙරෙන කාර්යයන් පිළිබඳ හොඳට සුභවාදී ලෙස කථා කෙරුවා. ඒ වාගේම එතුමාගෙන් හොඳ අදහස් වගයක් මේ සභාවට ගොනු වුණා. නමුත් මම දැක්කා, මීට ඉස්සෙල්ලා අමාත්‍යාංශයේ ගරු ඇමැතිතුමා කථා කරන වේලාවේ විපක්ෂයේ අය එතුමාට අදහස් ප්‍රකාශ කරන්න දුන්නේ නැහැ. ඒක බොහොම කනගාටුදායක කරුණක්. ඒ ගැන මාගේ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මොකද, ගරු ඇමැති කෙනෙක් - ඒ පැත්තෙත් ඉන්නවා පක්ෂ නායකත්වයෙන් පත් කරපු පක්ෂ නායකයෝ. මේ පැත්තෙත් ඉන්නවා අපේ පක්ෂ නායකත්වයෙන් පත් කරපු පක්ෂ නායකයෝ. ඒ නායකයෝ කථා කරනකොට, අපේ ගරු ඇමැතිවරු කථා කරනකොට ඒ අයගේ කථාවලට විශේෂයෙන්ම අපි කන් දෙන්න ඕනෑ. මොකද, අපි අද ඒ අයගේ අමාත්‍යාංශයන් යටතේ තමයි ගම්වල වැඩ කරගෙන යන්නේ. ඒ නිසා තමයි අද අපි නිමල් ලන්සා ගරු ඇමැතිතුමා මේ විෂයය භාර ඇමැතිතුමා වශයෙන්, එතුමා කරන හොඳ වැඩ ගැන, එතුමාගේ අමාත්‍යාංශයෙන් කරන හොඳ වැඩ ගැන අපි කථා කරන්නේ. පළාත්බද මාර්ග සංවර්ධනය දිහා බැලුවාම අද පළාත් සභාවෙන් වැඩිම වැඩ කොටසක් කරලා තිබෙන්නේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය භාර ඇමැතිවරයා වන නිමල් ලන්සා ගරු ඇමැතිතුමා බව අපට හඳුන්වන්න පුළුවන්. මම හිතන්නේ එතුමා පළාත්බද මාර්ගවලින් 70% ක් විතර දැන් කාපට් කරලා, ඒවා කොන්ක්‍රීට් කරලා ඉවරයි. ඒ එක්කම එතුමා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මුදල්, මහ ආණ්ඩුවේ මුදල් අරගෙන - මේ පළාත් සභාව හොඳ නැහැයි කියන සමහර අය, මේ පළාත් සභාව ගැරහීමට ලක් කරන අවස්ථාවක, බස්නාහිර පළාත් සභාවේ සංවර්ධනය සඳහා මහ ආණ්ඩුවේ මුදල් කෝටි ගණනක් මේ අවුරුද්දේ අරගෙන තිබෙනවා. ක එක නම්වලින් ඒ මුදල් Pass වෙලා තිබෙනවා. විශේෂයෙන්ම සුපිරි ගමක් - සපිරි රටක්, ඒ වාගේම රන් අරුණ කියන වැඩ සටහන යටතේ බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ විශාල මුදලක් මෙම අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. මෙම අමාත්‍යාංශය තුළින් පාරවල් විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශාල සති පොළවල්, දිවි නැගුම යටතේ සති පොළවල්. දැක්කාම හිතා ගන්නත් බැහැ. පිටරට වාගේ සති පොළවල් විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා.

ඒ වාගේම ශරීර සුවතා මං තීරු. අපේ ජනතාවගේ ශරීර සුවතාව සඳහා. අද වෛද්‍ය සායනයක් පැවැත් වුවා නම්, ඒ වෛද්‍ය සායනයේදී අපට බලාගන්න පුළුවන් අපේ ශරීර සෞඛ්‍ය කොහොමද කියලා. බොහෝ දෙනෙකුට මම හිතන්නේ, එක්කෝ දියවැඩියාව. එහෙම නැත්නම් අධි රුධිර පීඩනය. එහෙම නැත්නම් නොයෙකුත් රෝගවලට ලක් වෙලා තිබෙනවා. නමුත් මම කියන්න සන්තෝෂයි. දැනට අවුරුද්දකට, මාස අටකට ඉස්සෙල්ලා මෙතුමා මහර ආසනයට සම්බන්ධ අපේ ගෙවල්

කිට්ටුව මං තීරුවක් ඉදි කෙරුවා. කිලෝ මීටර් තුනක් දුර. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගෙවල් ළඟ ඇසළින් අක්කා කියලා කොස් කපන අම්මා කෙනෙක් හිටියා. මේ ගෑණු කෙනා හෙන තරබාරුයි. ඇවිදින්න බැරුවයි හිටියේ. අපි උදේට ඇවිදින්න යන කොට රබර් සෙරප්පු දෙකක් දාගෙන ඒ කොස් කපන ඇසිලින් අක්කත් ශරීර සුවතාවය සඳහා මං තීරුවේ ඇවිද්දා. අද කියන්න සන්තෝෂයි. අපිත් එක්ක එකට එක ඇවිදිනවා. කිසිම ලෙඩක් නැහැ. එයාට දියාවැඩියාව තිබුණයි කිව්වා. අධික රුධිර පීඩනය තිබුණයි කිව්වා. නමුත් අද ඒ අය මේවායේ ඇවිදිනවා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු සංවිධායකතුමා වාගේ අය මේක දිහා මුලින් බැලුවේ වපර ඇහෙන්. මුලින් කිව්වේ සල්ලි කන යක්ෂයෙක් කියලා. අද ඒගොල්ලොත් මේවායේ ඇවිදිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියත් එන්න කැමැතියිලු.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මම හිතනවා ඉදිරියේදී ඒ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමියගේ පැත්තෙත් මං තීරු ඉදි වෙයි කියලා. ඇවිදින මං තීරු. ඒ නිසා මෙම අමාත්‍යාංශය ගැන සුළුපටුවට හිතන්න එපා. ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මුදල් දීලා, ප්‍රකෝටි ගණනක වැඩ කරලා තිබෙනවා. මෑතා සායන. ගැබිනි මව්වරු ඒ දවස්වල හිටියේ අගුපිලි ගානේ. අද අභිමානයෙන් ගිහිල්ලා හොඳ සුදු යකඩ පුටුවල ඉඳගෙන තමන්ගේ කාර්යය කරගෙන එළියට එන්න පුළුවන් ක්‍රමයක්, අද මේ අමාත්‍යාංශයෙන් හදපු Building වලින් ප්‍රායෝජන ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශය මාර්ගවලට විතරක් සීමා වුණේ නැහැ. ඒ වාගේම බස්නාහිර පළාතට පමණක් සීමා වුණේ නැහැ. සබරගමුව, වයඹ වාගේ පළාත්වලට ගිහිල්ලා පාරවල් හැදුවේ බස්නාහිර පළාත් සභාවේ ඒ නිලධාරී මහත්ම මහත්මීන්. ඒ වාගේම ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් යන්ත්‍රෝපකරණ විශාල තොගයක් අපේ බස්නාහිර පළාත් සභාවට පරිත්‍යාග කරලා තිබුණා. මම හිතනවා 2013 දිහා බැලුවාම අපට සන්තෝෂ වෙන්න පුළුවන්. පක්ෂ විපක්ෂ සියලුදෙනාටම ආඩම්බරයෙන් ඉන්න පුළුවන්. මෙතුමාට සලකනවා. ගරු ඇමැතිතුමාට. ඒක මම හොඳටම දන්නවා. ඒක නිසා අපි සන්තෝෂ වෙන්න ඕනෑ, මෙතුමා වාගේ ඇමැති කෙනෙක් අපේ අමාත්‍යාංශයක් භාරගෙන අපට මෙහෙම සැලකීම ගැන.

ඒ එක්කම සත්ව නිෂ්පාදනය දිහා අපි බලන්න ඕනෑ. අර මන්ත්‍රීතුමා කිව්වා, විශාල තණ බිම් තිබෙනවා. විශාල කැලෑවල් තිබෙනවා. ඒවා එළි කරලා තමන්ගේ ගව පට්ටි පාලනය හරියට කරන්න කියලා. ඒ කියන්නේ හොඳ ගවයින්, හොඳ අභිජනන මධ්‍යස්ථාන බිහි කරලා හොඳ ගවයින් මේ රටට බිහි කරන්න

[ ගරු ජානක සූරියබණ්ඩාර ]

කියලා කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් කියන්න කනගාටුයි. ඔය කියන නිසා මමත් ගෙදර කුකුල්ලු දහ දෙනෙක් හැදුවා. දවසකට කිකිළියෝ බිත්තර අටක් දැම්මා. අවුරුදු ගණනක්ම මම කන්නේ, ඒ කිකිළියන්ගේ බිත්තර. ඒ වාගේම මම කිරි හරකෙක් හැදුවා. කිරි බෝතල් අටක් ගත්තා. මාස තුනක් හතරක් දොවන කොට දෙන දෙන ගෙවල්වල කියනවා අද එපා, අපට සෙම කියලා. අර කිව්වා වාගේ මේ කිරිවල සෙමයි කියනවා. පිරිසිදු එළකිරි එපැයි කියනවා. අන්තිමට වතුර බෝතලය ගාණටවත් කිරි බෝතලය විකුණ ගන්න බැරි තත්ත්වයට අපේ පැත්ත වැටුණා. අද ගම්පහ දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය වැඩියි. නමුත් කිරි බොන කට්ටිය අඩුයි. ඒ නිසා ඒ නිෂ්පාදනය හරි මිලකට අලෙවි කරන්න ක්‍රමවේදයක් හදාගන්න ඕනෑ. ඒ නිසා අපි ක්‍රමවේදයන්, වෙන වෙන දේවල් යෝගට්, චීස් ඒ වාගේ දේවල් හදන ක්‍රමවලට අපි යන්න ඕනෑ. අපි කිරි ගැනම හිතලා හරි යන්නේ නැහැ. ඒ නිසා හොඳ කිරි ගව පාලනයක් අපේ ලංකාව තුළ දියත් කළොත් අපට පිටරටින් චීස් ගෙනෙන්න ඕනෑ නැහැ. අපේ ලංකාවේ නිෂ්පාදනය කරගන්න පුළුවන්. ඒ නිසා මම කරුණාකරලා ඉල්ලා සිටිනවා. මෙවැනි යෝජනා ක්‍රියාත්මක කරන්න කියලා. ඒ එක්කම කුකුල් පාලනයත්. ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් මම හිතන්නේ ගෙවල් 10,000 කට වැඩිය කුකුල් පැටව් දහ දෙනා ගණනේ දීලා තිබෙනවා. ගම් බිත්තර කියන එක ඉස්සර අපි කලාතුරකින් කෑවේ. ගමේ ගම් කුකුළෙක්, කිකිළියක් හොයා ගන්න නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ හැම ගෙයකටම ඔබතුමාත් ගියාද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

හැම ගෙයකටම ගිහිල්ලා - අද අපට ඕනෑම කඩයකටම ගියාම රුපියල් 15/- ක් දීලා ගම් බිත්තරයක් අරගෙන කන්න පුළුවන් තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මේ දිවි නැඟුම කියන ව්‍යාපෘතිය තුළින් තමයි මේ සියල්ලක්ම ක්‍රියාත්මක වුණේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යන වැඩ පිළිවෙළ ගැන අපි නොයෙක් නොයෙක් විවේචන කරන්න පුළුවන්. නමුත් අද අපේ බස්නාහිර පළාතත්, මුළු රටත් ලබලා තිබෙන දියුණුව ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ.

නමුත් කනගාටුවෙන් වුණත් එකක් ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ ධීවර කර්මාන්තය ගැන. අපි ධීවර කර්මාන්තයට මොනතරම් අතහිත දුන්නත් ධීවර අතරමැදියා - ඒ මාළු මාර්කට් එකෙන් එළියට ඇවිල්ලා ගමට එනකොට අධික මිල ගණන්වලට වෙළඳාම් කරන්න පුරුදු වෙලා තිබෙනවා. මම ඊයේ තලපත් පන්සියයක් ගත්තා. තලපත් මාළු පන්සියයක්. රුපියල් 480/- යි. මම හිතේ තියාගත්තා ආයේ තලපත් මාළු කන්නේ නැහැයි කියලා. ඒ නිසා මෙවැනි දේවල් නැති කරන්න ඕනෑ. නිෂ්පාදනය

කොච්චර වෙළඳ පොළට ආවත් ගමට එනකොට ගමේ ඉන්න මිනිස්සුන්ව අතරමැදියා හූරගෙන කන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වැඩිය පෝෂණය තිබෙන්නේ, කුඩා මාළුවල කියලා ඔබතුමා කියන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මම පිළිගන්නවා. නමුත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙයා පොඩි එවුන් කන්න හරි කැමැතියි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක විහිළුවකට ගන්න එපා. ඒ නිසා මා ඉල්ලා සිටිනවා. බස්නාහිර පළාත් සභාවෙනුත් ධීවර වෙළඳසැල් ආරම්භ කරලා, සංචාරක ක්‍රමයක් ඇති කරලා, ලොරිවල ගිහිල්ලා, ගම්වලට ගිහිල්ලා මාළු අඩු මුදලට ගම්වලට බෙදා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අද ධීවර අමාත්‍යාංශයේ ලොරියක් යනවා නම්, ලොරියට ටවුන් එකට යන්න දෙන්නේ නැහැ. මාළු කඩේ අය ගහන නිසා ලොරිය මහ නවත්තගෙන ඉන්නේ. ඒ මිනිස්සුන්ව මන්නෙන් කපනවා. යන්න දෙන්නේ නැහැ. මෙවැනි ක්‍රමවලින් අහිංසක ජනතාවට අසාධාරණයක් වෙනවා. ඒ නිසා මේවාට සාධාරණයක් ඉෂ්ට කරන්න ක්‍රමයක් සොයන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. සංචාරක ව්‍යාපාරය නිසා අද - විශේෂයෙන්ම දේශීය සංචාරකයින්වත් පිනවන්න ඕනෑ. අද විදේශිකයින්ට වැඩිය අපේ ප්‍රදේශවලට එන්නේ දේශීය සංචාරකයෝ. ඒ නිසා තමයි අද හැඳල ප්‍රදේශයේ විශාල සංචාරක පුරවරයක් බවට පත් කරන්න අපේ ගරු ඇමැතිතුමා වැඩ කටයුතු කරගෙන යන්නේ. අවසාන වශයෙන් මම තව එකක් කියන්න ඕනෑ. අපි හැමදෙයක් ගැනම බලනවා. නමුත් කුළියට ඉන්න නිවැසියන් ගැන කිසිම අවබෝධයක් අපට නැහැ. කුළී නිවැසියන් පොඩි ගෙයකට වුණත් රුපියල් 10,000/-ක්, රුපියල් 15,000/- ක් ගෙවනවා. තමන්ගේ පඩියෙන් ඒ ගේ ගත්තොත් දවස කන්න සල්ලි නැහැ. ඒ නිසා කරුණාකරලා ගෙවල් කුළී පාලක මණ්ඩලයක් ඇති කරලා, මොනවා හරි ක්‍රමවේදයක් හදලා ගෙවල් කුළියට ඉන්න ඒ මිනිස්සුන්ට අපි සහනයක් සලසන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ අයට සින්නක්කර ගෙයක් අරන් දෙන්න ඕනෑ. එහෙම නැත්නම් සාධාරණ කුළියක්, කාමර තුනයි, කුස්සියයි, සාලෙයි රුපියල් 15,000/- යි. ඉතින් පඩිය රුපියල් 22,000/- යි. රුපියල් 15,000/- ක් දුන්නාම අතට ඉතිරි වන්නේ රුපියල් 7000/- යි. මෙවැනි දේවල් ගැන අපි කල්පනා කරලා බලලා, අපි යම්කිසි ක්‍රමවේදයන් හදලා ඉදිරියේදී බස්නාහිර පළාත් සභාව තුළින්වත්, මහ ආණ්ඩුවෙන් ඉෂ්ට කරන්නේ නැත්නම් සුදු අලියෙක් කියන බස්නාහිර පළාත් සභාව තුළින්වත් මේවා ඉෂ්ට සිද්ධ කරලා දෙන්න අවස්ථාව අපේ ගරු ඇමැතිතුමාට හයිය, ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 04.30 ]

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිමල් ලන්සා ගරු අමාත්‍යතුමන්ගේ අමාත්‍යාංශ පහ ගැන, ඒ කියන්නේ මහා මාර්ග, නිවාස හා ඉදි කිරීම්, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, සංචාරක හා ධීවර කටයුතු පිළිබඳ යන අමාත්‍යාංශ ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දන්නා පරිදි අපි දෙන්නාම නියෝජනය කරන්නේ එකම ආසනයක්. ඒ මීගමුව. ඒ නිසා මම එතුමාව හොඳින් දන්න හඳුනන කෙනෙක්. මම හිතන්නේ, මම මීගමුවට එනකොට එතුමා ඉපදිලා නැහැ. මම හිතන්නේ මගේ පාසලේ සාමාන්‍ය පෙළ පාස් වුණු නිමල් ලන්සා කියන ශිෂ්‍යයා, නගර සභාවේ මන්ත්‍රී කෙනෙක් වුණා. නගරාධිපති වුණා. ආයේ මමත් සමඟ පළාත් සභාවේ මන්ත්‍රී කෙනෙක් වුණා. අද අමාත්‍යවරයෙක් වෙලා තිබෙනවා. මම ගොඩක් සතුටු වෙනවා. මගේම මීගමු ආසනයේ, මේ වාගේ අමාත්‍ය ධුරයට පත් වුණු මගේ සහෝදර පළාත් සභා මන්ත්‍රීවරයෙක් ගැන.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ශ්‍රීනාත්ට මොකද වුණේ?

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

අනේ මට බාධා කරන්න එපා. කථාව අහගන්න. බාධා කරන්න එපා. මම මේ ගැන අවසානයේදී කථා කරන්න ඉන්නවා. ඇත්තෙන්ම එතුමාට ලැබිලා තිබෙන අමාත්‍යාංශ පහ මම හිතන්නේ, මහජනතාවට හුඟක් වැඩ කරන්න පුළුවන්, මහජනතාවත් සමඟ කිට්ටුව ඉන්න පුළුවන් අමාත්‍යාංශ පහක්. එකක් තමයි මහා මාර්ග. ඒ වාගේම නිවාස හා ඉදි කිරීම්, ඒ වාගේම සත්ව නිෂ්පාදන, ධීවර හා සංචාරක. අද එතුමා

ජීවත්වන මීගමු ආසනය ගත්තාම මේකේ සුවිශේෂ අවස්ථාවක් වෙන්නේ, අපි දෙදෙනාම ඉන්නේ සංචාරක පුරවරයක. ඒ වාගේම ධීවර පුරවරයක. මම හිතන්නේ, එතුමාට මේ අමාත්‍යාංශ දෙකේ ගොඩක් වැඩ කරන්න පුළුවන්. මොකද එතුමා ගැන මිනිසුන් කථා කරනවා. ඒ කියන්නේ, එතුමා මිනිසුන්ගේ හදවතට දැනෙන්න වැඩ කරලා තියෙනවා කියන එකයි එතැනින් අදහස් වෙන්නේ. අපි ඒ සත්‍ය දේ සත්‍ය වශයෙන් පවසන්න ඕනෑ. ඇත්තෙන්ම මම ගොඩක් සතුටු වෙනවා. මොකද, සංචාරක ව්‍යාපාරය ගත්තාම එතුමාට ලැබුණායින් පස්සේ සංචාරක තොටුපළවල් හුඟාක් ලස්සනට ඒවා සැලසුම් කරලා තිබෙනවා. මම හිතන්නේ, මම දකින විධියට තව අවුරුදු 10 ක්, 15 ක් යන කොට අපේ ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරයේ පළමුවැනි ස්ථානය බවට පත් කරන්න පුළුවන් රටක්. අනික් රටවල් එක්ක දැක්කාම, අපේ රටේ සංස්කෘතික සම්පත් දැක්කාම අපට මේක හිතෙනවා. හරි විධියට කළොත් අවුරුදු 10 ක්, 15 ක් යන විට සංචාරක ව්‍යාපාර ලෝකයේ අංක එකට ගෙනෙන්න පුළුවන් රටක් බවට පත් වෙනවා. ඒ නිසා අපි මේ ගැන උනන්දුවක් අද සිට දැක් වුවොත් තව අවුරුදු 15 කින් ඒ ප්‍රතිඵලය නෙළා ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා තරුණ අමාත්‍යවරයෙක් හැටියට එතුමා ගන්න උත්සාහය ගැන අපි සතුටු වෙන්න ඕනෑ. මොකද, මමත් සංචාරක ව්‍යාපාරයට ගොඩක් සම්බන්ධ වෙලා ඉන්නවා. මගේ අක්කට තමයි Jetwing සංචාරක ව්‍යාපාරයේ හෝටල් ඔක්කෝම තිබෙන්නේ. මම හිතන්නේ මෙතුමා ඒ අය සමඟ ගොඩක් වැඩ කරනවා. අක්කාගේ දුව සහ පුතා තමයි මේක ගොඩක් පාලනය කරන්නේ. මෙතුමා ගැන කථා කරනවා. ඒ නිසයි මම එහෙම කථා කළේ.

ඒ වාගේම මෙතුමාගේ පවුලේ අය ධීවර රැකියාව කරන්නේ. එතුමා ධීවරයින් ගැන හොඳට දන්න එක්කෙනෙක්. එතුමා ධීවරයින්ටත් ගොඩක් වැඩ සටහන් කරන එක්කෙනෙක්. මොකද, ධීවරයෝ එතුමා ගැන ගොඩාක් කථා කරනවා. මම ඔබතුමාට ඉතාමත් කැමැත්තෙන් යෝජනාවක් ගෙනෙන්න කැමැතියි. මීගමුව කියන ධීවර පුරය අද ගොඩක් දුරට - විශේෂයෙන් කළපුව පරිසර දූෂණයට ලක් වෙලා තිබෙනවා. ඔබතුමා වැඩක් කරන්න පුළුවන් අමාත්‍යවරයෙක් හැටියට මේ යෝජනාව ගෙනෙන්න මම හිතා ගත්තා. ඒ කියන්නේ, Aquaculture. මට මතක් වෙනවා. අපි ඉන්දුනීසියා සංචාරයේ අපේ ගරු අමාත්‍යතුමාත් එක්ක ගිය අවස්ථාවේදී, මම හිතන්නේ අප දෙදෙනාට අවස්ථාවක් ලැබුණා, සිංගප්පූරුව හරහා එනකොට එක්තරා මාළු ෆාම් එකක් නිරීක්ෂණය කරන්න. ඒකේ හිටියේ ඩෘෂප කියන විශාල මාළු. කොස්සා. මේ මාළුවා විශාල විධියට ඒ ගොල්ලෝ ඇති කරනවා. විශාල ෆාම් එකක් තිබුණේ. මම හිතන්නේ ඒ අයගේ ආදායම් මාර්ග මිලියන ගණනක්. මම හිතන්නේ, අප දෙදෙනාව අරගෙන ගිය කාර් එකත් කෝටි ගණනක කාර් එකක්. ඒකෙන් තේරුම් යන්නේ Aquaculture කියන ව්‍යාපාරයෙන් අපට කොච්චර මුදලක් ලබා ගන්න පුළුවන්ද කියන එකයි. අපේ පුංචි රට වටේම තිබෙන්නේ මුහුද. අපට මාළු ගොඩක් එහෙම බලෙන් හදන්න උවමනාවක් නැහැ. හැදිච්ච මාළු අල්ලා ගැනීම තමයි තිබෙන්නේ.

[ ගරු පෝල් පෙරේරා ]

ඒත් අද මීගමුවට පුංචි ව්‍යසනයක් වෙලා තිබෙනවා. Aquaculture කියන්නේ ජල ජීවී විද්‍යාව. මේකේ ඉස්සෝ සහ කකුළුවෝ ගොඩාක් බහුලව හැදෙන එකක්. එත් මේ ධීවරයින්ට දැනුම හුඟක් අඩුයි. ඒගොල්ලෝ විශාල අධ්‍යාපනයක් තිබෙන අය නොවෙයි. මේගොල්ලන්ගේ පටු දැනුම නිසා මේ උදේට අල්ලන මාළුන්ගේ සේරම කපලා කොටලා ඉතුරුවන බොකු, බඩවැල්, වරල් හා අනවශ්‍ය කොටස් සේරම නැවත කළපුවටම ඔබනවා. ඒ නිසා දවස් කීපයක් ගියාම මේ මස් නරක් වෙලා මේකේ අම්ල ගතියක් නිපද වෙනවා. ඒ අම්ල ගතිය නිපද වුණාම පුංචි කාලයේ බිත්තර ඔක්කෝම ඉස්සන්ගේ බිත්තර සහ කකුළුවන්ගේ බිත්තර සේරම විනාශ වෙලා යනවා.

ඒක නිසා අද මීගමුව කළපුවට ඉස්සන් නැති, කකුළුවන් නැති කළපුවක් තමයි අපට දායාද වෙලා තිබෙන්නේ. ඒත් ඉතා පහසුවෙන් මේ පරිසර දූෂණය නතර කරන්න පුළුවන්. එක්තරා මැෂින් එකක් තිබෙනවා. මේකට කියන්නේ රෙන්ඩරින් ප්ලාන්ට් කියලා. මේක ජපානයේ ලක්ෂ 40 ක් විතර වෙනවා. ඉන්දියාවේ ලක්ෂ 25 ක් විතර වෙනවා. මේ රෙන්ඩරින් ප්ලාන්ට් කියන මැෂින් එකට මාළුන්ගේ අහක යන කොටස්, ඒකට Fish Offal කියලා කියන්නේ. අහක යන මාළු සේරම ගෙනැල්ලා මේ මැෂින් එකට දාන්න පුළුවන්. අපට තිබෙන්නේ ධීවරයින්ට Dust bin කීපයක් දීලා, උදේට කපන මේ මාළුවල දහ ජරාව මේ Dust bin වලට දාන්න කියලා පසුව ප්‍රවාහන සේවාවකින් මේ මැෂින්වලට ගෙනත් දාන්න විතරයි. මේ මැෂින් එකෙන් එළියට එන්නේ ඉතා වටිනා ප්‍රෝටීන් වර්ගයක් තමයි. මේ ප්‍රෝටීන් ආහාරය අපට සත්ත්ව ආහාරයක් වශයෙන් පාවිච්චි කරන්න පුළුවන්. විශාල මුදලක් ලබා ගන්න පුළුවන්. සමහරවිට මේ අනවශ්‍ය මාළු කොටස් එකතු කරගන්න මහ ලොකු වියදමක් යන්නේ නැහැ. ඒක මිනිස්සුන්ට උවමනා කරන දෙයක්. මේ මිනිස්සු කැමැති නැහැ, කළපුවට දාන්න. මම දවසක් ගිය වේලාවක ඇහුවා, ඇයි මේ වැඩේ කරන්නේ කියලා. සර්, අපට වෙන කරන්න දෙයක් නැහැයි කිව්වා. අපට මේවා ගෙනිහිල්ලා අහකට දාන්න බැහැයි කිව්වා. අපි කරන්නේ මේ කළපුවට ඔබලා නිකන් ඉන්නවා කියලා. කොටසක් මුහුදට යනවා. අනික් කොටස කළපුවේම ඉතුරු වෙලා, අම්ල වැඩි වෙලා ඉස්සන්ගේ වර්ධනය සහ කකුළුවන්ගේ වර්ධනය ඇනහිටලා යනවා. ඒ නිසා මේ දුප්පත් ධීවරයාට තමයි මේ පහර වදින්නේ.

ඒ නිසා මම ගරු ඇමැතිතුමාට ඔබතුමා හරහා යෝජනා කරන්න කැමැතියි. මේ රෙන්ඩරින් ප්ලාන්ට් කියන මැෂින් එකක් ගෙනැල්ලා කිසියම් තැනක මේක තිබ්බා නම්, අපට ධීවර මිනිස්සුන්ගේ මේ තිබෙන පරිසර දූෂණ ප්‍රශ්නයට විසඳුමක් ඇති වෙනවා. ඉස්සන් වර්ධනය කිරීමේ වේගය සහ කකුළුවන් වර්ධනය කිරීමේ වේගය ගොඩාක් වැඩි කරන්න පුළුවන්. එහි අතුරු ඵලයක් හැටියට එන මේ ප්‍රෝටීන් ආහාරය සත්ව ආහාරයක් වශයෙන් විකුණලා විශාල මුදලක් ලබා ගන්න පුළුවන්. ඒ නිසා මම ඉතා

සතුටින් අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමැතිතුමාට යෝජනා කරනවා. මේ රෙන්ඩරින් ප්ලාන්ට් කියන මැෂින් එක ඔබතුමාට ගෙන්නන්න පුළුවන්. ඒ තුළින් මීගමු ආසනයේ පරිසර දූෂණය අයින් කරන්න පුළුවන් උපක්‍රමයක් හැටියට එය හදන්න. මේ සම්බන්ධව ඔබතුමාට අවශ්‍ය සේරම තාක්‍ෂණ දැනුම මම ඕනෑ වේලාවක දෙන්න සූදානම්. මොකද අපි සමාජ සේවකයන් හැටියට ඇවිල්ලා තිබෙන්නේ. අපි පටු පක්‍ෂ බෙදා ගැනීමේ දේශපාලනයක් කරනවාට වඩා අපි මහජන සේවයක් කළොත් තමයි අපිත් එක්ක මිනිස්සු එන්නේ. ඒ නිසා අපි මහජන සේවකයෝ වශයෙන් තමයි මේවා කරන්න අවශ්‍ය වෙන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා හරහා ගරු ඇමැතිතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශ පහ ගැන කථා කරන මේ විවාදයේදී මම කරන ඉල්ලීම මේකයි.

ඒ වාගේම මම දකිනවා. ඔබතුමාගේ මේ අමාත්‍යාංශයට සත්ව නිෂ්පාදනය හිමි වෙලා තිබෙනවා. මම හිතන්නේ, ඔබතුමා මේ සම්බන්ධයෙන් ගොඩක් වැඩ කරගෙන යනවා. ඒ ගැන ජනතාව කථා කරනවා. අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, කිරිවල සෙම තිබෙනවා කියලා. ඇත්තෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එළකිරිවල සෙම ගතිය වැඩියි තමයි. එළකිරිවල සෙම නොදැනෙන්න අපි ඒකට ඉඟුරු මිශ්‍ර කරන්න ඕනෑ. ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමා, ඉඟුරු මිශ්‍ර කරපුවාම ඒ සෙම ගතිය කවදාවක්වත් අපට ඇති වෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක හින්දා අපි දෙන්නා එක්කහු වෙමු.

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

ඒ වාගේම මේකට හොඳ විකල්පයක් තමයි පුංචි දරුවන්ට - එළු කිරි බොන කෙනෙකුට කවදාවක්වත් සෙම ඇති වෙන්නේ නැහැ. ඒ වාගේම එළු කිරි බොනවා නම් මන්ද පෝෂණය වාගේ ලෙඩ රෝග සේරම ඉවර වෙනවා. මම හිතන්නේ, ගරු ඇමැතිතුමාට පුළුවන් මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න. මම හිතන්නේ ගරු ඇමැතිතුමනි, අද එළු කිරි සොයා ගන්න හරි අමාරුයි. අපට පිට රටින් ගේන්න ඕනෑ. පිට රට ගැන කථා කරනකොට අපි මේ කිරි වර්ග හුඟාක් නවසීලන්තය, ඕස්ට්‍රේලියාව වාගේ සීත රටවලින් ගෙනෙන්නේ. මේ රටවල්වලට ගියාම මාස හතරක් විතර සීතලේ වෙව්ලනවා. ඉන්න බැහැ. එතකොට හරක්ට Heaters ගහලා තිබෙන්නේ. කැම වර්ග ඔක්කෝම Heaters වලින් උෂ්ණත්වයට ගෙනත් තිබෙන්නේ. කොච්චර අමාරුවෙන්ද මේ රටවල් කිරි නිෂ්පාදනය කරන්නේ. අපේ රටේ දේශගුණය ඒ වාගේ නොවෙයි. අපට තිබෙන්නේ ඉතා සෞම්‍ය දේශගුණයක්. අපට මේ දේශගුණය පැය දෙකෙන් වෙනස් කර ගන්න පුළුවන්. අද මෙතැන සිට පැය දෙකෙන් නුවරඑළියට ගියාම ඕස්ට්‍රේලියාවක් හම්බ වෙනවා. නවසීලන්තයක් හම්බ වෙනවා. අපේ රටේ හැම සතෙකුටම ඔබින දේශගුණයක් තිබෙන්නේ. අපට ලැජ්ජයි කථා කරන්න. අපි නවසීලන්තයෙන් කිරි ගේනවා. අපි ඕස්ට්‍රේලියාවෙන් කිරි ගේනවා. ලැජ්ජයි කථා කරන්න. මේ වාගේ හොඳ රටක් තියාගෙන, දේශගුණයක් තියාගෙන අපේ කිරි අපි නිෂ්පාදනය කරන්නේ නැත්තේ ඇයි? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ළඟත් වැස්සියෝ 20 ක් ඉන්නවා. ඒ වැස්සියන්ගෙන් කිරි ලීටර් 50 ක් විතර ගන්නවා. ඒ නිසා ගරු ඇමැතිතුමාට මම හිතන්නේ මේක විශාල වශයෙන් ව්‍යාප්ත කරන්න පුළුවන්. සමහරවිට මේක ගෙයින් ගෙට දෙන්න ගියාමත් අපේ මිනිස්සුත් එක්ක වැඩ කරන්න හරි අමාරුයි. සමහරවිට වැස්සිය පහුවදාට විකුණගෙන. ඒ නිසා අපට මහා පරිමාණ නිෂ්පාදකයින් හදන්න වෙනවා. මහ පරිමාණ නිෂ්පාදකයින් හදපුවාම ඒගොල්ලන්ට බැංකු ණය අරන් දෙන්න පුළුවන්. අපි කවදාවක්වත් ඒ මුදල් නාස්ති කර ගන්නේ නැහැ. මහ පරිමාණ නිෂ්පාදකයින් හදලා තමයි අපට මේ පුංචි පරිමාණ නිෂ්පාදකයින් හදන්න වෙන්නේ. මම හිතන්නේ එතකොට මේ ව්‍යාපෘතිය කවදාවක්වත් කඩාගෙන වැටෙන්නේ නැහැ. ඒක නිසා මේක අපට අවශ්‍යම දෙයක්. මේ කිරි නිෂ්පාදනය අත්‍යවශ්‍ය දෙයක්. එහෙම වුණොත් අපේ රටට විදෙස් රටවල්වලින් කිරි ගෙනෙන්න අවශ්‍යතාවයක් නැහැ. කිරි මිල වැඩි වුණා, කිරි මිල වැඩි වුණා කියලා කෑ ගහන්න ඕනෑත් නැහැ. මම හිතන්නේ අපේ රටේ මෙය හදා ගන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

මගේ කාලය ඉවරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක් විතර දෙන්න පුළුවන්. මීගමුවේ නිසාවෙන් විනාඩියක් දෙන්න කියලා ගරු ඇමැතිතුමා කියනවා.

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම 36(1) වගන්තිය යටතේ පුංචි වරප්‍රසාද ප්‍රශ්නයක් මම මේ කථා කරන්න යන්නේ. මම දන්න විදියට මෙතැන ගරු අමාත්‍යවරු, ගරු මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. මේ අයව මේ ගෞරවනීය පළාත් සභාවට පත් කරලා එවලා තිබෙන්නේ, මහජනයා විසින්. ඒ නිසා මේ ස්ථානය උත්තරීතර ස්ථානයක්. මෙතැන ඉන්න අය උත්තරීතර අය වශයෙන් තමයි මම නම් දකින්නේ. එතකොට මේක බලන් ඉන්න මහජනතාව ගොඩාක් ඉන්නවා. පත්තරෙන්

දකින අයත් ගොඩාක් ඉන්නවා. ඒත් මේ පසුගිය මාස දෙක තුන අතර අපි හැසිරෙන විලාශය ගැන අපි ඉතාමත් කනගාටු වෙන්න ඕනෑ. ඇත්තටම කනගාටු වෙන්න ඕනෑ. මොකද මේ උත්තරීතර අය ඒ විධියට හැසිරෙන කොට සමහරවිට මේ බලන් ඉන්න ලේකම්වරු සහ නිලධාරී මණ්ඩලය මේවා එළියට ගිහිල්ලා කියන හැටි මම නම් අහලා තිබෙනවා. ඒ නිසා අවුරුදු 35 ක් උගන්වපු ගුරුවරයෙක් හැටියට මම ඔබතුමා හරහා ගෞරවනීය අමාත්‍යවරුන්ගෙන් සහ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ආයාචනයක් කරනවා. මේ විනය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගෝලයන්ගෙන්.

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

ඇත්තටම මේකේ මගේ ගෝලයෝ ගොඩාක් ඉන්නවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ලන්සා ගරු ඇමැතිතුමා ගෝලයෙක්ද?

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

කිව්වා නේ දැන්. ඒ නිසා ගරු අමාත්‍යවරුන්ගෙන් සහ ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ආයාචනයක් කරනවා. මේ පළාත් සභාවේ ගෞරවනීය තත්ත්වය සහ එතුමන්ලාගේ මේ ගෞරවනීය උත්තරීතර ස්ථානය රැක ගන්න විනය ගැන ටිකක් කල්පනා කරන්න කියලා ආයාචනයක් කරනවා. ඔබ සැමට ස්තුතියි.

[ අ.භා. 04.46 ]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පස්වන පළාත් සභාවේ 25 වන අයවැය විවාදය සඳහා මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වැය ශීර්ෂ අංක 108, 124, 125 යටතේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අයවැය විවාදය සඳහා කරුණු කිහිපයක් කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 3782 කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා. මේ වර්ග කිලෝ මීටර 3782 න් C හා D පන්තියේ මාර්ග කිලෝ මීටර් 1956 ක් ආවරණය වෙනවා. මේ C හා D පන්තියේ මාර්ග කිලෝ මීටර් 1956 දිහා බැලුවාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෑම වර්ග කිලෝ මීටර දෙකකටම බස්නාහිර පළාතේ මාර්ග කිලෝ මීටරයක් ආවරණය වෙනවා. ඒ නිසා අපට

[ ගරු එම්.එම්.එම්. අම්ජාඩ් ]

පසුගිය කාලවකවානුව පිළිබඳව සන්තෝෂයෙන් කියන්න පුළුවන්. පස්වන පළාත් සභාව ඓතිහාසික සංවර්ධනයකට උර දෙනකොට මේ බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ඓතිහාසික ජයග්‍රහණයක් ලබා තිබෙනවා. සිය ඉලක්කයන් කරා හඹා ගිය අමාත්‍යාංශයක් කියන එක අපි මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ ගරු අමාත්‍ය නිමල් ලන්සා මැතිතුමාගේ නායකත්වය යටතේ - මට එතුමා මැවී පෙනෙන්නේ අපේ දිවංගත ජෙයාර්ජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමා හා සමාන විධියට. මම ජෙයාර්ජ් ප්‍රනාන්දු පුල්ලේ ඇමැතිතුමාගේ කාලයේ මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරියෙක් වශයෙන් කටයුතු කරලා තියෙනවා. එතුමා පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන නිලධාරියෙක් වශයෙන් සෘජු තීන්දු ගත්තු, සෘජු දේශපාලන නායකත්වයක් දුන්නු ඇමැතිවරයෙක් තමයි එදා ජෙයාර්ජ් ප්‍රනාන්දු පුල්ලේ ඇමැතිතුමා. මම හිතන්නේ, ඒ වාගේ දිස්ත්‍රික්කයෙන් බිහි වුණු පරපුරක කොටසක් තමයි අද නිමල් ලන්සා මැතිතුමා කියන එක අපට නිර්භයව ප්‍රකාශ කරන්න පුළුවන්. පසුගිය අවුරුදු හතර, පහ තුළ ගත්තා නම් මේ බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය තුළ අපි දැක්කා, මේ 1956 ක් වූ කිලෝ මීටර් සංඛ්‍යාවෙන් අද වන විට 1448 ක මාර්ග කිලෝ මීටර සංඛ්‍යාවක් කාපට් වෙලා තිබෙනවා. 1448 ක මාර්ග කිලෝ මීටර සංඛ්‍යාවක් කාපට් වන කොට රන් අරුණ යටතේ කිලෝ මීටර 845 ක් කාපට් වෙලා තිබෙනවා. ඒ වාගේම සුපිරි ගමක්, සපිරි රටක් යටතේ කිලෝ මීටර 603 ක් සංවර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ පසුගිය අවුරුදු තුන ඇතුළත මම හිතන්නේ බිලියන 18 ක්, ඒ කියන්නේ මිලියන 18,000 ක් වියදම් කරලා එක් අමාත්‍යාංශයකින් මේ වාගේ සීඝ්‍ර සංවර්ධනයක් වුණු ඓතිහාසික අවස්ථාවක් කියන එකයි. මේ ඓතිහාසික අවස්ථාව මේ විවාදයේදී රන් අකුරෙන් ලියවෙනවා කියන එක අපි මේ සභාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ නිසා අද මේ බස්නාහිර පළාත් සභාව කියලා කියන කොට, සෑම හන්දියක් ගාණේ යන කොට, මම කිව්වා වාගේ අපේ වර්ග කිලෝ මීටර දෙකක ඒකකයක් තුළ එක කිලෝ මීටරයක් බස්නාහිර පළාත් සභාවේ මාර්ග වෙන කොට හැම හන්දියක්, හන්දියක් ගාණේම සුපිරි ගමක් - සපිරි රටක් කියන ඒ බෝඩ් එක තිබෙන කොට බස්නාහිර පළාත් සභාවේ සංවර්ධනය විද්‍යාමාන වෙනවා. ඒ සංවර්ධනය තුළින් බස්නාහිර පළාත් සභාව තිබෙනවයි කියන එක ඔප්පු වෙනවා. අපේ ගරු මහ ඇමැතිතුමාගේ පින්තූරය තිබෙනවා. නිමල් ලන්සා ගරු ඇමැතිතුමාගේ පින්තූරය තිබෙනවා. බස්නාහිර පළාත් සභාවක් තිබෙනවයි කියන එක අද මුළු මේ බස්නාහිර පළාතේ ඉන්න පුංචි පහේ ළමයා පවා දැනගෙන තිබෙනවා කියන එක පිළිබඳව මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන් මේ අවස්ථාවේදී තම හෘද සාක්ෂියට එකහව කථා කරනවා ඇති කියලා මම දන්නවා. ඒ නිසා අද අපට සන්තෝෂ වෙන්න පුළුවන්. බස්නාහිර

පළාත් සභාවේ, පස් වන පළාත් සභාවේ මේ වාගේ සංවර්ධනයක් දියත් වන කොට පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ විවාදයේදී මේ කරුණු කාරණා කියන්න ලැබීමත් වාසනාවක් කියන එක මම මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් කියන්න කැමැතියි. අද විපක්ෂය පවා මේ සංවර්ධනය පිළිබඳව විමතියට පත් වෙලා තිබෙනවා.

බස්නාහිර පළාත් සභාවට විතරක් මේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය අද සීමා වෙලා නැහැ. මේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සබරගමු පළාත, උතුරු මැද පළාත වැනි පළාත්වල පවා සංවර්ධන කටයුතු කරනවා. ඒ වාගේම ඉංජිනේරු තාක්ෂණික උපදෙස් පවා ලබා දෙමින් විශාල සංවර්ධන කටයුත්තක් පසුගිය කාල වකවානුව තුළ කරලා තිබෙනවයි කියන එක මම මේ සභාවේදී මතක් කරන්න කැමැතියි. සබරගමුව සහ වයඹ පළාත් සභාවල කිලෝ මීටර 803 ක්, මිලියන 18,636 ක මුදලින් සංවර්ධන කටයුතු වෙනවයි කියන එකත් මේ සභාවේදී මතක් කරන්න කැමැතියි. අපි දකිනවා. ගොඩනැගිල්ලක් ශක්තිමත් වෙන්න, ඒ ගොඩනැගිල්ලේ කුළුන ශක්තිමත් වෙන්න ඕනැ. ඒ වාගේ තමයි, රටක සංවර්ධනයේ ජීවනාලිය වෙන්නේ මාර්ග සංවර්ධනයක් දියත් වුණොත් විතරයි. ඒ නිසා අද අපට පැහැදිලිව කියන්න පුළුවන්. හැම ගමක් ගමක් ගාණෙම ගියාම, හැම හන්දියක් හන්දියක් ගාණෙම ගියාම මග නැඟුමද, ගම නැඟුමද, රන් අරුණද, සුපිරි ගමක් - සපිරි රටක් ද ඒ වාගේ විශාල සංවර්ධන ව්‍යාපෘති මාර්ග සංවර්ධනය වෙනුවෙන් දියත් වෙලා අද විශාල සංවර්ධනයක් සිද්ධ වීම තුළ අද අපි සියලුම මහජන නියෝජිතයින්ට ලොකු ආඩම්බරයක් කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

අපේ මධ්‍යම ආණ්ඩුවේ ජාතික අයවැය ගත්තා නම්, අපේ සමස්ත අයවැය තිබෙන්නේ බිලියන 1200 යි. මේ බිලියන 1200 න් අපේ බස්නාහිර පළාත් සභාවේ අයවැයට තිබෙන්නේ බිලියන 40 යි. ඒ කියන්නේ ඒකට සාපේක්ෂව අපේ ප්‍රතිශතය වෙන්නේ 3.33% යි. මේ 3.33% ඇතුළත අපි මේ කරන සංවර්ධනය දිහා බැලුවාම අපට තෘප්තිමත් වෙන්න පුළුවන්. බස්නාහිර පළාත් සභාවේ බිලියන 40 තුළ සියලුම ක්ෂේත්‍රයන් සංවර්ධනය වන කොට අපේ මාර්ග ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය, මේ සියලුම ක්ෂේත්‍රයන් මේ අමාත්‍යාංශය හරහා සංවර්ධනයක් සිද්ධ වෙලා තිබෙනවයි කියන එක අපි මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

මම මේ අවස්ථාවේදී අපේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ඉලක්කයන් කිහිපයක් පිළිබඳව අවධාරණය කරන්න කැමැතියි. ගරු ඇමැතිතුමනි, ඒ ඉලක්කයන් ජය ගන්න ඕනැ. ඒ ඉලක්කයන් මොනවාද කියලා කිව්වොත්, අපේ නගර සභා, ප්‍රාදේශීය පාරවල් තිබෙනවා. ඒ ආයතනවලට සංවර්ධනය කරගන්න බැරි පාරවල් තිබෙනවා. ඒ පාරවල් අතර විශේෂයෙන්ම නගරයට ගමන් කරන, නගරයට සේන්දු වෙන පාරවල් තිබෙනවා. මැකඩම් පාරවල්. තාර පාරවල්. ඒවා තවමත් සංවර්ධනය වෙලා නැහැ. ඒ මාර්ග සංවර්ධනය කරගන්නට ඒ ප්‍රාදේශීය සභාවලට ශක්තියක්, හයියක් නැහැ. ඒ නිසා ගරු ඇමැතිතුමනි, ඔබතුමා ශක්තිමත්. ඔබතුමාගේ අමාත්‍යාංශය දැන් පෝෂිත අමාත්‍යාංශයක්. ඒ කියන්නේ, සමස්ත අපේ C හා D පන්තියේ මාර්ග වලින් 75% කට, 80% කට සංඛ්‍යාවක් කාපට් වෙලා තිබෙන මොහොතක මේ අසරණ ප්‍රාදේශීය සභා, නගර සභාවල තිබෙන, ඒ අඩු පාඩු තිබෙන පාරවල් කීපයක්, අඩුම ගණනේ එක ආසනයකින් කිලෝ මීටර 02 ක බැගින් හෝ බස්නාහිර පළාත් සභාවට පවරා ගැනීමට කටයුතු කරලා, ඒවා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් දියත් කරන්නය කියලා මේ සභාවේදී ඔබතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාවෙන්න. සංවිධායකතුමාගෙන් විමසන්න. මොකද අපට ප.ව. 05.00 ට නතර කරන්න වෙනවා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 10 ක්ම දීලා තිබෙනවා. ඔබතුමාට තව විනාඩියක් දෙන්න පුළුවන්. කථා කරන්න.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ඒ වාගේම මාර්ග සංඥා සහ සංඥා පුවරු සවි කිරීම පිළිබඳව. ඒ වාගේම Black Spot සංවර්ධනය කිරීම පිළිබඳව. මාර්ග වට රවුම් සංවර්ධනය කිරීම පිළිබඳව. ඒ වාගේම මාර්ග රක්ෂිතයන් ආරක්ෂා කිරීම පිළිබඳව. ඒ වාගේම මාර්ග උරහිසවල් සංවර්ධනය කිරීම පිළිබඳව අපේ අවධානය යොමු කරන්න වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ මාර්ග කාපට් වුණත් අපේ මගියෙකුට පාරේ බැහැලා යන්න බැරි විධියට අද ඒ මාර්ගවල වාහන විශාල වේගයෙන් ගමන් කරනකොට, මඟී ජනතාවට ඒ මාර්ග දිගේ ගමන් කිරීමේ අවධානමක් තිබෙනවා. ඒ අවධානම දුරු කරන්නට මම කියනවා. මේ පුළුල් කරපු මාර්ගවල පදිකයන්ට ගමන් කරන්න පුළුවන් ආකාරයට, මාර්ග උරහිසවල් සකස් කරන්නය කියන එක ගරු ඇමැතිතුමාගේ අවධානය සඳහා යොමු කරනවා. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳව විග්‍රහ කරන්න ඕනැ.

එතුමන්ලා විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් කුඩා කාර්ය මණ්ඩලයක් එක්ක සංවර්ධනය කිරීමට දියත් වෙලා තිබෙනවා. අපේ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු ප්‍රධාන ඉංජිනේරුවරු, විධායක ඉංජිනේරුවරු, ඒ වාගේම පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු ඒ සියලු කාර්ය මණ්ඩලය අපේ ගරු අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ මේ ලැබී තිබෙන ප්‍රගතිය පිළිබඳව සතුටු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 04.58 ]

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාර්ග සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, සත්ව නිෂ්පාදන හා ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධව කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ නැති වුණත් හදිසියේම ලැබුණු ඉල්ලීම අනුව කරුණු කිහිපයක් ඔබතුමා මාර්ගයෙන් සභාවට ඉදිරිපත් කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම බේරුවල මගේ සහෝදර මන්ත්‍රීවරයාගේ කථාවෙන් පස්සේ මටත් ඒ අවස්ථාව ලැබීම ගැන එක පැත්තකින් සතුටු වෙනවා. විශේෂයෙන්ම මාර්ග පිළිබඳව හැමෝම දීර්ඝව අදහස් ප්‍රකාශ කරනවා. ඒ මාර්ග සංවර්ධනයේදී එතුමා බේරුවල සංචාරක උපදේශකයෙක් හැටියටත්, ධීවර උපදේශකයෙක් හැටියටත් ගණනය කරලා පසුගිය කාලයේ මම බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ දැක්කා යම් සංවර්ධන වැඩ පිළිවෙළක් කරලා තිබුණා. ඒ වගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ධීවර කටයුතු පිළිබඳව මතක් කරන්න ඕනෑ. වර්තමානයේ ධීවර කටයුතු පිළිබඳව රේඛීය අමාත්‍යාංශයත්, බස්නාහිර පළාත් සභාවත් හැටියට අපත් අතර යම්කිසි විෂමතාවයක් තිබෙනවා. ඔවුන් ජාතික මට්ටමින් කටයුතු කරන කොට අපේ විෂයය ධාරාවට පවා යම් යම් අවස්ථාවලදී සම්බන්ධ වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වුණත් වර්තමාන ධීවර ඇමැතිතුමා සුළු ධීවරයින් පිළිබඳව මීට වැඩිය අවධානය යොමු කරනවා නම්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර දෙන්න යම් පියවර ගන්නවා නම් හොඳයි කියන එකයි මගේ මතය.

ඒ වාගේම අපේ විෂයයට නැඹුරු වෙන්න ඕනෑ. විශේෂයෙන්ම මිරිදිය මසුන් සම්බන්ධව. කළුතර දිස්ත්‍රික්කය, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කය ගත්තාම මිරිදිය මසුන් නිෂ්පාදනය සඳහා අලුත් වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් මීට වැඩිය හොඳයි කියන එක මම යෝජනා කරන්න කැමැතියි. විශේෂයෙන්ම බේරුවල ප්‍රදේශය නොවෙයි. මතුගම, අගලවත්ත වාගේ ප්‍රදේශවල ජනතාවට මිරිදිය මසුන් සඳහා ආධාර දීලා, ඒවා ක්‍රමවත්ව දැනුවත් කරගෙන කටයුතු කරන්න පුළුවන් නම් මුහුදු මසුන්ට වඩා පෝෂදායි ආහාරයක් වන මිරිදිය මත්ස්‍ය ව්‍යාපාරය වැඩි දියුණු කරන්න පුළුවන්. ඒ වාගේම ඔවුන්ගේ රැකියා නිෂ්පාදනයක් හැටියට, ආදායම් මාර්ගයක් හැටියට පත් කරගන්න පුළුවන් වෙනවා.

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විසිතුරු මසුන් තරුණයින් අතර ප්‍රචලිත කරලා ඔවුන්ගේ දේශීය හා විදේශීය ආදායම් මාර්ගයක් හැටියට ස්වයං රැකියාවක් හැටියට යොමු කරන්න ගරු ඇමැතිතුමනි, ඔබතුමා යම් ප්‍රතිපාදන වෙන් කරලා ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් කරනවා නම් සුදුසු යැයි මම යෝජනා කරන්න කැමැතියි. නමුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ සියලු දේ කරන්න 3.3% ක ප්‍රතිපාදනයක් තමයි තිබෙන්නේ. මේක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් ගණනාවකට - ඒ නිසා මේ මුදල් ප්‍රමාණවත් කියලා අපට හිතන්න බැහැ. ඒ වුණාට ඔබතුමාට හැකියාවක් තිබෙනවා විදේශධාර පවා ලබා ගෙන කටයුතු කරන්න. එහෙම හැකියාවක් නිර්මාණය කරගන්න කියලා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම ධීවරයින්ගේ පවුල් සම්බන්ධව කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ධීවරයන් මුහුදු ගිහිල්ලා ජීවිතක්ෂයට පත් වෙනවා. එතැන්දී ධීවරයින්ට ලොකු අසාධාරණයක් වෙනවා. රේඛීය අමාත්‍යාංශයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මොහොතකට ඉන්න.

# රීති අංක 50(6) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 50(6)

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"න්‍යායපත්‍රයානුකූලව අද දිනට නියමිත වැඩ කටයුතු අවසන් වන තුරු මෙම සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි මා යෝජනා කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විශේෂයෙන්ම මතක් කළේ, මුහුදු රැකියාව සඳහා ගිහිල්ලා මුහුදේදී ජීවිතක්ෂයට පත් වෙන පවුල්වලට යම් ආධාරයක් ලබා දීම සඳහා විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ධීවර ප්‍රඥප්තියක් සම්මත කරනවා නම් ඔවුන්ගේ වෘත්තියට හා සුභ සාධනය වෙනුවෙන් කටයුතු කරන්න අපට පහසු වෙයි. ඔවුන්ගේ පවුල්වලට යම් ආධාරයක් දෙන්න විතරක් නොවෙයි. ඔවුන්ගේ දරුවන්ට ශිෂ්‍යත්වයක් ලබා දීලා ඔවුන් පෝෂණය කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ඇති කරන්නය

කියලා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට මම යෝජනා කරන්න කැමැතියි. විශේෂයෙන්ම වාරකන් කාලයේදී ධීවරයා දුක් විඳින ජීවිත කාලයක්. දිගටම මම මේ සභාව තුළ මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. පෙන්නුම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම වාරකන් කාලය තුළදී ඔවුන්ගේ විශ්‍රාම වැටුප ප්‍රමාණවත් වෙන්නේ නැහැ. වාරකන් කාලය තුළදී ධීවර පවුල්වලට යම් පෝෂ්‍යදායි වැඩ පිළිවෙළක්, එහෙම නැත්නම් ජීවත්වීම සඳහා යම් විශේෂ ආධාර වැඩ පිළිවෙළක් ඔබතුමා මාර්ගයෙන් මම යෝජනා කරන්න කැමැතියි.

ඒ වාගේම අපි නිවාස අමාත්‍යාංශය පිළිබඳව කථා කරනවා නම් මේ බස්නාහිර පළාතේ මට මතකයි, ලෝරන්ස් මාදිවල ඇමැතිතුමා ඉන්න අවස්ථාවලදී අපි සියලුම මන්ත්‍රීවරු එවකට රුපියල් ලක්ෂය බැගින් අපේ ප්‍රතිපාදනවලින් වෙන් කරලා, මම හිතන්නේ ඔබතුමාත් දායකත්වය දරන්න ඇති. අපි අරමුදලක් පිහිටුවාගෙන, නිවාස අරමුදලක් හැටියට ඇවිල්ලා පසුගිය කාලය වනතුරු යම්කිසි ප්‍රමාණයක නිවාස ඉදි කිරීම් සඳහා යම් ආධාර වැඩ පිළිවෙළක් තිබුණා. ඒක 2012 අවුරුද්දේදී නිවාස ආධාර දීම සම්බන්ධව ක්‍රියාත්මක වෙනවා අපි දැක්කේ නැහැ. ඒ විතරක් නොවෙයි. මට මතකයි, බස්නාහිර පළාත් සභාවේ සැලසුමක් සකස් කරලා තිබුණා. ඒ ගැන සාකච්ඡා කළා. රජයේ සේවකයින්ට නිවාස ලබා දීම සඳහා විශාල වැඩ පිළිවෙළක් ගැන අපි සාකච්ඡා කළා. චීන සමාගමකට ලබා දුන්නා කිව්වා. නමුත් ඒ වැඩ පිළිවෙළට කුමක් වුණාදැයි කියන එක වර්ෂ ගණනාවක් තිස්සේ අපට තිබෙන ප්‍රශ්නයක්. එහෙමනම් ඒ නිවාස ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අද නිවාස ඉදි කිරීමේදී අපට විශාල ආධාරයක් කරන්න සිද්ධ වෙනවා. අද භාණ්ඩ මිල ඉහළ යනවා. සිමෙන්ති කොට්ටයක් රුපියල් 1000/- ක් වෙනවා. ඇස්බැස්ටෝස් අඩි 8, 10 ෂීට් එකක් රුපියල් දෙදහස් ගණනක් වෙනවා. එහෙමනම් මේ දෙන ආධාර ප්‍රමාණය යම් ක්‍රමයකින් වැඩි කිරීම සඳහා පියවරක් ගන්නය කියන එක මම විශේෂයෙන්ම ඔබතුමාට මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම සත්ව නිෂ්පාදනය ගත්තාම කුකුළන්, එළුවන් සහ ඌරන් ඇති කිරීම පමණක් නොවෙයි. විශේෂයෙන්ම සත්ව නිෂ්පාදනයේදී කිරි එළදෙනුන් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපට හැකියාවක් තිබෙනවා. අද රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරු ඉන්නවා. අමාත්‍යවරු හිටියත් මුළු රටේම කිරි නිෂ්පාදනය තිබෙන්නේ 28% යි. අප පරිහරණය කරන්නේ එම ප්‍රමාණය තමයි. අපි පිටරටියන්ට එහෙම නැත්නම් සමාගම්වලට දොස් කියලා වැඩක් වෙන්නේ නැහැ. පසුගිය අවුරුදු 17 ක් තිස්සේ කිරි නිෂ්පාදනය පිළිබඳව රජයේ අවධානය යොමු වෙලා සාකච්ඡා කළා. විවාද කළා. නමුත් අද වනතුරු 28% කට පමණයි සීමා වෙලා තිබෙන්නේ. එහෙමනම් ඔබතුමාට හැකියාව තිබෙනවා, අපේ බස්නාහිර පළාත සඳහා අවශ්‍ය කිරි ගවයින් ඇති කරගෙන, ඒ නිෂ්පාදනය වැඩි කරගෙන අපේ ප්‍රදේශයේ දරුවන්ට කිරි වීදුරුවක් ලබා දෙන්න. අපේ ප්‍රදේශයේ කැමැති උදවියට කිරි පරිහරණය කරන්න ඒ අවස්ථාව ලබා දීමට ගරු ඇමැතිතුමාට හැකියාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ඒ කරුණු මතක් කරමින් ඉදිරි කාලයේදී ගරු ඇමැතිතුමා මාර්ග සංවර්ධනයේදී ධීවර ප්‍රදේශයක් හැටියට, ඒ වාගේම සංචාරක ප්‍රදේශයක් හැටියට බේරුවල, ඔබතුමාගේ මීගමු පුරය වාගේම බේරුවලත් ධීවර හා සංචාරක ප්‍රදේශයක්. ඒ වාගේම ඓතිහාසික සිද්ධස්ථාන තිබෙන ප්‍රදේශයක්. විශේෂයෙන්ම කතෝලික ජනතාවගේ කල්වාරිය. බෞද්ධ ජනතාවගේ කන්ද විහාරය. මුස්ලිම් ජනතාවට බේරුවල කැච්චිමල පල්ලි වාගේ දේවස්ථාන සම්බන්ධ කළා වාගේ, කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන ඓතිහාසික හා පුරාණ මධ්‍යස්ථාන සම්බන්ධ කරගෙන දේශීය ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා යම් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නය කියලා ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාට මතක් කරනවා. විශේෂයෙන්ම පළාත් මාර්ග අධිකාරිය කටයුතු කරගෙන ගියත් මාර්ග අධිකාරිය පිළිබඳව පසුගිය දවස්වල අඩුපාඩුකම් පෙන්වන්න වෙනවා. ඒවායේ ගිණුම් කටයුතු පිළිබඳව සමහර අවස්ථාවලදී ගිණුම් කාරක සභාවක් හැටියට අපට ගැටලු සහගත තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම දැනටමත් සමහර කොන්ත්‍රාත් උදවිය කියනවා අපට මුදල් එන්න තිබෙනවා. අපි වැඩ කරලා තිබෙනවා. අපට මුදල් ලැබුණේ නැහැයි කියන එක පිළිබඳවත් ගරු ඇමැතිතුමාගේ අවධානය යොමු කරමින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ ලබා දීපු විනාඩි ගණනට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. ස්තුතියි.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් වෙනවා."*

***ඊට අනුකූලව අ.භා. 05.07 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 05.07 p.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

2013 වර්ෂය වෙනුවෙන් පැවැත්වෙන අයවැය විවාදයේ තුන්වැනි දවස අද. අද දවසේ පූර්ව භාගයේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ

වැය ශිර්ෂ අංක 105, 116, 117, 118, 119 පිළිබඳ විවාදයන් ආරම්භ වුණා. එකී වැය ශිර්ෂයන් සඳහා ගරු මන්ත්‍රීවරුන් 14 දෙනෙකු සහභාගි වෙමින් සිය අදහස් ප්‍රකාශ කළා. විවාදය අවසානයේ බෙදීමක් ඉල්ලා සිටි බැවින් 105, 116, 117, 118 හා 119 සඳහා පළාත් සභාව පක්ෂව ඡන්ද 65 ක්ද, විරුද්ධව ඡන්ද 22 ක්ද, වැළැකුණු ඡන්ද 00 ක්ද යනුවෙන් බෙදුණු බවත්, එකී වැය ශිර්ෂ ඒ අනුව සභා සම්මත වූ බවත් දිනයේ පූර්ව භාගයේ ප්‍රගතිය ලෙස මේ අවස්ථාවේදී දන්වා සිටිනවා.

අනතුරුව, ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශිර්ෂ පිළිබඳ විවාදය ආරම්භ වුණා. මධ්‍යාහ්න 12.00 ට පමණ ආරම්භ වී පස්වරු 04.00 දක්වා පැවැතුණු එකී විවාදයේදී ගරු මන්ත්‍රීතුමන්ලා 14 දෙනෙක් සිය අදහස් ප්‍රකාශ කරනු ලැබුවා. ඒ විවාදය අවසානයේදීද බෙදීමක් ඉල්ලා සිටි බැවින් ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ ශීර්ෂ අංක 107, 122, 123 හා 103 යන වැය ශිර්ෂයන් සඳහා පළාත් සභාවේ පක්ෂව ඡන්ද 64 ක්ද, විරුද්ධව ඡන්ද 24 ක්ද, වැළැකුණු ඡන්ද 00 ක් ලෙසද බෙදුණු අතර එකී වැය ශිර්ෂයන් සභා සම්මත වූ බව අද දිනයේ ප්‍රගතිය ලෙස සතුටින් දන්වා සිටිනු කැමැත්තෙමි.

ඒ වාගේම ඉන් අනතුරුව මාර්ග සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වැය ශිර්ෂ අංක 108, 124 හා 125 පිළිබඳ විවාදය ආරම්භ වූ අතර, එකී වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා ඊළඟ දිනයට යොමු වෙනවා. ඒ නිසාවෙන් අද දවසේ මේ ගෙවුණු පැයකට අධික කාලය තුළ අදහස් ප්‍රකාශ කළා වූ පක්ෂ විපක්ෂ දෙපාර්ශවයේම ගරු මන්ත්‍රීතුමන්ලාට මූලාසනය බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ..භා. 05.10 ට, 2012 දෙසැම්බර් මස 10 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Aaccordingly, the Provincial Council was adjourned at 05.10 p.m till 09.00 a.m, on 10.12.2012.*